Civil Aviation Authority
Sri Lanka

Safe and Efficient Skies for All

වාර්ෂික වාර්තාව 2021

ஆண்டறிக்கை 2021

ANNUAL REPORT 2021



ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

இலங்கை சிவில் விமானப் போக்குவரத்து அதிகாரசபை

CIVIL AVIATION AUTHORITY OF SRI LANKA

Civil Aviation Authority
Sri Lanka

සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක්



වාර්ෂික වාර්තාව 2021

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

පටුන

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි තේමා ගීතය / 2

ගුවන්සේවා සහ අපනයන කලාප සංවර්ධන ගරු රාජ්‍ය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. / 3

අප ගැන / 4

කෙටි යෙදුම් / 6

නාමාවලිය / 10

සභාපතිතුමාගේ සමාලෝචනය / 11

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ සමාලෝචනය / 15

CAASL හි පැතිකඩ / 18

සමස්ත විග්‍රහය / **18**
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි සාමාජිකයින් / **21**
අධ්‍යක්ෂ මණ්ඩලය / **22**
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි 13 වන මණ්ඩලයෙහි සාමාජිකයන් පිළිබඳ හැඳින්වීම / **23**
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය / **29**

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය / 32

ආකල්පය / **32**
අරමුණු / **32**
උපායමාර්ග / **32**
සාරධර්ම / **32**
CAASL හි ආසන්නතම ඉලක්ක / **32**
අපේක්ෂිත ප්‍රතිඵල / **33**
ප්‍රතිදානය / **33**

නියාමන විෂය පථය / 34

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගවීම / 36

අධිකාරියෙහි කාර්යභාරය / **36**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් / **36**
අධ්‍යක්ෂ මණ්ඩලය සහ පාලනය / **36**
අධිකාරියෙහි විධායක බලතල / **36**
අධිකාරියෙහි කමිටු / **37**
කාර්ය මණ්ඩල කමිටුව / **37**
විගණන සහ කළමනාකරණ කමිටුව / **37**
NGAP ශ්‍රී ලංකා වැඩසටහන පිළිබඳ ජාතික කමිටුව / **38**
සිවිල් ගුවන්සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව (CADEC) / **39**
පාර්ශ්වකරුවන් සමඟ පවතින සබඳතා / **39**
අධිකාරියෙහි සහ ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වයෙහි වගකීම් / **39**
වගවීම / **40**
අභිමත ගැටුම / **40**
තත්ව සහ අභ්‍යන්තර විගණනය / **40**
ව්‍යවස්ථාදායක අනුකූලතාව / **40**
ආචාර ධර්ම / **41**

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ මෙහෙයුම් සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්යමණ්ඩලය / 44

මෙහෙයවීම සහ කළමනාකරණය / 49

CAASL හි රැස්වීම් / **50**
ගුවන්සේවා නිරුපද්‍රවතා අධීක්ෂණ ඒකකය / **50**
නීති කටයුතු සහ බලාත්මක කිරීමේ ඒකකය / **53**
තොරතුරු සන්නිවේදන සහ තාක්ෂණ (ICT) ඒකකය / **53**
සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන සහ මාධ්‍ය ඒකකය / **54**
ගුවන් වෛද්‍ය සේවා ඒකකය / **55**
තාක්ෂණික පුස්තකාල ඒකකය / **56**
තත්ව සහ අභ්‍යන්තර විගණන ඒකකය / **57**
පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති අංශය / **58**

ගගන නාවික සේවා නියාමන ශාඛාව / 60

ගගන යාත්‍රාංගන අංශය / **61**
ගුවන් සන්තරණ සේවා අංශය / **63**

පියාසර නිරුපද්‍රතතා නියාමන ශාඛාව / 68

පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර අංශය / **69**
ගුවන්යානා මෙහෙයුම් අංශය / **71**
ගුවන්යානා ලියාපදිංචි සහ ගුවන් යෝග්‍යතා අංශය / **72**

ගුවන්සේවා ආරක්ෂණ නියාමන ශාඛාව / 74

ගුවන්සේවා ආරක්ෂක අංශය / **75**

ආයතනික කළමනාකරණ ශාඛාව / 78

ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන අංශය / **79**
මානව සම්පත් සහ දේපළ කළමනාකරණ අංශය / **83**
මූල්‍ය සහ ආදායම් කළමනාකරණ අංශය / **87**

CAASL හි කාර්ය සාධන සාරාංශය - 2021 / 89

2021 වර්ෂයේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක / 91

2021 වර්ෂයේ ගුවන් ගමන් පිළිබඳ විස්තර / 97

මූල්‍ය ප්‍රකාශන / 99-135

විගණකාධිපතිගේ වාර්තාව - 2021 / 136

විගණකාධිපති වාර්තාවට පිළිතුරු ලිපිය - 2021 / 143

Safe and Efficient Skies for All

වාර්ෂික වාර්තාව - 2021

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 15
වන වගන්තියට අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි තේමා ගීතය

ශ්‍රී ලංකා, සිවිල් ගුවන්සේවා අධිකාරිය
කිත් යසසින් සුදිලේ
හෙලි කොත හෙලි හෙළේ //

සක්විති රාවණ ආදි යුගෙත්
දඬු මොණරින් ගුවන දිනා//
විකුමැති ලක් දන වාරිය පොළිනුත්
පා විදු නුවණ මනා //

"උවදුරු තොර බව සඳහා මුල් වෙමු"
වෙයි පෙර වැකිය අපේ //
"ඉක්මන් අය මග නැගුමෙහි මුල් වෙමු"
මේ වෙයි දැකුම අපේ //

රටවැසි යුතුකම් ඉටු වන අයුරින්
මව් බිම හා බැඳෙමූ //
සමාජ මෙහෙවර සාර දහම් රැක
වගකීමෙන් පුදමූ//

පද රචනය : කලාශූරී අරිසෙන් අහුබුදු (දිවංගත)
ගායනය : කලාකීර්ති දේශමාන්‍ය ආචාර්ය පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේව (දිවංගත)
තනු නිර්මාණය : කලාකීර්ති දේශමාන්‍ය ආචාර්ය පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේව (දිවංගත)

ගුවන්සේවා සහ අපනයන කලාප සංවර්ධන ගරු රාජ්‍ය අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී,

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 15 වන වගන්තිය යටතේ ප්‍රකාශිත ව්‍යවස්ථාමය අවශ්‍යතාව සපුරාලීම සඳහා වාර්ෂික වාර්තාව - 2021 සම්පාදනය කරන ලදී. 2021 ජනවාරි 01 වන දින සිට 2021 දෙසැම්බර් 31 වන දින දක්වා කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්හි සාරාංශයක් සහ 2021 මූල්‍ය වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය මෙහි අන්තර්ගත වී ඇත.

උපුල් ධර්මදාස
සභාපති

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
2022 පෙබරවාරි 28 වන දින

දැක්ම

සැමට නිරුපද්‍රත අහසක් සහතික කරමින් ප්‍රවීණ සහ විශ්වසනීය ගුවන්සේවා නිරුපද්‍රතතා නියාමකයකු බවට පත් වීම.

මෙහෙවර

උපායමාර්ගික සැලසුම්කරණය සහ ප්‍රබලකර නියාමනය මගින්, ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන් සමගත් ජාතික ව්‍යවස්ථාමය අවශ්‍යතා සමගත් අනුගත නිරුපද්‍රත, සුරක්ෂිත, කාර්යක්ෂම, ක්‍රමවත් සහ පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන්සේවා පද්ධතියක් මෙහෙයවීම සුසාධනය කිරීම.

ආදර්ශ පාඨය

“සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක්”



සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක්

වසර ගණනාවක් පුරාවට අපි සිවිල් ගුවන්සේවා කර්මාන්තයේ දැක්ම වෙනස් දිශානතියකට යොමු කරමින් සිටිමු. එසේ වන්නේ, ලොව පුරා පිහිටුවා ඇති ප්‍රමිතීන් සම්පූර්ණයෙන්ම ග්‍රහණය කර ගැනීමටත් ඒවා සමඟ අපගේ ප්‍රමිතීන් පෙළගැස්වීමටත් හැකි වන පරිදි අපගේ මෙහෙයුම් කටයුතු හැඩගස්වා ගැනීමෙන් සහ ප්‍රතිනිර්මාණය කිරීම තුළිනි. අපි අහසේ නිරුපද්‍රත සහ සුරක්ෂිතභාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන අතරම, වඩාත් තිරසාර සහ පරිසර හිතකාමී මගක ගමන් කරමින් ඊළඟ පරම්පරාව සඳහා අපගේ අහස ආරක්ෂා කරන බවට සහතික වෙමු. ඵලදායී නියාමනය සහ උපායමාර්ගික සැලසුම්කරණය තුළින් අපට නව යුගයක් කරා යාමට හැකි වී ඇති අතර, සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක් නිර්මාණය කරමින් සුරක්ෂිත පියාපත් අධිෂ්ඨානශීලීව දරාගෙන විශිෂ්ටත්වය වෙත හඹා යන මාවතක අපි පියාසර කරමින් සිටිමු.

කෙටි යෙදුම්

AE	ගගන යාත්‍රාංගන
ANS	ගුවන් සංතරණ සේවා
AASL	සී/ස ගුවන් තොටුපල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම
ADG	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ADRM	ගගන යාත්‍රාංගන
AME (BL)	ගුවන්යානා නඩත්තු ඉංජිනේරු (මූලික බලපත්‍රය)
AML	ගුවන්යානා නඩත්තු බලපත්‍රය
AMO	අනුමත නඩත්තු සංවිධානය
AMT	ගුවන්යානා නඩත්තු කාර්මික
ANR	ගුවන් සංතරණ රෙගුලාසි
AOC	ගුවන්යානා මෙහෙයුම් සහතිකය
AS	ගගන නාවික සේවා
ASN	ගුවන්සේවා නිරුපද්‍රතතා නිවේදනය
ASM	ගුවන්සේවා නිරුපද්‍රතතා අධීක්ෂණය
AT&ER	ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන
ATC	ගුවන් ගමන් පාලනය/ගුවන් ගමන් පාලක
ATM	ගුවන් ගමන් කලමනාකරණය
AV. SEC	ගුවන්සේවා සුරක්ෂිතතාව
AW	ගුවන් යෝග්‍යතාව
AWE	ගුවන් යෝග්‍යතා ඉංජිනේරු
BIA	බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල
BIRD	කුරුලු ගැටීම් :ඊසරා් විරසනැ*
CAASL	ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
CADEC	සිවිල් ගුවන්සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව
CEO	ප්‍රධාන විධායක නිලධාරී
COSCAP-SA	මෙහෙයුම් නිරුපද්‍රතතාව හා අඛණ්ඩ ගුවන් යෝග්‍යතාව වර්ධනය කිරීමේ - දකුණු ආසියා සහයෝගිතා වැඩසටහන
CSI	මැදිරි නිරුපද්‍රතතා පරීක්ෂක
C of R	ලියාපදිංචි කිරීමේ සහතිකය
D	අධ්‍යක්ෂ
DDG/ASR	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුවන් අවකාශ සහ සුරක්ෂිතතා නියාමන)
DDG/ CAER	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඒකාබද්ධ කටයුතු සහ ආර්ථික නියාමන)
DDG/FSR	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පියසර නිරුපද්‍රතතා නියාමන)
DDG/ AVSER	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුවන්සේවා සුරක්ෂිතතා නියාමන)
D/AE	අධ්‍යක්ෂ/ගගන යාත්‍රාංගන
D/ANS	අධ්‍යක්ෂ/ගුවන් සංතරණ
D/AOPS	අධ්‍යක්ෂ/ගුවන්යානා මෙහෙයුම්
D/ARAW	අධ්‍යක්ෂ/ගුවන්යානා ලියාපදිංචි කිරීම සහ ගුවන් යෝග්‍යතා
D/ATER	අධ්‍යක්ෂ/ගුවන් ප්‍රවාහන හා ආර්ථික නියාමන
D/AVS	අධ්‍යක්ෂ/ගුවන්සේවා සුරක්ෂිතතා
D/ HR&PM	අධ්‍යක්ෂ/මානව සම්පත් සහ දේපළ කළමනාකරණ
D/F&RM	අධ්‍යක්ෂ/මූල්‍ය සහ ආදායම් කළමනාකරණ
D/TO&PL	අධ්‍යක්ෂ/පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර
D/ER&P	අධ්‍යක්ෂ/පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති
D/QIA	අධ්‍යක්ෂ/තත්ව සහ අභ්‍යන්තර විගණන
DG	අන්තරායකර ද්‍රව්‍ය
DGCA	සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්
EASA	යුරෝපා ගුවන්සේවා නිරුපද්‍රතතා නියෝජිත ආයතනය
ER&P	පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති
FIR	පියාසර තොරතුරු කලාපය
FS	පියාසර නිරුපද්‍රතතාව
FPP	පියාසර කාර්යපටිපාටි වැඩසටහන
FUEL	ඉන්ධන සම්බන්ධ
GCOL	බිම ගැටීම
GSA	පොදු අලෙවි නියෝජිත
ICAO	ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය
ICT	තොරතුරු සන්නිවේදන සහ තාක්ෂණය
IS	ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය
PBN	කාර්යසාධන පාදක සංතරණය
LALT	අඩු උන්නතාංශ මෙහෙයුම්
LCC	අඩු වියදම් ගුවන් ප්‍රවාහන සමාගම්
LA&EU	නීති සහ බලාත්මක කිරීමේ ඒකකය

කෙටි යෙදුම්

MAC	ගුවන් ආසන්නතාව/ACAS අනතුරු ඇඟවීම්/දුරස්භාවය නැති වීම/ ආසන්න ගැටීම්
MED	වෛද්‍ය
MRIA	මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපල
NCASP	ජාතික සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා වැඩසටහන
OTHR	වෙනත්
Q&IA	තත්ව සහ අභ්‍යන්තර විගණන
RI	ගුවන් ධාවනපථය ආක්‍රමණය - වාහන, ගුවන්යානා හෝ පුද්ගලයා
RPK	ආදායම් මගී කිලෝමීටර්
RTK	ආදායම් ටොන් කිලෝමීටර්
SARPs	ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්
SAARC	දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානය
SARI	දකුණු ආසියානු කලාපීය ප්‍රාරම්භනය
SCF-NP	පද්ධති/සංරචක ක්‍රියාවිරහිතවීම් හෝ දුර්වලවීම්
SCF-PP	බලෝත්පාදක ක්‍රියාවිරහිතවීම් හෝ දුර්වලවීම්
SEC	සුරක්ෂිතතාව
SLAS	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති
SLCAP	ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා ප්‍රකාශය
SLFRS	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති
SMS	නිරුපද්‍රතතා කළමනාකරණ ක්‍රමය
SSP	රාජ්‍ය නිරුපද්‍රතතා වැඩසටහන
TO&PEL	පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර
TURB	කුණාටු මුණගැසීම්
USAP	විශ්ව සුරක්ෂිතතා විගණන වැඩසටහන
USOAP	විශ්ව නිරුපද්‍රතතා අධීක්ෂණ විගණන වැඩසටහන
WILD	වනජීවී ගැටුම
WSTRW	සුළං මාරුව හෝ ගිගුරුම් කුණාටුව

දීප්තිමත් අනාගතයක් උදෙසා ශක්‍යතාවන් උපයෝජනය





නාමාවලිය

ප්‍රධාන කාර්යාලය : ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
අංක 152/1, මිනුවන්ගොඩ පාර
කටුනායක, ශ්‍රී ලංකාව

දුරකථන අංකය : 94 -11-2304632ල 94-11-2358800
ෆැක්ස් : 94 -11-2304644
විද්‍යුත් තැපැල් ලිපිනය : contactus@caa.lk
වෙබ්අඩවිය : www.caa.lk
තැපැල් ලිපිනය : තැ.පෙ. 535, කොළඹ
විදුලි සංදේශ ලිපිනය : AIRCIVIL
AFTN ලිපිනය : VCCCYAYX

කටුනායක කාර්යාලය : ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
FD II, පිටත්වීමේ පර්යන්තය
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක

දුරකථන අංකය : 94 -11-2252269
ෆැක්ස් : 94 -11-2252269

මත්තල කාර්යාලය : ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ, මත්තල

දුරකථන අංකය : 94 -47-7510530
ෆැක්ස් : 94 -47-7510541

ගුවන් යෝග්‍යතා උප කාර්යාල : ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
කොළඹ ගුවන්තොටුපළ
රත්මලාන

දුරකථන අංකය : 94 -11 -3135828
ෆැක්ස් : 94 -11 -2635756

විගණකවරුන් : විගණකාධිපති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
නීතීඥවරුන් : නීතිපති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
බැංකුකරුවන් : ලංකා බැංකුව, මහජන බැංකුව
රක්ෂණකරුවන් : සෙලින්කෝ සාමාන්‍ය රක්ෂණ සමාගම

සභාපතිතුමාගේ සමාලෝචනය



2021 වසර පුරා පැවති වසංගත ව්‍යාප්තිය මිනිසුන්ගේ ජීවන තත්වයට මෙන්ම සේවා පරිසරයට අභියෝග එල්ල කළ අතර එය ලොව පුරා මගී ගමනාගමනයට ද ඇති කළ බලපෑම හේතුවෙන් ගෝලීය ගුවන්සේවාව ද එහි ගොදුරක් බවට පත් විය. මෙම අභියෝගය හමුවේ වුවද ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන්සේවා කටයුතු අඛණ්ඩව පවත්වා ගෙනයාම සඳහා අවශ්‍ය නියාමන කටයුතු සිදු කර ඇත.

සභාපතිතුමාගේ සමාලෝචනය

සේවක යහපැවැත්මට ප්‍රමුඛතාව ලබා දීම

මෙම පසුබිම තුළ, අපගේ ආසන්නම ප්‍රමුඛතාව වූයේ අප සේවකයන්ගේ සහ අප ක්‍රියාත්මක වන වපසරිය තුළ සිටින ගුවන් ප්‍රජාවගේ යහපැවැත්ම වන අතර එමනිසා COVID-19 ව්‍යසනයට එරෙහිව අපගේ සේවකයන්ගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීම සඳහා වැඩි අවධානයක් ලබා දෙන ලදී. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුව කටුනායක ප්‍රධාන කාර්යාලයේ ද මත්තල උප කාර්යාලයේ ද වීරවිල සහ මඩකලපුව ප්‍රදේශයේ පිහිටි අපගේ නිල නිවාස/ නිවාඩු බංගලාවල ද සනීපාරක්ෂාව සහ අනෙකුත් පූර්වාරක්ෂක පියවර අප විසින් හඳුන්වා දෙන ලදී. ගගන නාවික සේවා ඒකක සහ ගුවන්තොටුපළ පරිශ්‍රය තුළ මෙහෙයුම් සහ නිරීක්ෂණ කටයුතුවල නියැලී සිටින තැනැත්තන් සඳහා පෞද්ගලික ආරක්ෂණ උපකරණ ඇතුළුව 'ශල්‍ය මුහුණු ආවරණ' සැපයීම හරහා එකී පරිශ්‍ර තුළ වෛරසය පැතිරීමේ අවදානම අඩු කිරීමට ද අප විසින් පියවර ගන්නා ලදී. මීට අමතරව, සේවකයන්ගේ පහසුව සහතික කරමින් අපි අපගේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ COVID-19 එන්නත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කළෙමු. මෙවැනි ක්‍රියාකාරකම් හේතුවෙන්, අපගේ සේවකයන් වසංගතයට ගොදුරු වීමෙන් ආරක්ෂා කර ගැනීමට අපට හැකි වූ අතර එම කාලපරිච්ඡේදය තුළ අභියෝග රැසකට මුහුණ දෙමින් වුවද, අපගේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට CAASL සේවකයන් දක්වන ලද අප්‍රතිහත ධෛර්ය, සහයෝගීතාව සහ ශක්තිය වෙනුවෙන් මම ඔවුන්ට අවංකවම ස්තුතිය පළ කරමි.

ගුවන් වෛද්‍ය කණ්ඩායමේ ප්‍රශංසනීය කාර්ය සාධනය

පෙර නොවූ විරූ අභියෝග මධ්‍යයේ, ආරක්ෂාව සහතික කරමින් මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා එම කාලපරිච්ඡේදය තුළ වෙහෙස නොබලා කටයුතු කළ CAASL ගුවන් වෛද්‍ය කණ්ඩායමට මම කෘතඥ වෙමි.

මොස්කව් වෙත සහ ඒ වෙතින් සෘජු ගුවන් ගමන් නැවත ආරම්භ කිරීම

වසරේ මුල් භාගයේ දී ශ්‍රී ලංකාව සහ රුසියාව අතර අලුත් කරන ලද ගුවන්සේවා ගිවිසුමට අනුකූලව, 2015 වසරේ නවතා දමන ලද දෙරට අතර සෘජු ගුවන් ගමන් වසර හයකට පසු නැවත ආරම්භ කිරීමට අපට හැකි විය. මම ද විදේශ කටයුතු සහ සංචාරක අමාත්‍යාංශවල නියෝජිත කණ්ඩායමක් ද රේඛීය අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමඟ එක්ව රජය වෙනුවෙන් මෙම ගිවිසුමට අනුග්‍රහය දැක්වීමු. නව විධි විධාන අනුව, ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් මේ වන විට දෙරට අතර BIA සිට DME දක්වා 2021 ජූලි 30 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිකුරාදා පිටත් වී ඉරිදා ආපසු පැමිණෙන නොනවතින ගුවන් ගමනක් ක්‍රියාත්මක කර ඇත.

EU-EASA ව්‍යාපෘති කාර්යාලය, අග්නිදිග ආසියාව

2021 ජූනි 15 වන දින, EASA හි විධායක අධ්‍යක්ෂවරයා විසින් වසර තුනක කාල පරිච්ඡේදයක් වෙනුවෙන් එහි දෙවන අදියර සඳහා අලුත් කිරීමේ ගිවිසුමට අත්සන් තබන ලදී. යුරෝපා සංගමය සහ ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන සාමාජික රටවල ගුවන්සේවා අධිකාරීන් අතර ආයතනික සබඳතාව සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. සැප්තැම්බර් 24 වන දින CAASL හි ස්ථාපිත ශ්‍රී ලංකාවේ කාර්යාලය නැවත ආරම්භ කිරීම සහ දීර්ඝ කරන ලද ව්‍යාපෘති කාලය ප්‍රයෝජනයට ගනිමින් EU-EASA විසින් එහි සාමාජික රටවල් සඳහා සැලසුම් කර ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපි අපේක්ෂා කරමු.

ගුවන්සේවා පිළිබඳ දැනුවත් කිරීමේ මාර්ගගත වැඩසටහන

වසංගතය විසින් එල්ල කරන ලද අභියෝග හේතුවෙන් සම්පත්දායකයන් විසින් පාසල් වෙත ගොස් පාසල් ළමුන් සඳහා සිදු කරන ලද ගුවන්සේවා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් දිගටම කරගෙන යාමට නොහැකි විය. එබැවින්, ඊට විකල්පයක් ලෙස, මගේ මෙහෙයවීම සහ පෞද්ගලික අධීක්ෂණය යටතේ CAASL කණ්ඩායම විසින් දැනුවත් කිරීමේ වැඩසටහන, ඒකාබද්ධ සන්නිවේදන වේදිකාවක්, එනම් "ZOOM" හරහා සිදු කරන මාර්ගගත වැඩසටහනක් බවට පරිවර්තනය කරන ලදී. ඊළඟ පරම්පරාව වෙත CAASL විසින් ගනු ලබන නව මුලපිරීමක් ලෙස මෙම දැනුවත් කිරීමේ වැඩසටහන්හි පළමු වැඩසටහන් මාලාව ඔක්තෝම්බර් 17 වන දින ආරම්භ වූ අතර දිවයිනේ විවිධ ප්‍රදේශවල පාසල් සිසුන් 1,000 කගේ සහභාගිත්වයක් සහිතව වසර තුළ සැසි 14 ක් පවත්වන ලදී.

ලෝක සංචාරක වෙළඳපොළ ලන්ඩනය (WTM London)

මූල්‍ය වර්ෂය තුළ, සහභාගී වන රටවලට ප්‍රතිලාභ සැලසෙන පරිදි ව්‍යාපාරික අවස්ථා සංවර්ධනය කිරීම සහ නිර්මාණය කිරීම සඳහා

සභාපතිතුමාගේ සමාලෝචනය

කර්මාන්තයේ වෘත්තිකයන් එක් කරන ප්‍රමුඛතම ගෝලීය වැඩසටහන නොවැම්බර් මස පළමු සතියේ ලන්ඩන් නුවර දී පැවැත්වුණු අතර ගුවන්සේවා ව්‍යාපාරික දැනුම බෙදාහදා ගනිමින් මෙම වැඩසටහනට සහභාගී වීමේ අවස්ථාව මට ද හිමි විය. ශ්‍රී ලංකාවේ කර්මාන්ත සංවර්ධනයට උපකාරී වන වෙනත් රටවල ගුවන්සේවාවන්හි නව ප්‍රවණතා දැන ගැනීමට ද මට මෙහිදී හැකි විය.

ඩුබායි ගුවන් ප්‍රදර්ශනය

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ රජය, එරට සිවිල් ගුවන්සේවා අධිකාරිය සහ ආරක්ෂක අමාත්‍යාංශය සමඟ එක්ව ඉදිරිපත් කරන ලද ඩුබායි ගුවන් ප්‍රදර්ශනය ලොව වඩාත්ම සාර්ථක සහ බලපෑම්සහතග නියෝජිත වැඩසටහන් අතරින් එකක් ලෙස ශ්‍රේණිගත කර ඇත. මෙම ප්‍රදර්ශනය 2021 නොවැම්බර් 14 සිට 18 දක්වා පැවැත්වුණු අතර මෙම අවස්ථාවට සහභාගී වූ ගුවන්සේවා වෘත්තිකයන් සහ ජ්‍යේෂ්ඨ ගුවන් නියමුවන් අතරින් එක් අයෙකුවීමේ භාග්‍ය මට ද හිමි විය. එවැනි වටිනා අවස්ථාවකට සහභාගීවී මා ලද නව දැනුම සහ එහිදී ඇති කර ගත් නව සබඳතා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවාවේ ප්‍රගමනය සඳහා යොදා ගැනීමට මම අපේක්ෂා කරමි.

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා දිනය

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා දිනයේ පළමු සැමරුම, ICAO හි 50 වන සංවත්සරයේ කොටසක් ලෙසත් 1996 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් දෙසැම්බර් 7 වන දින, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා දිනය වශයෙන් ප්‍රකාශ කිරීමට සමගාමීවත් 1994 වර්ෂයේ දෙසැම්බර් 7 වන දින පවත්වන ලදී. ඉන් පසුව දෙසැම්බර් 7 වන දින රජයේ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් නොකළද ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා දිනය ලෙස සමරනු ලැබේ. 'ගෝලීය සංවර්ධනය සඳහා නවෝත්පාදන වැඩිදියුණු කිරීම' යන්න වසරේ තේමාව ලෙස දක්වන ලද අතර එය 2023 වසර දක්වා එලෙසම පවතිනු ඇත. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා දිනය සමරනු ලැබුවේ ICAO හි ඉදිරි ගමන පිළිබඳ රාජ්‍ය රූපවාහිනී සංස්ථාව මඟින් විකාශය වන 'රූපවාහිනී කතිකාව' යන රූපවාහිනී වැඩසටහනේ සංවාදයක් පවත්වමිනි. CAASL හි සභාපතිවරයා වශයෙන් ICAO හි අරමුණු, එහි ඉදිරි ගමන සහ එහි සාමාජික රාජ්‍යයක් වීමෙන් අපට අත්වන ප්‍රතිලාභ පිළිබඳ විස්තර කරමින් මෙම වැඩසටහන හරහා ජනතාව ඇමතීමට ලද අවස්ථාව මා ලද භාග්‍යයක් කොට සලකමි.

රටේ විධායක ජනාධිපතිවරයාගේ CAASL සංචාරය

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා දිනයට සමගාමීව, 2021 දෙසැම්බර් 23 වන දින පැවති වසර සඳහා වූ සමාප්ති උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අප ආරාධනාව පිළිගෙන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා කටුනායක පිහිටි සිවිල් ගුවන්සේවා අධිකාරියේ ප්‍රධාන කාර්යාලය පරිශ්‍රය වෙත පැමිණියේය. සිවිල් ගුවන්සේවා නිලධාරීන්, සේවකයන් සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා ඉතිහාසයේ ප්‍රතිමූර්ති වූ ජ්‍යේෂ්ඨතම ගුවන් නියමුවන් පිරිසකගේ අභිලාෂයන්ට සවන් දීමට ජනාධිපතිතුමා මෙය අවස්ථාවක් කොට ගත්තේය. ජ්‍යේෂ්ඨ ගුවන් නියමුවන්ට ස්වකීය සිවිල් ගුවන්සේවා කාලය තුළ ඔවුන් ලත් අත්දැකීම් පිළිබඳ රසවත් කථා බෙදාහදා ගැනීමට මෙය අවස්ථාවක් විය. සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත විධායක ජනාධිපතිවරයෙකුගේ පළමු ආගමනය සිහි කිරීම වෙනුවෙන් ඔවුන් වෙත සමරු තිළිණ ප්‍රදානය කිරීම සහ එම අවස්ථාව සිහිවීම පිණිස 'නා ගසක්' රෝපණය කිරීම ද මෙහිදී සිදු විය. එම අවස්ථාවට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහභාගී වීම අගය කරමින් එතුමා වෙත සමරු තිළිණයක් පිරිනැමුවෙමි. ප්‍රවාහන අමාත්‍ය, සිවිල් ගුවන්සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍ය, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, සංචාරක සහ සිවිල් ගුවන්සේවා විෂය පිළිබඳ අමාත්‍යාංශ ලේකම්වරු, ගුවන්තොටුපළ සහ ගුවන්සේවා ශ්‍රී ලංකා සමාගමෙහි සභාපති, ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්හි සභාපති සහ සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි මණ්ඩල සාමාජිකයෝ මෙම අවස්ථාවට සහභාගී වූ සම්භාවනීය අමුත්තෝ අතර වූහ.

සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය තුළ නව පරම්පරාව වෙනුවෙන් වන අපේක්ෂාවන්

ආසියා සහ පැසිෆික් කලාපවල ගුවන්සේවා ක්ෂේත්‍රයේ රැකියා සඳහා පවතින ඉහළ අපේක්ෂාවන් සහ ICAO විසින් පුරෝකථනය කර ඇති පරිදි ඉදිරි කාලය තුළ ගුවන්සේවා වෘත්තිකයන් සඳහා වැඩිවන ඉල්ලුම සැලකිල්ලට ගනිමින්, අපගේ අධ්‍යාපන පද්ධතිය තුළ විෂයක් ලෙස සිවිල් ගුවන්සේවාව ප්‍රවර්ධනය කිරීමට මම බලාපොරොත්තු වෙමි. බලධාරීන් සමඟ පැවති දීර්ඝ සාකච්ඡාවලින් අනතුරුව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන VI – XI ශ්‍රේණි පෙළ පොත්වලට සිවිල්

සභාපතිතුමාගේ සමාලෝචනය

ගුවන්සේවා විෂය ඇතුළත් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා දීම හේතුවෙන් අප අපේක්ෂාව වෙත සුබ ලකුණු පහළ විය. මෙමඟින් සිසුන්ට විෂය පිළිබඳ සැලකිය යුතු දැනුමක් ලබා ගැනීමට සහ ඔවුන්ගේ ඉදිරි වෘත්තීය මාර්ගය තීරණය කිරීමට ඉඩ සැලසෙනු ඇත.

අනතුරුවලින් තොර ඉහළම ආරක්ෂාවක් සහතික කිරීම - උපද්‍රව රහිත වසරක්

අනතුරුවලින් තොර උපරිම ආරක්ෂාවක් අපේක්ෂිත පරිසරයක් තුළ, සිවිල් ගුවන්සේවා සඳහා නීතිවිරෝධී මැදිහත්වීම්වලින් ආරක්ෂා වීමට අදාළ සියලු කාරණාවල දී මඟින්, ගුවන්යානා කාර්ය මණ්ඩලය (Crew), භූමි සේවක පිරිස (Ground Personnel) සහ මහජනතාවගේ ආරක්ෂාව සපුරාලන වැනි ජාත්‍යන්තර වගකීම් ඉටු කිරීමේ කාර්යභාරය පැවරී ඇති නියාමන ආයතනයක් ලෙස CAASL හි අපි මෙම අරමුණ සාර්ථක ලෙස සාක්ෂාත් කර ගනු ලැබුයේ උපද්‍රවවලින් තොර වසරක නිමාව සනිටුහන් කරමිනි.

මූල්‍ය කාර්යසාධනය

වසංගතය හේතුවෙන් ගුවන්සේවා මෙහෙයුම්වලට දැඩි බාධා ඇති වුව ද, 2020 වසරට සාපේක්ෂව අපගේ මූල්‍ය කාර්යසාධනයේ සුළු හෝ වර්ධනයක් වාර්තා කිරීමට අපට හැකි විය. CAASL මූල්‍ය කාර්යසාධනය පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් මෙම වාර්ෂික වාර්තාවේ 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයෙහි දක්වා ඇත.



උපුල් ධර්මදාස CTC
සභාපති
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය



මෙම වසරේ වැදගත්ම සිදුවීම වූයේ ශ්‍රී ලංකාවට මාලේ හරහා ගමන් කිරීම සඳහා දශක ගණනාවකට පසු නැවත වරක් ශ්‍රී ලංකාව වෙත එයාර් ෆ්‍රාන්ස් මෙහෙයුම් ආරම්භ වීමයි. යුරෝපය සතු කීර්තිමත් ගුවන් සමාගමක් වන එයාර් ෆ්‍රාන්ස් ආගමනය රටේ ගුවන්සේවා කර්මාන්තයට මහඟු පිටුවහලක් විය.

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

මෙම කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ගෝලීය වසංගත තත්වය හේතුවෙන් අත්හිටවූ මෙහෙයුම් නැවත ආරම්භ කිරීම උදෙසා ක්‍රියාමාර්ග ගන්නා ලදී. එමරේට්ස්, කටාර් එයාවේස්, කුවේට් එයාර්වේස් සහ එතිහාඩ් එයාර්වේස් ආදර්ශයට ගනිමින් ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් විසින් ගුවන්යානා යොදා ගනිමින් විදෙස්ගතව සිටින ශ්‍රී ලාංකිකයන් නැවත මවු බිමට ගෙන්වා ගැනීමේ මෙහෙයුම් සඳහා සැලකිය යුතු දායකත්වයක් සැපයීය.

කොවිඩ්-19 තත්වය සහ ඊට අදාළ සෞඛ්‍ය මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින්, ගුවන්සේවා බලධාරීන් විසින් වසරේ මුල් භාගයේ දී පැමිණෙන මගීන් සංඛ්‍යාව සීමා කළ අතර, සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් සාධාරණ ලෙස ශ්‍රී ලංකාව වෙත මෙහෙයුම් සිදු කරනු ලබන ගුවන් සමාගම් සඳහා මගී ප්‍රමාණයන් වෙන් කොට දක්වන ලදී. කෙසේ වෙතත්, මෙම සීමා කිරීම් වසරේ දෙවන භාගයේ දී ඉවත් කෙරුණි.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ගුවන් සමාගම් බොහොමයක් මගී ගුවන්යානා භාවිත කරමින් සිදු කරන භාණ්ඩ මෙහෙයුම් ආකාරයෙන් පවත්වා ගෙන ගිය අතර, අවශ්‍ය නියාමන අනුමැතීන් මත ගුවන්යානා මැදිරිවල භාණ්ඩ රැගෙන යන ලදී. ලොට් පොලිෂ්, තායි එයාර් ඒෂියා, ෆ්ලයිඩුබායි, එයාර් ඇරබියා, ටර්කිෂ් එයාර්ලයින්ස් සහ ඉන්දියාගෝ වැනි ගුවන්සේවා මෙවැනි මෙහෙයුම් සිදු කළ අතර, මනා ඇගයීමකින් අනතුරුව සිවිල් ගුවන්සේවා අධිකාරියේ මෙහෙයුම් ඒකකයෙන් ගුවන්යානා මැදිරිවල භාණ්ඩ ප්‍රවාහනයට ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් විසින් අනුමැතිය ලබා ගන්නා ලදී. මේ අතරතුර කැතේ පැසිෆික්, කටාර් එයාර්වේස්, එමිරේට්ස්, ඕමාන් එයාර්ලයින්ස්, එයාර් චයිනා විසින් ශ්‍රී ලංකාව වෙත ඔවුන්ගේ නියමිත භාණ්ඩ සේවා පවත්වා ගෙන ගිය අතර, එමඟින් ශ්‍රී ලංකාවේ වාණිජ අංශය විශාල ලෙස ධෛර්යමත් කරන ලදී. ඊට අමතරව, ප්‍රධාන වශයෙන් පෙරදිග ආසියාතික රටවල්වලින් ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය සඳහා අමුද්‍රව්‍ය ප්‍රවාහනය මෙන්ම එහි නිමැවුම් ගුවන්යානා යොදා ගනිමින් යුරෝපය සහ ඇමරිකාව යන රටවල් සඳහා අපනයනය සිදු කරමින් වියට්නාම් එයාර්ලයින්ස්, වියට් ජෙට්, ඉතියෝපියන් එයාර්ලයින්ස්, සහ ඊජිප්ට් එයාර් විසින් තත්කාර්ය ගුවන් භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම් මෙම කාලය තුළ සිදු කරන ලදී.

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් විසින් කොළඹ හරහා ඕස්ට්‍රේලියාව වෙත අඛණ්ඩ පියාසැරි සමඟින් නයිරෝබි (කෙන්යා) වැනි නව ගමනාන්තයන් සඳහා ද ගුවන් භාණ්ඩ ප්‍රවාහන සේවා ආරම්භ කරන ලද අතර ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, චීනය සහ අනෙකුත් ගමනාන්තයන් රැසක් වෙත ගුවන් භාණ්ඩ ප්‍රවාහනය ආරම්භ කරමින් ගුවන් භාණ්ඩ මෙහෙයුම් කටයුතුවල සිය ස්ථාවරය සහතික කර ගන්නා ලදී. මීට අමතරව ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ජාත්‍යන්තර ගුවන් භාණ්ඩ ක්‍රියාකරු වන ෆිට්ස් ඇවිඒෂන් විසින් වසර තුළදී වියට්නාමය, පකිස්ථානය, ඉන්දියාව, මියන්මාරය සහ මාලදිවයින වැනි ගමනාන්තයන් වෙත ඔවුන් අලුතෙන් හඳුන්වා දෙන ලද ලංකාවේ භාණ්ඩ මෙහෙයුම්හි දියුණුව සඳහා උපකාර වන ගුවන්යානා ඇණිය යොදා ගනිමින් සිය මෙහෙයුම් වැඩි කරන ලදී. තවද, නව ගුවන් භාණ්ඩ ක්‍රියාකරුවකු වන කසකස්ථානයේ එයාර් අස්තානා විසින් ලංකාව වෙත වැඩි කරන ලද වාර ගණනක් සමඟ ඔවුන්ගේ මෙහෙයුම් ආරම්භ කරන ලද්දේ සංචාරක කර්මාන්තය සඳහා ශක්තියක් වෙමිනි.

මෙම වසරේ වැදගත්ම සිදුවීම වූයේ ශ්‍රී ලංකාවට මාලේ හරහා ගමන් කිරීම සඳහා දශක ගණනාවකට පසු නැවත වරක් ශ්‍රී ලංකාව වෙත එයාර් ෆ්‍රාන්ස් මෙහෙයුම් ආරම්භ වීමයි. යුරෝපය සතු කීර්තිමත් ගුවන් සමාගමක් වන එයාර් ෆ්‍රාන්ස් ආගමනය රටේ ගුවන්සේවා කර්මාන්තයට මහඟු පිටිවහලක් විය.

ලොව වටා නෞකාවන්හි සේවය කරන නාවිකයන් හුවමාරුව වසර තුළ දැකගත හැකි වූ වැදගත් සිදුවීමකි. ඔවුන්ගේ හුවමාරු ක්‍රියාවලිය සඳහා ප්‍රධාන බාධකය වූයේ කොවිඩ්-19 වසංගත තත්වය සහ අදාළ ගුවන්යානා නොමැති වීමය. මෙම ගැටලුව සඳහා විසඳුමක් ලෙස, CAASL මෙවැනි මෙහෙයුම්/හුවමාරු සඳහා අනුමැතිය ලබා දුන් අතර, දැඩි සෞඛ්‍ය නීති මාර්ගෝපදේශ යටතේ ශ්‍රී ලංකාවේ ගුවන්තොටුපළ සහ වරායන් භාවිත කරනු ලබන නාවිකයන් වෙත 2021 සැප්තැම්බර් දක්වා අවස්ථාව ලබා දෙන ලදී. ඉන් පසුව මෙම අවස්ථාවෙන් ප්‍රයෝජනය ගැනීමට ගුවන්සේවා කිහිපයක් සමඟ නාවිකයන් හුවමාරු කටයුතු සිදු කළ අතර, වසර අවසානයේ දී ඉන්දිගෝ, ස්පයිස්ජෙට්, කටාර් එයාර්වේස්, එයාර් ඒෂියා පිලිපීන්, මෝල්ඩීවියන් එයාර්ලයින්ස් සහ තවත් ඒ ආකාරයේ ගුවන් සමාගම් කිහිපයක් මෙම මෙහෙයුම් පවත්වා ගෙන යන ලදී. මෙය වසංගත තත්වය හමුවේ ඇති වූ නව ව්‍යාපාරික අවස්ථාවකි.

වත්මන් ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්යානා ලැයිස්තුගත කිරීමේ ලේඛනයේ 2021 දෙසැම්බර් මස අවසානය වන විට මුළු ගුවන්යානා සංඛ්‍යාව 80 ක් ලෙස දැක්වුණු අතර ඊට විශාල ගුවන්යානා 25 ක් (MTOW>5700KGS), සැහැල්ලු ගුවන්යානා 43 ක්, හෙලිකොප්ටර 07 ක්, බැලූන් 04ක් සහ අඩි සැහැල්ලු

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ සමාලෝචනය

යානා 01 ක් ඇතුළත් විය. ඊට අමතරව 2021 දෙසැම්බර් අවසානයේ නව ගුවන්යානා 03 ක් ද ලියාපදිංචි කරන ලද අතර ගුවන්යානා 69 ක ලියාපදිංචිය අලුත් කරන ලදී. මෙම කාලය තුළම ගුවන්තොටුපළ ගුවන් මෙහෙයුම්හි ආරක්ෂාව තහවුරු කරමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ මඩකලපුව ගුවන්තොටුපළ සඳහා කලාපීය රෙගුලාසි ප්‍රකාශ කිරීම සඳහා සකස් කෙරෙමින් පැවතිණි.

අධිකාරියේ ඉදිරි සංවර්ධනය සඳහා අවැසි කුසලතා සහ දැනුමෙන් සේවකයන්ගේ පිරිපුන්බව සහතික කරලීමට, එහි දැක්ම සමඟ කටයුතු කරනු ලබන කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් පෝෂණය කිරීමෙහිලා CAASL විසින් මානව ප්‍රාග්ධනය සංවර්ධනය වෙත ආයෝජනය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. මූල්‍ය වර්ෂය තුළ නව බඳවා ගැනීම් අටක් (8) ඇතුළුව, 2021.12.31 දිනට මුළු කාර්ය මණ්ඩලය චිකසිය හැත්තෑ හයක් (176) විය.

කොවිඩ්-19 පසුබිම තුළ අපි දේශීය මෙන්ම විදේශීය පුහුණුවීම් සඳහා භෞතිකව සහභාගීවීමේ ගැටලුවලට මුහුණ දුණි. එබැවින් අන්තර්ජාල ක්‍රමවේදයන් විකල්පයක් ලෙස යොදා ගත් අතර, සේවකයන්ට ඔවුන්ගේ කුසලතා සංවර්ධනයට පුළුල් පරාසයක පුහුණුවක් ලබා දෙන ලදී. මෙකී අරමුණ පෙරදැරිව 2021 වසරේ දී සාමාජිකයන් චිකසිය විසි හතරක් (124) සඳහා පුහුණුව ලබා දෙන ලදී.

ගුවන්සේවා කර්මාන්තයේ ගතික ස්වාභාවය විසින් එහි නිරතව සිටින වෘත්තිකයන් වෙතින් වඩාත් නවීකරණය වූ කුසලතා සහ නිපුණතා අපේක්ෂා කර සිටී. මේ සම්බන්ධයෙන් සමාලෝචිත වසර තුළ සේවකයන් චිකසිය අසූ හතක් (187) ආවරණය වන පරිදි ක්ෂේත්‍රයේ නව දැනුම ලබා දෙමින් දේශීය සහ විදේශීය පුහුණු හැටනවයක් (69), සම්මන්ත්‍රණ, වැඩමුළු, රැස්වීම් සහ පරීක්ෂණ පවත්වන ලදී. පෙර වසර සමඟ සසඳන කළ පුහුණු වීම් සංඛ්‍යාව 30% කින් වර්ධනය වී ඇත.

රාවණා රජු සහ අපට අහිමි වූ ගුවන් ආධිපත්‍යය සම්බන්ධ දැනුම පිළිබඳ පුරාවෘත්ත රහසක්ව පවතී. අප විසින් ශක්තිමත් සාක්ෂි සපයනු ලැබුවහොත් එමඟින් ලෝක ඉතිහාසය නව මානයක් වෙත යොමු කරනු ඇත. රාවණා රජු වාසය කළ ස්ථාන පිළිබඳ සාක්ෂි සපයනු ලබන තොරතුරු රාශියක් පවතින අතර, ශ්‍රී ලංකාවේ රාවණා රජුගේ ක්‍රියාකාරකම්හි වැදගත්කම විනිශ්චය කිරීමට බොහෝ දෙනා ස්ථාන ගවේෂණය කර ඇති අතර, ඒ පිළිබඳ සංචාරක පොත්පත් සකස් කර ඇත. එබැවින් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ද මෙම වසර තුළ රාවණා රජු පිළිබඳ සැඟව ගිය පුරාවෘත්ත සහ ගුවන්සේවා ආධිපත්‍ය පිළිබඳ වියැකී ගිය අප උරුමය පිළිබඳ පර්යේෂණ සිදු කරන ලදී.

එමෙන්ම, CAASL ආයතනික සැලැස්ම, වාර්ෂික වාර්තාව, වාර්ෂික වැඩසටහන, CAASL ක්‍රියාකාරී සැලැස්ම, සෞභාග්‍යයේ දැක්ම පිළිබඳ වැඩසටහන් වාර්තා, ප්‍රගති වාර්තා, සංඛ්‍යාලේඛන වාර්තාව, මහ බැංකු වාර්තාව, ආයතනික ප්‍රතිඵල රාමුවේ (ORF) ප්‍රගතිය මිනුම් කිරීමේ වාර්තා සම්පූර්ණ කර මූල්‍ය වර්ෂය තුළ නියමිත දිනට පෙර අප විසින් අදාළ රාජ්‍ය ආයතන වෙත ඉදිරිපත් කර ඇත.

විදේශයන්හි මිලදී ගත් ගුවන් ටිකට්පත් සඳහා අය කරන අධිභාරය CAASL හි මූලික ආදායම් මාර්ගය ලෙස පැවතුණි. එබැවින්, 2021 වර්ෂය සඳහා CAASL හි මුළු ආදායම සහ වියදම පිළිවෙළින් රු. මිලියන 1,128 ක් සහ රු. මිලියන 707 ක් වන ලදී. 2021 වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය රු. මිලියන 330 ක් ලෙස පැවතුණි.

මූල්‍ය වර්ෂය පුරා කොවිඩ්-19 වසංගතය ආශ්‍රිත බාධා මධ්‍යයේ වුවද CAASL විසින් සිදු කරන ලද ප්‍රධාන කාර්යයන් සහ ක්‍රියාකාරකම් ඉහතින් සංක්ෂිප්ත කොට දක්වා තිබේ. 2021 වසරේ වාර්ෂික වැඩසටහන සාර්ථක කිරීමෙහි ලා CAASL හි සියලුම සේවකයන් ධනාත්මකව ලබා දුන් දායකත්වයට ස්තුතිය පිරිනැමීමට මෙය මම අවස්ථාවක් කර ගනිමි. CAASL හි මෙහෙවර ඉටු උදෙසා CAASL සභාපති, උපසභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ගේ විපුල සහය සහ මග පෙන්වීම වෙනුවෙන් මම ස්තුතිවන්ත වෙමි. තවද, CAASL හි සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරීවරයා ලෙස මගේ රාජකාරි ඉටු කිරීම සඳහා ගරු සංචාරක අමාත්‍යාවරයා, ගුවන්සේවා සහ අපනයන කලාප සංවර්ධන ගරු රාජ්‍ය අමාත්‍යවරයා, ඉහත අමාත්‍යාංශවල සියලුම ලේකම්වරුන් සහ නිලධාරීන් ලබා දුන් සහයෝගය සහ මග පෙන්වීම වෙනුවෙන් මම ඔවුන්ට ස්තුතිය පුද කරමි.



කපිතාන් තේමිය අබේවික්‍රම
සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

CAASL හි පැතිකඩ

සමස්ත විග්‍රහය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL), 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත යටතේ 2002 දෙසැම්බර් 27 වන දින ස්ථාපිත කරන ලදී. එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන වගන්තිය යටතේ ගිණුම් විගණනය කිරීමේ කාර්යය සඳහා පොදු ව්‍යවසායයක් ලෙස සලකනු ලැබේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි මූලික කාර්යය වනුයේ 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ දක්වා ඇති ව්‍යවස්ථාදායක විධිවිධාන යටතේ දේශීය සිවිල් ගුවන්සේවා කර්මාන්තය නියාමනය කිරීමයි. රටේ පුරවැසියන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම සඳහා ජාතික ආර්ථිකයේ වර්ධනයට දායක වන කර්මාන්තයේ ආරක්ෂාව, සුරක්ෂිතබව, කාර්යක්ෂමතාව, විධිමත්භාවය සහ පාරිසරික සංවේදීතාව යනාදියෙහි ඉහළ කාර්යසාධනය ඉලක්ක කර ගනිමින් ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) විසින් අනුගමනය කරන අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නිර්දේශිත භාවිතයන්ට අනුකූලව මෙය සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අට දෙනෙකුගෙන් (08) සමන්විත වන අතර ඉන් පස් දෙනෙකු (05) සිවිල් ගුවන්සේවා විෂය භාර ගරු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ. ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්, මූල්‍ය විෂය භාර ගරු අමාත්‍යවරයාගේ නියෝජිතයෙක් සහ සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් යන තිදෙනා CAASL හි නිල බලයෙන් පත්වූ අනෙකුත් සාමාජිකයන් තිදෙනා වේ. CAASL හි සභාපතිවරයා සහ උපසභාපතිවරයා පත් කරනු ලබන්නේ සිවිල් ගුවන්සේවා විෂය භාර ගරු අමාත්‍යවරයා විසිනි. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ව්‍යවස්ථාව අනුව CAASL හි ප්‍රධාන විධායක නිලධාරියා වේ.

පත් කරන ලද සාමාජිකයන්ගේ නිල කාලය පත්වීම් ලද දිනයේ සිට වසර තුනක් (03) වේ.

අධිකාරිය, සිවිල් ගුවන්සේවා විෂය භාර අමාත්‍යවරයාගේ සාමාන්‍ය මඟපෙන්වීමට සහ පාලනයට යටත් වේ.

අංශ සහ ඒකක පිළිබඳ සමස්ත විග්‍රහය

ගගන යාත්‍රාංගන

ශ්‍රී ලංකාවේ සිවිල් ගගන යාත්‍රාංගනවලට අදාළ නියාමන කටයුතු සිදු කිරීම සඳහා සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහය වීමේ වගකීම ගගන යාත්‍රාංගන අංශයට පැවරේ. සිවිල් ගගන යාත්‍රාංගන, ගොඩබිම් සහ ජල යාත්‍රාංගනවලින් සමන්විත වේ. දැනට පවතින ගොඩබිම් යාත්‍රාංගන දහහතරෙන්, යාත්‍රාංගන පහක් පිළිබඳ වගකීම සිවිල් ගුවන්සේවා අධිකාරිය සතු වන අතර, ඒවා තවදුරටත් ජාත්‍යන්තර සහ දේශීය ගගන යාත්‍රාංගන ලෙස වර්ගීකරණය කර ඇත. විශාල ජල මූලාශ්‍ර ප්‍රමාණයක් ශ්‍රී ලංකාව සතු වන අතර ඉන් එකොළහක් සංචාරක ආකර්ෂණය දිනා ගන්නා පාවෙන ගුවන්යානා මෙහෙයුම් සිදු කිරීම සඳහා යොදා ගනී. ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) ප්‍රමිතීන් සහ නිර්දේශිත පිළිවෙත් (SARPs), ජාතික නීති සම්පාදනයට සහ අඛණ්ඩ නිරීක්ෂණ සහ විගණන ක්‍රියාකාරකම්වලට අනුගත කරමින් ගගන යාත්‍රාංගනවල ආරක්ෂිත සහ කාර්යක්ෂම ගුවන්යානා මෙහෙයුම් සහතික කිරීම මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

ගුවන් සන්තරණ සේවා අංශය

ගුවන් සන්තරණ සේවා අංශයේ (ANS) මූලික වගකීම වන්නේ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) විසින් අනුගමනය කරන ලද අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නිර්දේශිත පිළිවෙත් (SARPs) අනුව කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපය (Colombo FIR) තුළ ගුවන් සන්තරණ සේවා සැපයීම පාලනය කරන නීති රීති සැකසීමයි. එකී ප්‍රමිතීන් ශ්‍රී ලංකාවේ ගුවන් සන්තරණ සේවා සැපයුම්කරු විසින් සම්පාදනය කර ඇති බව සහතික කිරීම ද එමඟින් සිදු වේ.

පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර අංශය

අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ නිර්දේශිත පිළිවෙත්වලට අනුකූලව සිවිල් ගුවන්සේවා සම්බන්ධයෙන් ආරක්ෂක සංවේදී ක්‍රියාකාරකම්වල නියැලී සිටින පුහුණු ආයතන සහ පුද්ගලයන් සහතික කිරීම සහ අධීක්ෂණය සඳහා නීති, රීති සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීමේ වගකීම පුහුණු ආයතන සහ පුද්ගල බලපත්‍ර අංශය විසින් දරයි.

CAASL හි පැතිකඩ

ගුවන්යානා මෙහෙයුම් අංශය

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) විසින් අනුගමනය කරන ලද අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නිර්දේශිත පිළිවෙත්වලට අනුකූලව, ක්‍රියාකරුවන්ගේ ඵලදායී ආරක්ෂක අධීක්ෂණය සඳහා, දේශීය රෙගුලාසි, නීති, නියෝග සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීමේ වගකීම මූලික වශයෙන් ගුවන්යානා ආරක්ෂණ නියාමන අංශය (Division of Flight Safety Regulations) යටතේ ඇති ගුවන්යානා මෙහෙයුම් අංශය වෙත පැවරේ.

ගුවන්යානා ලියාපදිංචි සහ ගුවන් යෝග්‍යතා අංශය

අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ නිර්දේශිත පිළිවෙත්වලට අනුකූලව ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්යානා ලියාපදිංචි කිරීම සඳහා නීති රීති සහ ක්‍රියා පටිපාටිය සකස් කිරීමේ ප්‍රධාන වගකීම ගුවන්යානා ලියාපදිංචි සහ ගුවන් යෝග්‍යතා අංශයට පැවරී ඇත. නඩත්තු පුහුණු සංවිධාන, අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධාන සහ ගුවන්යානා නඩත්තු සංවිධාන සඳහා අනුමැතිය ප්‍රදානය කිරීම සහ ඒවායේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම එහි කාර්යභාරයට ඇතුළත් වේ.

ගුවන්සේවා ආරක්ෂක අංශය

ගුවන්සේවා ආරක්ෂක අංශයේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා මෙහෙයුම් සඳහා ආරක්ෂිත පරිසරයක් සහතික කිරීමට සියලුම ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා ආරක්ෂක ප්‍රමිතීන් සපුරාලන අයුරින් ජාතික සිවිල් ගුවන්සේවා ආරක්ෂක වැඩසටහන සංවර්ධනය කිරීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම වේ.

ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන අංශය

ගුවන් ප්‍රවාහන හා ආර්ථික නියාමන අංශය ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ආයතනික කළමනාකරණ අංශය යටතේ පවතින අතර ශ්‍රී ලංකාවේ ගුවන්සේවා කර්මාන්තය නියාමනය කිරීමේ වගකීම එයට පැවරී තිබේ.

මානව සම්පත් සහ දේපළ කළමනාකරණ අංශය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි රාජකාරි ඉටු කිරීම සඳහා සුදුසු පුද්ගලයන් සේවයේ යොදවා ඇති බව සහතික කිරීම මානව සම්පත් සහ දේපළ කළමනාකරණ අංශය (HRPM) විසින් සිදු කරයි. තවද, CAASL හි ස්වකීය කාර්යසාධනය වැඩි දියුණු කර ගැනීමට සහ ඉදිරියට පවත්වාගෙන යාමට පුද්ගලයන්ට සහ සේවක පිරිසට පහසුකම් සැලසීමට සහ ඔවුන් පෙළඹවීමට චමඟින් අවස්ථා නිර්මාණය කරයි. අධිකාරියේ කාර්යාල පරිපාලනය සහ දේපළ කළමනාකරණය සම්බන්ධයෙන් ද මෙම අංශය වගකීම දරයි.

මූල්‍ය සහ ආදායම් කළමනාකරණ අංශය

CAASL/රාජ්‍ය ප්‍රතිපත්ති, නීති රීති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව සීමිත මූල්‍ය සම්පත් කාර්යක්ෂමව, ඵලදායීව සහ ආර්ථිකව කළමනාකරණය කිරීමත් ICASL විසින් ප්‍රකාශයට පත් කරන ලද සාමාන්‍ය පිළිගත් ගිණුම්කරණ මූලධර්ම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පොත්පත් පවත්වාගෙන යාමත් සත්‍ය සහ සාධාරණ තත්වයේ මූල්‍ය ගිණුම් සැපයීමත් සඳහා මෙම අංශය වගකීම දරයි.

පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති අංශය

පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති අංශය විසින් ගුවන්සේවා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, CAASL සංඛ්‍යාලේඛන වැඩසටහන කළමනාකරණය කිරීම, CAASL හි විවිධ වැඩසටහන් පැවැත්වීම, භෞතික යටිතල පහසුකම් සංවර්ධනය, CAASL ලිපිලේඛන/වාර්තා/දැන්වීම් ප්‍රකාශනය කිරීම සහ ජාත්‍යන්තර ගුවන්සේවා (CORSIA) වැඩසටහන සඳහා කාබන් අඩු කිරීමේ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම යනාදිය සඳහා වගකීම දරනු ලැබේ. මෙම අංශය විසින් CAASL සඳහා වන සියලුම ප්‍රසම්පාදන කටයුතු ද සිදු කරනු ලැබේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි ව්‍යාපාරික සහ සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා කාර්යක්ෂම, සුරක්ෂිත, විශ්වසනීය සහ තිරසාර තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සැපයීම මෙම ඒකකය මඟින් සිදු කෙරේ.

නෛතික කටයුතු සහ බලාත්මක කිරීමේ ඒකකය

නෛතික කටයුතු සහ බලාත්මක කිරීමේ ඒකකයේ (LA&E) ප්‍රධාන කාර්යභාරය වන්නේ CAASL හි නෛතික සහ බලාත්මක කිරීමේ කාර්යයන්ට අදාළ කටයුතු විධිමත් කිරීමයි. ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සම්මුතීන් අනුමත කිරීම/ප්‍රතිග්‍රහණය, ගුවන්සේවා පිළිබඳ ප්‍රාථමික සහ අනුබද්ධ නීති සමාලෝචනය කිරීම, යාවත්කාලීන කිරීම සහ සංවර්ධනය කිරීම, CAASL හි බලාත්මක කිරීමේ ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීම සහ

CAASL හි පැතිකඩ

CAASL හි අයිතිවාසිකම් සහ අවශ්‍යතාවන්හි ආරක්ෂණය සඳහා මෙම ඒකකය මූලික වශයෙන් වගකිව යුතුය.

තත්ව සහ අභ්‍යන්තර විගණන අංශය

තත්ව සහ අභ්‍යන්තර විගණන අංශය විසින් CAASL හි අවදානම් කළමනාකරණය, පාලනය සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට ස්වාධීන සහතිකයක් සපයනු ලබන අතර ගුණාත්මකභාවය පිළිබඳ වන අවශ්‍යතා සපුරාලීම ද සහතික කෙරේ.

ගුවන්සේවා ආරක්ෂණ අධීක්ෂණ ඒකකය

ICAO ඇමුණුම 13 සහ ඇමුණුම 19 හි අඩංගු ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නිර්දේශිත පිළිවෙත්වලට අනුකූලව ගුවන්යානා අනතුරු සහ සිද්ධි විමර්ශන සහ රාජ්‍ය ආරක්ෂණ වැඩසටහන (SSP) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය වගකීම් සහතික කිරීම සහ රට තුළ නියමුවන් රහිත ගුවන් යාත්‍රා නියාමනය කිරීම, ගුවන්සේවා ආරක්ෂණ අධීක්ෂණ ඒකකයේ වගකීම වේ.

සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන ඒකකය

සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන ඒකකය විසින් මහජනතාව අතර විශේෂයෙන් පාසල් සිසුන් ඇතුළු තරුණ පරම්පරාව අතර ගුවන්සේවා දැනුම වැඩි දියුණු කිරීම, ගුවන්සේවා සම්බන්ධ කාලීන මෙන්ම විශ්වාසදායක පුවත් සපයා ප්‍රජාව සතු දැනුවත්භාවය යාවත්කාලීන කිරීම සහ විද්‍යුත්, මුද්‍රිත සහ නව මාධ්‍ය වේදිකා හරහා ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ ගුවන්සේවා සංස්කෘතියක් නිර්මාණය කිරීමේ වගකීම දරනු ලැබේ.

ගුවන් වෛද්‍ය සේවා ඒකකය

මෙම ඒකකය මඟින් CAASL බලපත්‍රලාභීන්ගේ වෛද්‍ය ඇගයීම් සඳහා පහසුකම් සැපයීම පමණක් නොව, අනෙකුත් ප්‍රධාන විශේෂ ක්ෂේත්‍ර වන ගුවන් වෛද්‍ය පුහුණුව, පර්යේෂණ, කාර්ය මණ්ඩලය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර ගුවන් වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම, ප්‍රවේශ වීමේ ස්ථානවල මහජන සෞඛ්‍ය සේවා සිදු කිරීම, CAASL සේවාදායකයන්ගේ සහ කාර්ය මණ්ඩලයේ සුබසාධනය සහතික කරමින් CAASL හි අනෙකුත් අංශ සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ නිරීක්ෂණ කටයුතු සහ පහසුකම් සැලසීමේ කටයුතු ආදිය ඇතුළත් විශාල ක්ෂේත්‍රයක් ආවරණය කෙරේ. තවද, ගුවන් වෛද්‍ය සේවා අංශය විසින් රාජ්‍යයට සහ ගුවන්සේවා කර්මාන්තයට අභ්‍යවකාශ ආරක්ෂණ විසඳුම් සහ මහජන සෞඛ්‍ය ආරක්ෂණ විසඳුම් අඛණ්ඩව සපයනු ලැබේ. ගුවන් වෛද්‍ය සේවා අංශයෙහි ක්‍රියාකාරකම්වල සියලුම පැති අත්‍යවශ්‍යයෙන්ම අභ්‍යවකාශ ආරක්ෂාව වැඩි දියුණු කිරීම අරමුණු කර ගෙන ඇත.

තාක්ෂණික පුස්තකාලය

CAASL හි තාක්ෂණික පුස්තකාලය, CAASL සහ දේශීය ගුවන්සේවා කර්මාන්තය තුළ අභ්‍යන්තර ලේඛන කළමනාකරණය, ICAO ප්‍රකාශන, අදාළ රෙගුලාසි, රජයේ ප්‍රකාශන සහ අනෙකුත් සාමාන්‍ය ලේඛන ප්‍රතිග්‍රහණය සහ බෙදා හැරීම සඳහා වගකීම දරයි. CAASL නිල වෙබ් අඩවියේ පරිපාලනය සහ අන්තර්ගත කළමනාකරණය, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ දක්වා ඇති පරිදි මහජනතාව වෙත තොරතුරු ලබා දීම, ICAO සහ APAC රාජ්‍ය ලිපි සමඟ ලිපි හුවමාරුව කළමනාකරණය කිරීම සහ CAASL වෙනුවෙන් විශ්ව ආරක්ෂණ අධීක්ෂණ විගණන වැඩසටහන - අඛණ්ඩ අධීක්ෂණ ප්‍රවේශය (USOAP-CMA) හි පරිපාලනය කිරීම තාක්ෂණික පුස්තකාලය වෙත භාර දී ඇත.

CAASL හි පැතිකඩ

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි සාමාජිකයින්

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි (CAASL) 13 වන මණ්ඩලය

අංකය	නම	තනතුර
01.	උපුල් ධර්මදාස මහතා CTC	සභාපති
02.	අමිත විජයසූරිය මහතා	උප සභාපති
03.	නිහාල් ජයවර්ධන මහතා PC	CAASL හි සාමාජික
04.	ඩබ්ලිව්. එම්. එස්. චමින්ද වෙලේගම මහතා	CAASL හි සාමාජික
05.	කපිතාන් නවීන් ද සිල්වා මහතා	CAASL හි සාමාජික
හොබවන තනතුර හේතුවෙන් මණ්ඩල සාමාජිකත්වය දරන		
06.	(විශ්‍රාමික) මේජර් ජනරාල් පී.ඩී.එච්. කමල් ගුණරත්න	නිල බලයෙන් පත් වූ සාමාජික ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්
07.	පී.කේ. අයන්ති ද සිල්වා මිය	නිල බලයෙන් පත් වූ සාමාජික අමාත්‍යවරයා විසින් නම් කරන ලද මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිත (මුදල් අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්)
08.	කපිතාන් තේමිය අබේවික්‍රම මහතා	නිල බලයෙන් පත් වූ සාමාජික ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි, සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී

අමාත්‍යාංශ නිරීක්ෂිකා - ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

අංකය	නම	තනතුර
01.	අවන්ති සේනාරත්න මිය	අමාත්‍යාංශ නිරීක්ෂිකා අධ්‍යක්ෂ (ගුවන්සේවා) ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

අධ්‍යක්ෂ මණ්ඩලය


1


2


3


4


5


6


7


8


9

අධ්‍යක්ෂ මණ්ඩලය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි 13 වන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් පිළිබඳ හැඳින්වීම

(1) උපුල් ධර්මදාස මහතා

සභාපති
CAASL හි සාමාජික

උපුල් ගංගානාත් ධර්මදාස මහතා (සහතික ලත් සංචාරක උපදේශක), 2020 ජනවාරි 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිවිල් ගුවන්සේවා අධිකාරියේ සභාපතිවරයා ලෙස වැඩ භාර ගන්නා ලදී.

1952 දී උපත ලද උපුල් ධර්මදාස මහතා, මාතර රාහුල, සිල්වෙස්ටර් සහ ශාන්ත තෝමස් යන විද්‍යාලවලින් පාසල් අධ්‍යාපනය ලැබුවේය. 1972 වර්ෂයේ දී ඔහු ලංකා හෝටල් පාසලෙන් උපාධිය ලබා සිලෝන් ඔබරෝයි හෝටලයේ සේවය කළේය. පසුව එයාර් සිලෝන් ආයතනයට සම්බන්ධ වූ විතුමා UTA පුහුණුව ලබා 1974-1979 වර්ෂයන් දක්වා එහි සේවය කළේය.

1979 වර්ෂයේ දී ඔහු "ලංකා කල්‍යාණී" කැඩෙට් පුහුණු නෞකාවේ මුදල් භාරකරු ලෙස කටයුතු කළ අතර, 1980 වර්ෂය දක්වා එහි සේවය කළේය.

උපුල් ධර්මදාස මහතා 1980 වර්ෂයේ දී එක්සත් ජනපදයේ කැලිෆෝනියා ප්‍රාන්තයේ ලොස් ඇන්ජලීස්හි දී ආහාර හා පෝෂණවේදය පිළිබඳ උපාධියක් සම්පූර්ණ කළේය. උපාධිය සම්පූර්ණ කිරීමෙන් පසු, ඔහු 1982 සිට 1987 දක්වා කැලිෆෝනියාවේ හොඳම රෝහල් කිහිපයක රෝහල් පෝෂණවේදියෙකු ලෙස සේවය කළේය.

1984 වර්ෂයේ දී ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ 'උපුල් ට්‍රැවල්ස් සර්විස්' ආරම්භ කරමින් අර්ධකාලීන සංචාරක ව්‍යාපාරයක් ආරම්භ කළේය.

1989 වර්ෂයේ දී ඔහු "Institute of Certificate Travel Agent of Massachusetts" වෙතින් සංචාරක කර්මාන්තයේ ඉහළම ශ්‍රේණිගත සහතිකය ලබා ගත් අතර, එහිදී සංචාරක කර්මාන්තයේ උපදේශකයෙකු ලෙස CTC (සහතික ලත් සංචාරක උපදේශක) නමින් විශේෂිත ප්‍රමිතියක් ඔහු වෙත පිරිනමන ලදී. 1999 වර්ෂයේ දී ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්හි GSA කළමනාකරණය සහ සුරක්ෂිතභාවය තහවුරු කළේය.

ඔහු ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සහ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ක්ෂේත්‍ර පිළිබඳව අඛණ්ඩ විශේෂඥ පුහුණුවක් ඇත්තෙකි. මීට අමතරව, සංචාරක වෘත්තිකයන් 150,000 කට අධික පිරිසකට සේවා මෙන්ම, පළමු / ව්‍යාපාරික පන්තියේ ගමන් වට්ටම් ලබා දෙමින් ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ "Upper Class Travel Inc" නමින් සමාගමක් පිහිටුවන ලදී. එමෙන්ම ඔහු විසින් 2006 වර්ෂයේ දී සමස්ත කැලිෆෝනියා සහ නෙවාඩා ප්‍රාන්තයට සුබෝපභෝගී වාහන සේවාවක් ලබා දෙමින් ලොස් ඇන්ජලීස්හි ඉහළ පන්තියේ ලිමොසින් වාහන සේවාවක් ආරම්භ කළ අතර, 2009 වර්ෂයේ දී ලොස් ඇන්ජලීස්හි ශ්‍රී ලංකා ලිමොසින් සමාගමේ සභාපති වශයෙන් පත් කරන ලදී. ඔහු 2011 වර්ෂයේ දී කැලිෆෝනියාවේ ලොස් ඇන්ජලීස්හි දී UEI Inc මූල්‍ය ආයතනයක් නිර්මාණය කළ අතර 2014 වර්ෂයේ දී ජාත්‍යන්තර සංචාර වෙන්කරවා ගැනීම සඳහා වන Utravel.com නම් වූ යෙදවුමක් සංවර්ධනය කරන ලදී.

ඔහු ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් ප්‍රදානය කරන ලද 2006 වර්ෂයේ විශිෂ්ට ජයග්‍රහණ සම්මාන ලාභියා මෙන්ම 2017 වර්ෂයේ දී ඇමරිකා එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා/ඇමරිකා සංස්කෘතික සංවිධානය විසින් පිරිනමන ලද ශ්‍රී ඇමරිකා සම්මානයේ ජයග්‍රාහකයා ද විය.

1984 සිට 2020 දක්වා කාලය තුළ උතුරු ඇමරිකාවෙන් ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් වෙත ලද ඉහළම ආදායම වන ඇමෙරිකානු ඩොලර් මිලියන 200 කට අධික ආදායමක් ගෙන ඒම සඳහා උපුල් ගංගානාත් ධර්මදාස මහතා මූලික විය. වර්තමානයේ ඔහු එක්සත් රාජධානියේ ටීස් නිම්නයේ මිඩ්ල්ස්බරෝහි ටීසයිඩ් විශ්වවිද්‍යාලයෙන් පරිපාලනවේදී උපාධියක් හදාරනු ලබයි.

(2) අමිත විජයසූරිය මහතා

උප සභාපති
CAASL හි සාමාජික

අමිත විජයසූරිය මහතා එවකට ජාතික ගුවන් සේවය ලෙස හැඳින් වූ එයාර් ලංකා ලිමිටඩ් වෙත 1981 වර්ෂයේ දී සම්බන්ධ විය. ඔහුගේ වසර 38 ක සේවා කාලය තුළ ශ්‍රී ලංකාව සහ විදෙස් රටවල්හි පිහිටි ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ජ්‍යේෂ්ඨ කළමනාකාර තනතුරු කිහිපයක් හොබවා ඇත.

ජනාධිපති, ගරු අග්‍රාමාත්‍ය, සියලුම කැබිනට් අමාත්‍යවරුන් සහ ගරු අමාත්‍යවරුන්ගේ සියලුම VVIP සංචාර කළමනාකරණය කිරීම ඔහුගේ මෙහෙයුම් විෂය පථයේ ප්‍රධාන විශේෂත්වය විය. එමෙන්ම ඔහු අමාත්‍යාංශ ලේකම්වරුන්, පොලිස්පති ඇතුළු හමුදා ප්‍රධානීන්ගේ සියලුම විදේශ සංචාර භාරව කටයුතු කළේය. විජයසූරිය මහතා සතුව විකුණුම් සහ අලෙවිකරණය, මහජන සම්බන්ධතා, උසස්වීම් සහ රාජ්‍ය සහ මහජන

අධ්‍යක්ෂ මණ්ඩලය

කටයුතු ආදී ගුවන්සේවා ක්ෂේත්‍රයේ අත්දැකීම් සම්භාරයක් ඇත. විශ්‍රාම ගැනීමෙන් පසු ඔහු නැවතත් ශ්‍රී ලංකන් ගුවන් සේවයේ මහජන සහ රාජ්‍ය කටයුතු පිළිබඳ උපදේශකයෙකු ලෙස පත් කරන ලදී.

(3) කපිතාන් තේමිය අබේවික්‍රම මහතා

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී නිලබලයෙන් සාමාජික

එච්.එම්.සී. නිමල්සිරි මහතා විශ්‍රාම ගැනීමෙන් පසු, 2020 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී ලෙස කපිතාන් තේමිය අබේවික්‍රම මහතා වැඩ භාර ගන්නා ලදී. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් ධූරයට පත්වීමට පෙර, කපිතාන් තේමිය මහතා කුවේට්හි ජසීරා එයාර්වේස් හි ජ්‍යේෂ්ඨ කපිතාන්වරයෙකු ලෙස කටයුතු කළේය.

කපිතාන් තේමිය මහතා 1990 වර්ෂයේ දී එයාර් ලංකාහි ගුවන්සේවා ක්ෂේත්‍රයේ "ලොක්හීඩ් ට්‍රයිස්ටාර්" ගුවන්යානා සමූහයේ ඉංජිනේරුවෙකු ලෙස සිය කීර්තිමත් වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. "ට්‍රයිස්ටාර්" පළමු කාණ්ඩයේ නිලධාරියෙකු බවට පත් වූ ඔහු, ඉන් පසුව එයාර්බස් A320/A330/A340 ගුවන්යානා සමූහයේ කපිතාන් ලෙසට පත් විය. එමෙන්ම සමාගම සඳහා ඔහු පිරික්සුම් නියමුවෙකු සහ VVIP නියමුවෙකු ලෙස ද කටයුතු කළේය.

ඉන්පසු ඔහු 2008 වර්ෂයේ සිට කිංෆිෂර් එයාර්ලයින්ස්හි කපිතාන්වරයෙකු ලෙස කටයුතු කළ අතර, ගුවන් සමාගමේ එයාර්බස් සමූහයේ ඉන්දියානු සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂවරයාගේ පිරික්සුම් නියමුවෙකු ලෙස සේවය කළේය. එමෙන්ම ඔහු ඉන්දීය සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නීති සහ රෙගුලාසි අනුව කිංෆිෂර් විශාල බඳ සහිත ගුවන්යානා පිළිබඳ උපදේශක සහ ගුවන් නියමු පුහුණුකරු හඳුන්වාදීම ආරම්භ කළ අතර, VVIP පියාසර කිරීම සඳහා පිළිගැනීමට ලක් විය.

2011 වසරේ දී ඔහු මිහින් ලංකාහි ප්‍රධාන නියමු - පුහුණු හා ප්‍රමිති ලෙස නිලය භාර ගත් අතර, එහිදී ඔහු ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ පිරික්සුම් නියමුවෙකු ලෙස පත් කෙරිණි. එමෙන්ම ඔහු ආධුනික ගුවන් නියමුවන් ඇතුළත් කිරීම් සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම ද දැරීය. මෙහිදී ඔහුට ගුවන් සමාගම වෙනුවෙන් CAASL හි බොහෝ නියාමන අවශ්‍යතා සපුරාලීමට සිදු විය. නව ගුවන්යානා ඇතුළත් කිරීමේ දී ප්‍රතිග්‍රහණ පරීක්ෂණ පියසැරි (Acceptance Test Flights) පැවැත්වීමට අමතරව, කපිතාන් තේමිය මහතා විශේෂ සහ VVIP ගුවන් ගමන් හැසිරවීම සම්බන්ධයෙන් ද කටයුතු කළේය.

උණුසුම් සහ ප්‍රබෝධමත් කාලගුණයක් සහිත ශ්‍රී ලංකාවේ සිට කඳුකර නේපාලය වෙත සංක්‍රමණය වූ කපිතාන් තේමිය මහතා 2015 වර්ෂයේ දී සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ මෙහෙයුම් ලෙස හිමාලය එයාර්ලයින්ස් වෙත එක් වූවේය. එහිදී ද ඔහු නේපාලයේ සිවිල් ගුවන්සේවා අධිකාරියේ පිරික්සුම් නියමුවෙකු ලෙස සේවය කළේය. ගුවන් සමාගමේ, ගුවන් ක්‍රියාකරු සහතිකය ලබා ගැනීම සඳහා වන කණ්ඩායමේ සාමාජිකයෙකු වූ ඔහු, නේපාල සිවිල් ගුවන්සේවා අධිකාරියේ නියාමන සහ බලපත්‍ර අවශ්‍යතා සපුරාලීම සඳහා ගුවන් නියමුවන්, තාක්ෂණික කාර්ය මණ්ඩලය සහ ගුවන්යානා මැදිරි කාර්ය මණ්ඩලය (Cabin Crew) සඳහා පුහුණු සම්බන්ධීකරණය කිරීමේ වගකීම ද දරන ලදී. එමෙන්ම හිමාලය එයාර්ලයින්ස් සඳහා නව ගුවන්යානා ප්‍රතිග්‍රහණ පරීක්ෂණ පියාසැරි පැවැත්වීමට ඔහුට බලය පැවරුණි. කපිතාන් තේමිය මහතා නේපාල අග්‍රාමාත්‍යවරයාගේ චීන සංචාරයේ අණදෙන නිලධාරියා ලෙස පත් කරන ලදී.

කපිතාන් තේමිය මහතා 2016 වසරේ දී කුවේට් සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවශ්‍යතා අනුව සියලුම නියාමන අංගයන් සපුරාලමින් මෙහෙයුම් අධ්‍යක්ෂ ලෙස රාජකාරී භාර ගැනීමට හිමාලය එයාර්ලයින්ස් සිට කුවේටයේ වටානියා එයාර්වේස් වෙත මාරු වූවේය. ගුවන් සමාගමට එහි ගුවන් ක්‍රියාකරු සහතිකය ලබා ගැනීම සඳහා ඔහු ශක්තියක් වූ අතර, සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, බහරේන්, ඊජිප්තුව, ඉරානය, ඉරාකය, තුර්කිය, ලෙබනනය, ඉන්දියාව, නේපාලය සහ නැගෙනහිර යුරෝපීය රටවල් යන අසල්වැසි රාජ්‍යයන් වෙත වන ගුවන් සේවයේ මෙහෙයුම් සම්බන්ධීකරණය කළේය. වටානියාහි ගුවන්යානා ප්‍රතිග්‍රහණ පරීක්ෂණ පියාසැරි ද කපිතාන් තේමිය මහතා විසින් සිදු කරන ලදී.

කපිතාන් තේමිය මහතා ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයෙන් ප්‍රාථමික හා උසස් අධ්‍යාපනය ලබා ගත් අතර, කැලිෆෝනියාවේ ඕක්ලන්ඩ්හි සියෙරා ගගන විද්‍යාලයෙන් පියාසර පුහුණුව ලබා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

(4) මේජර් ජනරාල් (විශ්‍රාමික) ජී. ඩී. එච්. කමල් ගුණරත්න මහතා

ආරක්ෂක ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය
නිලබලයෙන් සාමාජික

ජනරාල් තනතුර සඳහා තරු හතරක් ලබා ගෙන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අතින් උසස් වීමක් ලබා 2020 දෙසැම්බර් 28 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ත්‍රිවිධ හමුදා ප්‍රධානී ලෙස පත් කරනු ලැබූ ජනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) මහතා ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන නායකත්ව චරිතයකි.

වසර 35 කට වැඩි කාලයක් පුරා ශ්‍රේෂ්ඨ සේවා කාලයක් ඇති කීර්තිමත් හමුදා නායකයෙකු ලෙස අණ, මාණ්ඩලික සහ උපදේශක පත්වීම් ගණනාවක් දරමින් සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය නිලධාරියෙකු ලෙස වසර දෙකකට ආසන්න සේවා කාලයක් ඇති ජනරාල් ගුණරත්න මහතා වර්තමානයේ රජයේ පරිපාලන පද්ධතියේ ප්‍රධාන පරිපාලන පත්වීම් දෙකක් වන ආරක්ෂක අමාත්‍යාංශයේ සහ ජාතික ආරක්ෂාව සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් පත්වීම් දරයි. ඒ අනුව ජනාධිපතිවරයා සහ ජාතික ආරක්ෂාව සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යවරයාට අදාළ කරුණු සම්බන්ධයෙන් ප්‍රධාන ආරක්ෂක ප්‍රතිපත්ති සම්පාදකයා සහ ආරක්ෂක/ජාතික ආරක්ෂාව සම්බන්ධ අණ දෙන නිලධාරියා ලෙස ඔහු කටයුතු කරනු ලබයි.

ජනරාල් ගුණරත්න මහතා විසින් දරනු ලබන අතිවිශාල වගකීම් ප්‍රමාණයට අමතරව, 'සුරක්ෂිත රටක්, විනයගරුක, ගුණවත් සහ නීත්‍යනුකූල සමාජයක් ගොඩනැගීම' සහ 'ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ පුරාවිද්‍යා උරුම කළමනාකරණය' සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකායේ සභාපතිත්වය ද ඔහු විසින් දරනු ලබයි.

කීර්තිමත් ජ්‍යේෂ්ඨ හමුදා නිලධාරියෙකු ලෙස, මානුෂීය මෙහෙයුමේ අවසන් අදියරේ දී 53 වන සේනාංකයේ අණදෙන නිලධාරිවරයා (GOC) ලෙස ඔහු විසින් ඉටු කරන ලද කාර්යභාරය, අතිශයින් ප්‍රශංසනීය වූ අතර එය ශ්‍රී ලංකාවේ සමකාලීන යුද ඉතිහාසය තුළ අද්විතීය වේ. වන්නි ආරක්ෂක සේනා ආඥාපතිවරයා ලෙස කටයුතු කළ ඔහු, හමුදා රාජකාරියේ අවසාන කාලසීමාවේ දී විධායක අධිකාරී ජනරාල් (Adjutant General (AG)) සහ ප්‍රධාන අඥාපනත් ජනරාල් (Master General Ordinance (MGO)) යන යුද හමුදා මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී පත්වීම් දෙකක් දරා ඇත. ඔහු යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව, විශේෂ බලකා (SF) රෙජිමේන්තුව සහ ගජබා රෙජිමේන්තුව යන රෙජිමේන්තුවල ගෞරවනීය කර්නල් තනතුරු ද දරා ඇත. මෙම ධුර කාල තුළ රෙජිමේන්තු තුනටම කැපී පෙනෙන සේවාවක් ඔහු විසින් ඉටු කොට ඇත.

ඉහළ සුදුසුකම් ලත් පුද්ගලයෙකු ලෙස, ඔහු බලෝචිස්ථාන් විශ්වවිද්‍යාලයෙන් 'යුද කලාව සහ විද්‍යාව' පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත. ඉන්දියාවේ ජාතික ආරක්ෂක විද්‍යාලය වැනි ගෞරවනීය හමුදා ආයතනයකින් ඔහුගේ ඉහළම හමුදා අධ්‍යයන සුදුසුකම (ndc) ලබා ඇත. ඔහු මදුරාසි විශ්වවිද්‍යාලයේ 'ආරක්ෂක සහ උපායමාර්ගික අධ්‍යයනය' පිළිබඳ දර්ශනපති උපාධියක් ද ලබා ඇත.

තවද, ඔහු ශ්‍රී ලංකා යුද හමුදාවේ සේවය කළ කාලය තුළ විදේශයන්හි සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සමුළු කිහිපයකට සහභාගී වී ඇති අතර, බ්‍රසීලයේ නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානියා ලෙස රාජ්‍ය තාන්ත්‍රික ක්ෂේත්‍රයේ ද සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා ඉතිහාසයේ පළමු වරට යුද සාහිත්‍යය නිර්මාණය කළ කතුවරයකු වන අතර, ශ්‍රී ලංකාවේ විප්ලවීය යුද සාහිත්‍ය සංවේදනය; 'රණමඟ ඔස්සේ නන්දිකඩාල්' ඇතුළුව මේ දක්වා පොත් හතක් ප්‍රකාශයට පත් කර ඇත. ඔහු මේ වන විට ගීත හතක් රචනා කර ඇති විශිෂ්ට ගී පද රචකයෙකි. චිත්‍රානි ගුණරත්න මහත්මිය සමඟ ඔහු විවාහ වූ අතර ඔවුන්ට දියණියක ද සිටී.

අධ්‍යක්ෂ මණ්ඩලය

(5) පී.කේ. අයන්ති ද සිල්වා මහත්මිය

භාණ්ඩාගාර නියෝජිත
අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති
කළමනාකරණ සහ අධීක්ෂණ
දෙපාර්තමේන්තුව
නිලබලයෙන් සාමාජික

අයන්ති ද සිල්වා මහත්මිය මුදල් අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය වේ. ප්‍රතිපත්ති තීරණ සඳහා රජයේ ආයෝජනවලින් ලැබෙන ප්‍රතිඵල වාර්තා කිරීමේ වගකීම ඇය විසින් දරනු ලබයි.

රාජ්‍ය ආයෝජනවලින් සාමාන්‍ය ජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා දීම සඳහා වන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන අධීක්ෂණය, ඇගයීම සහ අනුග්‍රහය දැක්වීම සඳහා ක්‍රියාත්මක වන කණ්ඩායම අයන්ති මහත්මිය විසින් මෙහෙයවනු ලබයි.

අයන්ති මහත්මිය 1994 වසරේ දී සහකාර අධ්‍යක්ෂවරියක ලෙස රාජ්‍ය සේවයට එක් වූ අතර, සාර්ව ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික සැලසුම්කරණය, ජාතික අයවැයකරණය සහ ප්‍රතිඵල අධීක්ෂණය යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තු වෙත සිය කැපී පෙනෙන සේවය ලබා දුන්නාය. විසිහත් වසරක සේවා කාලය පුරා ඇය ජාතික ජල මණ්ඩලය, ලංකා විදුලි සමාගම, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය ඇතුළු රාජ්‍ය ආයතන 15 ක අධ්‍යක්ෂ මණ්ඩලයේ නිල බලයෙන් සාමාජිකත්වය දරා ඇත. ආර්ථික විද්‍යාඥයන්, තක්සේරුකරුවන් සහ ජනවිකාස විද්‍යාඥයන් යන ශ්‍රී ලංකාවේ වෘත්තීය සංගම් තුනක ඇය ක්‍රියාකාරී සාමාජිකාවකි.

ඇය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී සහ ශාස්ත්‍රපති විශේෂ උපාධි සහ ඕස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර් විශ්වවිද්‍යාලයෙන් ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ උපාධියක් මෙන්ම ජනවිකාස විද්‍යාව පිළිබඳ කොළඹ විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබා ඇත.

(6) ජනාධිපති නීතිඥ නිහාල් ජයවර්ධන මහතා

CAASL හි සාමාජික

ජයවර්ධන මහතා මහනුවර ශාන්ත අන්තෝනි විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලැබූ අතර 1980 වසරේ දී ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් විය. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ කාර්යබහුල වසර 3 ක් සහ මාස 10 ක කාලයකට පසු, ජයවර්ධන මහතා 1983 නොවැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු ලෙස ලියාපදිංචි විය. ඔහු 1984 ජූලි මාසයේ දී නීතිපති දෙපාර්තමේන්තුවට බැඳුණේය.

1990-91 අධ්‍යයන වර්ෂයේ දී ලන්ඩන් යුනිවර්සිටි කොලේජ්හි මහජන ජාත්‍යන්තර නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ගත් අතර, 1991 වර්ෂයේ දී ඔහු ද චිංගලන්තයේ සහ වේල්ස්හි ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු ලෙස ලියාපදිංචි විය. ගුවන්සේවා නීති ක්ෂේත්‍රය පිළිබඳ ජයවර්ධන මහතා සතුව විශාල අත්දැකීම් පවතී. ඔහු යම් කලක් සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුවේ නීති උපදේශකයෙකු ලෙස කටයුතු කළ අතර, සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත සහ සිවිල් ගුවන්සේවා පනත කෙටුම්පත් කිරීමේ දී සක්‍රීයව දායකත්වය ලබා දුන්නේය. ඔහු රටවල් කිහිපයක් සමඟ ද්වීපාර්ශ්වික ගුවන්සේවා ගිවිසුම් රාශියකට සහභාගී වී ඇත. 2004 වර්ෂයේ දී ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වීමෙන් පසු 2013 ජූලි දක්වා එම ධුරයේ කටයුතු කර ඇත. ඔහු සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් වී 2019 දෙසැම්බර් මාසයේ සිට එම තනතුරේ සේවය කරනු ලබයි.

ඔහු 1996 වර්ෂයේ සිට රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නීති උපදේශක කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කළේය. මෙම කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස, ජාතික ගුවන් සේවය වන එයාර් ලංකා පෞද්ගලීකරණය, කොළඹ වරායේ ඇතැම් කොටස් පෞද්ගලීකරණය, වැවිලි, රක්ෂණ සහ විදුලි සංදේශ අංශයේ රජයේ ව්‍යවසාය ඇතුළුව, 1996 සිට 2005 දක්වා රජය විසින් සිදු කරන ලද රජයේ ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රමුඛතම වැඩසටහන් සියල්ලටම පාහේ සහභාගී වූයේය. 2003 අප්‍රේල් මාසයේ දී ඔහු මෙම නීති උපදේශක කණ්ඩායමේ ප්‍රධානියා වූ අතර, 2005 මැයි මාසයේදී රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා තෙක් එම තනතුරේ කටයුතු ඉටු කළේය.

2002 වර්ෂයේ දී නීතිපති දෙපාර්තමේන්තුවේ සංස්ථා අංශයේ සමස්ත පරිපාලනය භාරව ඔහු පත් කරන ලදී. මෙම අංශය මඟින් රජයේ සංස්ථා 200 ක පමණ නෛතික කටයුතු මෙහෙයවීය.

අධ්‍යක්ෂ මණ්ඩලය

ඔහු සමාගමේ නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සඳහා 1993 මැයි මස සිට සහභාගි වූ අතර, 2007 අංක 7 දරන සමාගම් පනත ක්‍රියාත්මක කිරීම සඳහා මෙකී ක්‍රියාවලිය බලපාන ලදී. ප්‍රතිසංස්කරණ අවශ්‍ය ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම සඳහා පත් කරන ලද අනු කමිටුවක ලේකම්වරයා ලෙස ඔහු මුලින් ක්‍රියා කළ අතර පසුව සමාගම් නීති උපදේශක කොමිෂන් සභාවේ පර්යේෂණ සම්බන්ධීකාරක ලෙස ඔහු ලොව පුරා සමාගම් නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇති ලෝක බැංකු උපදේශකයෙකු සමඟ කටයුතු කළේය. කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේ ඔහුගේ සැලකිය යුතු දායකත්වය අගයමින් ඔහු 1998 අගෝස්තු මාසයේ දී සමාගම් නීති උපදේශක කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලද අතර 2008 අගෝස්තු දක්වා අඛණ්ඩව ඔහු එහි සේවය කළේය.

2002 සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත සහ 2010 සිවිල් ගුවන්සේවා පනත කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට සහ ඊට පෙර පැවති පැරණි නීති පද්ධති වෙනුවට හඳුන්වා දුන් නවීන සංකල්ප ප්‍රවර්ධනය කිරීමට ඔහු සක්‍රීයව කටයුතු කොට ඇත.

ඔහු 2005 මැයි මාසයේ දී නැවත පුද්ගලික නීතිඥ මණ්ඩලය වෙත පැමිණියේය.

ඔහු 1997 වසරේ සිට ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්යවරයෙකු සහ වාණිජ නීති පරීක්ෂකවරයෙකු ලෙස සේවය කරනු ලබයි. ඔහු ශ්‍රී ලංකාවේ නීති අධ්‍යාපන කවුන්සිලයේ උසස් නීති අධ්‍යයන ආයතනයේ ආයතනික නීතිය පිළිබඳ කථිකාචාර්යවරයෙකු ද වේ.

ඔහු සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව, සිවිල් ගුවන්සේවා අධිකාරිය, නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ නීති උපදේශකවරයෙකු ලෙස සේවය කර ඇත.

2004 සිට 2015 දක්වා කොළඹ හිල්ටන් හෝටලයේ හිමිකාරිත්වය දරන හෝටල් සංවර්ධකයින්ගේ (ලංකා) ලිමිටඩ්හි අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කර ඇති අතර, සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගමේ, සීමාසහිත ශ්‍රී ලංකා ලිබියා කෘෂිකාර්මික සහ පශු සම්පත් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු සහ සීමාසහිත ලංකා සතොසහි අධ්‍යක්ෂවරයෙකු සහ ආරම්භක සභාපතිවරයා විය.

ගුවන්සේවා නීතිය, රාජ්‍ය නීති, සංස්ථාපිත සහ වාණිජ නීතිය පිළිබඳ දක්ෂ උපදේශකයෙකු ලෙස නීති වෘත්තියට ඔහු කළ දායකත්වය අගයමින්, 2012 වර්ෂයේ දී ඔහු ජනාධිපති නීතිඥවරයෙකු ලෙස පත් කරන ලදී.

"2021 වර්ෂයේ දී කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත කෙටුම්පත් කර අවසන් කළ ත්‍රිපුද්ගල කෙටුම්පත් මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ඔහු සම්බන්ධ විය. ඔහු සමාගම් නීති උපදේශක කොමිෂන් සභාවේ සභාපති ලෙස කටයුතු කරනු ලබයි. එමෙන්ම ඔහු හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂවරයෙකි."

(7) කපිතාන් නවීන් ද සිල්වා මහතා

CAASL හි සාමාජික

ඇමරිකා එක්සත් ජනපදයේ ෆ්ලොරිඩාහි කීර්තිමත් ෆීජී සේෆ්ටි ඉන්ටර්නැෂනල් ෆ්ලයිට් විද්‍යාලයේ අධ්‍යාපනය හැදෑරීමෙන් පසු, කපිතාන් නවීන් ද සිල්වා මහතා ශ්‍රී ලංකා සිවිල් යුද්ධයේ උච්චතම අවස්ථාව වන විට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ස්වේච්ඡා සේවකයෙකු ලෙස සිය ගුවන් නියමු ජීවිතය ආරම්භ කරමින් ස්වේච්ඡා ගුවන් නියමුවෙකු ලෙස මව්බිමට සේවය කළේය.

1986 දී ඔහු එයාර් ලංකා, ජාතික ගුවන් සේවයට කැඩෙට් නියමුවෙකු ලෙස සම්බන්ධ වූ අතර එතැන් සිට කපිතාන් නිලය දක්වා ඉදිරියට ගොස් වසර 25 කට වැඩි කාලයක් උපදේශකයෙකු සහ පරීක්ෂකවරයෙකු ලෙස පුහුණුව ලබා ඇත.

ජාතික ගුවන් සේවයට සම්බන්ධ වූ දා සිට ඔහු A320 බලඇණියේ ප්‍රධාන නියමු, ගුවන් මෙහෙයුම් ප්‍රධානී සහ ශිෂ්‍යභට පුහුණු වැඩසටහන භාර ප්‍රධාන නියමු වැනි කළමනාකරණ තනතුරු දරා ඇත.

කපිතාන් නවීන් ද සිල්වා මහතා, ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්හි කළමනාකාරිත්වයේ කොටසක් ලෙසත් වෘත්තීය ගුවන් නියමුවෙකු ලෙසත් සේවය කළ කාලය තුළ ගුවන්සේවා කර්මාන්තයට අදාළ විවිධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇත. ක්ෂේත්‍රය තුළ වසර 38 ක කාලය තුළදී ලබා ගත් දැනුම හේතුවෙන් ඔහු ශ්‍රී ලංකාවේ ගුවන්සේවා කර්මාන්තයේ කැපී පෙනෙන චරිතයක් වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

(8) ඩබ්ලිව්.එම්.එස්. චමින්ද වෙලේගම මහතා

CAASL හි සාමාජික

ඩබ්ලිව්.එම්.එස්.සී වෙලේගම මහතා, ජනතා වතුකර සංවර්ධන මණ්ඩලය යටතේ 1989 වර්ෂයේ දී අභ්‍යාසලාභී සහකාර අධ්‍යක්ෂකයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, තේ පර්යේෂණ මණ්ඩලය, තලවකැලේ සහ ලුණුවිල පොල් පර්යේෂණ මණ්ඩලය යටතේ පුහුණුව ලබා ඇත. ඔහු වැවිලි කර්මාන්තයේ සහ පෞද්ගලික අංශයේ ජ්‍යේෂ්ඨ කළමනාකරණ තනතුරු දරමින් වසර 32 ක කාලයක් සේවය කොට ඇත. 2011-2015 කාලය තුළ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කර ඇති අතර වර්තමානයේ සිමාසහිත දැරණියගල වැවිලි සමාග මෙහි සභාපතිවරයා සහ බනිජ තෙල් නිෂ්පාදන වෙළඳාම් සිදු කරනු ලබන සිම්බා ලංකා හෝල්ඩින්ග්ස් (පුද්) සමාගමෙහි සහකාර කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස ද කටයුතු කරයි. මෝටර් රථ, සමුද්‍ර සහ ට්‍රාන්ස්ෆෝමර් ලිහිසි තෙල් නිෂ්පාදන සීමාසහිත පෞද්ගලික සමාගමක් වන මැලේසියාවේ හයිරැක්ස්හි ප්‍රාදේශීය අධ්‍යක්ෂ (Country Director) ලෙසත් බ්‍රිතාන්‍ය ලංකා සහයෝගීතාවයේ සභාපති ලෙසත් කටයුතු කළේය. ජපානයේ විදේශ තාක්ෂණික ශිෂ්‍යත්ව සංගමය (AOTS) යටතේ ඔහු PIPF වැඩසටහනේ පුහුණුව සාර්ථකව නිම කළේය. 2003 වර්ෂයේ දී ඔහු ඉන්දියානු කළමනාකරණ සහ තාක්ෂණ ආයතනයේ මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමාව සම්පූර්ණ කළේය.

(9) අවන්ති සේනාරත්න මහත්මිය

අමාත්‍යාංශ නිරීක්ෂක

ගුවන්සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

අවන්ති සේනාරත්න මහත්මිය ගුවන්සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ගුවන්සේවා) වේ.

වසර 17 ක පළපුරුද්දක් ඇති I වන පන්තියේ ශ්‍රී ලංකා පරිපාලන නිලධාරිනියක වන ඇය රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ප්‍රධාන තනතුරු රැසක් දරමින් රට වෙනුවෙන් කැපී පෙනෙන සේවයක් ඉටු කොට ඇත.

ඇය මැලේසියාවේ සයින්ස් විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MPA) ලබා ඇති අතර කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාවක් සම්පූර්ණ කර ඇත. ඊට අමතරව, ඇය ජාතික අධ්‍යාපන ආයතනයෙන් අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ඇත. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියක් (BA) ලබාගෙන ඇත.

ප්‍රධාන සංවර්ධන වැඩසටහන් රැසක් සඳහා සිය වටිනා අත්දැකීම් සහ දැනුම ලබා දෙමින් අවන්ති සේනාරත්න මහත්මිය 2018 වසරේ සිට සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය වෙත ස්වකීය දායකත්වය පිරිනමා ඇත. එසේම, ඇය සිය කාල සීමාව තුළ රාජ්‍ය නියෝජිත කණ්ඩායමේ සාමාජිකාවක ලෙස ප්‍රධාන සිවිල් ගුවන්සේවා සම්මන්ත්‍රණ කිහිපයකට ද සහභාගී වී ඇත.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය



(1) රෙහාන් වන්නිඅප්පා මහතා
අධ්‍යක්ෂ (ගුවන් ප්‍රවාහනය සහ ආර්ථික නියාමනය)/වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ගුවන් ප්‍රවාහනය සහ ආර්ථික නියාමනය

(2) පී. ඒ. ජයකාන්ත මහතා
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

(3) කපිතාන් තේමිය අබේවික්‍රම
සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී

(4) උපුල් ධර්මදාස මහතා CTC
සභාපති

(5) අමිත විජයසූරිය මහතා
උප සභාපති

(6) සමන් ගුණවර්ධන මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පියසර නිරුපද්‍රතතා නියාමන)

(7) ෂෙරිනා කාසිර් මිය
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුවන් අවකාශ සහ සුරක්ෂිතතා නියාමන)

(8) මාලක දසනායක මහතා
අධ්‍යක්ෂ- පාරිසරික පර්යේෂණ සහ ව්‍යාපෘති

(9) රමේෂා ද සිල්වා මිය
අධ්‍යක්ෂ
(තත්ව සහ අභ්‍යන්තර විගණන)

(10) මංජුලා වික්‍රමනායක මිය
අධ්‍යක්ෂ
(මූල්‍ය සහ ආදායම් කළමනාකරණය)

(11) එම්. ඒ. කේ. ප්‍රසන්න මහතා
අධ්‍යක්ෂ (ගුවන් සන්තරණ සේවා)

(12) සුගත් නාගහවත්ත මහතා
අධ්‍යක්ෂ
(පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර)

(13) කපිතාන් ලූෂන් ප්‍රනාන්දු
අධ්‍යක්ෂ (ගුවන්යානා මෙහෙයුම්)

(14) AVM (විශ්‍රාම ලත්) එච්. එන්. අබේසිංහ මහතා
අධ්‍යක්ෂ (ගුවන්සේවා ආරක්ෂණ)

(15) ෂර්මිලා මාගමමුදලි මිය
අධ්‍යක්ෂ (මානව සම්පත් සහ දේපළ කළමනාකරණ)

(16) පද්මිනි ජයවර්ධන මහත්මිය
අධ්‍යක්ෂ - (ගුවන්යානා ලියාපදිංචිය සහ ගුවන් යෝග්‍යතාව)

නියාමනය, සංකල්පයේ සිට යථාර්ථය දක්වා ගෙන ඒම





ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

ආකල්පය

අපට ඉහළින් ඇති ගුවන් අවකාශය, රටේ ප්‍රගතිය, සමෘද්ධිය සහ ජාතියේ අනාගත පරම්පරාව සඳහා කළමනාකරණය කළ යුතු, සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා විශාල විභවයක් සහිත පොදු සම්පතකි.

අරමුණු

- ආරක්ෂාව සහ ආරක්ෂක ඉලක්ක සපුරා ගැනීම හෝ ඉක්මවා යාම.
- සම්පත් නිසි ලෙස භාවිත කිරීම
- වෘත්තීයමය වීම හා දක්ෂ වීම.
- පුළුල් වූ විශ්වසනීයත්වයක් සහ පිළිගැනීමක් අත්කර ගැනීම.
- ජයග්‍රහණ පවත්වා ගැනීම හෝ වැඩි දියුණු කිරීම.
- සිදු කරන සෑම කටයුත්තකම ඉහළම ඵලදායීතාව අත්කර ගැනීම.
- ජාත්‍යන්තර ප්‍රමිති හා නිර්දේශිත පිළිවෙත් සමඟ ඉහළ මට්ටමක අනුකූලතාවක් පවත්වා ගැනීම.
- සිවිල් ගුවන්සේවා සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ප්‍රබල පහසුකම් සැපයුම්කරුවෙකු වීම.

උපායමාර්ග

- ව්‍යවස්ථාපිත කාර්යයන් වැඩිදියුණු කිරීම, ස්ථාවර ලෙස ක්‍රියාත්මක කිරීම සහ අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පිළිවෙත්වලට අනුකූලව සමාජ වගකීම් ඉටු කිරීම.
- විශේෂ ගුවන්සේවා ගැටලු සඳහා විසඳුම් හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
- විශේෂිත සංස්කෘතික වෙනස්කම් සිදු කිරීමෙහි ලා මූලපිරීම් හඳුන්වා දීම.
- ගුවන්සේවා කර්මාන්තය සමඟ එක්ව සහයෝගයෙන් කටයුතු කිරීම.
- ස්ථීර සහ විනිවිදභාවයකින් ක්‍රියාත්මක වීම සහ බාහිරව හා අභ්‍යන්තරව ඵලදායී සන්නිවේදනය.
- සියලුම ලිපි ලේඛන හා අභ්‍යන්තර ක්‍රියා පටිපාටිවල ඵලදායීතාවය හා අනුකූලතාව පවත්වා ගැනීම.

සාරධර්ම

CAASL සහ එහි සේවකයින්;

- ගුවන්සේවා ආරක්ෂණය පිළිබඳ ඉහළ ප්‍රමුඛතාවක් සහ වැදගත්කමක් නියම කිරීම තුළින් ආරක්ෂිත සංස්කෘතියක් ප්‍රවර්ධනය කළ යුතුය.
- CAASL හි සේවාලාභීන්ට සේවා සැපයීමේ විශිෂ්ටයෙකු විය යුතුය.
- භාරගන්නා සෑම කාර්යයකදීම "කළ හැකිය" යන ආකල්පයෙන් යුතුව ක්‍රියා කළ යුතුය.
- විශ්වසනීය බව, යථාර්ථවාදී බව සහ ස්ථීර බව අරමුණු කර ගත යුතුය.
- අඛණ්ඩ දියුණුවක් උදෙසා වෙනස් වීමට කැමැත්තක් සහ හැකියාවක් තිබිය යුතුය.
- සාර්ථකත්වය උදෙසා එක්ව කටයුතු කළ යුතුය.
- විවෘතව, අවංකව සහ විනිවිදභාවයෙන් යුතුව කටයුතු කළ යුතුය.
- සිදුකරන සෑම දෙයකම කාර්යක්ෂමතාව, ඵලදායීතාවය සහ විධිමත් බව ප්‍රවර්ධනය කළ යුතුය.
- සගයන් කෙරෙහි විශ්වාසය හා ගෞරවය දක්වමින් කණ්ඩායමක් ලෙස ක්‍රියා කළ යුතුය.
- සැමගේ දායකත්වය අගය කළ යුතුය.
- සමාජ වගකීම් සහ යුතුකම් හඳුනා ගත යුතුය.
- සිදුකරන කාර්යයන් තුළින් සතුටු විය යුතුය.
- වෘත්තීය ප්‍රවේශය ගැන ආඩම්බර විය යුතුය.
- ගෘහ පරිසරය හා රාජකාරී පරිසරය සමබරව පවත්වා ගත යුතුය.

CAASL හි ආසන්නතම ඉලක්ක

- වාණිජ ගුවන්සේවා අංශයට අදාළව සිදුවිය හැකි මාරාන්තික අනතුරු වැළැක්වීම.
- ගුවන්සේවා පැහැර ගැනීම් සහ සිවිල් ගුවන්සේවා කාර්යයන්හි සිදු වන නීති විරෝධී මැදිහත්වීම් වළක්වා ගැනීම.
- සාමාන්‍ය ගුවන් අනතුරු වැළැක්වීම.
- ගුවන්තොටුපළ භූමියේ සිදුවන මාරාන්තික ගුවන්යානා අනතුරු වැළැක්වීම.
- ඉංජිනේරු කටයුතු / නඩත්තු වැඩමුළු මඟින් ඇතිවිය හැකි අනතුරු අවම කිරීම.
- ගුවන්සේවා අනිසි සිදුවීම් අවම කිරීම.
- "නියමිත වේලාවට" පිටත්වීම්හි ප්‍රමාදය අවම කිරීම සඳහා සහය වීම.
- ගුවන් ගමන් සේවාවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම දිරිමත් කිරීම.
- ආරක්ෂක අවශ්‍යතා ගැන සැලකිලිමත් වෙමින් ගුවන්තොටුපළවල තදබදය අවම කිරීම සහ මගීන් පිරිසැකසුම් කිරීම වේගවත් කිරීම.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

- ගුවන් ප්‍රවාහනයේ මෙහෙයුම් පිරිවැය අවම කිරීමට සහ අපද්‍රව්‍ය ඉවත් කිරීමට උපකාරී වීම.
- ගුවන්සේවාවෙන් පරිසරයට ඇති වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා සහය වීම.
- සිවිල් ගුවන් සේවයේ ප්‍රතිලාභ පිළිබඳව පාසල් දරුවන් දැනුවත් කිරීම.
- මීළඟ පරම්පරාව උදෙසා ගුවන්සේවා වෘත්තිකයන් සූදානම් කිරීම.

අපේක්ෂිත ප්‍රතිඵල

- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය තුළ රජයේ ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිති හා නිර්දේශිත පිළිවෙත් ඉතා ඉහළ ඵලදායීතාවයකින් යුතුව නිරතුරුව ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම.
- සම්බාධක/සීමා කිරීම් සහ මගහැරීම්වලින් තොර ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා පද්ධතිය ජාත්‍යන්තරව පිළිගැනීම සහ ICAO විසින් රජයේ ගුවන්සේවා පද්ධතියට විරෙහිව සැලකිය යුතු අයුරින් ආරක්ෂිත ගැටලු මතු කිරීම වළක්වා ගැනීම.
- සිවිල් ගුවන්සේවාවන්හි ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ විධිමත්භාවය සහ ගුවන් ප්‍රවාහන පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය වැඩි දියුණු කිරීම.
- පාරිභෝගික තෘප්තිය වැඩි කිරීම
- අධිකාරියේ මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු කිරීම

ප්‍රතිදානය

ප්‍රතිදාන වර්ගය	ප්‍රතිදානය
ප්‍රතිපත්තිමය උපදෙස්	රජයට සහ වෙනත් සංවිධානවලට උපදෙස් දීම
	ව්‍යවස්ථා සංශෝධන
	රීති විකාශනය
	ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති විකාශනය සහ පළ කිරීම
	ගුවන්සේවා ප්‍රතිපත්ති විකාශනය කිරීම
	කාර්යපටිපාටි සංග්‍රහ විකාශනය
	ගුවන්සේවා යටිතල පහසුකම් පිළිබඳ මහා සැලැස්ම සකස් කිරීම
නිරුපද්‍රවතා තක්සේරුව සහ සහතික කිරීම	පහත දෑ වල අවදානම් කළමනාකරණය
	ගුවන්තොටුපල/ගුවන් පිටිය අංශයෙහි නිරුපද්‍රවතාව
	ගුවන් ප්‍රවාහන අංශයෙහි නිරුපද්‍රවතාව පොදුවේ ගුවන්සේවා අංශයෙහි නිරුපද්‍රවතාව
	පුද්ගල බලපත්‍ර නිකුත් කිරීමේ නිරුපද්‍රවතාව
	පියාසර පුහුණු නිරුපද්‍රවතාව
	ගුවන්යානා නඩත්තු නිරුපද්‍රවතාව
නිරුපද්‍රවතාව විශ්ලේෂණය, තොරතුරු සහ ප්‍රවර්ධනය	නිරුපද්‍රවතාව විමර්ශනය
	නිරුපද්‍රවතාව විශ්ලේෂණය
	නිරුපද්‍රවතා තොරතුරු, අධ්‍යාපනය සහ ප්‍රවර්ධනය
	ගුවන්යානා අනතුරු සිදුවීම් විමර්ශනය සහ නිරුපද්‍රවතා නිර්දේශ ක්‍රියාත්මක කිරීම
බලය පැවරීම	ගුවන් ප්‍රවාහන සමාගම් උපලේඛණ අනුමත කිරීම
	ගුවන් ගමන් ගාස්තු අනුමත කිරීම
	සංචාරක නියෝජිතයින් සහතික කිරීම
	ගුවන්යානා ලියාපදිංචි කිරීම
	ගුවන්යානා අමතර කොටස් ආනයනය සඳහා බලය පැවරීම
	උස ගොඩනැගිලි ඉදිකිරීම සඳහා බලය පැවරීම
	පොදු වෙළඳ නියෝජිතයින් සඳහා බලය පැවරීම
	ජාත්‍යන්තර මෙහෙයුම් සඳහා දේශීය ගුවන් ප්‍රවාහන සමාගම් නම් කිරීම
සුරක්ෂිතතා තක්සේරුව	සිවිල් ගුවන්සේවා අංශයෙහි සුරක්ෂිතතා අවදානම්
බලාත්මක කිරීම	නියාමන කඩකිරීම් කෙරෙහි දක්වන ප්‍රතිචාර
	මහජන සෞඛ්‍යය සහ සනීපාරක්ෂක අවශ්‍යතා බලාත්මක කිරීම
රජයට සහාය දැක්වීම	ගුවන් ප්‍රවාහන සමාගම් වෙතින් අපගමන බදු අයකර ගැනීම

නියාමන විෂය පථය

2021 වර්ෂය අවසානය වන විට ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ නියාමන විෂය ක්ෂේත්‍රය පහත සඳහන් පරිදි වේ.

නියාමන ක්ෂේත්‍රය	2021	2020	වෙනස (%)
ගුවන්තොටුපළ			
අභ්‍යන්තර ගොඩබිම් ගුවන්තොටුපළ	**11**	11	0
අභ්‍යන්තර ජල යාත්‍රාංගන	**11**	11	0
ජාත්‍යන්තර ගුවන්තොටුපළ	**3**	3	0
ගුවන් සමාගම්			
අභ්‍යන්තර ගුවන් සේවයන්හි නිරත වන දේශීය ගුවන් සමාගම්	**5**	7	-29
ජාත්‍යන්තර ගුවන් සේවයන්හි නිරත වන දේශීය ගුවන් සමාගම්	**2**	2	0
ජාත්‍යන්තර විදේශීය ගුවන් සමාගම්	**36**	39	-8
පුහුණු සංවිධාන			
පියාසර පාසල්	**8**	8	0
වර්ගීකරණ පුහුණු සංවිධාන	**2**	3	-33
ඉංජිනේරු / නඩත්තු පාසල්	**4**	4	0
සිවිල් ගුවන්සේවා පුහුණු මධ්‍යස්ථාන	**1**	1	0
ගුවන් සංතරණය			
ගුවන් සංතරණ සේවා සැපයුම්කරුවන්	**1**	1	0
ගුවන්යානා ලියාපදිංචි සහ ගුවන් යෝග්‍යතාව			
මහා පරිමාණයේ ගුවන්යානා (ගුවන්ගත කිරීමේ උපරිම බර කි.ග්‍රෑ. 5700 සහ ඊට වැඩි)	**25**	29	-14
කුඩා පරිමාණයේ ගුවන්යානා (ගුවන්ගත කිරීමේ උපරිම බර කි.ග්‍රෑ. 5700 ට අඩු)			
සැහැල්ලු ප්‍රවාහන ගුවන්යානා	**43**	42	2
අධි සැහැල්ලු ගුවන්යානා	**1**	2	-50
හෙලිකොප්ටර්	**7**	9	-22
උෂ්ණ වායු බැලූන	**4**	6	-33
කෘත්‍රිම පුහුණු උපක්‍රමික/පියාසර පුහුණු උපක්‍රමික			
» දේශීය පූර්ණ පියාසර අනුකාරක – A 320/A 330/ Integrated Panel Trainer	**3**	3	0
» ගුවන් ගමන් පාලන අනුකාරක (ATC)	**1**	1	0

නියාමන විෂය පථය

නියාමන ක්ෂේත්‍රය	2021	2020	වෙනස (%)
පුද්ගල බලපත්‍ර			
ශිෂ්‍ය නියමු බලපත්‍රලාභීන්	**211**	114	85
පෞද්ගලික නියමු බලපත්‍රලාභීන්	**173**	87	99
වාණිජ නියමු බලපත්‍රලාභීන්	**306**	176	74
ගුවන් ප්‍රවාහන නියමු බලපත්‍රලාභීන්	**448**	295	52
ගුවන් ගමන් පාලන බලපත්‍රලාභීන්	**54**	49	10
ගුවන්යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍රලාභීන්	**1**	1	0
ගුවන්යානා නඩත්තු බලපත්‍රලාභීන්	**81**	144	-44
ගුවන්යානා පිටත්කර හැරීමේ බලපත්‍රලාභීන් / ගුවන් මෙහෙයුම් නිලධාරී බලපත්‍රය	**1**	0	0
ගුවන් මැදිරි කාර්ය මණ්ඩල සාමාජික සහතිකලාභීන්	**176**	96	83
පියාසර උපදේශකවරුන්	**1**	1	0
සහකාර පියාසර උපදේශකවරුන්	**8**	3	167
භූමි උපදේශක බලපත්‍රලාභීන්	**3**	6	-50
ගුවන් පරීක්ෂකවරුන්	**6**	6	0
නම් කළ සෝදිසි නියමුවන්	**20**	20	0
සිවිල් ගුවන්සේවා වෛද්‍ය පරීක්ෂකවරුන් / වෛද්‍ය තක්සේරුකරුවන්	**6**	6	0
සහතික කළ ගුවන්සේවා ආරක්ෂක පිරික්සුම්කරුවන්	**648**	452	43
සහතික කළ ගුවන්සේවා ආරක්ෂක උපදේශකවරුන්	**14**	13	8
සහතික කළ ගුවන්සේවා ආරක්ෂක කළමනාකරුවන්	**20**	2	900
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරුවන්			
ගෝලීය බෙදාහැරීමේ සේවා සැපයුම්කරුවන්	**4**	4	0
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරු බලපත්‍රලාභීන්	**309**	348	-11
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරු බලපත්‍රය - අ කාණ්ඩය	**298**	329	-9
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරු බලපත්‍රය - ආ කාණ්ඩය	**11**	19	-42
සාමාන්‍ය අලෙවි නියෝජිතයන්	**23**	24	-4

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගවීම

අධිකාරියෙහි කාර්යභාරය

අධිකාරියෙහි ප්‍රධාන කාර්යයභාරයට අයත් කාර්යයන් අතර පහත සඳහන් දෑ ප්‍රමුඛත්වයක් ගනී.

- තම අදහස් රටේ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය සැලසුම් කිරීමේ දී පිළිබිඹු වන බව සහතික කිරීම සඳහා සිවිල් ගුවන්සේවා විෂය භාර ගරු අමාත්‍යවරයා සහ අනෙකුත් රජයේ පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය කිරීම;
- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සහ ඉලක්ක සැකසීම සහ CAASL හි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනික කාර්යසාධනය අධීක්ෂණය කිරීම සහ අදාළ වන පරිදි සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය තුළ රජයේ අරමුණු පිළිබිඹු කිරීම සඳහා CAASL ආයතනික සැලැස්ම යාවත්කාලීන කිරීම;
- CAASL හි ප්‍රධාන විධායක නිලධාරියා ද වන සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වගකීම පැවරීම;
- CAASL හි කාර්යයන් සහ රාජකාරි ඉටු කිරීමට හැකි වන පරිදි සුදුසුකම් ලත් සහ කුසලතා සපිරි පුද්ගලයන් සේවයේ යෙදවීම සහ ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නිර්ණය කිරීම;
- CAASL ආයතනික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සහ ප්‍රගතිය පිළිබඳ සිවිල් ගුවන්සේවා විෂය භාර ගරු අමාත්‍යවරයාට වගවීම;

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්

ගුවන්සේවා හා සංචාරක ගරු අමාත්‍යතුමා විසින් 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත යටතේ ඔහුට පැවරී ඇති බලතල අනුව සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් පත් කරන ලදී.

සභාපති ලෙස උපුල් ධර්මදාස CTC මහතා සහ උපසභාපති ලෙස අමිත විජයසූරිය මහතා පත් කරන ලදි.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ පාලනය

අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සතුව ව්‍යාපාර සහ පරිපාලන, මූල්‍ය, නෛතික සහ ගුවන්සේවා ක්ෂේත්‍රවල විවිධ කුසලතා සහ පළපුරුද්ද ඇති බැවින් ඔවුන් විසින් සිවිල් ගුවන්සේවා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳව පුළුල් පරාසයක අදහස් හා මත පළ කරනු ලැබේ.

පත් කරනු ලැබීමෙන් පසු, සියලුම සාමාජිකයන් සිවිල් ගුවන්සේවා අධිකාරියේ යහපත වෙනුවෙන් ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරන අතර අධිකාරිය එහි තීරණ සම්බන්ධයෙන් ඒකමතිකව සිටිය යුතු බවත්, තනි තනි සාමාජිකයන්ට අධිකාරියෙන් පිටත වෙනම පාලන භූමිකාවක් නොමැති බවත් පිළිගත යුතුය.

යෝග්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සැකසීම මඟින් CAASL හි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බලතල සහ කාර්යයන් පැවරීමෙන් අධිකාරිය විසින් ප්‍රධාන විධායක නිලධාරියා මෙහෙයවනු ලැබේ. අධිකාරියේ ඉදිරි සැලසුම් එහි ත්‍රෛවාර්ෂික ආයතනික සංයුක්ත සැලැස්මට ඇතුළත් කර ඇති අතර සෑම වසරකම ආරම්භයේ දී අධිකාරිය විසින් අනුමත කරනු ලබන වාර්ෂික වැඩසටහන, පුහුණු වැඩසටහන, ප්‍රසම්පාදන වැඩසටහන, වැඩසටහන් අයවැය සහ විගණන වැඩසටහන හරහා ඵලදායී ලෙස අධීක්ෂණය කරනු ලැබේ. දැනට නිශ්චිත විධිවිධාන නොමැති සියලුම කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා හරහා අධිකාරිය ප්‍රධාන විධායක නිලධාරිතුමා වෙත උපදෙස් ලබා දෙන අතර එවැනි යෝජනා බලාත්මක කිරීම ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ යුතුකම වේ.

අධිකාරියේ විධායක බලතල

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතට අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරනු ලබන අතර, ඔහු සිවිල් ගුවන්සේවා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරිවරයා ලෙස ද ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරයි.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගවීම

අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන එකී සේවා නියමයන් සහ කොන්දේසිවලට ඔහු යටත් විය යුතු අතර ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත මඟින් හෝ අදාළ වන වෙනත් ලිඛිත නීතියක් මඟින් හෝ යටතේ ඔහුට/ඇයට පවරා ඇති සියලුම රාජකාරි සහ කාර්යයන් ඉටු කළ යුතුය. එසේම අධිකාරියේ කාර්යයන් පිළිබඳ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් වන වගකීම් ද පැවරෙනු ඇත. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට ව්‍යවස්ථාපිතව පැවරී ඇති කාර්යයන් සම්බන්ධයෙන් ඔහු ස්වාධීනව කටයුතු කරනු ඇතැයි අධිකාරිය විසින් පිළිගැනේ. කෙසේ වෙතත්, එවැනි රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීමේ දී, ඔහුට CAASL හි සම්පත් අනුමත ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශයන් යටතේ භාවිත කළ හැකිය.

අධිකාරී කමිටු

අධිකාරිය ස්ථාවර කමිටු දෙකක් (02) පිහිටුවා ඇත. එනම්, කාර්ය මණ්ඩල කමිටුව, විගණන සහ කළමනාකරණ කමිටුව යි. විශේෂිත ගැටලු කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සහ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මේවා පිහිටුවා ඇත. අධිකාරියේ අරමුණු සපුරාලීම සහ නියමිත ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංවිධානයේ ප්‍රගතිය ඇති කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා සෑම කමිටුවකටම බලතල පවරා ඇත. පහත සඳහන් කවර හෝ කාරක සභාවකට බලතල සහ කාර්යයන් පැවරීම නොතකා, මණ්ඩලයට අවශ්‍ය යැයි සලකනු ලබන එවැනි ඕනෑම හෝ සියලු කරුණු සම්බන්ධයෙන් එහි බලතල දිගටම ක්‍රියාත්මක කළ හැකිය.

කාර්ය මණ්ඩල කමිටුව

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කාර්ය මණ්ඩල කමිටුව අධිකාරියට වගකිව යුතුය;

- ආයතනික ව්‍යුහයක් සම්මත කර ගැනීම සහ අවශ්‍ය විටෙක, අවශ්‍ය පරිදි එය වෙනස් කිරීම;
- වැටුප් හා සේවක සංඛ්‍යාව තීරණය කිරීම;
- තෝරා ගැනීම, බඳවා ගැනීම, පත්කිරීම, උසස් කිරීම, පහත හෙළීම, විශ්‍රාම ගැන්වීම / සේවයෙන් පහ කිරීම යනාදියට අදාළ සේවකයන්ගේ කටයුතු;
- අවශ්‍ය විටදී, අවශ්‍ය පරිදි බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීම හෝ සංශෝධනය කිරීම;
- CAASL සඳහා මාණ්ඩලික රීති සහ පරිපාලන ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම;
- CAASL සඳහා කාර්යාල පටිපාටි සංවර්ධනය;
- සේවකයන් පිළිබඳ විනය ක්‍රියාමාර්ග ගැනීම;
- CAASL සේවකයන් සඳහා විනය පටිපාටි සංවර්ධනය කිරීම;
- CAASL ආයතනික සැලැස්ම අවශ්‍ය විටදී, අවශ්‍ය පරිදි සංශෝධනය කිරීම හෝ යාවත්කාලීන කිරීම;
- CAASL හි වාර්ෂික වැඩසටහන සහ පුහුණු ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ වැඩසටහන අධීක්ෂණය කිරීම;
- සේවකයන් සඳහා විදේශීය පුහුණුව සඳහා අනුමැතිය ලබා දීම සහ CAASL සේවකයන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;
- චංචල හෝ නිශ්චල දේපළ අත්පත් කර ගැනීම සහ/හෝ එවැනි දේපළ සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා දීම;
- DCA සේවකයන් සඳහා කල් නොපිරුණු විශ්‍රාම හෝ වෙන්වීම සඳහා වන වන්දි යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම,
- CAASL සේවකයන් සඳහා සමාජ සහ සුභසාධන යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම.

CAASL හි පහත සඳහන් සාමාජිකයන්ගෙන් කාර්ය මණ්ඩල කමිටුව සමන්විත වේ.

(1) උපුල් ධර්මදාස මහතා (සභාපති)

(2) කපිතාන් තේමිය අබේවික්‍රම (සාමාජික)

(3) නිහාල් ජයවර්ධන මහතා, ජනාධිපති නීතීඥ (සාමාජික)

විගණන සහ කළමනාකරණ කමිටුව

පහත සඳහන් කරුණු සඳහා විගණන හා කළමනාකරණ කමිටුව වගකිව යුතුය;

- තත්ව සහ අභ්‍යන්තර විගණන අංශයේ වගකීම තීරණය කිරීම සහ වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම;
- ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කිරීම සහ ඇගයීම;
- පිරිවැය ඵලදායිතාව සහතික කිරීම සහ නාස්තිකාර වියදම් ආදිය ඉවත් කිරීම සඳහා නියමිත කාල පරාසයන් තුළ කාර්ය සාධනය සමාලෝචනය කිරීම;

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගවීම

- බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධ වීම සහ විගණකාධිපතිගේ කළමනාකරණ ලිපි පසු විපරම් කිරීම;
- ව්‍යවස්ථාව, රෙගුලාසි, නීති සහ චක්‍රලේඛ අනුකූලද යන්න තහවුරු කර ගැනීම;
- ගිණුම්කරණ ප්‍රමිතීන් සමඟ වන අනුකූලතාව සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම;
- නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා අභ්‍යන්තර විගණන/බාහිර විගණන වාර්තා සහ කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම;
- රාජ්‍ය ව්‍යවසාය කමිටුවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම;
- වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම සඳහා කමිටුවේ නිගමන පිළිබඳ වාර්තාව සකස් කිරීම;
- සියලුම විගණන කටයුතු පිළිබඳව අධිකාරිය විසින් ඉල්ලා සිටින විට සහ ඉල්ලා සිටින පරිදි අධිකාරිය වෙත වාර්තා කිරීම.

විගණන සහ කළමනාකරණ කමිටුව පහත සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

(1) අයන්ති ද සිල්වා මෙනවිය (සභාපති)

(2) චමින්ද වෙලේගම මහතා (සාමාජික)

(3) අවන්ති සේනාරත්න මෙනවිය (තාවකාලික සාමාජික)

NGAP ශ්‍රී ලංකා වැඩසටහන පිළිබඳ ජාතික කමිටුව

- ශ්‍රී ලංකාවේ "ඊළඟ පරම්පරාව උදෙසා ගුවන්සේවා වෘත්තිකයන්ගේ" (NGAP) වැඩසටහන පිළිබඳ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) සංකල්පය.

නුදුරු අනාගතයේ දී අපේක්ෂිත දක්ෂ ගුවන්සේවා වෘත්තිකයන්ගේ හිඟයක් ඇති වනු ඇතැයි ජාත්‍යන්තර ගුවන්සේවා ප්‍රජාව විසින් පිළිගෙන ඇත. එබැවින්, මෙම ගැටලුව විසඳීම සඳහා, අනාගත ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන පද්ධතිය ක්‍රියාත්මක කිරීමට, කළමනාකරණය කිරීමට සහ පවත්වාගෙන යාමට වඩාත් සුදුසුකම් සහිත දක්ෂ ගුවන්සේවා වෘත්තිකයන් සිටින බව සහතික කිරීම සඳහා ICAO විසින් "ඊළඟ පරම්පරාව උදෙසා ගුවන්සේවා වෘත්තිකයන්" (NGAP) යනුවෙන් මුලපිරීමක් හඳුන්වා දෙන ලදී.

NGAP ශ්‍රී ලංකා වැඩසටහනට එහි මෙහෙවර, දැක්ම, අරමුණු සහ ප්‍රධාන ක්‍රියාකාරී සැලැස්මට අදාළ වගකීම් සඳහා NGAP ශ්‍රී ලංකා වැඩසටහන පිළිබඳ ජාතික කමිටුව විසින් සහය දක්වනු ලැබේ.

NGAP ශ්‍රී ලංකා වැඩසටහනේ අරමුණු පහත පරිදි වේ;

- කර්මාන්තයේ පාර්ශ්වකරුවන්ගේ දිගුකාලීන මානව සම්පත් අවශ්‍යතා හඳුනා ගැනීමේ දී සහ ගුවන්සේවා වෘත්තිකයන් ආකර්ෂණය කර ගැනීම, දැනුම ලබා දීම, පුහුණු කිරීම සහ රඳවා ගැනීම සඳහා උපායමාර්ග සැකසීමේ දී ඔවුන් හා සන්නිවේදනය කිරීමට සහ ඔවුන්ට සහය වීමට ජාතික සංසදයක් පිහිටුවීම.
- ඊළඟ පරම්පරාව සම්බන්ධ කර ගැනීම සඳහා මාර්ගෝපදේශ සහ මෙවලම් සැපයීම සහ තරුණයන් සඳහා ගුවන්සේවාව ශක්‍ය වෘත්තියක් ලෙස ප්‍රවර්ධනය කිරීම මඟින් කර්මාන්තයට සහය වීම.



"NGAP ශ්‍රී ලංකා වැඩසටහන පිළිබඳ ජාතික කමිටුව"

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගවීම

NGAP ශ්‍රී ලංකා වැඩසටහන පිළිබඳ ජාතික කමිටුව

ප්‍රධාන උපදේශක:-
උපුල් ධර්මදාස මහතා CTC
(CAASL සභාපති)

උපදේශක:-
අමිත විජයසූරිය මහතා
NGAP ශ්‍රී ලංකා වැඩසටහන පිළිබඳ ජාතික කමිටුව පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත වේ.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

(1) කපිතාන් තේමිය අබේවික්‍රම මහතා - සභාපති

(2) පී.ඒ. ජයකාන්ත මහතා - උප සභාපති

(3) ගිමිහාන් දබරේරා මහතා - ලේකම් සහ NGAP ජාතික සම්බන්ධීකාරක

(4) චින්. නවජීවන් මහතා - සහකාර ලේකම්

(5) රෙහාන් වන්නිඅප්පා මහතා - උපදේශක

(6) කේ.එම්.එම්.එන්. දසනායක මහතා - ගුවන්සේවා අධ්‍යයන සංවර්ධන කමිටුවේ ප්‍රධානී

(7) ප්‍රභාත් කුලරත්න මහතා - ගුවන්සේවා පිළිබඳ දැනුවත් කිරීමේ කමිටුවේ ප්‍රධානී

ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගමේ නියෝජිතයන්

(1) දේවින්ද අබේගුණවර්ධන මහතා

(2) තිවංක වීරසිංහ මහතා

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ නියෝජිතයන්

(1) ජයනි සේනානායක මහත්මිය

(2) රචිත විතාරණගේ මහතා

සිවිල් ගුවන්සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව (CADEC)

සිවිල් ගුවන්සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව (CADEC) 2010 අගෝස්තු මාසයේ දී පිහිටුවන ලද්දේ අනාගත පරපුර (පාසල් දරුවන්) වැඩිදියුණු කිරීමේ සහ සිවිල් ගුවන්සේවා කටයුතු පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ අරමුණු සහිතව විශේෂ වැඩසටහන් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ය. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ ප්‍රධානත්වයෙන් ද අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහයෙන් ද මෙම කමිටුව ක්‍රියාත්මක වේ. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරන සහ මණ්ඩලය විසින් අනුමත කරන පරිදි, CAASL හි සේවකයන් අතුරින් පත් කරන ලද සාමාජිකයන්ගෙන් මෙය සමන්විත වේ.

පාර්ශ්වකරුවන් සමඟ පවතින සබඳතා

විශේෂයෙන්ම සිවිල් ගුවන්සේවා විෂය භාර ගරු අමාත්‍යතුමාගේ අපේක්ෂාවන් පිළිබඳව දැනුවත්ව සිටීම සඳහා පාර්ශ්වකරුවන් සමඟ සමීප සහ නිරන්තර සම්බන්ධතා පැවැත්වීමේ වගකීම අධිකාරිය විසින් පිළිගනු ලැබේ.

අධිකාරියේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ වගකීම

අධිකාරියෙහි සහ ප්‍රධාන විධායක නිලධාරී ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ කාර්යභාරය පැහැදිලිව වෙන්කර තිබීම සිවිල් ගුවන්සේවා අධිකාරිය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන වැදගත්ම සාධකය වේ.

අධිකාරියෙහි සහ ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග පිහිටුවීම කෙරෙහි අවධානය යොමු කරමින් අනතුරුව අරමුණු වෙත ළඟාවීමේ ප්‍රගතිය අධීක්ෂණය කෙරේ. අධිකාරිය තවදුරටත් එහි ප්‍රවර්තන ප්‍රතිපත්ති, කාර්යපටිපාටි හෝ චර්යාවන් තුළ නිශ්චිත විධිවිධාන නොපවතින කරුණු සම්බන්ධව මගපෙන්වීමද ලබා දෙයි.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගවීම

මෙකී ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සහ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ වගකීම ප්‍රධාන විධායක නිලධාරී ප්‍රමුඛව ජ්‍යෙෂ්ඨ කළමනාකරණය මත පැවරී ඇත.

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත, ඒ යටතේ සාදන ලද ගුවන් සන්තරණ රෙගුලාසි හෝ වෙනත් ලිඛිත නීතියක් ප්‍රකාරව සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත විශේෂයෙන් පවරා ඇති නිශ්චිත නියාමන වගකීම් ඉටු කිරීමේ වගකීම අධිකාරිය විසින් බෙදා නොගන්නා අතර අධිකාරිය ඉන් වෙන්ව සිටියි.

කෙසේ වෙතත්, සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ රජය මත පැවරී ඇති නියාමන වගකීම් සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය පිරිස්, උපකරණ, පහසුකම් සහ සේවාවන් සඳහා ඇතුළත් නමුත් ඒවාට සීමා නොවන, අවශ්‍ය සියලු සම්පත් සහ සහය අධිකාරිය විසින් ලබා දෙනු ඇත.

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ CAASL හි ප්‍රධාන විධායක නිලධාරී වෙත බලතල සහ කාර්යයන් පැවරීම සංක්ෂිප්ත සහ සම්පූර්ණ බව සහතික කිරීම මඟින් අධිකාරිය එම භූමිකාවන් පැහැදිලිව පෙන්නුම් කරයි.

වගවීම

අධිකාරිය සහ එහි කමිටු විසින් එහි උපායමාර්ගික අරමුණු වෙත ළඟා වීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ සිවිල් ගුවන්සේවා අධිකාරියේ කටයුතු එහි ආයතනික සැලැස්මේ දක්වා ඇති ප්‍රතිපත්ති, උපායමාර්ගික මඟ පෙන්වීම් සහ අපේක්ෂාවන් අනුව කළමනාකරණය කිරීම, මෙහෙයවීම, ගිණුම්කරණය සහ අධීක්ෂණය කිරීම සහතික කිරීම සඳහා නිරන්තරයෙන් රැස්වීම් පවත්වනු ලැබේ.

අභිමත ගැටුම

අධිකාරිය විසින් අභිමතයන් ලේඛනයක් පවත්වා ගෙන යන අතර අධිකාරියේ සාමාජිකයන් ඔවුන්ගේ අභිමතයන් ප්‍රකාශ කිරීමට ඇති වගකීම් පිළිබඳව දැනුවත් බව සහතික කරයි. මෙම ප්‍රවේශය, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සහ CAASL හි සියලුම සේවකයන් සඳහා අභිමත ගැටුම් ලේඛනයක් පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය හරහා ද පිළිබිඹු වේ.

තත්ව සහ අභ්‍යන්තර විගණනය

අධිකාරියේ බොහෝ කාර්යයන් සහ රාජකාරි පවරා ඇති නමුත්, ඵලදායී ආයතනික පාලන සහ අධීක්ෂණ පද්ධති පවත්වාගෙන යාමේ සමස්ත අවසාන වගකීම අධිකාරිය සතුව පවතී.

අධිකාරියේ නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා ස්ථාපිත ප්‍රතිපත්ති පද්ධති සහ ක්‍රියා පටිපාටි අභ්‍යන්තර පාලනයට ඇතුළත් වේ. මෙම වාර්තාවේ අඩංගු වගකීම් ප්‍රකාශයට අත්සන් කිරීම මඟින් අධිකාරිය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය තම වගකීම පිළිගෙන ඇත.

එක් එක් CAASL අංශයන්හි අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ සවිස්තරාත්මක විමර්ශනය සහ අධීක්ෂණය සඳහා වගකිව යුතු තත්ව සහ අභ්‍යන්තර විගණන අංශයකින් අධිකාරිය සමන්විත වේ. තත්ව සහ අභ්‍යන්තර විගණන අංශය CAASL විසින් ඉටු කරනු ලබන සමස්ත රාජකාරි, කාර්යයන් සහ සේවාවන්හි ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා වගකිව යුතු අතර නියමිත ක්‍රියා පටිපාටි අනුව, අධිකාරියේ සභාපතිවරයා සහ විගණන සහ කළමනාකරණ කමිටුව වෙත සෘජුවම වාර්තා කරන ලද මූල්‍ය සහ අනෙකුත් තොරතුරුවල විශ්වසනීයත්වය සඳහා වගවිය යුතුය.

අභ්‍යන්තර විගණනය, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයෙන් ස්වාධීනව ක්‍රියාත්මක වන අතර නියමිත ක්‍රියා පටිපාටි අනුව, CAASL හි ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන් ද කටයුතු කරන CAASL හි අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ විගණන සහ කළමනාකරණ කමිටුවට එහි නිගමනය සෘජුවම වාර්තා කරයි.

ව්‍යවස්ථාදායක අනුකූලතාව

සංවිධානය සියලු නීතිරීතිවලට අනුකූල වන බව සහතික කිරීමේ වගකීම අධිකාරිය විසින් පිළිගනු ලැබේ. අනුකූලතා ගැටලු ක්‍රමානුකූලව හඳුනා ගැනීම සහ සේවකයන්ට විශේෂයෙන් අදාළ වන ව්‍යවස්ථාදායක අවශ්‍යතා පිළිබඳව ඔවුන් සියලු දෙනා දැනුවත් ද යන්න සහතික කිරීම සඳහා වැඩසටහනක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන වගකීම අධිකාරිය විසින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත පවරා ඇත.

රජයේ සංවිධාන විසින් අධිකාරිය වෙත නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂිත චක්‍රලේඛ සහ/හෝ විධානයන් එක් එක් අවස්ථාව මත පදනම්ව අධිකාරියට අදාළ කර ගැනීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් තීරණ ගනු ලැබේ. එබැවින්, අධිකාරියේ

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගවීම

නීත්‍යනුකූල බලතල, කර්තව්‍ය සහ යුතුකම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කෙරෙහි අධිකාරිය විසින් එකී චක්‍රලේඛවල අන්තර්ගතයන්හි බලපෑම පරීක්ෂා කර ඒවා අදාළ කර ගැනීමෙහි ස්වභාවය සහ වපසරිය තීරණය කරන්නේ නම් මිස, රජයේ දෙපාර්තමේන්තුවක් විසින් නිකුත් කරනු ලබන සෑම චක්‍රලේඛයක්ම CAASL හි කළමනාකරණය තුළ ස්වයංක්‍රීයව අදාළ නොකර ගනු ඇත.

CAASL හි ක්‍රියාකාරිත්වය සඳහා රජයේ චක්‍රලේඛ යොදා ගැනීම දීර්ඝ කිරීම සම්බන්ධයෙන් යාවත්කාලීන වූ විකඟතා ලැයිස්තුවක් පවත්වාගෙන යාමේ වගකීම CAASL හි ආයතනික කටයුතු සහ ආර්ථික නියාමන අංශය වෙත පැවරේ.

ආචාර ධර්ම

අධිකාරිය විසින් ආචාරධර්ම සංග්‍රහයක් සකස් කර ඇති අතර, කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් සදාචාරාත්මක හැසිරීම් පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වා ගෙන යන්නේ ද, "යහපත් ආයතනික පාලනයේ" මූලධර්ම ක්‍රියාත්මක කරන්නේ ද යන්න නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ. සදාචාරාත්මක ප්‍රමිතීන් සමඟ ඇති අනුකූලතාව පිළිබඳ අධීක්ෂණය කිරීම ක්‍රියාත්මක කරනු ලබන්නේ පැමිණිලි සහ විනය ක්‍රියාමාර්ග, අභ්‍යන්තර විගණන වාර්තා, හෝ ආචාර ධර්ම සංග්‍රහයේ අඩංගු මූලධර්මවලට පටහැනි ඕනෑම වාර්තාවක් හෝ හැඟවීමක් ආදියට අදාළ ප්‍රවණතා අධීක්ෂණය කිරීම වැනි ක්‍රම මඟිනි.

යහපත් ආයතනික පුරවැසිභාවය යන්නෙන් අධිකාරියෙන් මෙන්ම අධිකාරිය විසින් අධීක්ෂණය කරන කර්මාන්තයෙන් ද පිටත ප්‍රජාවන් රැසකගේ සාමාජිකයෙකු බව තමන් විසින් පිළිගැනීම සහ එම ප්‍රජාවන්ට අයත් සියලුම පුරවැසියන්ගේ ආචාරධර්ම, සම්මත අයිතිවාසිකම් සහ වගකීම් සමඟ පාරදෘශ්‍ය, ස්ථාවර, ස්වාධීන සහ වගකීම් සහගත ලෙස ක්‍රියා කිරීමට කැපවීම යන ලක්ෂණවලින් යුත් අධිකාරිය සහ එහි සේවකයන් අදහස් වේ.

සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්ය මණ්ඩලය

අධිකාරියේ කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය පහත පරිදි නිරූපණය කෙරේ. කෙටි යෙදුම්, මෙම වාර්තාව ආරම්භයේ ලැයිස්තුගත කර ඇත.

කර්මාන්තය තුළ නිරුපද්‍රතතාව ආරක්ෂා කිරීම සහ සේවාවන් සැපයීම මඟින් අප පොරොන්දු ඉටු කරන්නෙමු





ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ මෙහෙයුම් සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්යමණ්ඩලය



ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ
මෙහෙයුම් සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්යමණ්ඩලය



Legends
SCAI – Senior Civil Aviation Inspector
Mgr. – Manager
CAI – Civil Aviation Inspector
AM – Assistant Manager

Rev 03 – 09/05/2019

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ
මෙහෙයුම් සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්යමණ්ඩලය

	කෙටි යෙදුම	Os කේතය	තනතුර
1.			සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී
2.	ADG 01	OS1-HM22-ADG	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
3.	DDG 01	OS2-HM21-DDG-1	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුවන් අවකාශ සහ සුරක්ෂිතතා නියාමන)
4.	DDG 02	OS2-HM21-DDG2	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පියසර නිරුපද්‍රතතා නියාමන)
5.	DDG 03	OS2-HM21-DDG3	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඒකාබද්ධ කටයුතු සහ ආර්ථික නියාමන)
6.	DDG 04	OS2-HM2-1-DDG4	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුවන් සේවා සුරක්ෂිතතා නියාමන)
7.	D 01	OS3-HM11-D2	අධ්‍යක්ෂ (ගගන යාත්‍රාංගන)
8.	D 02	OS3-HM11-D3	අධ්‍යක්ෂ (ගුවන් සන්තරණ සේවා)
9.	D 03	OS3-HM11-D10	අධ්‍යක්ෂ (පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර)
10.	D 04	OS3-HM11-D5	අධ්‍යක්ෂ (ගුවන්යානා මෙහෙයුම්)
11.	D 05	OS3-HM11-D6	අධ්‍යක්ෂ (ගුවන්යානා ලියාපදිංචි සහ ගුවන් යෝග්‍යතා)
12.	D 06	OS3-HM11-D8	අධ්‍යක්ෂ (මානව සම්පත් සහ දේපළ කළමනාකරණ)
13.	D 07	OS3-HM11-D9	අධ්‍යක්ෂ (මූල්‍ය සහ ආදායම් කළමනාකරණ)
14.	D 08	OS3-HM11-D7	අධ්‍යක්ෂ (ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන)
15.	D 09	OS3-HM11-D1	අධ්‍යක්ෂ (ගුවන්සේවා ආරක්ෂණ)
16.	D 10	OS3-HM11-D4	අධ්‍යක්ෂ (පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති)
17.	D 11	OS3-HM11-D11	අධ්‍යක්ෂ (තත්ව සහ අභ්‍යන්තර විගණන)
18.	D 12	OS3-HM11-D12	අධ්‍යක්ෂ (තොරතුරු සන්නිවේදන සහ තාක්ෂණ)
19.	SCAI 01	OS4-MM11-AD-1	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන)
20.	SCAI 02	OS4-MM11-AD-2	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන ප්‍රමිති)
21.	SCAI 03	OS4-MM11-AN-1	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණය-මෙහෙයුම්)
22.	SCAI 04	OS4-MM11-AN-2	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන නාවික තොරතුරු සේවා)
23.	SCAI 05	OS4-MM11-AN-5	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන නාවික කාලගුණ විද්‍යාව)
24.	SCAI 06	OS4-MM11-AN-3	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණය -තාක්ෂණික)
25.	SCAI 07	OS4-MM11-AN-4	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ATM සහ ප්‍රමිති සහ ක්‍රියා පටිපාටි)
26.	SCAI 08	OS4-MM11-PL-1	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර පරීක්ෂණ සහ ප්‍රමිති)
27.	SCAI 09	OS4-MM11-PL-3	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - ගුවන්යානා කාර්ය මණ්ඩලය)
28.	SCAI 10	OS4-MM11-PL-4	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - පියාසර කටයුතුවලින් පරිබාහිර කාර්ය මණ්ඩලය)
29.	SCAI 11	OS4-MM11-OP-1	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා පියාසර මෙහෙයුම්)
30.	SCAI 12	OS4-MM11-OP-2	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා භූමි මෙහෙයුම්)
31.	SCAI 13	OS4-MM11-OP-3	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා මැදිරි ආරක්ෂාව)
32.	SCAI 14	OS4-MM11-AW-1	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා ලියාපදිංචි සහ ගුවන් යෝග්‍යතා ප්‍රමිතීන්)
33.	SCAI 15	OS4-MM11-AW-2	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (නඩත්තු සහ අලුත්වැඩියා සංවිධාන)
34.	SCAI 16	OS4-MM11-AW-3	ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ක්‍රියාකරු සහතිකකරණය සහ නිරීක්ෂණය)

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ
මෙහෙයුම් සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්යමණ්ඩලය

	කෙටි යෙදුම	Os කේතය	තනතුර
35.	SCAI 17	OS4-MM11-HR-1	කළමනාකරු (මානව සම්පත් කළමනාකරණය)
36.	Mgr 18	OS4-MM11-HR-2	කළමනාකරු (ආයතනික කටයුතු සහ දේපළ කළමනාකරණය)
37.	Mgr 19	OS4-MM11-HR-3	කළමනාකරු (කාර්ය මණ්ඩල පුහුණුව සහ සංවර්ධනය)
38.	Mgr 20	OS4-MM11-FM-1	කළමනාකරු (අයවැය සහ වැඩසටහන්)
39.	Mgr 21	OS4-MM11-FM-2	කළමනාකරු (මූල්‍ය මෙහෙයුම්)
40.	Mgr 22	OS4-MM11-AT-1	කළමනාකරු (ගුවන්සේවා සහ ගුවන් ගමන් හිමිකම්)
41.	SCAI 23	OS4-MM11-AS-1	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් තොටුපල සුරක්ෂිතතා)
42.	SCAI 24	OS4-MM11-AS-2	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් සමාගම් ආරක්ෂණ)
43.	Mgr 25	OS4-MM11-SP-1	කළමනාකරු (පර්යේෂණ සහ සංවර්ධන සැලසුම්)
44.	Mgr 26	OS4-MM11-HR-5	කළමනාකරු (ලිපිලේඛන සහ වෙබ් කළමනාකරණය)
45.	Mgr 27	OS4-MM11-IA-1	කළමනාකරු (අභ්‍යන්තර විගණනය සහ තත්ව සමීක්ෂණය)
46.	Mgr 28	OS4-MM11-DM-2	කළමනාකරු (නෛතික කටයුතු සහ බලාත්මක කිරීම්)
47.	Mgr 29	OS4-MM11- DM -4	කළමනාකරු (තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය)
48.	SCAI 30	OS4-MM11-PL-2	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්සේවා ප්‍රතිකාර)
49.	MGR 31	OS4-MM11-DM-1	කළමනාකරු (ගුවන්සේවා ආරක්ෂණ අධීක්ෂණ)
50.	Mgr 32	OS4-MM 1-1-DM-3	ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ විධායක සහකාර
51.	Mgr 33	OS4-MM 1-1-DM-4	මණ්ඩලයේ ලේකම්
52.	Mgr 34	OS4-MM 1-1DM -5	කළමනාකරු (සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන)
53.	CAI 01	OS5-MA5-3-AD-1 -1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන මෙහෙයුම්)
54.	CAI 02	OS5-MA5-3-AD-1-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන මෙහෙයුම්)
55.	CAI 03	OS5-MA5-3-AD-1-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන මෙහෙයුම්)
56.	CAI 04	OS5-MA5-3-AD-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන ප්‍රමිතීන්)
57.	CAI 05	OS5-MA5-3-AN-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණය-මෙහෙයුම්)
58.	CAI 06	OS5-MA5-3-AN-2-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන නාවික තොරතුරු සේවය)
59.	CAI 07	OS5-MA5-3-AN-2-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන නාවික තොරතුරු සේවය)
60.	CAI 08	OS5-MA5-3-AN-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණය-තාක්ෂණික)
61.	CAI 09	OS5-MA5-3-AN-4	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ATM- ප්‍රමිති සහ ක්‍රියා පටිපාටි)
62.	CAI 10	OS5-MA5-3-PL-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර පරීක්ෂණ)
63.	CAI 11	OS5-MA5-3-PL-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර ප්‍රමිතීන්)
64.	CAI 12	OS5-MA5-3-PL-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - ගුවන්යානා කාර්ය මණ්ඩලය)
65.	CAI 13	OS5-MA5-3-PL-5	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍රය - පියාසර කටයුතුවලින් පරිබාහිර කාර්ය මණ්ඩලය)
66.	CAI 14	OS5-MA5-3-PL-4	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පියාසර පුහුණුව)
67.	CAI 15	OS5-MA5-3-OP-1-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා පියාසර මෙහෙයුම්)
68.	CAI 16	OS5-MA5-3-OP-1-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා පියාසර මෙහෙයුම්)
69.	CAI 17	OS5-MA5-3-OP-1-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා පියාසර මෙහෙයුම්)
70.	CAI 18	OS5-MA5-3-OP-2-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා භූමි මෙහෙයුම්)
71.	CAI 19	OS5-MA5-3-OP-2-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා භූමි මෙහෙයුම්)
72.	CAI 20	OS5-MA5-3-OP-2-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා භූමි මෙහෙයුම්)

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ
මෙහෙයුම් සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්යමණ්ඩලය

	කෙටි යෙදුම	Os කේතය	තනතුර
73.	CAI 21	OS5-MA5-3-OP-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා මැදිරි ආරක්ෂාව)
74.	CAI 22	OS5-MA5-3-OP-4	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (මිනිසුන් රහිත ගුවන්යානා පද්ධති)
75.	CAI 23	OS5-MA5-3-AW-4	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - නිර්මාණය සහ නිෂ්පාදනය)
76.	CAI 24	OS5-MA5-3-AW-1-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - ගුවන් බඳ)
77.	CAI 25	OS5-MA5-3-AW-2-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - බල චන්ජිම)
78.	CAI 26	OS5-MA5-3-AW-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - ගුවන් ඉලෙක්ට්‍රොනික ශිල්පය)
79.	CAI 27	OS5-MA5-3-AW-1-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - ගුවන් බඳ)
80.	CAI 28	OS5-MA5-3-AW-2-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - බල චන්ජිම)
81.	AM 29	OS5-MA53-HR-1	සහකාර කළමනාකාරු (මානව සම්පත් කළමනාකරණය)
82.	AM 30	OS5-MA53-HR-2	(සහකාර කළමනාකරු (ආයතනික කටයුතු සහ දේපළ කළමනාකරණය)
83.	AM 31	OS5-MA53-HR-3	සහකාර කළමනාකරු (පුහුණු)
84.	AM 32	OS5-MA53-FM-1	සහකාර කළමනාකරු (අයවැය සහ වැඩසටහන්)
85.	AM 33	OS5-MA53-FM-1	සහකාර කළමනාකරු (මූල්‍ය මෙහෙයුම්)
86.	AM 34	OS5-MA53-AT-1	සහකාර කළමනාකරු (ගුවන්සේවා සහ ගුවන් ගමන් හිමිකම්)
87.	AM 35	OS5-MA53-AT-3	සහකාර කළමනාකරු (ගුවන් ප්‍රවාහන සේවා)
88.	CAI 36	OS5- MA53-AS-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්තොටුපළ ආරක්ෂණ)
89.	CAI 37	OS5-MA53-AS-2-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් සමාගම් ආරක්ෂණ)
90.	CAI 38	OS5-MA53-AS-2-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් සමාගම් ආරක්ෂණ)
91.	CAI 39	OS5-MA53-AS-3 - 1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ආරක්ෂණ ප්‍රමිතීන්)
92.	CAI 40	OS5-MA53-AS-3 -2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ආරක්ෂණ ප්‍රමිතීන්)
93.	CAI 41	OS5-MA53-Fal-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (සේවා පහසුකම්)
94.	AM 42	OS5-MA53-SP-3	සහකාර කළමනාකරු (සංඛ්‍යාලේඛන සහ පුරෝකථනය)
95.	AM 43	OS5-MA53-SP-2	සහකාර කළමනාකරු (සැලසුම්)
96.	AM 44	OS5- MA53-SP-1	සහකාර කළමනාකරු (විශේෂ වැඩසටහන්)
97.	AM 45	OS5-MA53-HR-5	සහකාර කළමනාකරු (ලිපිලේඛන සහ වෙබ් කළමනාකරණය)
98.	AM 46	OS5-MA53-IA-1	සහකාර කළමනාකරු (අභ්‍යන්තර විගණනය සහ තත්ව සමීක්ෂණය)
99.	AM 47	OS5-MA53-DM-2	සහකාර කළමනාකරු (නෛතික කටයුතු සහ බලාත්මක කිරීම)
100.	AM 48	OS5-MA53-AT-2	සහකාර කළමනාකරු (ජාත්‍යන්තර සබඳතා)
101.	AM 49	OS5-MA53-HR-4	සහකාර කළමනාකරු (තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය)
102.	AM 50	OS5-MA53-DM-1	සහකාර කළමනාකරු (ගුවන්සේවා ආරක්ෂණ අධීක්ෂණය)
103.	JM 51	OS6-JM11-SP-4	සභාපතිතුමාගේ පෞද්ගලික සහකාර
104.	JM 52	OS6-JM 1-1-DM-1	සහකාර කළමනාකරු (සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන)
105.	JM 53	OS6-JM11-DM-3-1	සම්බන්ධීකරණ නිලධාරී
106.	JM 54	OS6-JM11-DM-3-2	සම්බන්ධීකරණ නිලධාරී
107.	JM 55	OS6-JM11-DM-3-3	සම්බන්ධීකරණ නිලධාරී
108.	JM 56	OS6-JM11-DM-3-4	සම්බන්ධීකරණ නිලධාරී
109.	JM 57	OS6-JM11-DM-3-5	සම්බන්ධීකරණ නිලධාරී



මෙහෙයවීම සහ කළමනාකරණය

"සැමට නිරූපදූත සහ කාර්යක්ෂම අහසක්"

මෙහෙයවීම සහ කළමනාකරණය

CAASL රැස්වීම්

සමාලෝචිත වසර තුළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් අධිකාරි රැස්වීම් නවය (09) ක් පවත්වන ලද අතර, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය මෙන්ම අධිකාරිය මඟින් නියාමනය කරනු ලබන සිවිල් ගුවන්සේවා කර්මාන්තය යන දෙකෙහිම ප්‍රගතිය සහ යහපැවැත්ම සඳහා යෝජනා සම්මත කර ගෙන තිබේ. සමාලෝචිත කාල සීමාව තුළ CAASL හි කාර්ය මණ්ඩල කමිටුව දෙවතාවක් (02) රැස්වූ අතර CAASL හි විගණන කමිටුව තුන් වතාවක් (03) රැස් වී තිබේ.

ගුවන්සේවා නිරුපදුතතා අධීක්ෂණ ඒකකය

ICAO ඇමුණුම 13 යටතේ ගුවන්යානා අනතුරු සහ සිද්ධි විමර්ශනය පිළිබඳ පරිපාලන කටයුතු සහ ICAO ඇමුණුම 19 යටතේ ආරක්ෂණ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන කාර්යයන් සිදු කිරීම මෙම ඒකකයේ ප්‍රධාන කාර්යභාරයන් වේ. මීට අමතරව, පුද්ගල මැදිහත් වීමකින් තොරව ක්‍රියාත්මක වන ගුවන්යානා මෙහෙයුම් සම්බන්ධ කටයුතු සඳහා ද මෙම ඒකකය වගකිව යුතුය.

නියාමන සංවර්ධනය

ශ්‍රී ලංකාව තුළ සිදුවන පුද්ගල මැදිහත් වීමකින් තොරව ක්‍රියාත්මක වන ගුවන්යානා මෙහෙයුම් පිළිබඳ නියාමන, කෙටුම්පත් කර ඇති අතර, එය සාකච්ඡා මට්ටමේ පවතී.

AIG සහ ගුවන්යානා අනතුරු සහ සිදුවීම් විමර්ශනය පිළිබඳ ICAO ඇමුණුම 13 සහ ආරක්ෂණ කළමනාකරණය පිළිබඳ ඇමුණුම 19 සඳහා අනුකූලතා පිරික්සුම් ලැයිස්තු පිළිබඳ රාජ්‍ය ගුවන්සේවා ක්‍රියාකාරකම් ප්‍රශ්නාවලිය, ICAO- CMඑ හි දී යාවත්කාලීන කරන ලදී.

ආරක්ෂණ කළමනාකරණය පිළිබඳ ICAO ඇමුණුම 19 ට අනුකූලව ආරක්ෂණ අවදානම් තක්සේරුව පිළිබඳ ඇමුණුමක් සමඟ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර රාමුව පිළිබඳ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියේ දෙවන සංස්කරණය නිකුත් කරන ලදී.

අදාළ අංශ මඟින් පිළිගැනීමට පෙර, ගුවන් ක්‍රියාකරුවන්ගේ ආරක්ෂණ කළමනාකරණ පද්ධති අත්පොත් හතක් සමාලෝචනය කොට කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර රාමුව පිළිබඳ SLCAIS 070 ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය සමඟ ඒවාහි ඇති අනුකූලතාව පරීක්ෂා කරන ලදී.

ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පිළිවෙත් සමඟ ක්ෂේත්‍රයේ නව සංවර්ධනයන්හි අනුකූලතාව තහවුරු කිරීමේ අරමුණින් ගුවන් නියමුවන් රහිත ගුවන්යානා පද්ධති ක්‍රියාත්මක කිරීම පිළිබඳ SLCAIS -053 ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි නව සංස්කරණය සකස් කරන ලදී. නවීකරණය කරන ලද ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්ට අනුකූලව, ඩ්‍රෝන-ආදර්ශ ගුවන්යානා මෙහෙයුම් සිදු කිරීම පිළිබඳ නව ක්‍රියා පටිපාටි සකස් කරන ලදී.

ආරක්ෂක අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රේගුව සමඟ එක්ව ඩ්‍රෝන යානා ආනයනය කිරීමේ ක්‍රියා පටිපාටිය සකස් කරන ලදී. එමෙන්ම පුද්ගල මැදිහත් වීමකින් තොරව ක්‍රියාත්මක වන ගුවන්යානා - නියමු පරීක්ෂණය සහ පුද්ගල මැදිහත් වීමකින් තොරව ක්‍රියාත්මක වන ගුවන්යානා පුහුණු සංවිධානය පිළිබඳ මාර්ගෝපදේශ ද සකස් කරන ලදී.

සහතිකකරණ ක්‍රියාකාරකම්

2021 වර්ෂයේ නිකුත් කරන ලද UAV අනුමැතීන්



2021 වර්ෂයේ දී ලියාපදිංචි කළ ඩ්‍රෝන යානා 1,028 ක් විය. තවද, පුද්ගල මැදිහත් වීමකින් තොරව ක්‍රියාත්මක වන ගුවන්යානා (UAV) මෙහෙයුම් සම්බන්ධ අනුමැතීන් 942 ක් ද, ශ්‍රී ලංකාවේ ආදර්ශ පියාසර මෙහෙයුම් සඳහා අනුමැතීන් 5 ක් ද ලබා දෙන ලදී.

ගැනුම්කරුවන්ගේ ඉල්ලීම අනුව සකස් කොට ලියාපදිංචි කර ඇති ඩ්‍රෝන යානා 48 ක් ඇත. ඊට අමතරව SLCAIS 053 ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතියෙහි දක්වා ඇති පරිදි පුද්ගල මැදිහත් වීමකින් තොරව ක්‍රියාත්මක වන ගුවන්යානා ආනයනය,

මෙහෙයවීම සහ කළමනාකරණය

චකලස් කිරීම සහ නිෂ්පාදනය කිරීම සඳහා බලපත්‍ර 02 ක් ලබා දී ඇත. පුද්ගල මැදිහත් වීමකින් තොරව ක්‍රියාත්මක වන ගුවන්යානා මෙහෙයුම් සඳහා ස්ථානයක් පරීක්ෂා කර අනුමත කරන ලදී.

ගුවන් සේවයෙහි හදිසි අවස්ථා

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන්යානා සහ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන විදේශ රටක ලියාපදිංචි ගුවන්යානා සම්බන්ධයෙන් 2021 වර්ෂයේ ගුවන් සේවයෙහි ඇති වූ හදිසි අවස්ථා 226 ක් වාර්තා විය. මින් 14 ක් විදේශයක ලියාපදිංචි වී ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ගුවන්යානා සම්බන්ධයෙන් වාර්තා වන අතර, සෙසු ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති ගුවන්යානා හා සම්බන්ධ වේ.

සමස්ත සිදුවීම් අතරින්, එක් කාණ්ඩයක් තුළ සිදු වූ වැඩිම හදිසි අවස්ථා සංඛ්‍යාව ලෙස ගුවන්යානා මත පක්ෂීන් ගැටීම් 70 ක් වාර්තා විය. වාර්තා වූ පක්ෂීන් ගැටීමේ අනතුරු අතර කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ ආශ්‍රිත සිදුවීම් 54 ක් ද, හම්බන්තොට මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ ආශ්‍රිත සිදුවීම් 3 ක් ද, රත්මලාන කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ ආශ්‍රිත සිදුවීම් එකක් ද විය.

වර්ෂය තුළ පද්ධති/සංරචක ඇණහිටීම හෝ අක්‍රියවීම් සම්බන්ධ සිදුවීම් 52 ක් වාර්තා විය.

ATM / සන්නිවේදනය ආශ්‍රිත සිදුවීම් 38 ක් වාර්තා වී ඇති අතර, මුම්බායි පියාසැරි තොරතුරු කලාපය තුළ වැඩිම සංඛ්‍යාවක් වාර්තා වී ඇති, ATS ඒකක සමඟ සම්බන්ධ නොවීම හේතුවෙන් බොහෝ සිදුවීම් වාර්තා විය.

විමර්ශන

2019 අප්‍රේල් 2 වන දා ගරුඩ ඉන්දුනීසියානු ගුවන් සේවයේ අංක PK-GPF දරන එයාර්බස් A330-341 ගුවන් යානය, අවපීඩනය හේතුවෙන් ශ්‍රී ලංකාවේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළට හදිසියේ ගොඩබෑමේ සිදුවීම පිළිබඳ විමර්ශනය අවසන් කරන ලදී. ආරක්ෂක නිර්දේශ සහිත අවසන් වාර්තාව ඉදිරිපත් කරන ලදී.

2020 දෙසැම්බර් 2 වන දින බංග්ලාදේශයේ හසරත් ෂාජලාල් ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සිට ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ දක්වා පියාසර කළ ශ්‍රී ලංකන් ගුවන් සේවයට අයත් UL 190, UL 190, 4R-AND ගුවන් යානය සම්බන්ධයෙන් සිදු කළ විමර්ශනය අවසන් විය. පිළිගත් නියෝජිතයන් වන ප්‍රංශයේ සිවිල් ගුවන්සේවා ආරක්ෂාව පිළිබඳ විමර්ශන හා විශ්ලේෂණ කාර්යාංශය (BEA) සහ එයාර්බස් සමාගම, සැලසුම් කිරීමේ රාජ්‍ය සහ නිෂ්පාදනය කිරීමේ රාජ්‍ය මෙන්ම සිංගප්පූරුවේ ප්‍රවාහන ආරක්ෂණ විමර්ශන කාර්යාංශය (TSIB) වශයෙන් ද කටයුතු කරමින් විමර්ශන සඳහා තාක්ෂණික විශේෂඥතාව සපයන ලදී. කෙටුම්පතෙහි අවසන් වාර්තාව නිකුත් කිරීමට පෙර, අදාළ රාජ්‍යයන්ගේ අදහස් විමසීම සඳහා ඉදිරිපත් කරන ලදී.

2021 ජනවාරි 23 වන දින, ශ්‍රී ලංකාවේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ (VCBI) සිට සිංගප්පූරුවේ චැංගි ජාත්‍යන්තර ගුවන්තොටුපළ දක්වා (WSSS), ගුවන් භාණ්ඩ ප්‍රවාහන ගුවන් යානයක් ලෙස ක්‍රියාත්මක වීමට නියමිතව තිබූ ශ්‍රී ලංකන් ගුවන් සේවයට අයත් ලියාපදිංචි අංක 4R-ALP දරන UL 1430 ගුවන් යානය අනපේක්ෂිතව කඩා වැටීම පිළිබඳ සිදුවීමක් විමර්ශනය කර අවසන් වාර්තාව ආරක්ෂිත නිර්දේශ සහිතව නිකුත් කරන ලදී.

2021 මාර්තු 21 වන දින ශ්‍රී ලංකාවේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සිට ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර කිංග්ස්ෆර්ඩ් ස්මිත් ජාත්‍යන්තර ගුවන්තොටුපළ දක්වා ජකර්තා පියාසැරි තොරතුරු කලාපය හරහා FL 390 යාත්‍රා කිරීමේ දී, ආසන්න වශයෙන් අඩි 1540 ක උන්නතාංශ අපගමනයක්, ශ්‍රී ලංකන් ගුවන් සේවයේ UL 606, 4R-ALR ගුවන්යානා මඟින් වාර්තා කළ අතර, විමර්ශනය කර අවශ්‍ය කඩිනම් පියවර ගන්නා ලදී.

2021 සැප්තැම්බර් 22 වන දින ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක (VCBI) සිට ඉන්දියාවේ චෙන්නායි ජාත්‍යන්තර ගුවන්තොටුපළ (VOMM) දක්වා ක්‍රියාත්මක වීමට නියමිතව තිබූ, ශ්‍රී ලංකන් ගුවන් සේවයට අයත් ලියාපදිංචි අංක 4R-ABO දරන UL 121, A320 යානාව අනපේක්ෂිතව කඩා වැටීම පිළිබඳ තවත් සිදුවීමක් විමර්ශනය කොට අවසන් කරන ලදී.

2021 සැප්තැම්බර් 18 වන දින ශ්‍රී ලංකාවේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සිට සෞදි අරාබියේ රියාද්හි කිං කලිඩ් ජාත්‍යන්තර ගුවන්තොටුපළ වෙත පිටත් වූ ශ්‍රී ලංකන් ගුවන් සේවයට අයත් UL1265, 4R-ALM ගුවන් යානය FL 292 පමණ ඉහළට පියාසර කිරීමේ දී හිම කැට වැස්සකට මුහුණ දුන් අතර, ඉදිරිපස වීදුරු දෙකම කැඩී ගොස් තිබිණි. ගුවන් යානය නැවත කඳවුරට (VCBI) පැමිණ ඇති අතර, අඩි බර ගොඩබෑමක් සිදු කර ඇත. මෙම සිදුවීම බරපතළ සිදුවීමක් ලෙස වර්ගීකරණය කොට ඒ අනුව විමර්ශන ආරම්භ කර ඇත. කඩිනම් පිළියම් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, විමර්ශනය සිදු වෙමින් පවතී.

මස්කට් ATC මඟින් 410 මට්ටමේ පියාසැරිය ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන්, 2021 ඔක්තෝම්බර් 18 වන දින එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සිට කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ දක්වා,

මෙහෙයවීම සහ කළමනාකරණය

ශ්‍රී ලංකන් ගුවන් සේවයට අයත් UL 226 ගුවන් යානය මස්කට් පියාසැරි තොරතුරු කලාපය හරහා ETOPS මාර්ගයට අපගමනය වීමේ සිද්ධියක් විමර්ශනය කර අවසන් වාර්තාව නිකුත් කරන ලදී.

2021 ඔක්තෝම්බර් 21 වන දින ජපානයේ නරිතා ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සිට ශ්‍රී ලංකා කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (VCBI) දක්වා පියාසර කළ ශ්‍රී ලංකන් ගුවන් සේවයට අයත් UL 455, A330, 4R-ALL ගුවන් යානයේ කාර්ය මණ්ඩලය විසින් එහි ධාවන පථය පියාසැරි කළමනාකරණ සහ මාර්ගෝපදේශ පද්ධතියට (FMGS) වැරදි ලෙස ඇතුළත් කිරීමේ සිදුවීම විමර්ශනය කොට අවසාන වාර්තාව නිකුත් කරන ලදී.

2021 දෙසැම්බර් 22 වන දින පුහුණු කිරීම සඳහා දෙවුන්දර දෙසට රට හරහා පිටත්ව ගිය 4R-ASJ ලියාපදිංචිය දරන සකුරායි ඒවියේෂන් එයාර්ක්‍රෆ්ට් පයිප්පර් PA 38- 112, විදුලිය විසන්ධි වීමකට ලක් වූ අතර එය පයාගල වෙරළට හදිසි ගොඩබෑමක් සිදු කර ඇත. ඒ පිළිබඳ විමර්ශනය ආරම්භ කොට සිදුවෙමින් පවතී.

2021 දෙසැම්බර් 27 වන දින, 4R-GAF සකුරායි ඒවියේෂන් ගුවන් යානය, සෙස්නා 172L, VCCS (සීගිරිය) සිට VCCK (කොග්ගල) දක්වා යාත්‍රා කළ අතර චන්පිම අකර්මන්‍යව VCBI (බ.ජා.ගු) සිට ඊසාන දෙසින් නාවික සැතපුම් 2ත් 3ත් අතර ප්‍රමාණයක් තුළදී හදිසි පිවිසුම මත 22 ධාවන පථයට මඟින් 04 දෙනෙකු සමඟ ළඟා විය. එක් අයෙකුට බරපතළ තුවාල සිදු වූ නමුත් ජීවිත හානි සිදු නොවුණි. මෙම කාර්යාලය මඟින් එම අනතුර විමර්ශනය ආරම්භ කරන ලද අතර අදාළ රාජ්‍යයන් දැනුවත් කරන ලදී. අදාළ රාජ්‍යයන් මඟින් පිළිගත් නියෝජිතයන් පත් කර ඇති අතර විමර්ශනය සිදු වෙමින් පවතී.

ගුවන් ක්‍රියාකරුවන් විසින් වාර්තා කරන ලද නියාමන සහ කාර්ය පටිපාටි උල්ලංඝනය කිරීම් පිළිබඳ සිද්ධීන් පහක් විමර්ශනය කරන ලදී. අවශ්‍ය පරිදි ප්‍රතිකර්ම පියවර ගෙන ඇති අතර, ඉදිරියේ දී එවැනි දෑ නැවත ඇතිවීම වැළැක්වීම සඳහා ආරක්ෂණ නිර්දේශ සහිතව අවසන් වාර්තා නිකුත් කර ඇත.

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන්යානා සහ ශ්‍රී ලංකාව තුළ පවතින විදෙස් රටක ලියාපදිංචි ගුවන්යානාවල සියලුම සිදුවීම් - 2021



ARC	අසාමාන්‍ය ධාවන පථ සම්බන්ධතාවය	OTHR	වෙනත්
ADRM	ගගන යාත්‍රාංගණ	RAMP	ගොඩබිම් හැසිරවීම
ATM	ATM/CNS	SCF-NP	පද්ධතිය / සංරචක අක්‍රිය වීම හෝ අක්‍රමවත් වීම
BIRD	පක්ෂීන් ගැටීම	SCF-PP	චන්පිම අක්‍රිය වීම හෝ ක්‍රමවත්ව ක්‍රියා නොකිරීම
CABIN	ගුවන්යානා මැදිරි ආරක්ෂාව	SEC	සුරක්ෂිතතාව
EXTL	බාහිර බර අදාළ සිදුවීම්	TURB	කැළඹීම්වලට මුහුණ දීම
GCOL	භූමි ඝට්ටනයන්	WILD	වන සතුන් ගැටීම
MAC	චියාර්ප්‍රොක්ස්/ ACAS අනතුරු ඇඟවීම්/වෙන් කිරීමේ අලාභ/(ආසන්න) ගුවන් ඝට්ටනයන්	WSTRW	සුළං මාරුව හෝ අකුණු කුණාටු
MED	වෛද්‍ය		

මෙහෙයවීම සහ කළමනාකරණය

නීති කටයුතු සහ බලාත්මක කිරීමේ ඒකකය

නීති කටයුතු සහ බලාත්මක කිරීමේ ඒකකයේ ප්‍රධාන අරමුණ වනුයේ CAASL හි නෛතික සහ බලාත්මක කිරීමේ කටයුතුවලට අදාළ කාර්යය වඩාත් කාර්යක්ෂම කිරීමයි. ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සම්මුතීන් අනුමත කිරීම/ප්‍රති ග්‍රහණය, ගුවන්සේවා ප්‍රාථමික සහ අනුබද්ධ නීති සමාලෝචනය කිරීම, යාවත්කාලීන කිරීම සහ සංවර්ධනය කිරීම, CAASL බලාත්මක කිරීමේ ප්‍රතිපත්තිය සහ ශක්‍යතාව ශක්තිමත් කිරීම සහ CAASL හි අයිතිවාසිකම් සහ අභිමතයන් ආරක්ෂා කිරීම යන මූලික කාර්යයන් සඳහා මෙම ඒකකය වගකිව යුතුය.

නෛතික කටයුතු සහ බලාත්මක කිරීමේ ඒකකයේ වාර්ෂික කාර්යසාධනය පහත පරිදි වේ.

- ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සම්බන්ධ නීති විරෝධී ක්‍රියාවන් මර්දනය කිරීමේ බීජිං සම්මුතිය සහ ඒ ආශ්‍රිත අතිරේක නීති බලාත්මක කිරීම නීති කෙටුම්පත් සකස් කිරීම සඳහා නව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට පියවර ගන්නා ලදී.
- කේප් ටවුන් සම්මුතිය සහ අදාළ නීති බලාත්මක කිරීම
- නීති කෙටුම්පත් සකස් කිරීම සඳහා නව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට පියවර ගන්නා ලදී.
- ගුවන් යානය තුළ දී සිදු කරන අපරාධ සහ වෙනත් ක්‍රියාවන් පිළිබඳ වන සම්මුතිය සංශෝධනය කිරීම සඳහා නීති ක්‍රියාත්මක කිරීම - මොන්ට්‍රියල් සම්මුතිය 2014
- නීති කෙටුම්පත් සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.
- ගුවන්යානා ක්‍රියාකරුවන් සඳහා වන වගකීම් පිළිබඳ සීමා සහ රක්ෂණ අවශ්‍යතා සම්බන්ධයෙන් නියෝග (SLCAD 18) නිකුත් කිරීම.
- ජල යාත්‍රාංගණ රෙගුලාසි ඉදිරිපත් කිරීම

  අවසන් රෙගුලාසි කෙටුම්පත සඳහා CAASL නිරීක්ෂණ භාෂා ත්‍රිත්වයෙන්ම නීති කෙටුම්පත් සම්පාදකයා වෙත යොමු කරන ලදී.
- ගගන නාවික සේවා සැපයුම්කරු බලපත්‍ර රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම

  නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් CAASL නිරීක්ෂණ සඳහා භාෂා ත්‍රිත්වයෙන්ම දෙවන රෙගුලාසි කෙටුම්පත ලැබුණි.
- ගුවන්යානා ලියාපදිංචි කිරීම සහ පොදු ලකුණු රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම

  නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙන් CAASL නිරීක්ෂණ සඳහා භාෂා ත්‍රිත්වයෙන්ම අවසන් රෙගුලාසි කෙටුම්පත ලැබිණි.
- ගුවන් රෙගුලාසි අනුව අන්තරායකර භාණ්ඩ ප්‍රවාහනය ආරක්ෂිතව සිදු කිරීම පිළිබඳ ප්‍රකාශයට පත් කරන ලදී.

  අවසන් රෙගුලාසි කෙටුම්පත සඳහා CAASL නිරීක්ෂණ භාෂා ත්‍රිත්වයෙන්ම නීති කෙටුම්පත් සම්පාදකයා වෙත යොමු කරන ලදී.
- සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත සහ සිවිල් ගුවන්සේවා පනත සඳහා සංශෝධනය කරන ලදී.

  ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) පෞද්ගලික සමාගම සහ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම වෙතින් ලද යෝජනා සමාලෝචනය කරන ලදී.
- මෙහෙයුම් අංශය මඟින් නිකුත් කරන ලද සියලුම බලපත්‍ර, සහතික, අවසරපත්‍ර සහ ආකෘති පත්‍රවල නෛතික වලංගුභාවය සමාලෝචනය කර අවශ්‍ය සංශෝධන සහිතව ඒවා ඉදිරිපත් කරන ලදී.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) ඒකකය

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) ඒකකයමඟින් ප්‍රධාන කාර්යයන් දෙකක් ඉටු කරනු ලබයි. ඉන් පළමුවැන්න නම් තොරතුරු තාක්ෂණ සේවා සැපයීම උදෙසා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය කිරීමයි. එමඟින් පහත දෑ තහවුරු කරනු ලබයි.

- තොරතුරු පද්ධති කළමනාකරණය සහ ආරක්ෂණය
- දත්ත මූලාශ්‍ර කළමනාකරණය සහ ආරක්ෂණය
- පද්ධති යෙදවුම් කළමනාකරණය සහ ආරක්ෂණය
- ජාලය කළමනාකරණය සහ ආරක්ෂණය

දෙවැන්න වනුයේ තොරතුරු පද්ධති සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය සහ භාවිත කිරීමයි.

තොරතුරු තාක්ෂණ අංශයේ 2021 වසර තුළ ක්‍රියාතමක කරන ලද ප්‍රධාන කාර්යය වූයේ, “Google Workspace” සිට “Office 365” වෙත විද්‍යුත් තැපැල්

මෙහෙයවීම සහ කළමනාකරණය

සේවාව මාරු කිරීමයි. එමෙන්ම, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අංශය විසින් CAASL හි කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා අනුව ඔවුන්ගේ කාර්යය පහසු කිරීම සඳහා මෘදුකාංග යෙදුම් රැසක් නිර්මාණය කර ඇත. මෙම යෙදවුම් මඟින් මෙහෙයුම් සහ ක්‍රියාවලීන් වඩා නව්‍ය, ඵලදායී සහ කාර්යක්ෂම අයුරින් සිදු කර ගැනීමට මෙන්ම සිය තරඟකරුවන් අතරින් ඉදිරියට ගමන් කිරීමට CAASL හට සහය ලබා දෙයි. CAASL හි අරමුණු සහ අනෙකුත් ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරමින්, 2021 වර්ෂයේ දී තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) අංශය පහත දැක්වෙන ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට ද සමත් විය.

- PEL නව පරීක්ෂණ පද්ධතිය
- මාර්ග ගත අධිශීක්ෂණ කළමනාකරණ පද්ධතිය
- කාර්ය මණ්ඩල සාමාජික සහතිකය නිකුත් කිරීමේ පද්ධතිය
- CAASL සුදුසුකම් පත්‍රය නිකුත් කිරීමේ පද්ධතිය
- CAASL විද්‍යුත් සිද්ධි වාර්තා කිරීමේ පද්ධතිය
- CAASL වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම

පරිගණක, ජාල සම්බන්ධතාවය, විද්‍යුත් තැපැල් හිණුම හෝ වෙනත් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවාවන් සම්බන්ධ තාක්ෂණික ගැටලු මතු වූ විට CAASL හි සේවකයන් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපකාරක සහය ලබාගෙන ඇත. CAASL හි පරිගණක පරිශීලකයන් හට ඵලදායී සහ කාර්යක්ෂම පද්ධති සහය ලබා දෙමින්, CAASL හි සියලුම කාර්ය මණ්ඩලය සඳහා දෝෂ රහිත තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවා පරිසරයක්, තොරතුරු සන්නිවේදන සහ තාක්ෂණ අංශය මඟින් තහවුරු කර ඇත. තවද 2021 වසරේ දී වාර්තා වූ ගැටලු සහ ඒවාට විසඳුම් සෙවීම පිළිබඳ විස්තර පහත දැක්වේ. බොහෝ ගැටලු සුළු ගැටලු බව තවදුරටත් සටහන් කිරීමට කැමැත්තෙමු.

ගැටලු	වාර්තා කළ	තත්වය
මෘදුකාංග/දත්ත ගබඩාවට අදාළ	840	විසඳන ලද 840
දෘඩාංග/ජාලයට අදාළ	500	විසඳන ලද 500

සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන සහ මාධ්‍ය ඒකකය

ප්‍රධාන වශයෙන් රටේ තරුණ පිරිස ඇතුළු සාමාන්‍ය ජනතාව අතර ගුවන්සේවා පිළිබඳ අවබෝධය වර්ධනය කරමින්, ශ්‍රී ලංකාව තුළ ගුවන්සේවා සංස්කෘතියක් ඇති කිරීම, ගුවන්සේවා සම්බන්ධ කාලීන සහ වඩාත් විශ්වසනීය තොරතුරු සපයමින් ප්‍රජාව යාවත්කාලීන කිරීම සහ විද්‍යුත්, මුද්‍රිත මාධ්‍ය සහ සමාජ මාධ්‍ය ඔස්සේ එහි ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන ඒකකය සතු වගකීමයි. මෙම ඒකකය CAASL හි සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

සිවිල් ගුවන් සේවය සම්බන්ධයෙන් පාසල් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන

ශ්‍රී ලංකාවේ අනාගත පරපුර අතර ගුවන්සේවා සම්බන්ධ දැනුම ගොඩනැගීමේ අරමුණින් පාසල් තුළ 'සිවිල් ගුවන්සේවා සංගමයක්' නිර්මාණය කිරීම පිළිබඳ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් හයක්, පැවැත්වීමට නියමිතව තිබුණි. මෙම විෂය සම්බන්ධයෙන් දැනුවත්භාවයක් සහ උනන්දුවක් ඇති කිරීම උදෙසා මෙම වැඩසටහන හරහා සිවිල් ගුවන්සේවා සංකල්පය සමඟ තරුණ සිසුන් සම්බන්ධ කර ගැනීම අරමුණු කොට ඇත. ගුවන්තොටුපළ වැඩමුළු ඇතුළු වසර සඳහා සැලසුම් කොට තිබූ සියලුම වැඩසටහන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ක්‍රියාත්මක වූ සීමා කිරීම් සහ ආරක්ෂක නීතිරීති හේතුවෙන් කල් දැමීමට සිදු විය. වැඩසටහනේ ස්වාභාවය, ආරක්ෂක ක්‍රියාමාර්ග සහ සීමා කිරීම් අනුව පෙර වසරට වඩා වෙනස් කිරීමට සිදු විය. කෙසේ වෙතත්, සමාලෝචිත වසර තුළ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ මඟපෙන්වීම මත ආරක්ෂිත පසුබිමක විය පැවැත්වීමට සාකච්ඡා කරන ලදී.

සිවිල් ගුවන් සේවය පිළිබඳ දැනුවත් කිරීමේ මාර්ගගත වැඩසටහන

සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන සහ මාධ්‍ය ඒකකය මඟින් පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා 'මාර්ගගත ක්‍රමය' හඳුන්වා දුන් අතර සිසුන් 1000 ක් සඳහා වැඩසටහන් 14 ක් සූම් තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී. අවසාන විභාගය සඳහා සිසුනු 723 ක් සහභාගී වූහ.

මෙහෙයවීම සහ කළමනාකරණය

පාසල් ඉලක්ක කර ගනිමින් "ගුවන්සර" ගුවන්සේවා සඟරාව ප්‍රකාශයට පත් කිරීම

"ගුවන්සර" ගුවන්සේවා සඟරාවල සංස්කරණ විසි දෙකක් (22) ප්‍රකාශයට පත් කර තෝරාගත් පාසල් පුස්තකාල සඳහා බෙදා හැර ඇත. මෙම සඟරාව කියවීම සිසුන් අතර ප්‍රචලිත ඇති අතර, මෙම සඟරාවේ පිටපතක් උසස් පෙළ පන්ති සහිත සියලුම පාසල් වෙත නොමිලේ ලබා දී ඇත. කෙසේ වෙතත්, පසුගිය වසරේ වසංගතය පැතිරීම සහ පාසල් වසා දැමීම හේතුවෙන් සඟරාවේ අපේක්ෂිත ප්‍රමාණය මුද්‍රණය නොකළ අතර බෙදා හැරීම ද සීමා කිරීමට සිදු විය.

"ගුවන් සැරිසර" රූපවාහිනී වැඩසටහන විකාශනය

වැඩසටහන් නිෂ්පාදනයේ සුවිශේෂී ශෛලිය සහ පෙර අත්විඳ නැති හෝ ප්‍රසිද්ධියේ ප්‍රදර්ශනය කර නොමැති ගුවන්සේවා ක්ෂේත්‍රය තුළ සිත් ගන්නාසුළු පැතිකඩයන් ආවරණය කරන හෙයින් ගුවන් සැරිසර" රූපවාහිනී විශේෂාංග වැඩසටහන ජනප්‍රියත්වයට පත්ව ඇත. මෙහි ජනප්‍රියත්වය සහ සමාජය වෙත ලබා දෙන වටිනා සේවය හේතුවෙන් සම්මානයක් ද හිමි කරගෙන ඇත. කොවිඩ්-19 වසංගත තත්වයේ සීමාවන් ඉවත් කළ පසු මෙම වැඩසටහනේ නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට නියමිතය.

'සිවිල් ගුවන්සේවාව' හි වැදගත්කම පිළිබඳ වන දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා CAASL පුවත් සහ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ පුවත් මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය හරහා ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලදී. මෙසේ ඉලෙක්ට්‍රොනික් සහ මුද්‍රිත මාධ්‍ය භාවිත කරමින් තොරතුරු ප්‍රකාශයට පත් කිරීමට පියවර ගෙන ඇත.

සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන සහ මාධ්‍ය ඒකකය හරහා සම්බන්ධීකරණය කරන ලද පුවත්පත්, ගුවන්විදුලි සහ රූපවාහිනී වැඩසටහන් හරහා මෙය ක්‍රියාත්මක කෙරේ.

විශේෂ වැඩසටහන් සංවිධානය කිරීම

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා දිනයේ 77 වැනි සංවත්සරය සැමරීම සඳහා ප්‍රවර්ධන ඒකකය විසින් උත්සවයක් සංවිධානය කරන ලද අතර මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහභාගි විය.

දේශීය සහ ජාත්‍යන්තර පාඨකයන් සඳහා නව මාධ්‍ය හරහා සිවිල් ගුවන්සේවා තොරතුරු ප්‍රචාරණය

දේශීය හා ගෝලීය ප්‍රජාවන් අතර අධිකාරිය සහ එහි ක්‍රියාකාරකම් පිළිබඳ මෙන්ම සමස්තයක් ලෙස සිවිල් ගුවන් සේවයට අදාළ තොරතුරු පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම සඳහා ප්‍රයෝජනවත් වන මාධ්‍ය ලෙස නව මාධ්‍ය, වෙබ් පාදක සම්පත් සහ සමාජ මාධ්‍ය දැක්විය හැක. මෙහිදී, මෙම මාධ්‍ය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ඇතිව, නුදුරු අනාගතයේ දී මෙම මාධ්‍යයන් හරහා දැනුවත්භාවය ඇති කිරීම සඳහා අර්ථවත් අන්තර්ගතයන් සකස් කිරීමට ඒකකය සූදානම් වෙමින් සිටී.

ඉදිරි මාධ්‍ය අභිප්‍රායන්

අතීත සහ වර්තමාන සියලුම වැදගත් දත්ත සංරක්ෂණය කිරීමේ අරමුණින්, වසර තුළ ඒකකය විසින් විද්‍යුත් පුස්තකාලයක් ආරම්භ කරන ලදී. ඒකකය මඟින් මෙම පුස්තකාලයේ අන්තර්ගතය වැඩිදියුණු කරමින් පවත්වා ගෙන යනු ලබන අතර, අබණ්ඩ පදනමක් මත ගොනු කර තැබීම සඳහා ඓතිහාසික වශයෙන් වැදගත් කරුණු සහ සිදුවීම් පිළිබඳ පර්යේෂණ සිදු කරයි.

ගුවන් වෛද්‍ය සේවා ඒකකය

CAASL හි ගුවන් වෛද්‍ය සේවා ඒකකය 2021 වසර පුරා ක්‍රියාත්මක විය. රට තුළ කිහිප වරක්ම සංචරණ සීමා ක්‍රියාත්මක වුවද, ප්‍රධාන වශයෙන් දැඩි මහජන සෞඛ්‍යය නීති රීතිවලට අනුගත වෙමින් ගුවන් නියමුවන්, ගුවන් ගමන් පාලකවරුන් සහ ගුවන්යානා කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා වෛද්‍ය තක්සේරු කිරීම් සිදු කරමින් එමඟින් CAASL සේවාදායකයන් වෙත සිය සේවාවන් අබණ්ඩව සිදු කළේය.

තවද ICAO නියාමන අවශ්‍යතාවලට අනුකූල විකල්ප ක්‍රම භාවිත කොට බලපත්‍රවල වලංගුභාවය සහතික කරමින් විදෙස් රටවල සිර වී සිටින CAASL බලපත්‍රලාභීන්ගේ වෛද්‍ය වලංගුභාවය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබාදීමට විධිවිධාන සකස් කරන ලදී.

ICAO සහ EASA අවශ්‍යතා අනුව, I පන්තියේ වෛද්‍ය සහතිකලාභීන්ට නව වෛද්‍ය සහතිකයක් හඳුන්වා දෙන ලදී.

සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික කොවිඩ් මධ්‍යස්ථානය සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ දේශීය කාර්යාලය වැනි ජාතික අධිකාරීන් සමඟ සම්බන්ධීකරණය ඔස්සේ කොවිඩ්-19 රෝගය පැතිරීම වැළැක්වීමේ ක්‍රියාකාරකම් සඳහා ගුවන් වෛද්‍ය සේවා ඒකකය සිය අබණ්ඩ දායකත්වය ලබා දුන්නේය.

මෙහෙයවීම සහ කළමනාකරණය

වසර තුළ සිදු කරන ලද ප්‍රධාන මහජන සෞඛ්‍ය ක්‍රියාකාරකම් පහත දැක්වේ.

(අ) කොවිඩ්-19 වසංගත තත්වය, මහජන සෞඛ්‍ය නියාමන අවශ්‍යතා සහ මහජන සෞඛ්‍ය ආරක්ෂක පියවරයන්ට අනුගත විය යුතු ආකාරය පිළිබඳව CAASL, ගුවන් සමාගම් සහ ජාත්‍යන්තර ගුවන්තොටුපළවල සමස්ත කාර්ය මණ්ඩලය වෙත දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ සංචාරක අමාත්‍යාංශයේ ජාතික කමිටු කිහිපයක CAASL නියෝජනය කොවිඩ්-19 වසංගත තත්වය පැතිරීම වැළැක්වීම සහ ජාත්‍යන්තර සංචාර සඳහා අපගේ ගුවන්තොටුපළ විවෘත කිරීමේ දී නියාමන අවශ්‍යතා සංවර්ධනය කිරීම සඳහා පත් කර ඇත.

(ඇ) ලෝක සෞඛ්‍ය සංවිධානය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව කොවිඩ්-19 වසංගත තත්වය සඳහා ගුවන්සේවා කර්මාන්තයට අදාළ මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම සඳහා සම්පත්දායකයන් ලෙස සේවා පිරිනැමීම

(ඈ) සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහය ඇතිව තත්කාර්ය ගුවන් ගමන් සඳහා අනුමැතිය ලබා දීම, හදිසි ගුවන් වෛද්‍ය මෙහෙයුම්, සහ කාර්ය මණ්ඩල විවේකාගාරය පිළිබඳ නියාමන අවශ්‍යතා අධීක්ෂණය, කාර්ය මණ්ඩලය සඳහා PCR පරීක්ෂණ, නිරෝධායන අවශ්‍යතා ආදී කටයුතු සිදු කිරීම.

(ඉ) කොවිඩ්-19 වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ පැවති රැස්වීම්වල දී CAASL නියෝජනය කිරීම සහ ගුවන්සේවා සම්බන්ධ තීරණ ගැනීමේ දී සක්‍රීයව සම්බන්ධ වීම.

(ඊ) ජාත්‍යන්තර ජයග්‍රහණ - ගුවන් වෛද්‍ය සේවා ප්‍රධානී;

- ගුවන් සේවයේ ICAO ආසියා ශාන්තිකර මහජන සෞඛ්‍ය කමිටුවේ සාමාජිකයෙකු ලෙස තෝරාගෙන, ICAO CART (ගුවන්සේවා ප්‍රතිසාධන කාර්යසාධක බලකා සභාව) ලේඛනය සහ CAPSCA රෙගුලාසි වැනි ගුවන්සේවා ආශ්‍රිත මහජන සෞඛ්‍ය ලේඛන සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සහය සහ උපදෙස් ලබා දෙන ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.
- ICAO ඇමුණුම 9 සංවර්ධනයන් සහ සංශෝධන සිදු කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා ගුවන්සේවා කාර්යසාධක බලකායේ ICAO සෞඛ්‍ය ගැටලු පැතිරීම (HIOATF) විෂය පිළිබඳ විශේෂඥයෙකු ලෙස තෝරාගෙන ඇත.

ගුවන්සේවා වෛද්‍ය සහ ගුවන්සේවා මහජන සෞඛ්‍ය විධිමත් කිරීමේ කාර්යය (CAO සහ WHO ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව) පහත දෑ හරහා සම්පූර්ණ කර ඇත;

- ICAO, WHO සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නවතම අවශ්‍යතා අනුව කලින් කල සංශෝධන සහිතව කොවිඩ්-19 සඳහා විශේෂ නියමයන් ප්‍රකාශයට පත් කිරීම.
- දේශීය සහ ජාත්‍යන්තර අවශ්‍යතා අනුව, ගුවන්සේවාවෙහි මහජන සෞඛ්‍ය නිවාරණ අවශ්‍යතා සඳහා වන ප්‍රධාන නියමය 011 හි 2 වන සංස්කරණය (GD 011) ප්‍රකාශයට පත් කිරීම.

තව ද මෙම ඒකකය විසින් සිවිල් ගුවන්සේවා වෛද්‍ය නිලධාරීන් සහ ගුවන් සමාගම් වෛද්‍ය නිලධාරීන් පුහුණු කිරීම ICAO ගුවන්සේවා වෛද්‍ය අවශ්‍යතා අනුව සිදු කරන ලදී.

තාක්ෂණික පුස්තකාල ඒකකය

CAASL තාක්ෂණික පුස්තකාලය, CAASL සහ දේශීය ගුවන්සේවා කර්මාන්තය තුළ පවතින අභ්‍යන්තර ලේඛන, ICAO ප්‍රකාශනයන්ට අදාළ ප්‍රතිග්‍රහණය සහ ප්‍රචාරණය, අදාළ රෙගුලාසි, රජයේ ප්‍රකාශන සහ අනෙකුත් සාමාන්‍ය ලේඛන කළමනාකරණය සඳහා වන වගකීම දරයි. තාක්ෂණික පුස්තකාලය විසින් CAASL නිල වෙබ් අඩවියේ පරිපාලනය සහ අන්තර්ගත කළමනාකරණය, 2016 අංක 12 දරන RTI පනතේ දක්වා ඇති පරිදි මහජනතාව වෙත තොරතුරු ලබා දීම, ICAO සහ APAC රාජ්‍ය ලිපි සමඟ ලිපි හුවමාරුව කළමනාකරණය කිරීම සහ විශ්ව ආරක්ෂණ අධීක්ෂණ විගණන වැඩසටහන - CAASL වෙනුවෙන් අඛණ්ඩ අධීක්ෂණ ප්‍රවේශය (USOAP-CMA) පරිපාලනය කිරීම යන කටයුතු ද සිදු කරනු ලබයි.

මෙහෙයවීම සහ කළමනාකරණය

ලේඛන කළමනාකරණය

තාක්ෂණික පුස්තකාලය දැනුම ගවේෂණය කරන්නන් සඳහා දැනුම කේන්ද්‍රයක් ලෙස කටයුතු කරන අතර, ගුවන්සේවා රෙගුලාසි යාවත්කාලීන කරමින් ගෝලීය ගුවන්සේවා කර්මාන්තය පිළිබඳ කාලීන තොරතුරු විශාල ප්‍රමාණයක් පිරිනමනු ලබයි. සමාලෝචනය කරනු ලබන වසර පුරා, 2021 වසර සඳහා පුස්තකාලයට නව ප්‍රකාශන මිලදී ගැනීමට රුපියල් දෙලක්ෂ අසූහත් දහස් දෙසියය හැට හයක (රු.287, 266) මුළු පිරිවැයක් දරන ලදී. මීට අමතරව කාර්ය මණ්ඩලය අතර යාවත්කාලීන තොරතුරු ව්‍යාප්තිය ඉහළ නැංවීමේ අරමුණින් තාක්ෂණික පුස්තකාලය සමඟින් විවිධ අංශ සඳහා වන පුස්තකාල ද අබණ්ඩව පවත්වා ගෙන යන ලදී. වසර තුළ බාගත කොට පරීක්ෂා කරන ලද ICAO ප්‍රකාශන 4844 අතරින්, තාක්ෂණික පුස්තකාලය සහ අංශ පුස්තකාල සඳහා අනුපිළිවෙළින් ප්‍රකාශන හාරසිය හැට නවයක් (469) සහ දෙසිය පනස් එකක් (251) ප්‍රතිග්‍රහණය කොට යාවත්කාලීන කිරීම සිදු කොට ඇත. රාජ්‍ය ලිපි තුන්සියය දහතුනක් (313) ක් ද අදාළ අංශ අතර බෙදා හැර ඇත.

ලේඛන කළමනාකරණය



CAASL වෙබ් අඩවිය

CAASL වෙබ් අඩවිය යනු සාමාන්‍ය ජනතාව වෙත තොරතුරු බෙදා හැරීම සඳහා අත්‍යවශ්‍ය මූලාශ්‍රයකි. CAASL හි වෙබ් අඩවිය අබණ්ඩව යාවත්කාලීන කරන ලද අතර වසර තුළ පරිශීලකයන් පනස් එක් දහස් හයසිය අනූ දෙකක් (51,692) විසින් භාවිත කර ඇත. වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලද සිවිල් ගුවන්සේවා සම්බන්ධ තොරතුරු පිළිබඳව ජනතාව අතර පවතින උනන්දුව මෙමඟින් පෙන්නුම් කෙරේ.

තත්ව සහ අභ්‍යන්තර විගණන ඒකකය

විගණන කාර්යය

CAASL හි තත්ව කළමනාකරණය වැඩිදියුණු කිරීම තත්ව සහ අභ්‍යන්තර විගණන ඒකකයේ ප්‍රධාන වගකීම වේ. ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවලට අදාළව අනුකූලතා මට්ටම සමාලෝචනය සහ තක්සේරු කිරීම හරහා ආයතනයේ අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන පරිසරය සහ පාලන රාමුව පිළිබඳ සහතික වීමක් අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය මඟින් සපයනු ලබයි. QIA අංශය විසින් CAASL හි ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ අබණ්ඩතාව සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලතාවය අධීක්ෂණය කිරීම සහ මිනුම් කිරීම අබණ්ඩව සිදු කරනු ලැබේ.

කාර්ය සාධනය

2021 වර්ෂය තුළ කොවිඩ්-19 වසංගත තත්වයේ බලපෑම පැවතිය ද, විගණන නිරීක්ෂණ 110 ක් සඳහා හේතු වූ පුර්ව විගණන 33 ක් ඇතුළුව මුළු විගණන 80 ක් සිදු කරන ලදී. 2021 වාර්ෂික වැඩසටහන අනුව මෙය අපගේ සැලසුම්ගත විගණනවලින් 93% ක් සම්පූර්ණ කිරීමකි. පසුගිය වසරට සාපේක්ෂව පසු විගණනවලට අදාළ කාලසීමාව තුළ 42% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

මෙහෙයවීම සහ කළමනාකරණය



වසර තුළ පසු විගණන **47** ක් සිදු කරන ලදී.

අනුබණ්ඩනය

තාක්ෂණික විගණන **32%**

මූල්‍ය විගණන **21%**

මානව සම්පත් සම්බන්ධ විගණන **17%**

තත්ව විගණන **26%**

වෙනත් විගණන **21%**

පසු විගණන
2021 – 47
2020 – 33

42%
පසු විගණන

පූර්ව විගණන
2021 – 33
2020 – 51

35%
පූර්ව විගණන

සමීක්ෂණ

සමාලෝචිත වසර තුළ, ප්‍රථම වරට මෙම අංශය මඟින් මාර්ග ගත ක්‍රමයට 91 කින් සමන්විත ජනගහනයක් නියැදිය ලෙස යොදා ගනිමින් සේවක තෘප්තිමත්භාවය පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙහි අරමුණ වූයේ, සේවක චර්යාව සංවිධානයේ කාර්යසාධනය උදෙසා ධනාත්මකව බලපාන බැවින් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණය වෙත එහි ප්‍රතිඵල ඉදිරිපත් කිරීම යි. පෙර වසරට සමාන ආකාරයේ පාරිභෝගික තෘප්තිමත්භාවය පිළිබඳ සමීක්ෂණයක් ද සිදු කරන ලදී.

පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති අංශය

සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සහ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම

රාවණා රජු සහ අහිමි වූ ගුවන් ආධිපත්‍යය පිළිබඳ දැනුම කුතුහලයක් දනවන අභිරහසක් ලෙස පවතින අතර, එම කතා පුවත පිළිබඳ අභිරහස ශක්තිමත් සාක්ෂි සහිතව විසඳීමට හැකිනම් එය ලෝක ඉතිහාසය නව මානයක් වෙත යොමු කරනු ඇත. බොහෝ පාර්ශ්ව විසින් රාවණා රජු හා සම්බන්ධ ස්ථාන පිළිබඳව සාක්ෂි එකතු කර ලේඛනගත කර ඇත. ශ්‍රී ලංකාව තුළ රාවණා ක්‍රියාකාරකම්වල වැදගත්කම තක්සේරු කිරීම සඳහා ගවේෂණයන් සිදු කළ අතර, සියලුම රාවණා අඩවි සම්බන්ධ තොරතුරු එක් කරමින් විභව සංචාරක සාහිත්‍යයක් සකස් කර ඇත.

සංඛ්‍යා ලේඛන සහ පූර්ව කථන

ගුවන් ප්‍රවාහන සංඛ්‍යාන වැඩසටහන සහ CAASL සංඛ්‍යාලේඛන වැඩසටහන ඇතුළත් සිවිල් ගුවන්සේවා සංඛ්‍යාන වැඩසටහන CAASL විසින් කළමනාකරණය කරයි. විවිධ මෙවලම් සහ ශිල්පීය ක්‍රම භාවිත කරමින් දත්ත රැස් කිරීම, සම්පාදනය, අර්ථ නිරූපණය සහ ඉදිරිපත් කිරීම මෙම සංඛ්‍යාලේඛන වැඩසටහනට ඇතුළත් වේ.

මෙහෙයවීම සහ කළමනාකරණය

ඒ අනුව, CAASL විසින් ගුවන් ප්‍රවාහන සංඛ්‍යාලේඛන වැඩසටහන යටතේ ජාත්‍යන්තර ගුවන් සමාගම්/ගුවන්තොටුපළ, දේශීය ගුවන් සමාගම්/ගුවන්තොටුපළ සහ ඉන්ධන පරිභෝජනය පිළිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කරනු ලබයි. එමෙන්ම 2021 ජනවාරි සහ දෙසැම්බර් අතර කාලය තුළ ICAO සහ අනෙකුත් රාජ්‍ය/පෞද්ගලික ආයතන වෙත දත්ත බෙදා හරින කරන ලදී. තවද, CAASL සංඛ්‍යාලේඛන වැඩසටහන යටතේ 2020 CAASL වාර්ෂික වාර්තාව ඇතුළුව CAASL මාසික කාර්යසාධන දැන්වීම්/වාර්තා සකස් කිරීම සඳහා CAASL ආයතනයේ සෑම අංශයකින්ම මාසික වැඩ කාර්යසාධන සංඛ්‍යාලේඛන එකතු කරන ලදී.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ලේඛන, වාර්තා, සහ සඟරා ප්‍රකාශයට පත් කිරීම

ආයතනික සැලැස්ම වැඩිදියුණු කිරීමේ කාර්යය, සෞභාග්‍යයේ දැක්ම පිළිබඳ CAASL හි වැඩසටහන, රාජ්‍ය අමාත්‍යාංශය සඳහා වන ප්‍රගති වාර්තාවන්, සංඛ්‍යාලේඛන වාර්තාවන්, මහ බැංකු වාර්තාවන්, ආයතනික ප්‍රතිඵල රාමුවේ ප්‍රගතිය මැනීම - (ORF) සහ සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව සම්පාදනය කිරීම සම්පූර්ණ කර එම වාර්තා ප්‍රකාශයට පත් කර ඇති අතර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, අදාළ රාජ්‍ය ආයතන සහ ක්ෂේත්‍රයේ අනෙකුත් සේවාදායකයන් වෙත නියමිත දිනට ඉදිරිපත් කර ඇත.

ජාත්‍යන්තර ගුවන්සේවා සඳහා කාබන් තුලනය කිරීම සහ අඩු කිරීමේ යෝජනා ක්‍රමය (CORSIA)

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) ඉන්ධන පරිභෝජන දත්තවල අවශ්‍යතාවන්ට අනුකූලව, ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් විමෝචන (Emission) දත්ත සහ අනෙකුත් දත්ත රැස්කර, දත්තවල නිරවද්‍යතාවය තහවුරු කිරීමෙන් අනතුරුව ICAO හි මධ්‍යම ලේඛනාගාරය වෙත ඉදිරිපත් කරන ලදී.

සිවිල් ගුවන්සේවා අධිකාරියේ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සිදු කිරීම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා ක්‍රියා පටිපාටිවලට අනුකූලව, CAASL හි අංශවල සහ ඒකකවල අවශ්‍යතා අනුව භාණ්ඩ හා සේවාවන්හි සියලුම ප්‍රසම්පාදන සහ උපදේශන කටයුතු සිදු කරන ලදී. කොවිඩ්-19 වසංගත තත්වයේ දී CAASL කාර්ය මණ්ඩලයට මෙන්ම අවශ්‍ය බලධාරීන්ට සෞඛ්‍ය ආරක්ෂණ පියවරයන් සැපයීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන ද සිදු කරන ලදී.

භෞතික යටිතල පහසුකම් සංවර්ධනය

පරිසරය, පර්යේෂණ සහ ව්‍යාපෘති අංශය මඟින් ව්‍යාපෘති සැලසුම් කිරීම, ප්‍රසම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන අතර මේ සඳහා CAASL ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය, වාහන නැවතුම් පොළ සඳහා ආවරණයක් සැකසීමේ ව්‍යාපෘතිය සහ CAASL රියදුරන් සඳහා බහාලුම් ආකාරයේ නවාතැන් පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය ආදිය ඇතුළත් වේ.



ගගන නාවික සේවා නියාමන ශාඛාව

"සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක්"

ගගන නාවික සේවා නියාමන ශාඛාව

ගගන යාත්‍රාංගණ අංශය

ශ්‍රී ලංකාවේ සිවිල් ගගන යාත්‍රාංගණ නියාමනය කිරීමේ වගකීම ගගන යාත්‍රාංගණ අංශයට පැවරී ඇති අතර එමඟින් ගගන යාත්‍රාංගනවල ආරක්ෂිත සහ කාර්යක්ෂම ගුවන්යානා මෙහෙයුම් සහතික කිරීමට හැකි වේ. මෙම අංශය, ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති, නියෝග, උපදෙස් සහ මාර්ගෝපදේශ මඟින් පනවන ලද සිවිල් ගුවන්සේවා පනත, ICAO ඇමුණුම් සහ අනෙකුත් මාර්ගෝපදේශ, අදාළ තොරතුරු මඟින් බල ගැන්වේ. ICAO සම්මුතියෙහි ඇමුණුම 14 යනු ගගන යාත්‍රාංගණවලට අදාළ ප්‍රධාන ඇමුණුම වන අතර එය පිළිවෙළින් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති (IS) 30 සහ 41 මඟින් පනවනු ලැබේ. ඇමුණුම 14 පැනවීම සඳහා ප්‍රකාශයට පත් කරන ලද ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිවලට අමතරව, ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති දෙකක්, එනම් ගගන යාත්‍රාංගණ සහතික කිරීම සඳහා වන IS 37 සහ ගගන යාත්‍රාංගණවල පදික වේදිකාවේ ශක්ති මට්ටම් නියාමනය කිරීම සඳහා වන IS 32 ප්‍රකාශයට පත් කරන ලදී. කර්මාන්ත මාර්ගෝපදේශනය, කර්මාන්තයට සිය මෙහෙයුම් ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා සහය වෙමින් CAASL හි පහසුවෙන් ලබා ගත හැකි සේ පවතින තවත් සනාථ කිරීමේ ලියවිලි ප්‍රභේදයක් ලෙස සැලකේ.

ගගන යාත්‍රාංගණ සහතික කිරීම

ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය 30 අනුව සෑම ජාත්‍යන්තර ගුවන්තොටුපළක්ම සහතික කළ යුතු අතර මෙම සහතිකය වසර දෙකක කාලයක් සඳහා වලංගු වේ. සහතිකය අලුත් කිරීම ගගන යාත්‍රාංගණ අංශය විසින් පවත්වනු ලබන ගගන යාත්‍රාංගණ සහතික අලුත් කිරීමේ විගණනයකට යටත් වේ.

ගගන යාත්‍රාංගණ අංශය සහ සහයක අංශ විසින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කරමින් මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි බාධාවකින් තොරව මෙහෙයුම් සිදුකිරීමට අදාළව මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ (MRIA) සහතිකය අලුත් කිරීමේ විගණන වැඩසටහන ක්‍රියාත්මක කිරීම නැවැත්වීමට අනපේක්ෂිතව පැමිණි කොවිඩ්-19 ට පවා නොහැකි විය.

රත්මලාන ගුවන්තොටුපළ හෙවත් කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ රත්මලාන (CIAR), ජාත්‍යන්තර කලාපීය මෙහෙයුම් සඳහා සහතිකයක් ලබා ගැනීමේ ක්‍රියාවලියක යෙදී සිටී. මූලික පියවරක් ලෙස ගගන යාත්‍රාංගණ අංශය 2020 දී සහතික කිරීමේ විගණනය සිදු කරන ලද අතර විගණනයේ දී අනාවරණය වූ අඩුපාඩු නිවැරදි කරන ලෙස ක්‍රියාකරු වූ ගුවන්තොටුපළ සහ ගුවන්සේවා ශ්‍රී ලංකා සමාගම වෙත දැනුම් දෙන ලදී. ඔවුන්ගේ නිවැරදි කිරීමේ ක්‍රියාවලියේ දී ක්‍රියාකරුගේ ඉල්ලීම මත නිරන්තර සහයක් ලබා දී ඇත.

නියාමන සංවර්ධනය

ප්‍රකාශයට පත් කිරීමට නියමිත ජල යාත්‍රාංගණ පිළිබඳ නියාමන නීති කෙටුම්පත් කාර්යාලයේ සකස් වෙමින් පවතී. මෙකී නියාමන ක්‍රියාකරුවන්ගේ නියාමනය ඇතුළු පාවෙන ගුවන්යානා මෙහෙයුම් සහතික කිරීම සඳහා වේ.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ මඩකලපුව ගුවන්තොටුපළ සඳහා කලාපකරණ නියාමන ප්‍රකාශයට පත් කිරීමට නියමිත අතර එමඟින් ගුවන්තොටුපළ තුළ ආරක්ෂිත ගුවන්යානා මෙහෙයුම් සිදු කළ හැකි අවකාශය නිර්මාණය කරනු ඇත.

ඇමුණුම 14 හි නව සංශෝධන, IS 30 - ශ්‍රී ලංකාවේ ගගන යාත්‍රාංගණ ප්‍රමිති යන්නෙහි නව සංස්කරණයක් ලෙස නිකුත් කර ඇති අතර එය දැන් CAASL වෙබ් අඩවියෙන් පහසුවෙන් ලබා ගත හැකිය.

නිරීක්ෂණ කටයුතු

ශ්‍රී ලංකාවේ සිවිල් ගගන යාත්‍රාංගණ නියාමකයෙකු ලෙස, වසංගත කාලවල දී පවා සියලුම ගොඩබිම් ගගන යාත්‍රාංගණවල විභව නිරීක්ෂණ කටයුතු උපරිම වශයෙන් සිදු කිරීමට මෙම අංශය සමත් විය. මඟින් නොමැතිකම හේතුවෙන් එකම පාවෙන ගුවන්යානා ක්‍රියාකරුට ජල යාත්‍රාංගනවලට සිය මෙහෙයුම් සීමා කිරීමට සිදු විය.

ගගන යාත්‍රාංගණ සහතික කිරීමේ තීරුවේ දක්වා ඇති පරිදි, CIAR විසින් IS 30 හි අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා පූර්ණ පරිමාණ හදිසි අවස්ථා අභ්‍යාසයක් පවත්වන ලදී. සෞඛ්‍ය සීමාවන් හේතුවෙන්, ගගන යාත්‍රාංගණ අංශය ඇතුළුව ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය, සමස්ත අභ්‍යාසය තුළ එකම නිරීක්ෂකයන් ලෙස සහභාගී විය. අභ්‍යාසය සාර්ථක වූ අතර CIAR හි ගුවන්තොටුපළ හදිසි අවස්ථා සැලැස්ම තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා නිර්දේශ දැනුම් දී ඇත.

අනුමත කිරීම්

ගගන යාත්‍රාංගණ අභ්‍යන්තරයේ සිදුකරන ඉදිකිරීම් සහ අනෙකුත්

ගගන නාවික සේවා නියාමන ශාඛාව

ක්‍රියාකාරකම්වල දී ආරක්ෂණ අනුකූලතාවය සහතික කිරීම සඳහා, එවැනි ව්‍යාපෘතිවල ව්‍යාපෘති යෝජනා, සැලසුම් සහ ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය සමාලෝචනය කිරීමෙන් පසු ගගන යාත්‍රාංගණ අංශය විසින් අවශ්‍ය තාක්ෂණික මාර්ගෝපදේශ සහ අනුමැතිය ලබා දෙනු ලැබේ. එවැනි අනුමැතීන් ලබා දුන් ව්‍යාපෘති පහත දැක්වේ.

- අලුතින් ඉදිකරන ලද ගුවන්යානා නැවතුම්පළ E හි ORAT (මෙහෙයුම් සඳහා සූදානම සහ ගුවන්තොටුපළ මාරු කිරීම). මෙම ඉදිකිරීම, ගුවන්යානා නැවැත්වීමේ ධාරිතාව පුළුල් කිරීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි සිදු කරන ලද විශාලතම වැඩි දියුණු කිරීම් අතරින් එකකි. වසර අවසානයේ දී, ආරම්භක ගුවන්යානා නැවතුම්පළ E, ප්‍රමුඛත්වය යටතේ විවෘත කරන ලද මුත් ඊළඟ සහතික කිරීමේ විගණනයේ දී සහතික කරනු ලැබේ. මෙහෙයුම් සඳහා සූදානම ද පරීක්ෂා කර අනුමත කර ඇත.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි ඉන්ධන මුදා හැරීමේ නළ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ තුළ A පැකේජයෙහි 2 වන අදියර 2 වන පියවර (නව පර්යන්තය) සංවර්ධනය කිරීම. ආරක්ෂිත සැලසුම් සහ අනෙකුත් විධිවිධාන නියමිත කාලයේ දී අනුමත කරන ලදී.
- CIAR විසින් ඔවුන්ගේ ගුවන් ධාවන පථය IS 30 අවශ්‍යතා සමඟ අනුකූල වන පරිදි අඩු කිරීමෙන් පසු අනුමත විස්ථාපිත පර්යන්ත සහ ගුවන් ධාවන පථ සලකුණු.

ගෝලීය වාර්තාකරණ ආකෘතිය (GRF) ක්‍රියාත්මක කිරීම

GRF යනු ගුවන් ධාවන පථ චාරිකා අඩු කිරීම සඳහා වන ICAO හි ආරක්ෂිත ක්‍රියාත්මක කිරීම්වලින් එකකි. කොවිඩ්-19 බලපෑම හේතුවෙන් එය බලාත්මක වන දිනය 2021 වෙත මාරු කර ඇත. CAASL සහ AASL 2021 නොවැම්බර් 04 දින සිට බලාත්මක වන දිනය සාක්ෂාත් කර ගැනීම සඳහා නොපසුබටව කටයුතු කළ අතර ගගන යාත්‍රාංගණ අංශය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ කේන්ද්‍රස්ථානය වී ඇත. සෞඛ්‍ය රෙගුලාසි සහතික කරමින් අතථ්‍ය රැස්වීම් මාලාවක් සහ ප්‍රායෝගික සැසි මාලාවක් පවත්වන ලද අතර වැඩසටහන ඵලදායී ලෙස ක්‍රියාත්මක විය. මේ වන විට ශ්‍රී ලංකාවේ සියලුම ජාත්‍යන්තර ගුවන්තොටුපළ සඳහා GRF 2021 නොවැම්බර් 4 සිට ක්‍රියාත්මක වේ. GRF ක්‍රියාත්මක කිරීම පිළිබඳ SLCAP 2500 අත්පොත මාර්ගෝපදේශ සංග්‍රහයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

බාධක රහිත අවකාශ කළමනාකරණය (OLS)

එක් එක් සිවිල් ගගන යාත්‍රාංගණ සඳහා ආරක්ෂිත ප්‍රදේශයේ සීමා නිර්ණය කිරීම සහ ආරක්ෂිත ප්‍රදේශය තුළ සිදු වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන කලාපකරණ රෙගුලාසි මත පදනම්ව බාධක රහිත අවකාශ (OLS) ස්ථාපිත කෙරේ.

ගගන යාත්‍රාංගණයන්හි සිදු කෙරෙන ගුවන්යානා මෙහෙයුම්වල ආරක්ෂාව සඳහා ද, ගගන යාත්‍රාංගණ අවට බාධා රහිත පරිසරයක් පවත්වා ගැනීම සඳහා මෙන්ම ගුවන්යානා මෙහෙයුම්වල දී ඉලෙක්ට්‍රොනික හා වෙනත් මැදිහත්වීම් අවම කර ගැනීම සහ ගගන යාත්‍රාංගණ භාවිතය සහතික කිරීම සඳහා මෙම රෙගුලාසි අවශ්‍ය යැයි සලකනු ලැබේ.

සාමාන්‍ය ජනතාව, විදුලි සංදේශ ක්‍රියාකරුවන් සහ අනෙකුත් රාජ්‍ය ආයතන සඳහා වන බාධක සීමා අවශ්‍යතා මත පදනම්ව ගොඩනැගිලි, ඇන්ටනා, කුළුණු, සුළං කුළුණු, විදුලිය බෙදාහැරීමේ මාර්ග ආදිය ඉදිකිරීම සඳහා ගගන යාත්‍රාංගණ අංශය විසින් අනුමැතීන් නිකුත් කරනු ලැබේ. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් නිවසේ සිට වැඩ කරන අතරතුර පවා මෙම අංශය කාර්යක්ෂම ලෙස සේවා අබණ්ඩව පවත්වාගෙන යාම සහතික කළේය.

කිසිදු ප්‍රමාදයකින් තොරව උස අනුමත කිරීම් ලබා ගැනීම සඳහා අයදුම්කරුවන්ට අවශ්‍ය සහය ලබා දීම සඳහා අංශය මගින් මාර්ගගත සේවාවන් ද ක්‍රියාත්මක කරන ලදී.

අනුමත කිරීම් කඩිනම් කිරීම මඟින් අතිගරු ජනාධිපතිතුමාගේ ඉදිරි දැක්මක් වන "ගමට සන්නිවේදනය" වැඩපිළිවෙළ සඳහා පහසුකම් සැලසුණි.

ප්‍රමාදයන් වළක්වා ගැනීමට සහ කාර්යක්ෂමතාව සහ පෙර සැලසුම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා පරිපූර්ණ සිතියමක ආකාරයෙන් ගුවන්තොටුපළ අවට බාධක රහිත අවකාශ (OLS) සාමාන්‍ය ජනතාව වෙත දක්වා සිටීමට සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා අපේක්ෂා කරයි. මෙය මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ රත්මලාන හි ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතී.

ගගන නාවික සේවා නියාමන ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව ගගන යාත්‍රාංගණ අංශය අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කර ගෙන යනු ලැබේ.

ගුවන්සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූල විය යුතු බව දක්වා සිටින අතර ඒ එක් එක් කරුණ සඳහා ගගන යාත්‍රාංගණ අංශයේ දායකත්වය දක්වා ඇති පරිදි වේ.

- කටුනායක ගුවන්තොටුපළේ මගී පර්යන්තය සංවර්ධනය කිරීම;- මෙහෙයුම්වල කාර්යක්ෂමතාවයට සහ ආරක්ෂාවට බාධාවක් නොවන අයුරින් ඉදිකිරීම් කාල සීමාව තුළ ගගන යාත්‍රාංගණ සහ ගුවන්යානා මෙහෙයුම් ආරක්ෂිතව සිදු කිරීම සඳහා ගගන යාත්‍රාංගණ අංශය කොන්ත්‍රාත්කරුට සහ අනෙකුත් කොටස් හිමියන්ට අවශ්‍ය අනුමැතිය ලබා දෙයි.
- නුවරඑළිය ගුවන්තොටුපළ ඇතුළු අභ්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධනය කිරීම;- අමාත්‍යාංශය විසින් දක්වා ඇති පරිදි මූලික කටයුතු අවසන් කර ඇත. නිෂ්චිත ස්ථානයක් හඳුනාගෙන ඇති අතර අවශ්‍ය පරිදි වැඩිදුර උපදෙස් බලාපොරොත්තුවෙන් සිටී.
- මත්තල ගුවන්තොටුපළේ වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීම සහ පහසුකම් වැඩිදියුණු කිරීම;- ජාත්‍යන්තර වාණිජ මෙහෙයුම් බාධාවකින් තොරව ගලා යාම සඳහා සහතිකය අලුත් කිරීමේ විගණනය සිදු කර ඇත.

කොළඹ - වරාය නගරයෙහි ඉදිවන ජල යාත්‍රාංගණය

2021 වසර පාවෙන ගුවන්යානා මෙහෙයුම් සඳහා සුබදායී වසරක් නොවූවද, ශ්‍රී ලංකාවේ නව ආර්ථික කේන්ද්‍රස්ථානය වන කොළඹ වරාය නගරයේ ජල යාත්‍රාංගණයක් ස්ථාපිත කිරීමට අදහස් කරන බැවින් අධෛර්යයට පත් නොවන ක්‍රියාකරු සමෘද්ධිමත් අනාගතයක් වෙනුවෙන් දෑස් දල්වා ගෙන සිටී.

ගගන යාත්‍රාංගණ අංශයට අයදුම්පත්‍රය ලැබී තිබෙන අතර එය ස්ථාපිත කිරීමට පෙර සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා සහ ලබා දිය යුතු අනුමැතීන් පිළිබඳ ක්‍රියාකරු විසින් සියලුම පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය කොට සන්නිවේදනය කරන ලදී.

මෙම අංශය විසින් වෙබ් අඩවියේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ මූලික පරීක්ෂණය සිදු කළ අතර තවදුරටත් වැඩිදියුණු කිරීම් සිදු කිරීම සඳහා එකඟතාව පළ කර සිටියේය.

පුහුණු හා සංවර්ධන

අංශයේ පරීක්ෂක මණ්ඩලයට සිය දැනුම සහ ධාරිතාව වැඩි දියුණු කර ගැනීම සඳහා අතථ්‍ය පුහුණුවීම් ලබා දී ඇති අතර ICAO, COSCAP, SAAA දකුණු කොරියාව සහ මහජන චීන සමූහාණ්ඩුව විසින් මේ සඳහා පහසුකම් සපයා ඇත.

ගුවන් සන්තරණ සේවා අංශය

ගුවන් සන්තරණ සේවා (ANS) අංශයේ මූලික වගකීම වන්නේ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් අනුගමනය කරන ලද අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පිළිවෙත්වලට (SARPs) අනුකූලව කොළඹ පියාසැරි තොරතුරු කලාපය (කොළඹ FIR) තුළ ගුවන් සන්තරණ සේවා සැපයීම පාලනය කරන නීති රීති සැකසීම සහ එකී ප්‍රමිති ශ්‍රී ලංකාවේ ගුවන් සන්තරණ සේවා සැපයුම්කරු විසින් සම්පාදනය කර ඇති බවට සහතික වීම යි.

ගුවන් සන්තරණ සේවා අධීක්ෂණය සඳහා ANS නියාමන රාමුව යාවත්කාලීන කිරීම

ANS අංශයෙහි වගකීම වන්නේ, 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතෙහි 120 වන වගන්තිය ප්‍රකාරව ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති (IS) ප්‍රකාශයට පත් කරමින්, ඇමුණුම 2, ඇමුණුම 3, ඇමුණුම 4, ඇමුණුම 5, ඇමුණුම 10, ඇමුණුම 11, ඇමුණුම 12, සහ ඇමුණුම 15 යන ICAO ඇමුණුම් අටෙහි අඩංගු ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පිළිවෙත් යොදා ගැනීමයි.

2021 වර්ෂය තුළ, ANS කාර්ය මණ්ඩලය ඉහත සඳහන් ICAO ඇමුණුම්වලට අදාළව ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියේ අඛණ්ඩව නිරත විය. ඒ අනුව, ගුවන් සන්තරණ සේවා විධිමත් කිරීම සඳහා අදාළ වන ICAO ඇමුණුම්වල නවතම අනුවාදයට අනුකූල වන පරිදි පහත ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් යාවත්කාලීන කරන ලදී.

ගගන නාවික සේවා නියාමන ශාඛාව

- ගුවන් ගමන් සේවා පිළිබඳ සංශෝධිත නියාමනය (IS 025 - 3 වන සංස්කරණය).
- ස්වයංක්‍රීය යැපුම් නිරීක්ෂණ විකාශන (ADS-B OUT) මෙහෙයුම් පිළිබඳ සංශෝධිත නියාමනය (IS 064 - 2 වන සංස්කරණය).
- ගුවන් ගමන් සේවා සැපයීමේ දී තෙහෙට්ටුව කළමනාකරණය කිරීම පිළිබඳ නියාමනය (IS096).
- ශ්‍රී ලංකාවේ උපකරණ පියාසර ක්‍රියාපටිපාටිය සැලසුම් කිරීමේ සේවාව පිළිබඳ නියාමන (IS099).
- නිරීක්ෂණ සහ ගැටීම් වළක්වා ගැනීමේ පද්ධති පිළිබඳ සංශෝධිත නියාමන (IS047 - 2 වන සංස්කරණය).
- රේඩියෝ සන්තරණ ආධාරක පිළිබඳ සංශෝධිත නියාමන (IS034- 3 වන සංස්කරණය).
- PANS තත්වයෙහි ද ඇතුළුව සන්නිවේදන ක්‍රියා පටිපාටි පිළිබඳ සංශෝධිත නියාමන (IS038 - 3 වන සංස්කරණය).
- හඬ සන්නිවේදන පද්ධති පිළිබඳ සංශෝධිත නියාමන (IS040- 3 වන සංස්කරණය 01 වන සංශෝධනය).
- AIS පිළිබඳ සංශෝධිත නියාමන (IS028 - 3 වන සංස්කරණය 02 වන සංශෝධනය)

ANS හා සම්බන්ධ ICAO රාජ්‍ය ලිපි පිළිබඳ ක්‍රියාමාර්ගය

රාජ්‍ය ලිපිවල අඩංගු විෂය කරුණු ඵලදායි අයුරින් අප්‍රමාදීව ක්‍රියාත්මක කිරීම, එසේ 2021 වර්ෂයේ දී ANS අංශය මඟින් ICAO රාජ්‍ය ලිපි 92 ක් සලකා බලා ක්‍රියාත්මක කරන ලදී.

විගණන සහ නිරීක්ෂණ කටයුතු

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් (DGCA) විසින් අනුමත කරන ලද “ANS නිරීක්ෂණ සැලැස්ම 2021” ට අනුව මෙම අංශය විසින් අබණ්ඩව කර්මාන්තය පිළිබඳ නිරීක්ෂණ සිදු කරන ලදී. ශ්‍රී ලංකාව තුළ ගුවන් සන්තරණ සේවා සැපයීමේ දී ආරක්ෂක අධීක්ෂණ පද්ධතියේ සඵලතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් මෙහෙයුම් මධ්‍යස්ථාන/පද්ධතිවල නියමිත පරීක්ෂණ හැටතුනක් (63) සිදු කරන ලදී.

- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (VCBI), මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ (VCRI), කොළඹ ගුවන්තොටුපළ - රත්මලාන (VCCC), මඩකලපුව ගුවන්තොටුපළ (VCCB) සහ යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ (VCCJ) හි ATS මෙහෙයුම් මධ්‍යස්ථාන
- VCCC හි සෙවුම් සහ මුදාගැනීමේ (SAR) මධ්‍යස්ථානය
- VCBI හි ගගන නාවික තොරතුරු සේවා (AIS) මධ්‍යස්ථානය
- VCBI හි සිතියම් සහ ප්‍රස්ථාර ඒකකය
- අත්තිඩිය, පිදුරුතලාගල, කඳපොල, VCCC, VCCB, VCBI, VCRI සහ VCCJ හි සන්නිවේදන සන්තරණ සහ නිරීක්ෂණ (CNS) මධ්‍යස්ථාන
- ගුවන් ගමන් සේවාවන්හි ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය.
- කාලසටහන්ගත නොකළ පියාසැරි පරීක්ෂණ පැවැත්වීමේ දී ANS අංශය ගුවන් යෝග්‍යතාව, මෙහෙයුම් සහ ගුවන්සේවා ආරක්ෂක අංශ සමඟ එක්ව කටයුතු කළ අතර 2021 වර්ෂය තුළ පරීක්ෂණ හතරක් පවත්වන ලදී.
- VCRI හි ගගන යාත්‍රාංගණ සහතික අලුත් කිරීමේ විගණනයට ANS අංශය සහභාගී විය.

ආයතනික ප්‍රතිචිල රාමුව (ORF)

ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පිළිවෙත් සහ ජාතික ව්‍යවස්ථාදායක අවශ්‍යතා සඳහා ගුවන් සන්තරණ සේවා සැපයුම්කරුගේ අනුකූලතාවය 2021 වර්ෂය සඳහා ගණනය කරන ලදී.

ATC සිමියුලේටර පරීක්ෂණ සහ ශ්‍රේණිගත කිරීම් ඇගයීම්

ANS අංශය විසින් ගුවන් ගමන් පාලන සේවාව සැපයීමේ දී සංවර්ධිත සහ ස්ථාවර ප්‍රවීණතාවයක් සහතික කිරීම සඳහා ගුවන් ගමන් පාලකයින් පිළිබඳ ATC සිමියුලේටර පරීක්ෂණ තිස් අටක් (38) සහ ශ්‍රේණිගත කිරීම් ඇගයීම් එකොළහක් (11) සිදු කරන ලදී.

රේඩියෝ දුරකථන ක්‍රියා පටිපාටි පරීක්ෂණ

රේඩියෝ දුරකථන (RT) පරීක්ෂණ පැවැත්වීමේ දී ANS අංශය පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර (PEL) අංශය සමඟ සහයෝගයෙන් කටයුතු කළ අතර වාණිජ නියමු බලපත්‍රය (CPL) සහ පෞද්ගලික ගුවන් නියමු බලපත්‍රය (PPL) සඳහා පෞද්ගලික පියාසර පාසල්වල නියමුවන් සඳහා පවත්වනු ලබන RT පරීක්ෂණ සඳහා පරීක්ෂක මණ්ඩලය නියෝජනය කළේය. ඒ අනුව රේඩියෝ දුරකථන පරීක්ෂණ හතළිස් තුනක් (43) පවත්වන ලදී.

ගගන නාවික සේවා නියාමන ශාඛාව

විමර්ශන

ANS අංශය විසින් 2021 වර්ෂයේ ගුවන් ගමන් කළමනාකරණය සම්බන්ධ සිද්ධීන් පිළිබඳ පරීක්ෂණ දෙකක් (2) පවත්වා ඇති අතර, ඒවාහි අරමුණ වී ඇත්තේ එවැනි සිදුවීම් නැවත ඇතිවීම අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සහතික කිරීමයි.

ගුවන් ගමන් බලපත්‍ර / ගොඩබෑමේ නිෂ්කාශනය

කාල සටහන්ගත නොවූ තාක්ෂණික-නැවතුම්/වාණිජ්‍ය නොවන ගොඩබෑමේ පියාසැරි සහ ඉහළින් පියාසර කිරීම සඳහා අනුමැතිය ලබා දීම කාර්යක්ෂමව සිදු කරන ලදී. අපේක්ෂිත මෙහෙයුම් ස්ථානය අනුව ආරක්ෂක අමාත්‍යාංශය (MOD) සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව (SLAF) වැනි අනෙකුත් ආශ්‍රිත ආයතනවල අතිරේක අනුමැතීන්ට යටත්ව ගුවන්සේවා මෙහෙයුම් සඳහා අනුමැතිය ද ලබා දෙන ලදී. ඒ අනුව, ANS අංශය විසින් ශ්‍රී ලංකා භූමියට ඉහළින් පියාසර කිරීම සඳහා කාලසටහන්ගත නොකළ ගුවන්යානා 584 ක් සඳහා අනුමැතිය ලබා දුන් අතර ශ්‍රී ලංකාවට ගොඩබෑම සඳහා අවසර 551 ක් ලබා දෙන ලදී.

ශ්‍රී ලංකාවේ ගුවන්තොටුපළ තුළට රාජ්‍ය තාන්ත්‍රික ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකා භූමියට ඉහළින් පියාසර කිරීමට යෝජනා කළ ගුවන් ගමන් සම්බන්ධයෙන් විදේශ අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කර ඇත. ඒ අනුව, රාජ්‍ය තාන්ත්‍රික ගොඩබෑමේ පියාසැරි සඳහා විරෝධතා නොමැති/විකඟතා සටහන් 153 ක් සහ ශ්‍රී ලංකා භූමියට ඉහළින් පියාසර කිරීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික ගුවන්යානා සඳහා විරෝධතා නොමැති/විකඟතා සටහන් 57 ක් තිබුණි. තවද, ගුවන් ඡායාරූප/වෙළඳ දැන්වීම් පියාසැරි 41 ක් සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

AIP සංශෝධන, AIP අතිරේක, ගගන නාවික තොරතුරු චක්‍රලේඛ (AIC) සහ NOTAM

AIP සංශෝධන එකක් (01), AIP අතිරේක තුනක් (03) සහ ගගන නාවික තොරතුරු චක්‍රලේඛ හතරක් (04) නිකුත් කරන ලද අතර මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳ NOTAM පන්සිය හැත්තෑ නවයක් (579) පරීක්ෂාවට ලක් කර නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

ගුවන් සන්තරණ සේවා සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම

- ගුවන් ගමන් සේවා සපයුම්කරු පිළිබඳ ආරක්ෂණ කළමනාකරණ අත්පොත සමාලෝචනය කර පිළිගන්නා ලදී.
- කොළඹ FIR තුළ 50NM දේශාංශ වෙන් කිරීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද ආරක්ෂණ තක්සේරුව සමාලෝචනය කරන ලදී.
- මාලේ සහ කොළඹ TMA අතර TOC ස්ථානවල දී 30NM යෙදීම සම්බන්ධයෙන් සිදු කරන ලද ආරක්ෂණ තක්සේරුව සමාලෝචනය කරන ලදී.
- VCCC හි Solo Powered AGL ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද ආරක්ෂණ තක්සේරුව සමාලෝචනය කරන ලදී.
- ATS සැපයුම්කරු විසින් පවත්වන ලද ආරක්ෂණ විමර්ශනය සමාලෝචනය කරන ලදී.

ශ්‍රී ලංකා ගුවන් සන්තරණ සැලැස්ම (SLANP) සංවර්ධනය කිරීම

ශ්‍රී ලංකාව සඳහා ගුවන් සන්තරණ සැලැස්ම සංවර්ධනය කිරීම සම්පූර්ණ කර ඒ සඳහා සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා ගන්නා ලදී.

ANS පුහුණුව

ANS ආශ්‍රිත නියාමන කාර්යයන් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් ලෙස පුහුණු වූ කාර්ය මණ්ඩලයක් සංවර්ධනය කිරීම සහතික කිරීම සඳහා, අංශයේ නිලධාරීන්ට සිය වෘත්තීය නිපුණතා ශක්තිමත් කර ගැනීම සහ දැනුමේ සීමාවන් පුළුල් කර ගැනීම සඳහා විෂය කරුණු සම්බන්ධ පුහුණු 76 ක් පවත්වන ලදී.

ICAO සහ අනෙකුත් රැස්වීම්

අධ්‍යක්ෂ - ගුවන් සන්තරණ සේවා සහ ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක - ATMSP, APANPIRG (මාර්ග ගත රැස්වීම) (Virtïl Meeting) හි ගුවන් ගමන් කළමනාකරණ උප සමූහයේ (ATM/SG/8) අටවැනි රැස්වීමේ දී CAASL නියෝජනය කළේය.

කොළඹ FIR තුළ RNP 10 තිරස් වෙන් කිරීමේ ප්‍රමිතීන් යෙදීම පිළිබඳ මාර්ගෝපදේශ සැපයීම සඳහා ගුවන්තොටුපළ සහ ගුවන්සේවා ශ්‍රී ලංකා සමාගම සමඟ රැස්වීමක් පවත්වන ලදී.

ගුවන් ගුරුත්වාකර්ෂණය - චුම්බක සමීක්ෂණය පිළිබඳ රජයේ ව්‍යාපෘතියට සහය වෙමින් ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද රැස්වීම සඳහා ANS අංශය විසින් නියෝජනයක් කළේය.

ගගන නාවික සේවා නියාමන ශාඛාව

වෙළඳ නාවික ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා යුධ හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා රේගුව, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශය, NARA ආයතනය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යන ආයතන සමඟ ජාතික ගගන නාවික සෙවීම් සහ මුදාගැනීමේ සැලැස්ම පිළිබඳ සම්බන්ධීකරණය කර මාර්ග ගත රැස්වීම් පවත්වන ලදී.

ශ්‍රී ලංකා ගුවන් සන්තරණ සැලැස්ම පිළිබඳ ගුවන්තොටුපළ සහ ගුවන්සේවා ශ්‍රී ලංකා සමාගම සමඟ පවත්වන ලද රැස්වීම් නවය සම්බන්ධීකරණය කර මෙහෙයවන ලදී.

ICAO ආසියා/පැසිෆික් සෙවුම් සහ මුදා ගැනීමේ ක්‍රියාකාරී සමූහය (APSAR/WG/6) හි හයවන රැස්වීමට (මාර්ග ගත රැස්වීම) නම් කරන ලද ජ්‍යේෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක - ATM OPS සහ සිවිල් ගුවන්සේවා පරීක්ෂක - ATM OPS සහභාගී විය.

එක්ස්පෝ ලංකා හෝල්ඩින්ග්ස් පීවිල්සී සඳහා ශ්‍රී ලංකාවේ ක්ලවුඩ්ලයින් ගුවන්යානා මෙහෙයුම් පිළිබඳ සාකච්ඡාවට අධ්‍යක්ෂ ANS සහභාගී විය.

ICAO AIS - AIM ක්‍රියාත්මක කිරීමේ කාර්යසාධක බලකායේ (AAITF/16) දහසයවන රැස්වීමට (මාර්ග ගත රැස්වීම) AIS හි සිවිල් ගුවන්සේවා පරීක්ෂකවරු දෙදෙනෙක් සහභාගී විය.

APAC ගුවන් ගමන් කළමනාකරණ උප සමූහයේ (ATM/SG/9) 9 වැනි රැස්වීමට (මාර්ග ගත රැස්වීම) ANS අංශය සහභාගී විය.

ATS වෙන් කිරීමේ ප්‍රමිතීන් සාකච්ඡා කිරීම සඳහා ANS අංශය සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ නියෝජිතයන් සහ AASL හි ATS සහ E/ ANE නිලධාරීන් සමඟ රැස්වීමකට සහභාගී විය.

ATS සැපයුම්කරු පිළිබඳ ආරක්ෂණ කළමනාකරණ අත්පොත සමාලෝචනය කිරීම සඳහා AASL සමඟ අතථ්‍ය රැස්වීම් (Viratual Meetings) දෙකක් පවත්වන ලදී.

කොළඹ පියාසැරි තොරතුරු කලාපය තුළ සෙවීම් සහ මුදාගැනීමේ (SAR) සේවා

SAR සේවා සැපයීම සම්බන්ධයෙන් රාජ්‍ය වගකීම ඵලදායී අයුරින් ඉටු කිරීම සහතික කිරීමට රැස්වීම් සහ ක්‍රියාකාරී කණ්ඩායම් පිහිටුවීම හරහා CAASL විසින් සිදු කරන ලද මැදිහත්වීම් මඟින් පවත්වාගෙන යනු ලබන ගගන නාවික මුදාගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (ARCC) සහ ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ස්ථාපිත කර පවත්වාගෙන යනු ලබන සමුද්‍රීය මුදාගැනීම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (MRCC) අතර සම්බන්ධීකරණ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

CAASL විසින් ජාතික ගගන නාවික සෙවීම් සහ මුදාගැනීමේ සැලැස්මක් (NASARP) පිහිටුවීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. මේ සම්බන්ධයෙන් ජාතික ගගන නාවික සෙවීම් සහ මුදාගැනීමේ සැලැස්මේ මූලික කෙටුම්පත සකස් කරන ලද අතර ආරක්ෂක අමාත්‍යාංශයේ (MOD) සහ ගුවන්සේවා සහ අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය හරහා මෙම ලේඛනය ඉහත සැලැස්මේ පාර්ශ්වකරුවන් ලෙස හඳුනාගෙන තිබෙන ආරක්ෂක ආයතන සහ අනෙකුත් රාජ්‍ය ආයතන වෙත යොමු කරන ලදී. සැලැස්මේ සවිස්තරාත්මකව දක්වා ඇති කාර්යභාරය හඳුනා ගැනීමටත් ගගන නාවික සෙවීම් සහ මුදාගැනීමේ ප්‍රයත්නයක් සඳහා ඔවුන්ගේ උපරිම දායකත්වය ලබා දීම සඳහා තවදුරටත් ප්‍රතිසංස්කරණ සිදු කිරීමටත් පාර්ශවකරුවන්ට දැනුම් දෙන ලදී. සැලැස්ම අවසන් කිරීම සඳහා SAR පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවීම සඳහා කටයුතු සිදු කරන ලද අතර, වසර අවසානයේ දී එක් එක් පාර්ශ්වකරුවන් සඳහා ලැබෙන ප්‍රතිපෝෂණ සහ එකඟතා පාදක කොටගෙන මූලික කෙටුම්පත අවසන් කිරීමට හැකි විය. මේ වන විට CAASL සංශෝධන සමාලෝචනය කර ඒවා NASARP වෙත ඇතුළත් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

SAR සේවා සැපයීම සහතික කිරීම සඳහා ගගන නාවික සෙවීම් සහ මුදාගැනීම් පිළිබඳ සංස්ථාව සම්බන්ධයෙන් GOSL සහ GOI අතර ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා ඉන්දියාවේ විදේශ අමාත්‍යාංශය සහ ගුවන්තොටුපළ අධිකාරිය සමඟ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය අඛණ්ඩව සම්බන්ධ විය.

CAASL හි ARCC සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ MRCC අතර අවබෝධතා ගිවිසුම ANS විසින් සකස් කර අවසන් කරන ලද අතර, අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා එම ලේඛනය ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත යවන ලදී. අදාළ පාර්ශ්ව දෙක අතර අත්සන් කිරීම සඳහා එකී ලේඛනය සභාගත කිරීමට ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියේ ශ්‍රී ලංකා නාවික හමුදාව නිරතව සිටී.

ගගන නාවික සේවා නියාමන ශාඛාව

ANS සැපයීමට අදාළ නියාමන රාමුව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම

පහත සඳහන් ක්ෂේත්‍රයන්හි මාර්ගෝපදේශ අත්පොත් සංවර්ධනය කිරීම,

- ශ්‍රී ලංකාවේ IFP සැලසුම් සේවාව (95% ක් සම්පූර්ණ කර ඇත).
- ATS SMS අධීක්ෂණය සඳහා වන මාර්ගෝපදේශ අත්පොත (85% ක් සම්පූර්ණ කර ඇත).
- ATSP සැපයීමේ දී තෙහෙට්ටුව අධීක්ෂණය සඳහා වන මාර්ගෝපදේශ අත්පොත (50% ක් සම්පූර්ණ කර ඇත).
- AIS සැපයුම්කරු සහ දත්ත නිර්මාණකරුවන් සමඟ විධිමත් විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වන මාර්ගෝපදේශ අත්පොත (50% ක් සම්පූර්ණ කර ඇත).
- ATS SMM ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ක්‍රියාකාරී පුද්ගලයන් සඳහා වන මාර්ගෝපදේශ අත්පොත (50% ක් සම්පූර්ණ කර ඇත).
- ANSP ක්‍රියා කරන පියාසැරි - රේඩියෝ සන්තරණ ආධාරක ක්‍රමාංකනය සඳහා වන මාර්ගෝපදේශ අත්පොත (75% ක් සම්පූර්ණ කර ඇත)

USOAP අඛණ්ඩ අධීක්ෂණ ප්‍රවේශය (CMA) ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ නිවැරදි කිරීමේ ක්‍රියාකාරී සැලසුම්

අවශ්‍ය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති සහ අනෙකුත් අදාළ ලියකියවිලි ක්‍රමානුකූලව යාවත්කාලීන කරමින් නිවැරදි ක්‍රියාකාරී සැලසුම් (CAP) ක්‍රියාවට නැංවීමේ ක්‍රියාවලියට ANS කාර්ය මණ්ඩලය අඛණ්ඩව සහභාගී වූ අතර කර්මාන්තයේ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම ප්‍රදර්ශනය කිරීම සඳහා ආයතනය සූදානම් කිරීමේ අරමුණින් ගුවන් සන්තරණ සේවා සැපයුම්කරු සමඟ සම්බන්ධ විය.

ගෝලීය වාර්තාකරණ ආකෘතිය (GRF) ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාවේ GRF ක්‍රියාත්මක කිරීම සඳහා CAASL හි ගගන යාත්‍රාංගණ අංශය සමඟ ANS අංශය සහයෝගයෙන් කටයුතු කළේය. AE අංශය විසින් පවත්වන ලද GRF පුහුණුවීම් සඳහා ANS අංශය සහභාගී වූ අතර, ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක- ATMSP සහ සිවිල් ගුවන්සේවා පරීක්ෂක - AIS (D) විසින් පිළිවෙළින් ATC, AIS නිලධාරීන්/සි.ගු.සේ.අ. හි ආරක්ෂක කණ්ඩායම සඳහා GRF ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණු සැසි දෙකක් පවත්වන ලදී.

සි.ගු.සේ.අ. හි ගුවන් සන්තරණ සේවා අංශය විසින් GRF මත සංවර්ධනය කරන ලද SOP සමාලෝචනය කරන ලද අතර GRF ක්‍රියාත්මක කිරීම සඳහා සි.ගු.සේ.අ. හි ගුවන් සන්තරණ සේවා අංශය විසින් සකස් කරන ලද ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය සමාලෝචනය කරන ලදී.

"ගුවන්සේවාවේ අනාගත සංවර්ධනය සඳහා කොළඹ පියාසැරි තොරතුරු කලාපය නැවත සකස් කිරීම/ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ වෙතිහාසික අධ්‍යයනය" පිළිබඳ තක්සේරුව

පහත සඳහන් ක්ෂේත්‍රවලින් සමන්විත "ගුවන්සේවාවේ අනාගත සංවර්ධනය සඳහා කොළඹ පියාසැරි තොරතුරු කලාපය නැවත සකස් කිරීම/ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ වෙතිහාසික අධ්‍යයනය"ට අදාළ වාර්තාව සකස් කිරීම.

පියාසැරි තොරතුරු කලාපය, FIR සීමා නිර්ණය කිරීමේදී සලකා බලන සාධක, තක්සේරු කිරීමට හේතු, කොළඹ පියාසැරි තොරතුරු කලාපය, කොළඹ FIR හි මානයන්, කොළඹ FIR පරිණාමය, FIR තුළ සන්තරණ සේවා සැපයීමට අදාළ වත්මන් තත්වය, ගුවන් අවකාශය පැවරීමෙන් ඇතිවන ආර්ථික බලපෑම, ගුවන් අවකාශය නැවත ලබා ගැනීමට ගත් ක්‍රියාමාර්ග/ඒවාහි ප්‍රගතිය (95% ක් සම්පූර්ණ කර ඇත).

සේවා ගිවිසුම්

මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය දෙකෙන්ම ගගන නාවික සිතියම් සහ යානා සිතියම් සහ ප්‍රස්ථාර නොමිලේ සැපයීම සඳහා පෙපිසන් සමඟ පැවති සේවා ගිවිසුම අලුත් කරන ලදී.

සංස්ථා කටයුතු සහ කාර්යාල කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා දායකවීම

අඛණ්ඩ යොමු කිරීම් සහ සමාලෝචන හරහා, CAASL කාර්යාල අත්පොතෙහි පවතින අත්පොත්, පිරික්සුම් ලැයිස්තු, මාර්ගෝපදේශ සහ ANS පරිච්ඡේදය යාවත්කාලීන කරන ලදී.

CAASL වෙබ් අඩවියක ANS අංශයේ තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කර ඒ අනුව එය යාවත්කාලීන කරන ලදී.

පියාසර නිරුපද්‍රතතා නියාමන ශාඛාව



"සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක්"

පියාසර නිරුපද්‍රතතා නියාමන ශාඛාව

පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර අංශය

අදාළ වන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා නිර්දේශිත පරිචයන්ට අනුකූලව සිවිල් ගුවන්සේවා සම්බන්ධව නිරුපද්‍රතතා සංවේදී ක්‍රියාකාරකම්වල නියැලී සිටින පුහුණු සංවිධාන සහ පුද්ගලයන් සහතික කිරීම හා සෝදිසි කිරීම සම්බන්ධ නීති රීති හා ක්‍රියාපටිපාටි සංවර්ධනය කිරීම සඳහා පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර අංශය වගකිව යුතු වේ.

සිවිල් ගුවන්සේවා අධිකාරියේ පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර අංශය විසින් 2021 වසර තුළ පාරිභෝගිකයන් තෘප්තිමත් කරමින් ගුවන්සේවා ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලීම සඳහා සිය ශක්‍යතාව තවදුරටත් වර්ධනය කර ගෙන තිබේ.

- අක්‍රිය කාලසීමාව තුළ, ICAO අවශ්‍යතාවක් ලෙස අයදුම්කරුගේ සෞඛ්‍ය තත්වයට යටත්ව මාර්තු 31 වන තුරු දින 90 ක් දක්වා සහ දින 45 ක සිට ඉදිරියට කාල සීමාව දීර්ඝ කිරීමක් සියලුම බලපත්‍රලාභීන්ට ලබා දී ඇත. අක්‍රිය කාලසීමාව තුළ බලපත්‍රලාභියාගේ ප්‍රවීණතා පරීක්ෂණ අලුත් කිරීම සහ ශ්‍රේණිගත කිරීම් ක්‍රියාකරුගේ බලතල පිළිබඳ තහවුරු කිරීමකට යටත්ව දීර්ඝ කරන ලදී.
- "ගූගල් මීට්" පහසුකම භාවිතයෙන් අංශ රැස්වීම් පවත්වන ලදී. ඇමුණුම-1 හි නිර්දේශිත පිළිවෙත් අනුව මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීම සඳහා සියලුම පරීක්ෂකවරු සම්බන්ධ වූහ.
- ගුවන්යානා කාර්ය මණ්ඩල බලපත්‍ර සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති (IS) - 72, ප්‍රතිශීතනය සඳහා සංවර්ධනය කරන ලද අතර එය 2021 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක කරන ලදී. IS 72 හි අවශ්‍යතා අනුව නිපුණතා පරීක්ෂණ පෝරම, පිරික්සුම් ලැයිස්තු සහ අයදුම්පත් සකස් කරන ලදී. කර්මාන්තය සමඟ ක්‍රියාත්මක කිරීමේ වැඩමුළු සහ රැස්වීම් පවත්වන ලදී.
- IS 72 ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා DFOI රැස්වීම් පවත්වන ලදී.
- IS 72 අනුව නව ගුවන්යානා කාර්ය මණ්ඩල බලපත්‍රයක් නිකුත් කිරීම. IS 72 හි අවශ්‍යතාවන්ට අනුකූලව මාර්ග ගත බලපත්‍ර පද්ධතිය යාවත්කාලීන කිරීම
- SLCAP-3030 හි 2 වන කොටසේ සඳහන් ආකාරයට ගුවන්යානා සඳහා අධිකාරී අවශ්‍යතා කෙටුම්පත් කිරීම. IS 49, IS 50 සහ IS 55 වැනි දැනට පවතින ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්හි යාවත්කාලීන කිරීම් සම්පූර්ණ කරන ලදී.
- පවතින පරීක්ෂණ ක්‍රමය වැඩිදියුණු කිරීම අඛණ්ඩව සිදු විය. IS 72 හි පරීක්ෂණ අවශ්‍යතාවලට අනුකූලව පරීක්ෂණ ක්‍රියා පටිපාටිය යාවත්කාලීන කරන ලදී.
- ගුවන්යානා නඩත්තු පරීක්ෂණය අයදුම්කරුවන් 1100 ක් සඳහා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී සාර්ථකව පවත්වන ලද අතර වසංගතය හේතුවෙන් වසරේ දෙවන භාගය සඳහා සැලසුම් කර තිබූ AML පරීක්ෂණය කල් දමන ලදී.
- NIB අයදුම්පත් සකස් කර රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අතර ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලැබුණු නිෂ්කාශනය ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත යවා CAASL වෙබ් අඩවියේ පළ කරන ලදී.
- වසංගතය හේතුවෙන් වෙනත් රාජ්‍යයන් වෙතින් තොරතුරු ලැබීම සීමා කර ඇති බැවින් බලපත්‍ර සත්‍යාපන ලබා ගැනීමෙන් පසු ගුවන් නියමුවන් සහ නඩත්තු සේවකයන් සඳහා විදේශ බලපත්‍ර වලංගුකරණ සහතික නිකුත් කරන ලදී.

පියාසර නිරුපදුතතා නියාමන ශාඛාව

පුද්ගල හා ගුවන්සේවා පුහුණු සංවිධාන සහතික කිරීම, ඒවාහි ක්‍රියාකාරකම් අඛණ්ඩව නිරීක්ෂණය කිරීම සහ ආරක්ෂක ඌනතාවලට විසඳුම් ලබා දීම	නියමු බලපත්‍රය	1,135
	පියාසර උපදේශක (AFI සහ FI) බලපත්‍රය	9
	භූමි උපදේශක බලපත්‍රය	22
	විදේශ බලපත්‍ර වලංගුකරණ සහතිකය	29
	ගුවන් ගමන් පාලන බලපත්‍ර	163
	ගුවන්යානා නඩත්තු බලපත්‍ර	118
	ගුවන්යානා මැදිරි කාර්ය මණ්ඩල සහතිකය	193
	සිවිල් ගුවන්සේවා දැනුම පිළිබඳ පරීක්ෂණ	2,535
ගුවන්සේවා පුහුණු සංවිධාන සහතික කිරීම, ඒවාහි ක්‍රියාකාරකම් අඛණ්ඩව නිරීක්ෂණය කිරීම සහ ආරක්ෂක ඌනතාවලට විසඳුම් ලබා දීම	පුහුණු සංවිධාන අඛණ්ඩ පරීක්ෂණය	08
	ආසියානු ගුවන්සේවා මධ්‍යස්ථානය	1
	ෆිට්ස් එයාර් ඇකඩමිය	1
	ශ්‍රී ලංකා TRTO	1
	ATC පුහුණු මධ්‍යස්ථානය	1
	ෆ්ලයි සඳර්න් (ප්‍රයිවට්) ලිමිටඩ්	1
	සකුරායි ගුවන්සේවා ඇකඩමිය	1
	ලක්වින් ගුවන්සේවා (ප්‍රයිවට්) ලිමිටඩ්	1
	රෙඩ් බර්ඩ් ගුවන්සේවා (ප්‍රයිවට්) ලිමිටඩ්	1
	බලපත්‍ර නිරීක්ෂණ	6
ගුවන්යානා කාර්ය මණ්ඩල (Flight Crew) බලපත්‍ර (පෞද්ගලික නියමු බලපත්‍රය (PPL) / ගුවන් ප්‍රවාහන නියමු බලපත්‍රය (ATPL) සඳහා දැනුම පරීක්ෂණ පැවැත්වීම	භාරදුන් ප්‍රශ්න පත්‍ර ප්‍රමාණය - PPL	463
	භාරදුන් ප්‍රශ්න පත්‍ර ප්‍රමාණය - ATPL	737
ගුවන්යානා නඩත්තු සේවකයන් සඳහා දැනුම පරීක්ෂණ පැවැත්වීම	භාරදුන් ප්‍රශ්න පත්‍ර ප්‍රමාණය - AML	1,120
RT සහ ELPC සඳහා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම	PPL / CPL සඳහා RT සංඛ්‍යාව	64
	ELPC සංඛ්‍යාව	124
මාලදිවයින් අපේක්ෂකයන් සඳහා PPL / CPL / ATPL දැනුම පරීක්ෂණ පැවැත්වීම	භාරදුන් ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව	2
රාජ්‍ය ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම	අනුමත ආරක්ෂක කළමනාකරුවන් සංඛ්‍යාව	8
	පුහුණු පාසල්වල අනුමත ආරක්ෂක කළමනාකරණ පද්ධති අත්පොත් ගණන	8

පියාසර නිරුපද්‌රතතා නියාමන ශාඛාව

ගුවන්යානා මෙහෙයුම් අංශය

ක්‍රියාකරුවන්ගේ ඵලදායී ආරක්ෂක අධීක්ෂණය සඳහා, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) විසින් අනුගමනය කරන ලද අද්‍යාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පිළිවෙත් (SARP) වලට අනුකූලව දේශීය රෙගුලාසි, නීති, නියෝග සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම සඳහා ගුවන්යානා ආරක්ෂණ නියාමන අංශය යටතේ ඇති ගුවන්යානා මෙහෙයුම් අංශය මූලික වශයෙන් වගකිව යුතුය. ගුවන්සේවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන, අයදුම්කරුවන් විසින් මූලික අයදුම් කිරීම හෝ අලුත් කිරීම හෝ සිදු කළ යුතු බලපත්‍ර කිහිපයක් පහතින් දැක්වේ.

- ගුවන් ක්‍රියාකරු සහතිකය
- විදේශ ගුවන් ක්‍රියාකරු සහතිකය
- අන්තරායකර භාණ්ඩ බලපත්‍රය
- ගොඩබිම හැසිරවීම (Ground Handling) බලපත්‍රය
- භූමි ආධාරක සේවා (Ground Support Services) බලපත්‍රය

නියාමන සංවර්ධනය

මෙහෙයුම් අංශය විසින් 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 78 වන වගන්තිය යටතේ අන්තරායකර භාණ්ඩ සඳහා රෙගුලාසි සකස් කර ඇති අතර එකී ලේඛනය තක්සේරු කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කොට ඇත.

ගුවන් ක්‍රියාකරු සහතික

ගුවන් ක්‍රියාකරු සහතික සඳහා වන මූලික අයදුම්පත් හත (7) ක් ගුවන්යානා මෙහෙයුම් අංශයට ලැබී ඇති අතර ඒවා සමාලෝචනය වෙමින් පවතී;

- ඕපන් ස්කයිස්
- ෆ්ලයි ලංකන් ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ්
- රෙඩ් බර්ඩ් ඒවියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
- ලක්වින් ඒවියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
- ස්පාක් එයාර්
- අවුරා එයාර්ලයින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
- එයාර් කලම්බු

හෙලිටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් අවලංගු වූ ගුවන් ක්‍රියාකරු සහතිකය නැවත සක්‍රිය කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටී.

2021 වර්ෂය සඳහා පහත සඳහන් ගුවන් සමාගම් හය (06) සඳහා මෙහෙයුම් අංශය මඟින් ගුවන් ක්‍රියාකරු සහතික අලුත් කරන ලදී.

- ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
- ෆිට්ස් ඒවියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
- සෙනොක් ඒවියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
- සැෆ්රොන් ඒවියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
- IWS ඒවියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
- ෆල්යි සඳර්න් (ප්‍රයිවට්) ලිමිටඩ්

විදේශ ගුවන් ක්‍රියාකරු සහතික

මෙහෙයුම් අංශය මඟින් නිකුත් කරන ලද විදේශ ගුවන් ක්‍රියාකරු සහතික විසිනවයක් (29) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ගුවන් සමාගම්හි මෙහෙයුම් සේවා සඳහා අලුත් කරන ලද අතර 2021 දී විදේශ ගුවන් ක්‍රියාකරු සහතික නවයක (09) පළමු නිකුතුව සිදු කරන ලදී. නව විදේශ ගුවන් ක්‍රියාකරුවන් වන්නේ;

- මෝල්ඩිවියන් එයාර්ලයින්ස්
- ජසීරා එයාර්වේස්
- යුක්රේන් ඉන්ටර්නැෂනල් එයාර්ලයින්ස්
- එයාර් ඇස්තානා
- එයාර් ෆැල්කන්
- එරොෆ්ලෝට්
- වියට්නාම් එයාර්ලයින්ස්
- එයාර් ෆ්‍රාන්ස්
- මන්තා එයාර්

අන්තරායකර භාණ්ඩ ප්‍රවාහනය

ගුවන්යානා මෙහෙයුම් අංශය විසින් 2021 වර්ෂය සඳහා අන්තරායකර භාණ්ඩ බලපත්‍ර දොළහක් (12) අලුත් කරන ලදී.

අන්තරායකර භාණ්ඩ බලපත්‍ර සඳහා මූලික අයදුම්පත් දෙකක් ගුවන්යානා මෙහෙයුම් අංශය වෙත ලැබී ඇති අතර ඒවා ඇගයීම් ක්‍රියාවලිය යටතේ පවතී;

- ෆ්ලයි දුබායි
- ඕමාන් එයාර්

පියාසර නිරුපද්‍රතතා නියාමන ශාඛාව

ගොඩබිම හැසිරවීම් බලපත්‍රය

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම, ගොඩබිම හසුරුවන්නෙකු (Ground Handler) ලෙස සහතික කිරීමේ දී ප්‍රකාශිත ප්‍රමිතීන්ට අනුකූලද යන්න තහවුරු කිරීම සඳහා 2021 දී පුළුල් විගණනයක් සිදු කරන ලදී.

භූමි ආධාරක සේවා බලපත්‍රය

භූමි ආධාරක සේවා බලපත්‍රය නිකුත් කිරීම / අලුත් කිරීම, 2021 සිට ගුවන්යානා මෙහෙයුම් අංශයේ විෂය පථය යටතට ඇතුළත් කෙරේ.

නම් කරන ලද නියමු අධීක්ෂණ පරීක්ෂාව / නියමු ප්‍රවීණතා පරීක්ෂාව

ගුවන්යානා කාර්ය මණ්ඩල සාමාජිකයන් දාහතක් (17) සඳහා වන, නම් කරන ලද නියමු අනුමැතීන්හි අලුත් කිරීම සිදු කරන ලද අතර 2021 වසර සඳහා අනුමැතීන් පහක (05) පළමු නිකුතුව සිදු කරන ලදී.

2021 දී සිදු කිරීමට නියමිත නියමු ප්‍රවීණතා පරීක්ෂණ (PPC) සඳහා අනුමැතීන් අසූ හතක් (87) ලබා දෙන ලදී.

නම් කරන ලද පියාසර මෙහෙයුම් පරීක්ෂකවරුන්

දක්ෂ FOI නිලධාරීන්ගේ හිඟය හේතුවෙන්, නියාමන කාර්යයන් සහ නිරීක්ෂණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය වූ පරිදි සහ අවශ්‍ය වූ විට, CAASL සඳහා හෝ ඒ වෙනුවෙන් ඇතැම් නියාමන රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීමට අධිකාරිය විසින් බලය පවරා ඇති, නම් කරන ලද පියාසර මෙහෙයුම් පරීක්ෂකවරුන් සේවයේ යොදවා ඇත. එවැනි නම් කරන ලද පියාසර මෙහෙයුම් පරීක්ෂකවරුන් හතර දෙනෙකුගෙන් යුත් (04) අධිකාරිය සඳහා බලය පැවරීමේ නෛතික ලේඛනය 2021 දී අලුත් කරන ලදී.

නිරීක්ෂණ කටයුතු

ඵලදායී ආරක්ෂක අධීක්ෂණ පද්ධතියක් සහතික කිරීම සඳහා අනුමත නිරීක්ෂණ සැලැස්මට අනුව CAASL නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා දේශීය සහ විදේශීය ගුවන් ක්‍රියාකරුවන් පිළිබඳ අබණ්ඩ නිරීක්ෂණ සිදු කරනු ලැබේ. සමස්ත ගුවන්සේවා කර්මාන්තයම අර්බුදයට ලක් කළ කොවිඩ්-19 වසංගතය හේතුවෙන්, 2021 සඳහා අනුමත නිරීක්ෂණ කටයුතුවලින් 40% ක් පමණ මෙහෙයුම් අංශය විසින් සිදු කරන ලදී.

නිරීක්ෂණ ක්‍රියාකාරකම් අතරට ප්‍රධාන මූලික විගණන, බෑවුම් පරීක්ෂාව (Ramp Inspection), පුහුණු නිරීක්ෂණ, අන්තරායකර භාණ්ඩ ක්‍රියාකරුවන්, අන්තරායකර භාණ්ඩ හසුරුවන්නන්, අන්තරායකර භාණ්ඩ තොග, අනතුර් මාර්ග පරීක්ෂාව, සිමියුලේටර පරීක්ෂණය, නම් කරන ලද නියමු පරීක්ෂාව සහ ගොඩබිම හැසිරවීමේ පරීක්ෂණය (Ground Handling Inspection) ඇතුළත් විය. මීට අමතරව 2021 සඳහා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපළ පරීක්ෂා කිරීම් සිදු කරන ලදී.

ගුවන්යානා ලියාපදිංචි සහ ගුවන් යෝග්‍යතා අංශය

අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ නිර්දේශිත පිළිවෙත්වලට අනුකූලව ශ්‍රී ලංකාව තුළ සිවිල් ගුවන්යානා ලියාපදිංචි කිරීමේ නීති රීති සහ ක්‍රියා පටිපාටිය සකස් කිරීමේ ප්‍රධාන වගකීම ගුවන්යානා ලියාපදිංචි සහ ගුවන් යෝග්‍යතා අංශයට පැවරී ඇත. නඩත්තු පුහුණු සංවිධාන, අබණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධාන සහ ගුවන්යානා නඩත්තු සංවිධාන සඳහා අනුමැතිය ප්‍රදානය කිරීම සහ ඒවායේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම ද මෙම අංශයට අන්තර්ගත කාර්යයන් වේ.

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති සියලුම ගුවන්යානාවල ගුවන් යෝග්‍යතාවට අදාළ කාර්යයන් සහ ශ්‍රී ලංකාව වෙත ක්‍රියාත්මක වන සියලුම සිවිල් ලියාපදිංචි ගුවන්යානා පිළිබඳ නිරීක්ෂණ මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

2021 දෙසැම්බර් මස අවසන් වන විට ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්යානා ලියාපදිංචි කිරීම් 80 ක් වූ අතර විශාල ගුවන්යානා 25 ක් (MTOW>5700KGS), සැහැල්ලු ගුවන්යානා 43 ක්, හෙලිකොප්ටර් 07 ක්, බැලූන් 04 ක් සහ අධි සැහැල්ලු ගුවන්යානා 01 ක් වියට ඇතුළත් වේ.

නියාමන සංවර්ධනය

2021 වර්ෂයේ දී, අබණ්ඩ ගුවන් යෝග්‍යතාව සඳහා වන අවශ්‍යතා පිළිබඳ IS-M හි 2021 ඔක්තොම්බර් 29 දිනැති සංශෝධන 00, 3 වන සංස්කරණය නිකුත් කරන ලදී.

පියාසර නිරුපදුතතා නියාමන ශාඛාව

එමෙන්ම "ජාතිකත්ව සලකුණු සහ ලියාපදිංචිය පිළිබඳ රෙගුලාසි", නෛතික කෙටුම්පත්කරුගේ අවසන් කිරීම යටතේ පවතී.

"ඉන්ධන සහ ලිහිසි තෙල් සේවා සැපයුම්කරුගේ සහතික කිරීම පිළිබඳ රෙගුලාසි", කෙටුම්පත් කිරීමේ අදියරෙහි පවතී.

සිදු කරන ලද සහතික කිරීමේ කටයුතු

- ගුවන්යානාවන්හි ගුවන් යෝග්‍යතාව 2021 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා, ගුවන් යෝග්‍යතාව පිළිබඳ සහතික 04 ක පළමු නිකුතුව ද තවත් සහතික 54 ක අලුත් කිරීම ද සිදු කරන ලදී.
- අනුමත නඩත්තු සංවිධාන (AMO) නඩත්තු සංවිධාන (විදේශීය) සහතික 03 ක පළමු නිකුතුව සිදු කොට තිබේ. වාර්ෂික විගණනය සිදු කිරීමෙන් පසු නඩත්තු සංවිධාන (දේශීය) සහතික 10 ක් අලුත් කරන ලද අතර අනුමත නඩත්තු සංවිධාන (විදේශීය) සහතික 55 ක් ද අලුත් කරන ලදී. රත්මලාන ජාත්‍යන්තර ගුවන්තොටුපළ(RMA), බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ (JAF) හි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සඳහා විශේෂ නඩත්තු සංවිධාන අනුමැතීන් ලබා දී ඇත.

  වැඩමුළු ශක්‍යතා අනුමත කිරීම් 21 ක් ද ලබා දෙන ලදී. ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමේ නඩත්තු පහසුකම පිළිබඳව පුළුල් විගණනයක් සිදු කරන ලදී.
- ගුවන්යානා ලියාපදිංචි කිරීම් 2021 දෙසැම්බර් මස අවසන් වන විට නව ගුවන්යානා 03 ක් ලියාපදිංචි කර ඇති අතර 69 ක ලියාපදිංචිය අලුත් කර ඇත. සමාලෝචිත කාලසීමාව තුළ, ශ්‍රී ලංකා ගුවන්යානා ඇණියේ මුළු ගුවන්යානා 02 ක් ලියාපදිංචියෙන් ඉවත් කර ඇති අතර ගුවන් යෝග්‍යතාව පිළිබඳ අපනයන සහතිකයක් නිකුත් කර නොමැත.
- නඩත්තු පුහුණු සංවිධාන (MTO) වාර්ෂික විගණනය පැවැත්වීමෙන් පසු අනුමත නඩත්තු පුහුණු සංවිධාන සහතික 02 ක් අලුත් කරන ලදී.
- අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධාන (CAMO) වාර්ෂික විගණනයෙන් පසු අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සහතික 06 ක් නිකුත් කරන ලදී.

නිරීක්ෂණ කටයුතු

- ආරක්ෂාව පිළිබඳ අධීක්ෂණය කර්මාන්තයෙන් හඳිසි අවස්ථා පිළිබඳ වාර්තා 164 ක් ලැබුණු අතර ආරක්ෂාව පිළිබඳ අධීක්ෂණ වැඩසටහනේ කොටසක් ලෙස ඒවා විශ්ලේෂණය කරන ලදී.
- බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම් "Cessna 4R-HDE" සහ "4R-HDC" ලියාපදිංචියෙන් ඉවත් කරන ලදී.

වෙනත් කාර්යයන්

- අමතර කොටස් අනුමත කිරීම ගුවන්යානා නඩත්තු කිරීම සඳහා අවශ්‍ය ආනයන/අපනයන අමතර කොටස් සඳහා ක්‍රියාකරුවන් සහ නඩත්තු පහසුකම් රැසක් සඳහා ලිපි 110 ක් නිකුත් කරන ලදී.

ගුවන්සේවා ආරක්ෂක නියාමන ශාඛාව



"සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක්"

ගුවන්සේවා ආරක්ෂක නියාමන ශාඛාව

ගුවන්සේවා ආරක්ෂක අංශය

ගුවන්සේවා ආරක්ෂක අංශයේ මූලික අරමුණ වන්නේ භූමියේ හෝ ගුවනේ සිදු කරන ලද නීති විරෝධී මැදිහත්වීම්වලට එරෙහිව සිවිල් ගුවන්සේවා සපයන ගුවන්තොටුපළක මගීන්ගේ, ගුවන් කාර්ය මණ්ඩලයේ, ගුවන්තොටුපළ සේවක පිරිසේ සහ මහජනතාවගේ ආරක්ෂාව සහතික කරමින් ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා සඳහා නිසි අධිකාරිය වන DGCA වෙනුවෙන් රට තුළ සිවිල් ගුවන්සේවා කර්මාන්තයේ ආරක්ෂක කටයුතු නියාමනය කිරීම වේ.

ICAO හි සාමාජික රාජ්‍යයක් ලෙස, ප්‍රමිති සහ නිර්දේශිත පිළිවෙත්වලට අනුකූල වූ ක්‍රියාමාර්ග එකතුවක් සහ ජාත්‍යන්තර, ජාතික සහ ගුවන්තොටුපළ මට්ටමින් විවිධ මානව හා ද්‍රව්‍යමය සම්පත් එකතුවක් හරහා මෙය සිදු කෙරේ. මෙම මූලික පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා, ICAO ඇමුණුම 17 - ආරක්ෂාව යන්නෙහි විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලංකාවේ ජාතික සිවිල් ගුවන්සේවා ආරක්ෂණ වැඩසටහන (NCASP) සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ සමාලෝචනය කිරීම මෙම අංශයට පවරා ඇත.

නියාමන සංවර්ධනය

2021 වර්ෂයේ දී, ගුවන්සේවා ආරක්ෂක අංශය නියෝජනය කරමින් පහත සඳහන් සිවිල් ගුවන්සේවා නියාමන වර්ධනයන් සඳහා මෙම අංශය දායක විය.

- යුධෝපකරණ හෝ වෙනත් යුද මෙවලම් ප්‍රවාහනය කිරීමේ රෙගුලාසි
- CAASL බලාත්මක කිරීමේ අත්පොතෙහි ඇතුළත් කළ යුතු විභව ගුවන්සේවා ආරක්ෂක උල්ලංඝණයන්
- ගුවන්සේවා ආරක්ෂක සේවා සැපයුම්කරුවන්ගේ බලපත්‍රය පිළිබඳ නව ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය
- ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය 46 - ගුවන්යානා සඳහා වන ගොඩබිම් හැසිරවීමේ (Ground Handling) කටයුතු පිළිබඳ විධිවිධාන, පහසුකම් සහ/හෝ සේවා සඳහා බලපත්‍ර නිකුත් කිරීම
- විධාන අංක 006 - භූමි ආධාරක සේවා (Ground Support Services) (අන්වර්ථ නාමය - ස්ථාවර පදනම් ක්‍රියාකරු) බලපත්‍රය නිකුත් කිරීම

ගුවන් ආරක්ෂණ කටයුතු සම්බන්ධයෙන් ආරක්ෂක පාර්ශ්වකරුවන් යොමු කිරීම සඳහා ආරක්ෂක විධාන දෙකක් (02) අනුගමනය කරමින් මෙම කොටස නිකුත් කරන ලදී.

- සිවිල් ගුවන්තොටුපළවල සිවිල් ගුවන්සේවා මෙහෙයුම් සඳහා පාලන ගුවන්සේවා ආරක්ෂණ පියවර ශක්තිමත් කිරීම; ශ්‍රී ලංකාව. (ක්‍රියාත්මක වන දිනය- 2021/02/17)
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ වෙතින් ආරම්භ වී ජපානය වෙත සිදු කරන සෘජු ගුවන් ගමන් සඳහා වන පාලන ආරක්ෂක පියවරයන් වැඩිදියුණු කිරීම. (ක්‍රියාත්මක වන දිනය - 2021/07/19)

මාර්ගෝපදේශ සංවර්ධනය

2021 වර්ෂයේ දී ගුවන්සේවා ආරක්ෂක අංශය විසින් පහත සඳහන් මාර්ගෝපදේශ සමාලෝචනය කරන ලදී.

- SLCAP 1000 - ගුවන්සේවා ආරක්ෂණ කර්මාන්ත මාර්ගෝපදේශ අත්පොත
- SLCAP 1100 - ගුවන්යානා ක්‍රියාකරු ආරක්ෂණ වැඩසටහන් ප්‍රමිතිය
- SLCAP 1200 - ගුවන්සේවා ආරක්ෂණ පරීක්ෂක අත්පොත
- SLCAP 1300 - ගුවන්සේවා ආරක්ෂක කාර්යාල ක්‍රියාපටිපාටි අත්පොත

සහතික කිරීමේ කටයුතු

- ගගන යාත්‍රාංගණ සහතිකය

ගගන යාත්‍රාංගණ ක්‍රියාකරු විසින් AVSEC නියාමන අවශ්‍යතා සඳහා අනුකූලවීම සහතික කරන අතර, 2021 දී මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ ගගන යාත්‍රාංගණ සහතිකය අලුත් කිරීමට අංශ පරීක්ෂක මණ්ඩලය දායක විය.

- ගුවන් ක්‍රියාකරු සහතිකය

ගුවන්යානා ක්‍රියාකරු ආරක්ෂක වැඩසටහන් සහ මෑතකාලීන මෙහෙයුම් වාර්තා සමාලෝචනය කිරීමෙන් පසු, දේශීය ගුවන්යානා ක්‍රියාකරුවන් සඳහා නිර්දේශ 10 ක් සහ විදේශීය ගුවන්යානා ක්‍රියාකරුවන් සඳහා නිර්දේශ 17 ක් සිය ගුවන් ක්‍රියාකරු සහතික / විදේශ ගුවන් ක්‍රියාකරු සහතික නිකුත් කිරීම / අලුත් කිරීම සඳහා සිදු කරන ලදී.

- ගුවන්සේවා ආරක්ෂක කාර්ය මණ්ඩල සහතිකය

ගුවන්තොටුපළ සහ ගුවන්යානා ක්‍රියාකරුවන්ගෙන් සමන්විත වන ගුවන්සේවා ආරක්ෂක කාර්ය

ගුවන්සේවා ආරක්ෂක නියාමන ශාඛාව

මණ්ඩල සාමාජිකයන් සහතික කිරීම / නැවත සහතික කිරීම, කොවිඩ්-19 වසංගතය අතරතුර පවා 2021 වර්ෂය පුරා අඛණ්ඩව මෙම අංශය මඟින් සිදු කෙරිණි. 2021 වර්ෂය තුළ සහතික කරන ලද කාර්ය මණ්ඩල සාමාජික විස්තර පහත පරිදි වේ.

- ගුවන්සේවා ආරක්ෂක කළමනාකරුවන් සහතික කිරීම/නැවත සහතික කිරීම - 20
- ගුවන්සේවා ආරක්ෂක උපදේශකවරුන් සහතික කිරීම/නැවත සහතික කිරීම - 14
- ගුවන්සේවා ආරක්ෂක පිරික්සුම්කරුවන් සහතික කිරීම/නැවත සහතික කිරීම - 48

තව ද මෙම වසර තුළ මීට අමතරව, ගුවන්සේවා ආරක්ෂක පිරික්සුම්කරුවන් 600 ක් නැවත සහතික කිරීම දීර්ඝ කරන ලදී.

- ගුවන්සේවා ආරක්ෂක පිරික්සුම් උපකරණ සහතිකය
  ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්හි ආරක්ෂක පිරික්සුම් උපකරණ 10 ක් සහතික කිරීම / නැවත සහතික කිරීම අවසන් කර ඇති අතර ගුවන්තොටුපළ සහ ගුවන්සේවා ශ්‍රී ලංකා සමාගමෙහි ආරක්ෂක පිරික්සුම් උපකරණ 22 ක් 2021 වර්ෂය තුළ සහතික කිරීමේ ක්‍රියාවලියේ පවතී.

නිරීක්ෂණ කටයුතු

රට තුළ කොවිඩ්-19 වසංගත තත්වය පැවතියදී වුවද, මෙකී අංශයේ පරීක්ෂක මණ්ඩලය විසින් සියලුම නිලධාරීන්ගේ සහය ඇතිව රටේ ගුවන්සේවා ආරක්ෂක අධීක්ෂණ පද්ධතිය ලබා දී ඇති ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යාම සඳහා කැපවී සිය යුතුකම ඉටු කරන ලදී.

2021 දී අනුමත කරන ලද නිරීක්ෂණ සැලැස්මට අනුකූලව මෙම අංශයේ පරීක්ෂක මණ්ඩලය විසින් ගුවන්සේවා ආරක්ෂක සේවා සැපයුම්කරුවන් පිළිබඳ පහත තත්ව පාලන ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- AVSEC පරීක්ෂණ - 40
- AVSEC පරීක්ෂණ - 03
- විගණන - 00
- නිරීක්ෂණ - 06

මෙම අංශයේ පරීක්ෂක මණ්ඩලය විසින් කාල සටහන්ගත නොකරන ලද ගුවන්යානා මෙහෙයුම් පිළිබඳ පරීක්ෂණ 03 ක් සහ "ෆ්ලයිට් චියාර්" හි ප්‍රථම භාණ්ඩ ප්‍රවාහන ගුවන් මෙහෙයුම පිළිබඳ පුළුල් පරීක්ෂණයක් සිදු කර ඇත. තවද, ගුවන්යානා සඳහා ගොඩබිම් හැසිරවීමේ (Ground Handling) විධිවිධාන සහ පහසුකම්/සේවා සඳහා බලපත්‍රය නිකුත් කිරීමට අදාළව AVSEC අංශය ආවරණය වන පරිදි ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්හි මූලික සහතික කිරීමේ විගණනය පරීක්ෂක මණ්ඩලය විසින් සිදු කරන ලදී.

බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ගය

අදාළ AVSEC නියාමන අවශ්‍යතා සඳහා අනුකූල නොවන ක්‍රියාකරුවන්ට එරෙහිව බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. එවැනි අනනුකූලතා සම්බන්ධයෙන් ක්‍රියාකරුවන් විසින් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සත්‍යාපනය කිරීම සඳහා මෙම අංශය විසින් පසු විපරම් ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කරන ලදී.

අනෙකුත් තොරතුරු

- "විශ්ව ආරක්ෂණ විගණන වැඩසටහන - ශ්‍රී ලංකාවේ අඛණ්ඩ අධීක්ෂණ ප්‍රවේශ (USAP-CMA) විගණනය

2022 ICAO-CMA විගණන කාල සටහනට අනුකූලව, ICAO ඇමුණුම 17 ප්‍රමිති සහ ඇමුණුම 9 හි ආරක්ෂාව සම්බන්ධ විධි විධාන ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකාවේ අනුකූලතා මට්ටම තීරණය කිරීම සඳහා, 2022 වසරේ පළමු භාගය තුළ ශ්‍රී ලංකාව විගණන ක්‍රියාවලියට භාජනය කරනු ලැබේ. එබැවින්, 2021 වසරේ අවසාන කාර්තුව තුළ, ක්‍රියාකාරී සැලැස්මක් සහිතව ICAO වෙත රාජ්‍ය වගකීම් ඉටු කරන අතරම, විගණනයට මුහුණ දීමට ද මෙම අංශය සූදානම් වෙමින් සිටියේය.

- ජාතික සිවිල් ගුවන්සේවා ආරක්ෂක කමිටුව (NCASC)

රට තුළ පවතින කොවිඩ්-19 වසංගත ව්‍යාප්තියේ බලපෑම් හේතුවෙන්, 2021 දී ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් එක් (01) NCASC රැස්වීමක් පමණක් කැඳවන ලද මුත් සෑම ලිත් වර්ෂයකම NCASC රැස්වීම් අවම වශයෙන් දෙවරක්වත් පැවැත්විය යුතුය. ජාතික සිවිල් ගුවන්සේවා ආරක්ෂණ වැඩසටහනේ විවිධ අංශ ක්‍රියාත්මක කිරීමට අදාළ හෝ වගකිව යුතු රාජ්‍ය දෙපාර්තමේන්තු, ආයතන සහ රාජ්‍ය ආයතන, ගුවන්තොටුපළ සහ ගුවන්යානා ක්‍රියාකරුවන්, ගුවන් ගමනාගමන සේවා සපයන්නන් සහ අනෙකුත් ආයතන අතර ආරක්ෂක කටයුතු සම්බන්ධීකරණය කිරීම මෙකී රැස්වීම් පැවැත්වීමෙහි අරමුණ වේ.

ගුවන්සේවා ආරක්ෂක නියාමන ශාඛාව

- සිවිල් ගුවන්සේවා තර්ජන තක්සේරු කමිටුව

2021 වසරේ රට තුළ කොවිඩ්-19 ව්‍යාප්තිය පැවතිය ද කමිටු රැස්වීම් සාර්ථකව පවත්වන ලදී. මෙම කමිටුවේ පරමාර්ථය වන්නේ සිවිල් ගුවන් සේවයට ඇති තර්ජනය අඛණ්ඩව තක්සේරු කිරීම සහ ඒ පිළිබඳව ජාතික බුද්ධි ප්‍රධානියා (CNI) වෙත වාර්තා කිරීම වන අතර ඒ අනුව තර්ජන මට්ටමට සරිලන පරිදි සුදුසු ගුවන්සේවා ආරක්ෂක පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා පවතින තර්ජන මට්ටම පිළිබඳව සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් දෙනු ලැබේ. ප්‍රායෝගික ගුවන්තොටුපළ යටිතල පහසුකම් තත්වයන් කමිටු තක්සේරුවලට ඇතුළත් කිරීම සඳහා, තර්ජන පිළිබඳ තක්සේරුවේ ප්‍රතිඵල අවසන් කිරීමට පෙර, කමිටුව 2021 ඔක්තෝබර් 15 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ වෙත ගුවන්තොටුපළ සංචාරයක් සිදු කළේය. ICAO RCS මත පදනම්ව සමාලෝචනය කරන ලද තර්ජන පිළිබඳ තොරතුරුවල ප්‍රතිඵල ද සමඟින් ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා මෙහෙයුම්වලට ඇති තර්ජනයන්හි ස්වභාවය 2021 දෙසැම්බර් මාසයේ දී CNI වෙත දන්වා ඇත.

- ගුවන් යානයක/ගුවන් භාණ්ඩ තොග රඳවනයන් මත අවි ආයුධ රැගෙන යාම සඳහා අනුමැතිය

ශ්‍රී ලංකාවේ ගුවන් සීමාව තුළ සහ ශ්‍රී ලංකාව තුළ ගුවන්තොටුපළ වෙත/වෙතින් යුධෝපකරණ ප්‍රවාහනය සඳහා වන අනුමැතිය ලබා දීම.

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත පැවරී ඇති අතර එම ඉල්ලීම් රාජ්‍ය සහ පෞද්ගලික සංවිධාන මෙන්ම පුද්ගලයන් විසින් සිදු කරනු ලැබේ. මෙවැනි වාතාවරණයක් තුළ, 2021 වර්ෂයේ දී ගුවන්යානාවල යුධෝපකරණ ප්‍රවාහනය සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා කිසිදු ඉල්ලීමක් ඉදිරිපත් නොවූ අතර, භාණ්ඩ තොගය තුළ යුද උපකරණ රැගෙන යාම සඳහා අනුමැතීන් 47 ක් ලබා දී ඇත.

- අධිකරණමය සහ පරිපාලනමය වශයෙන් පාලිත මගීන්ගේ ගුවන් ප්‍රවාහනය

2021 වර්ෂය තුළ අධිකරණමය සහ පරිපාලනමය වශයෙන් පාලිත මගීන් සඳහා ශ්‍රී ලංකාව වෙත/වෙතින් ගුවන් ප්‍රවාහනය සඳහා නිර්දේශ 151 ක් ලබා දෙන ලදී.

- ගුවන්සේවා කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා ගුවන්තොටුපළ ප්‍රවේශ බලපත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශ

ගුවන් සමාගම් සේවකයන්ට ගුවන්තොටුපළවල රාජකාරී ඉටු කිරීම සඳහා ගුවන්තොටුපළ ප්‍රවේශ බලපත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශ 191 ක් ද, ශ්‍රී ලංකාවේ ගුවන්තොටුපළවල AVSEC නොවන නිරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා විදේශීය ගුවන් සමාගම් වෙත නිර්දේශ 02 ක් ද ලබා දී ඇත.

- CAASL කාර්ය මණ්ඩලය සඳහා ගුවන්තොටුපළ ප්‍රවේශ බලපත්‍ර සකස් කිරීම

CAASL කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ගුවන්තොටුපළ ප්‍රවේශ බලපත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශ ලබා දීම මෙම අංශය විසින් අඛණ්ඩව පරිපාලනය කරන ලදී. දෛනික අවසරපත් සහ ස්ථිර/තාවකාලික ප්‍රවේශ බලපත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශ 180 ක් ලබා දෙන ලදී.

- කර්මාන්තයේ පුහුණු අවශ්‍යතා සපුරාලීමට දායක වීම

ගුවන්තොටුපළ සහ ගුවන්සේවා ශ්‍රී ලංකා සමාගම විසින් සිය AVSEC කළමනාකරුවන්ට අදාළ සහතික කිරීමේ අවශ්‍යතා සපුරාලීම සඳහා පවත්වන ලද චික් (01) පුහුණු වැඩසටහනක් සඳහා මෙම අංශයේ පරීක්ෂක මණ්ඩලය දායක විය.

- කටුනායක CAASL ප්‍රධාන කාර්යාලයේ ඒකාබද්ධ ආරක්ෂක පද්ධතිය කළමනාකරණය කිරීම

CAASL ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය, ගනුදෙනුකරුවන් සඳහා ආරක්ෂිත පරිසරයක් සහතික කිරීම සඳහා සහ එහි දේපළ ආරක්ෂා කිරීම සඳහා මෙම පරිශ්‍රය තුළ ස්ථාපිත භෞතික ආරක්ෂක සේවා, ඉලෙක්ට්‍රොනික ප්‍රවේශ පාලන පද්ධතිය සහ සංවෘත පරිපථ රූපවාහිනී (CCTV) පද්ධතිය, මෙම අංශය විසින් අඛණ්ඩව පරිපාලනය කරන ලදී.



ආයතනික කළමනාකරණ ශාඛාව

"සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක්"

ආයතනික කළමනාකරණ ශාඛාව

ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන අංශය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ආයතනික කළමනාකරණ අංශය යටතේ පවතින ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන අංශය විසින් ශ්‍රී ලංකාවේ ගුවන්සේවා කර්මාන්තය නියාමනය කිරීමේ වගකීම දරනු ලැබේ.

ගුවන්සේවා ක්ෂේත්‍රය දෙවන අනුප්‍රාප්තික වසර සඳහා ද කොවිඩ්-19 වසංගත තත්වයේ බලපෑමට මුහුණ දුන් අතර, මෙම අංශය විසින් සැලසුම් කරන ලද වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමේ අභියෝගයන්ට ලක් විය. වසංගත තත්වය හේතුවෙන්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය මාර්ගෝපදේශවලට සමගාමීව පැමිණෙන මගීන් සඳහා අනුමැතිය ලබා දීම වැනි නව ක්‍රියාකාරකම් පවත්වා ගෙන යාමට ඒකකයට සිදු විය.

ජාත්‍යන්තර ගුවන් සමාගම් විසින් සිදු කරන ලද මෙහෙයුම්

2021 මූල්‍ය වර්ෂය තුළ, ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ඇතුළුව නියමිත මගී ගුවන් සමාගම් (Scheduled Passenger Airlines) 24 ක් ශ්‍රී ලංකාව වෙත/වෙතින් සිය මෙහෙයුම් පවත්වා ගෙන ගියේය. පෙර වසර සමඟ සසඳන කළ ගෝලීය වසංගත තත්වය හේතුවෙන්, නියමිත මගී ගුවන් ගමන් ප්‍රමාණයේ අඩුවක් දැක ගත හැකි විය. පෙර සිට පැවතෙන ගුවන් සමාගම් මෙම කාලයේ ප්‍රධානම ක්‍රියාකරුවන් වූ අතර, මූලික සේවා සපයන (“No-Frills”) ගුවන් සමාගම් ද ලොව ප්‍රධාන ගමනාන්තයන් වෙත/වෙතින් මගී සංචලන සිදු කිරීම සඳහා සිය දායකත්වය සැපයීය. ඊට අමතරව එමරේට්ස් එයාර්ලයින්ස්, එතිහාඩ් එයාර්වේස්, එයාර් ෆ්‍රාන්ස්, වර්ජින් පොලිෂ්, ටර්කිෂ් එයාර්ලයින්ස්, සිංගප්පෝ එයාර්ලයින්ස්, ගල්ෆ් එයාර්, එයාර් ඉන්දියා, එරෝෆ්ලෝට්, එයිනා ඊස්ටන් සහ කටාර් එයාර්වේස් වැනි ප්‍රමුඛ විදේශ ගුවන් සමාගම් 2021 වර්ෂයේ දී ශ්‍රී ලංකාව වෙත ඔවුන්ගේ මෙහෙයුම් පවත්වා ගෙන ගියහ.

ගුවන්තොටුපළ මගී සීමා කිරීම අඛණ්ඩව පැවතීම හේතුවෙන්, ගුවන් සමාගම් සියල්ලටම පාහේ ශ්‍රී ලංකාව වෙත පැමිණීමේ වාර ගණන අඩු කිරීමට සිදු විය. කෙසේ වෙතත්, 2020 වර්ෂයේ දී මෙහෙයුම් අත්හිටුවීමෙන් පසු මෙම වසර තුළ ගුවන් සමාගම් රැසක් නැවත මෙහෙයුම් ආරම්භ කර ඇත.

විදේශ රටවල අතරමං වූ ශ්‍රී ලාංකිකයන් නැවත මව් රටට ගෙන්වා ගැනීමේ ගුවන් ගමන් වැඩි වශයෙන් ක්‍රියාත්මක කිරීම හරහා මෙරට ගුවන් මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් විසින් සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන ලදී. එමරේට්ස්, කටාර් එයාර්වේස්, කුවේට් එයාර්වේස් සහ එතිහාඩ් එයාර්වේස් යන ගුවන් සමාගම් ද එවැනි අරමුණු සඳහා ගුවන් ගමන් ක්‍රියාත්මක කළහ. කෙසේ වෙතත්, කොවිඩ්-19 ආශ්‍රිත සෞඛ්‍ය සීමා කිරීම් සහ වෙනත් රටවල් සඳහා පැවති සංචරණ කිරීමේ සීමා හේතුවෙන් ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගමට වෙනත් ගමනාන්ත වෙත සිදු කරනු ලබන ගුවන් ගමන් සීමා කිරීමට සිදු විය. එමෙන්ම ඉන්දීය දේශසීමා වසා දැමීම හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ගුවන් සමාගම්වලට සිය ප්‍රධාන ගමනාන්ත සහ සම්බන්ධතා අහිමි විය.

සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුව, වසරේ මුල් භාගයේ දී පැමිණෙන මගී සංඛ්‍යාව සීමා කළ අතර සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ශ්‍රී ලංකාව වෙත ක්‍රියාත්මක වන ගුවන් සමාගම් අතර සාධාරණ අයුරින් මගී ප්‍රමාණයන් වෙන් කරන ලදී. සීමා පැනවීම් මෙම වසරේ දෙවන භාගයේ දී ඉවත් කරන ලදී.

කැතේ පැසිෆික්, සිංගප්පෝ එයාර්ලයින්ස්, ඉන්දිගෝ සහ එයාර් ඒෂියා වැනි ගුවන් සමාගම් දෙරටේ විවිධ සීමා පැනවීම් හේතුවෙන් මගී සංචලන පියාසැරි වෙනුවට ගුවන් භාණ්ඩ සංචලන පියාසැරි ක්‍රියාත්මක කරන ලදී.

ගුවන් භාණ්ඩ මෙහෙයුම්හි වර්ධනය

වසංගත තත්වය පැවතිය ද පෙර වසරට සාපේක්ෂව ලොව පුරා මගී මෙහෙයුම් සුළු වශයෙන් ඉහළ ගිය අතර කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය පැවතිය දී පවා මගී මෙහෙයුම්වලට සාපේක්ෂව භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම් තවදුරටත් ඉහළ ගියේය. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ගුවන් සමාගම් රැසක් මගී ප්‍රවාහන ගුවන්යානා යොදා ගනිමින් ගුවන් භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම් ක්‍රියාත්මක කළ අතර අවශ්‍ය නියාමන අනුමැතීන් සහිතව ගුවන් මැදිරි තුළ ගුවන් භාණ්ඩ ප්‍රවාහනය සිදු කළේය. ලොට් පොලිෂ්, තායි එයාර් ඒෂියා, ෆ්ලයි ඩුබායි, එයාර් ඇරබියා, ටර්කිෂ් එයාර්ලයින්ස් සහ ඉන්දිගෝ මෙවැනි මෙහෙයුම් සිදු කළ ගුවන් සමාගම් සඳහා නිදසුන් වේ. පූර්ණ ඇගයීමකින් පසුව ගුවන්යානා මැදිරි තුළ භාණ්ඩ ප්‍රවාහනය සඳහා CAASL හි මෙහෙයුම් අංශයෙන් ගුවන් සමාගම් සඳහා අනුමැතිය හිමි විය. ශ්‍රී ලංකාවේ වාණිජ අංශයන් බෙහෙවින් දිරිමත් කරමින් කැතේ පැසිෆික්, කටාර් එයාර්වේස්, එමිරේට්ස්, ඕමාන් එයාර්ලයින්ස්, එයාර් චයිනා යන ගුවන් සමාගම් විසින් ශ්‍රී ලංකාව වෙත සිදු කිරීමට නියමිතව තිබූ භාණ්ඩ ප්‍රවාහන සේවා අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

ඉහත ගුවන් සමාගම්වලට අමතරව මෙම කාලය තුළ වියට්නාම් එයාර්ලයින්ස්, වියට් ජෙට්, ඉතියෝපියන් එයාර්ලයින්ස් සහ ඊජිප්ට් එයාර් යන ගුවන් සමාගම් විසින් ප්‍රධාන වශයෙන් නැගෙනහිර ආසියාතික රටවලින් ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයට අවශ්‍ය

ආයතනික කළමනාකරණ ශාඛාව

අමුද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා ගුවන් භාණ්ඩ ප්‍රවාහන පියාසැරි ක්‍රියාත්මක කරන ලදී. ඊට අමතරව, ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්තයේ නිෂ්පාදිතය යුරෝපයට සහ ඇමරිකාවට අපනයනය කරනු ලැබුවේ ගුවන් භාණ්ඩ ප්‍රවාහනය යොදා ගනිමිනි.

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් විසින් නයිරෝබි (කෙන්යාව) වැනි නව ගමනාන්ත වෙත ගුවන් භාණ්ඩ ප්‍රවාහන පියාසැරි ආරම්භ කළ අතර කොළඹ හරහා ඕස්ට්‍රේලියාව දක්වා දිගටම පියාසැරි සිදු විය. තවද, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, චීනය සහ තවත් ගමනාන්ත රැසක් වෙත ගුවන් භාණ්ඩ ප්‍රවාහන පියාසැරි ක්‍රියාත්මක කිරීම හරහා ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් විසින් ගුවන් භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම්හි සිය ස්ථානය තහවුරු කර ගන්නා ලදී.

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ජාත්‍යන්තර ගුවන් භාණ්ඩ ප්‍රවාහන ක්‍රියාකරු වන ෆිට්ස් ඒවියේෂන් මඟින් ඔවුන් අලුතින් හඳුන්වා දුන් ගුවන්යානා ඇණිය භාවිත කරමින් වියට්නාමය, පකිස්තානය, ඉන්දියාව, මියන්මාරය, සහ මාලදිවයින වැනි ගමනාන්ත වෙත වසර තුළ ඔවුන්ගේ මෙහෙයුම් වැඩි කර ගන්නා ලද අතර එය ශ්‍රී ලංකාව වෙත සිදු කෙරෙන ගුවන් භාණ්ඩ ප්‍රවාහනය සංවර්ධනය කිරීම සඳහා මහත් රුකුලක් විය.

කාර්යක්ෂම නාවික හුවමාරු මෙහෙයුම් අබණ්ඩව පවත්වාගෙන යාම

ලොව පුරා යාත්‍රාවන්හි සේවය කරනු ලබන නාවිකයන් විසින් ඔවුන්ගේ කාලසීමාව අවසන් වූ පසු සාමාන්‍ය මඟී ගුවන්යානා භාවිත කරමින් ඔවුන් සේවය කරන යාත්‍රාවන් හුවමාරු කර ගනු ලැබේ. පූර්ව කොවිඩ්-19 වසංගත තත්වය යටතේ, මෙකී ක්‍රියාවලිය පහසුවෙන් සිදු කරගෙන ගියද, කොවිඩ්-19 වසංගත තත්වය හමුවේ ගුවන් ගමන් නිසි ලෙස ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මෙය වඩාත් සංකීර්ණ ක්‍රියාවලියක් බවට පත් විය. 2020 වර්ෂයේ දී මෙම ආකාරයේ මෙහෙයුම්/හුවමාරු සඳහා අනුමැතිය ලබා දීමට CAASL කටයුතු කළේය. සමාලෝචිත වර්ෂය තුළ දැඩි සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ ශ්‍රී ලංකාවේ ගුවන්තොටුපළ සහ වරායන් භාවිත කරනු ලබන නාවිකයන් සඳහා 2021 සැප්තැම්බර් මස වන තුරු මෙය අබණ්ඩව ක්‍රියාත්මක විය. නාවිකයන් හුවමාරුව ව්‍යාපාර අවස්ථාවක් බවට පත් කරගනිමින් ගුවන් සමාගම් කිහිපයක් විසින් පවත්වා ගෙන ගිය අතර, වසර අවසානයේ දී ඉන්දිගෝ, ස්පයිස්ජෙට්, කටාර් එයාර්වේස්, එයාර් ඒෂියා පිලිපින්, මෝල්ඩීවියන් එයාර්ලයින්ස් සහ තවත් තත්කාර්ය විදේශීය ගුවන් සමාගම් කිහිපයක් මෙම මෙහෙයුම දිගටම පවත්වා ගෙන ගියේය. මෙම නව ව්‍යාපාරික අවස්ථාව වසංගතය හේතුවෙන්ම පමණක් වර්ධනය වූවක් විය.

නව ක්‍රියාකරුවන්

2020 වසරේ මඟී ඉල්ලුම අඩු වීම සහ බොහෝ රටවල් වසා දැමීම හේතුවෙන් ශ්‍රී ලංකාව වෙත මෙහෙයුම් අත්හිටුවනු ලැබූ රටවල් විසින් ශ්‍රී ලංකාවේ සහ සෙසු රටවල සීමා කිරීම් ඉවත් කිරීමත් සමඟ, 2021 වසරේ දී නැවත මෙහෙයුම් ආරම්භ කරන ලදී. කුවේටයේ පිරිවැය අඩු ගුවන් සමාගමක් වන ජසීරා එයාර්වේස් විසින් ශ්‍රී ලංකාව වෙත මෙහෙයුම් ආරම්භ කළද, වසර තුළ කෙටි කාලීන අත්හිටුවීමක් සිදු කරන ලදී. කසකස්තානයේ ගුවන් සමාගමක් වන එයාර් අස්ටානා, සංචාරක කර්මාන්තය සඳහා මහඟු පිටිවහලක් වෙමින් ශ්‍රී ලංකාව වෙත සිය මෙහෙයුම් ආරම්භ කරන ලදී.

වසරේ කැපී පෙනෙන මුලපිරීමක් වූයේ, ශ්‍රී ලංකාව වෙත මාලේ හරහා ක්‍රියාත්මක වන යුරෝපීය කීර්තිමත් ගුවන් සමාගමක් වන, එයාර් ෆ්‍රාන්ස්හි මෙහෙයුම් රටේ ගුවන් කර්මාන්තයට රුකුලක් වෙමින් දශක ගණනාවකට පසු නැවත ආරම්භ කිරීමයි.

ජාත්‍යන්තර වරලත්, සහ ව්‍යාපාරික පේටි ක්‍රියාකරුවන්

වසරේ තුන්වන කාර්තුව දක්වා කාල සටහන්ගත කුලී ගුවන් ගමන් ක්‍රියාත්මක නොවීය. අධික ඉල්ලුම හේතුවෙන් කුලී ගුවන් ගමන් සහ පෞද්ගලික ගුවන් ගමන් බොහෝමයක් ක්‍රියාත්මක විය. වසංගතයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ සංචාරක කර්මාන්තයට රුකුලක් වෙමින් පළමු කාර්තුව තුළ ස්කයිඅප් ගුවන් සමාගම සහ යුක්රේන් ජාත්‍යන්තර ගුවන් සමාගම විසින් මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළ වෙත කුලී ගුවන් ගමන් ක්‍රියාත්මක කළහ. බොහෝ සීමාවන් ලිහිල් කිරීමෙන් පසු, වසර අවසානයේ දී ඉහළ මඟී ආදායමක් සහිතව කුලී ගුවන්සේවා කිහිපයක් සිය මෙහෙයුම් ආරම්භ කරන ලදී. ගලිවර් එයාර්, ස්කයිඅප් සහ SCAT එයාර්ලයින්ස් ද කුලී ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීමෙන් සංචාරක ව්‍යාපාරයට දායක විය.

කාල සීමා සම්බන්ධීකරණය

ගුවන් ගමන් මෙහෙයුම් සීමා කිරීම හේතුවෙන්, පෙර වසරට අනුව සමාලෝචිත වර්ෂය තුළ ලබා දී ඇති සියලුම පෙර කාලසීමාවන් සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අවලංගු කරන ලදී. කෙසේ වෙතත්, සීමා කිරීම් හරහා උපරිම මෙහෙයුම් කාර්යක්ෂමතාවයක් සහතික කරලීම සඳහා CAASL විසින් දුෂ්කර කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාව වෙත සිදුකරන සියලුම ගුවන් මෙහෙයුම් සඳහා සහය දක්වමින් විශේෂ අනුමත කාල සීමා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන ලදී.

පෙර වසර මෙන් මඟින් හැසිරවීම සෞඛ්‍ය නිතිරීති මඟින් සීමා කළ අතර, තුන්වන කාර්තුව දක්වා වසර පුරා සීමා කිරීම් පැවතුණි. පසු කාලීනව

ආයතනික කළමනාකරණ ශාඛාව

සීමා ලිහිල් කරන ලද නමුත්, වසරේ මුල් භාගයේ දී කාල සීමා වෙන් කිරීම සඳහා එකම පියාසැරි වෙන් කිරීමේ යාන්ත්‍රණයක් පවත්වා ගෙන යන ලදී. මෙම ලිහිල් කිරීම හේතුවෙන්, නව කාල සීමා යාන්ත්‍රණය සමඟ ඉහළ දමන ලද ගුවන් ගමන් සමඟින් ගුවන් සමාගම්වලට තවත් කාල සීමාවන් ලබා දීමට හැකි විය.

තවද, මෙහෙයුම් දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් කාල සීමා අවම කිරීමේ යාන්ත්‍රණයක් හරහා, 2022 වසර ගිම්හානය සෘතුව සහ 2022/23 ශීත සෘතුව දක්වා ගුවන් සමාගම්වලට ඔවුන්ගේ පෙර කාල සීමාවන් පවත්වා ගෙන යාමට අවසර දෙන ලදී.

ගුවන් සමාගම් බලපත්‍ර සහ විදේශ ගුවන් සමාගම් බලපත්‍ර

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සියලුම ගුවන් සමාගම්වලට සිය මෙහෙයුම්වල තාක්ෂණික නිපුණතාවය සනාථ කරනු ලබන ගුවන් මෙහෙයුම් සහතික පත්‍රයක් (AOC) තිබිය යුතුය. එසේම ගුවන් සමාගමට ඔවුන්ගේ වාණිජ කටයුතු සිදු කිරීමට අවශ්‍ය අවසර ලබා ගැනීමට බලපත්‍රයක් අවශ්‍ය වේ. නියමිත මගී සේවා සඳහා ගුවන් සමාගම් බලපත්‍රයක් නිකුත් කරනු ලබන අතර, වරලත් මෙහෙයුම් සඳහා වරලත් බලපත්‍රයක් නිකුත් කෙරේ. පෞද්ගලික අරමුණු සඳහා භාවිත කරන ගුවන්යානා සඳහා පෞද්ගලික ගුවන් ගමන් බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

වසර තුළ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, සැෆ්රන් එයාර් සහ ෆිට්ස් එයාර් යන සමාගම්හි ගුවන් සමාගම් බලපත්‍ර අලුත් කරන ලද අතර නව බලපත්‍ර නිකුත් නොකරන ලදී. බලපත්‍ර අලුත් කරන ලද වරලත් ගුවන් සමාගම් වූයේ ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, ෆිට්ස් එයාර්, ටීවී ස්කයිලාර්ක්, දයා ඒවියේෂන්, මිලේනියම් එයාර්, සෙනොක් එයාර්, සකුරායි, ෆලයි සඳර්න්, සිනමන් එයාර් සහ එෆ් එයාර්වේස් වේ.

සංචාරක නියෝජිතයන්

ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවන්ගේ (මගී) බලපත්‍රය නියාමනය කිරීම (සංචාරක නියෝජිත බලපත්‍රය), 1992 අංක 55 දරන ගුවන් නාවික පනතේ විධි විධාන සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත මගින් බලපත්‍රලාභීන්ට මගීන් ප්‍රවාහනය කිරීම, භාණ්ඩ ප්‍රවාහනය කිරීම සහ ගුවනින් තැපැල් කිරීම සඳහා අවසර ලබා දේ. ශ්‍රී ලංකාව තුළ එවැනි ව්‍යාපාර පවත්වාගෙන යාමට ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරුවන්ගේ (මගී) බලපත්‍රය අනිවාර්ය අවශ්‍යතාවයකි. නියෝජිතායතනයේ ප්‍රකාශිත ප්‍රාග්ධන/ප්‍රාග්ධන දායකත්වය අනුව 'අ' කාණ්ඩය සහ 'ආ' කාණ්ඩය යනුවෙන් බලපත්‍ර කාණ්ඩ දෙකක් පවතී. එය වාර්ෂිකව අලුත් කළ හැකිය.

සමාලෝචිත වර්ෂය තුළ, 'අ' කාණ්ඩය සඳහා අලුත් බලපත්‍ර 25 ක් සහ 'ආ' කාණ්ඩය සඳහා අලුත් බලපත්‍රයක් නිකුත් කරමින් නව බලපත්‍ර 26 ක් නියෝජිතයන් සඳහා නිකුත් කරන ලදී. 'අ' කාණ්ඩයේ බලපත්‍රලාභීන් 273 දෙනෙකු තම බලපත්‍රය අලුත් කළ අතර 'ආ' කාණ්ඩයේ බලපත්‍රලාභීන් 10 දෙනෙකු බලපත්‍රය අලුත් කර ඇත. කොවිඩ්-19 වසංගත තත්වයේ බලපෑම් හේතුවෙන් බොහෝ නියෝජිතයන් තම ව්‍යාපාරය අවසන් කර ඇත. 'ආ' කාණ්ඩයේ කිහිපදෙනෙකු විසින් 'අ' කාණ්ඩය වෙත ඔවුන්ගේ බලපත්‍ර උසස් කරන ලදී. CAASL විසින් නව බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ දී සහ පවතින බලපත්‍ර අලුත් කිරීමේ දී බැංකු ඇපකර ඉදිරිපත් කිරීම සඳහා වසරක කාලයක සහනයක් ලබා දෙන ලදී.

ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවන්ගේ බලපත්‍ර

මාසය	පළමු නිකුත් කිරීම				අලුත් කිරීම			
	අ කාණ්ඩය		ආ කාණ්ඩය		අ කාණ්ඩය		ආ කාණ්ඩය	
	2021	2020	2021	2020	2021	2020	2021	2020
ජනවාරි	3	8	0	0	24	61	0	6
පෙබරවාරි	2	12	0	0	38	32	1	9
මාර්තු	2	3	0	0	46	19	0	1
අප්‍රේල්	3	0	0	0	27	0	1	0
මැයි	0	0	0	0	0	3	0	1
ජූනි	0	0	0	0	0	56	0	2
ජූලි	5	0	0	0	14	34	3	0
අගෝස්තු	0	0	0	0	5	21	0	0
සැප්තැම්බර්	0	0	0	0	24	32	1	0
ඔක්තෝම්බර්	2	0	0	0	41	6	1	0
නොවැම්බර්	5	0	0	0	17	19	0	0
දෙසැම්බර්	3	0	1	0	37	23	3	0
එකතුව	25	23	1	0	273	306	10	19

01 වන වගුව - 2020 සහ 2021 ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවන්ගේ බලපත්‍ර නිකුත් කිරීම

ආයතනික කළමනාකරණ ශාඛාව

විගමිකයන් සහ රැකියා කරනු ලබන/ඉගෙනුම ලබන ශ්‍රී ලාංකික සිසුන් වෙත වීසා නිර්දේශය

ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ ප්‍රකාරව සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබා දෙන ලද උපදෙස් අනුව, ශ්‍රී ලංකාව සඳහා රැකියා අවසරපත/පදිංචිවීමේ වීසා ලබා ගැනීම සඳහා දේශීය ගුවන් සමාගමක සේවය කරනු ලබන සියලුම විගමිකයන්, සිවිල් ගුවන් සේවයෙන් අනුමැතිය ලබා ගත යුතුය. ගුවන් ක්ෂේත්‍රය සඳහා එවැනි අභියාචනා CAASL මඟින් අනුමත කරනු ලබයි. DGCA හි නියෝගය සමඟින් 2019 ජුනි මස සියලුම අයදුම්කරුවන් වෙත සම්මුඛ පරීක්ෂණ පැවැත්විය යුතු නව ක්‍රියා පටිපාටියක් හඳුන්වා දෙන ලදී.

කොවිඩ්-19 වසංගත තත්වය සහ ඊට අදාළව රට තුළ පැවති තත්වය සහ රට අඟුලු දැමීම් හේතුවෙන් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නොහැකි වූ අතර විගමන දෙපාර්තමේන්තුව විසින් වීසා දීර්ඝ කිරීම ලබා දෙන ලදී.

අංශය මඟින් විදෙස් කාර්මික සහ කාර්මික නොවන විගාමිකයාන් ක්ෂේත්‍රය වෙත වීසා අනුමත කිරීම් 71 ක් සිදු කළ අතර, වසර තුළ විදේශීය සිසුන් සඳහා වීසා නිර්දේශ 303 ක් නිකුත් කර ඇත.

සංචාරක නියෝජිතයන්ට සහ ගුවන් සමාගම්වලට එරෙහිව පාරිභෝගික පැමිණිලි

ගුවන් ප්‍රවාහන සේවා භාවිත කරනු ලබන මහියෙකුට සාමාන්‍යයෙන් ප්‍රසන්න අත්දැකීමක් ලැබේ. නමුත් කලාතුරකින් ඇති වන විශේෂ අවස්ථාවන්හිදී, මඟීන් අපහසුතාවයට පත් විය හැකිය. එවැනි අවස්ථාවක මඟීන්ට සංචාරක නියෝජිතයන්, ගුවන්සේවා සහ ගුවන්තොටුපළවලට එරෙහිව අධිකාරියට පැමිණිලි කිරීමේ විකල්පය ඇත. CAASL පාර්ශ්ව දෙක අතර මැදිහත් වෙමින් විසඳුමක් සඳහා ඔවුන් යොමු කරයි. පසුගිය වසරේ කොවිඩ්-19 වසංගත තත්වය සහ මඟී ප්‍රමාණය අඩුවීම හේතුවෙන් පාරිභෝගික පැමිණිලි සංඛ්‍යාව ද අඩු විය.

සමාලෝචිත වර්ෂය තුළ එවැනි පැමිණිලි 30 ක් මඟීන්ගෙන් ලැබී ඇති අතර වසර අවසානයේ දී 25 ක් විසඳා අවසන් කිරීමට අංශයට හැකි විය. සෙසු පැමිණිලි විමර්ශනය කෙරෙමින් පවතින අතර ධනාත්මක ප්‍රතිඵල අපේක්ෂා කෙරේ. කොවිඩ් හේතුවෙන් ගමනාගමනයට බාධා ඇති වූ අතර පාරිභෝගිකයන් විසින් ගුවන් සමාග මෙන් මුදල් ආපසු ඉල්ලා සිටින ලදී.

එවැනි පැමිණිලිවලින් බහුතරයක් ගුවන් ටිකට්පත් ආපසු ගෙවීම හා සම්බන්ධ වන අතර, පහත රූප සටහන මඟින් ලැබුණු පැමිණිලි වර්ගීකරණය කර දක්වයි.

වසර තුළ පැමිණිලි - 2021



භූමි ආධාරක සේවා බලපත්‍ර - (ස්ථාවර පදනමේ ක්‍රියාකරු බලපත්‍ර)

ඉදිරියේ දී සියලුම ව්‍යාපාරික පෙට්/පෞද්ගලික පෙට් ක්‍රියාකරුවන් සහ තත්කාර්ය වරලත් ක්‍රියාකරුවන්, CAASL හි අනුමත භූමි ආධාරක සේවා සැපයුම්කරුවන්ගේ සහය ඇතිව ඔවුන්ගේ ගුවන් ගමන් ක්‍රියාත්මක කළ යුතු බවට CAASL විසින් යෝජනා කරන ලදී.

වසරේ මුල් භාගය සලකා බැලීමේ දී එක් භූමි ආධාරක සේවාවක් සඳහා අවසර පත් අලුත් කරන ලදී.

වර්ෂයේ මැද භාගයේ දී සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් පරිදි භූමි ආධාරක සේවා සඳහා අවසර දීමේ ක්‍රියාවලිය මෙහෙයුම් අංශය වෙත පවරා තිබුණි.

ආයතනික කළමනාකරණ ශාඛාව

ක්ෂේත්‍රයේ මෙහෙයුම් සඳහා සහය දැක්වීමට කොවිඩ් 19 ආශ්‍රිත කාර්යය

මෙම අංශය, විශේෂයෙන් අධ්‍යක්ෂ (ගුවන් ප්‍රවාහන හා ආර්ථික නියාමන) සහ කළමනාකරු (ගුවන්සේවා සහ ගුවන් ගමන් හිමිකම්) මෙම දුෂ්කර කාලවල දී කර්මාන්තය පැවැත්ම තහවුරු කිරීමට සහය වීම සඳහා අධිකාරියේ කොවිඩ්-19 වසංගත තත්වයට අදාළ කටයුතුවල ක්‍රියාකාරිව නිරත වූහ.

නැවත රට වෙත ගෙන්වා ගැනීම සඳහා වන මගී අනුමැතිය

පැමිණෙන මගීන් සඳහා කොවිඩ්-19 සීමා හේතුවෙන්, 2020 වසර තුළ ආරම්භ කරන ලද ජාතික කොවිඩ්-19 කාර්යසාධක බලකාය විසින් ක්‍රියාත්මක කරන ලද අනුමත කිරීමේ ක්‍රියාවලියක් විය. සෞඛ්‍ය සීමාවන් සහ දේශසීමා පාලන යාන්ත්‍රණය හේතුවෙන් අනුමත කිරීමේ ක්‍රියාවලිය 2021 වසරේ තුන්වන කාර්තුව දක්වා පැවතුණි. අනුමත කිරීමේ ක්‍රියාවලිය තුළ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ශ්‍රී ලංකාවට පැමිණෙන ඕනෑම මගියෙකු සඳහා පළමු අනුමැතිය ලබා දිය යුතු අතර, CAASL විසින් දෙවන අනුමැතිය ලබා දිය යුතුය. ආපසු ගෙන්වා ගැනීමේ ගුවන් ගමන්වල පැමිණි මගීන් ද ඇතුළුව මගීන්ට රට තුළට පැමිණීමට පහසුකම් සැලසීම සඳහා වසර තුළ එවැනි අනුමත කිරීම් 80,000 ක් පමණ ක්‍රියාත්මක කරන ලදී.

කළමනාකරු (ගුවන්සේවා සහ ගුවන් ගමන් හිමිකම්), කළමනාකරු (කාර්ය මණ්ඩල පුහුණු සහ සංවර්ධන) සහ කළමනාකරු (පර්යේෂණ සංවර්ධන සහ විශේෂ ව්‍යාපෘති) යන තනතුරු ඇතුළත් අධ්‍යක්ෂ (ගුවන් ප්‍රවාහන හා ආර්ථික නියාමන) ප්‍රධානත්වයෙන් යුතු විශේෂ කණ්ඩායමක් අනුමත කිරීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීම සඳහා පිහිටුවන ලදී. කණ්ඩායමේ කැපවීම නිසා නොපමාව අනුමැතිය ලබාදීමට අධිකාරියට හැකිවිය.

සාමාන්‍ය මෙහෙයුම්වලට බාධා පමුණුවන වෛරසයේ වෙනස් වීම් සහ අනපේක්ෂිත ස්වභාවය හේතුවෙන් වරින් වර පැවති රැස්වීම් රැසකට ද මෙම අංශය සහභාගී විය.

EASA-APP සහ COSCAP-SA වැඩසටහන්වලට අදාළ ක්‍රියාකාරකම් සඳහා සහය

අධිකාරියට බොහෝ පුහුණු අවස්ථා ලබා ගැනීමට මෙන්ම නියාමන සේවා සඳහා සහය ලබා ගැනීමට හැකි වන පරිදි EASA ගුවන්සේවා හවුල්කාරිත්ව වැඩසටහන සහ COSCAP - දකුණු ආසියාතික වැඩසටහන යන දෙකෙහිම ජාතික සම්බන්ධීකාරක ලෙස අධ්‍යක්ෂ (ගුවන් ප්‍රවාහන හා ආර්ථික නියාමන) සේවය කරනු ලබයි.

ඊ-එයාර්වේ බිල්පත්

ඊ-එයාර්වේ බිල්පත් ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන වසර තුළ අබණ්ඩව පවත්වා ගෙන ගිය අතර, විනිවිදභාවය වැඩි කිරීම සඳහා බොහෝ නව ගුවන් සමාගම් සහ භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් වැඩසටහනට සම්බන්ධ විය.

මානව සම්පත් සහ දේපළ කළමනාකරණ අංශය

මානව සම්පත් සහ දේපළ කළමනාකරණ අංශය (HRPM) විසින් සේවා ඉටු කරලීම සඳහා නිවැරදි කාර්ය මණ්ඩලයක් CAASL සතු වීම සහතික කරලනු ලබයි. එමෙන්ම, එමඟින් පුද්ගලයන් සහ සේවක පිරිසට වර්ධනය වීම උදෙසා පහසුකම් සැලසීම සහ පෙළඹවීම මෙන්ම CAASL හි ඔවුන්ගේ කාර්ය සාධනය වර්ධනය කිරීමට අවස්ථාවන් නිර්මාණය කිරීම ද සිදු කරනු ලබයි. අධිකාරියේ කාර්යාල පරිපාලනය සහ දේපළ කළමනාකරණය සම්බන්ධයෙන් ද මෙම අංශය වගකීම දරයි.

සමාලෝචිත වර්ෂය තුළ, HRPM අංශය එහි උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධිකාරියට අබණ්ඩව සහය දක්වන අතර, එය අදාළ අරමුණු, ක්‍රියා පටිපාටි, සුදුසුකම්, සීමාවන් සහ නිදහස් කිරීම් (ඇත්නම්) පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් දක්වනු ලබන මානව සම්පත් ප්‍රතිපත්ති සමූහයක් සමඟින් ක්‍රියාත්මක වන අතර, කාර්ය මණ්ඩල රීති සහ පරිපාලන ක්‍රියා පටිපාටි අත්පොතෙහි මාර්ගෝපදේශ (SLCAP 5000) ලෙස ද සකසා ඇති අවශ්‍යතා සපුරාලනු ලබයි. අධිකාරිය විසින් ප්‍රමුඛතා ඉටුකර ගැනීම සඳහා පිහිටුවා ඇති ඉලක්ක, අරමුණු සහ අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා HRPM අංශය සැමවිටම දැඩිව කටයුතු කරනු ලබයි.

ආයතනික ප්‍රතිසංස්කරණ සහ කාර්ය මණ්ඩල සම්පාදනය

ප්‍රමුඛ සහ විශ්වසනීය ගුවන් ආරක්ෂණ නියාමකයෙකු වීමේ මූලික පරමාර්ථය මත පදනම්ව, සෑම සේවකයෙකුම CAASL සමඟ එක් වනුයේ අපේක්ෂිත අරමුණු සහ සහජ හැකියාවන් වැඩිදියුණු කර ගැනීම උදෙසා ක්‍රියාත්මක කරනු ලබන ක්‍රම සහ ක්‍රියාපිළිවෙත් පිළිබඳ මනා අවබෝධයකින් යුතුව ද යන්න පිළිබඳ වැඩි විශයෙන් අවධානය යොමු කෙරෙන බඳවා ගැනීමේ ක්‍රමවේදයක් CAASL විසින් පවත්වා ගෙන යනු ලබයි.

ආයතනික කළමනාකරණ ශාඛාව

අධිකාරියේ කාර්යයන් මෙහෙයවීම සඳහා නිපුණ සහ කාර්යක්ෂම ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමට HRPM අංශය මුල පිරීම් සකස් කර ඇත. එබැවින්, CAASL හි අඛණ්ඩ මෙහෙයුම් සහතික කරලීමට තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා වඩාත් සුදුසු අපේක්ෂකයන් එක් කර ගැනීමට HRPM විශාල උත්සාහයක් ගෙන ඇත. 2021 වර්ෂයේ දී නව බඳවාගැනීම් අටක් (8) සිදු වූ අතර, 2021.12.31 දිනට මුළු කාර්ය මණ්ඩල සාමාජිකයන් එකසිය හැත්තෑ හය (176) ක් විය. දැනට සිටින කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ධුරාවලියේ ඉහළ තනතුරුවලට යොමු වීම උදෙසා අවස්ථාවක් ඇති කරලමින් 2021 වසර තුළ උසස්වීම් දහයක් (10) ලබා දී ඇත. රජයේ චක්‍රලේඛ හරහා පනවා ඇති සීමාවන් නිසා බොහෝ බඳවා ගැනීම් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

සේවක කාණ්ඩ



01 වන රූපය - 2021.12.31 දිනට සේවක කාණ්ඩ

රූප සටහන 01 හි දැක්වෙන පරිදි, සමාලෝචිත වර්ෂය අවසන් වන විට, අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු සහ ප්‍රධාන විධායක නිලධාරියෙකු, ප්‍රධාන විධායක නිලධාරි හැර ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වයේ රැකියා කාණ්ඩයේ නිලධාරීන් තිදෙනෙකු (3), ජ්‍යෙෂ්ඨ කළමනාකරු කාණ්ඩයේ සේවකයන් නවය (9) දෙනෙකුගෙන්, සහ කළමනාකරණ රැකියා කාණ්ඩයේ විසිතුන් දෙනෙක් (23) කින් CAASL කාර්ය මණ්ඩලය සමන්විත වේ. වත්මන් සංඛ්‍යාලේඛනවලට අනුව, කාර්ය මණ්ඩල සාමාජිකයන් හතළිස් හත් (47) ක් බලාත්මක / මෙහෙයුම් / දිර්ඝ කිරීම යන කාණ්ඩයේ සේවය සඳහා බඳවා ගෙන ඇති අතර, කාර්ය මණ්ඩල සාමාජිකයින් හතක් (7) ආධුනික කළමනාකරු යටතේ වර්ගීකරණය කර ඇත. තවද, කාර්ය මණ්ඩල සාමාජිකයින් පස් දෙනෙකු (5) කළමනාකරණ සහකාර - තාක්ෂණික ලෙස ද හතළිස් නවයක් (49) කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන ලෙස ද සේවයේ යොදවා ඇත. ප්‍රාථමික මට්ටමේ පුහුණු සහ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු සේවකයන් යටතේ, එක් එක් කාණ්ඩය සඳහා පිළිවෙළින් කාර්ය මණ්ඩල සාමාජිකයන් දහනවයක් (16) සේවයට බඳවා ගෙන ඇත.

මෙම කාලය තුළ අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම් පහක් (5) සිදු කර ඇත. රජය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ හේතුවෙන් 2021 ඔක්තෝම්බර් මාසයේ සිට බඳවා ගැනීමේ ක්‍රියාවලිය සීමා කරන ලද බැවින්, 2021 දෙසැම්බර් 31 වන දින වන විට පුරප්පාඩු 32 ක් පවතී. එම කාලය තුළ සේවක පිරිවැටුම 2.84% ක් ලෙස වාර්තා වී ඇත.

ආයතනික කළමනාකරණ ශාඛාව

සේවක සුභසාධනය

කාර්ය මණ්ඩල සුබසාධන පහසුකම්



02 වන රූපය - කාර්ය මණ්ඩල සුබසාධන පහසුකම්

2021 වර්ෂයේ දී, 02 වන රූප සටහනෙහි දක්වා ඇති, අධිකාරියේ මූලිකාංගයක් වන සේවකයන්ගේ යහපැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වන පුළුල් පරාසයක සුබසාධන පහසුකම් සැපයීම අඛණ්ඩව CAASL විසින් සිදු කරන ලදී.

සේවකයන්ට සහ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයන්ට පිරිනැමෙන වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය වැඩි වශයෙන් ප්‍රතිලාභ ලබන සුබසාධන පහසුකම වේ. මෙම වසරේ දී සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීවිල්සී හි සහය ඇතිව ගෘහස්ථ වෛද්‍ය පහසුකම් වශයෙන් කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දෙමාපියන් වෙත රුපියල් ලක්ෂ හැත්තෑ පන්දහසක (රු. 175,000.00) අමතර ප්‍රතිලාභයක් වෙන් කර ඇත.

වසර තුළ, බාහිර රෝගී ප්‍රතිලාභ යටතේ හිමිකම් නවසිය අසූ හතර (984) ක් ඉදිරිපත් කර ඇති අතර 2021 ජනවාරි සිට 2021 දෙසැම්බර් දක්වා වූ ප්‍රතිපත්ති කාලය සඳහා එහි වටිනාකම රුපියල් හයමිලියන පන්ලක්ෂ හතළිස් පන්දහස් දෙසිය හැත්තෑ නවයක් සහ සත හතළිස් නවයක් (රු. 6,545,279.49) ක් වේ. ඉන් අනතුරුව, එම කාලසීමාව තුළ, එක් මිලියන හත්ලක්ෂ අසූ දෙදහස් තුන්සිය අටක් සහ සත හතළිස් අටක (රු. 1,782,308.48) වටිනාකමකින් යුතු ගෘහස්ථ වෛද්‍ය රක්ෂණ හිමිකම් 23 ක් සේවකයන්ට ප්‍රදානය කර ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සහය ඇතිව CAASL පරීක්ෂකවරුන් සඳහා ඔවුන්ගේ සෞඛ්‍යයට, ආරක්ෂාවට සහ සුරක්ෂිතභාවයට වන හානිදායක තත්වයන්ට මුහුණදීමේ හැකියාව ආවරණය කිරීමට අතිරේක විශේෂ ආවරණයක් ඇතුළුව සෑම සේවකයෙකු සඳහාම හදිසි අනතුරු රක්ෂණ ප්‍රතිපත්තිය ලබා දී ඇත.

03 වන රූප සටහනෙහි දැක්වෙන පරිදි අධිකාරිය විසින් ස්ථාපිත කරන ලද මාණ්ඩලික ණය වැඩසටහන මඟින් කාර්ය මණ්ඩල සාමාජිකයන්ට විශාල වශයෙන් මූල්‍ය ආධාර සපයා ඇත.



03 වන රූපය - ණය පැතිකඩ

CAASL හි කාර්ය මණ්ඩලය විසින් එහි කාර්ය මණ්ඩලයට සුබසාධනයක් ලෙස ණය පහසුකම් ලබා දී ඇත. 2021 වර්ෂය තුළ සේවක සේවිකාවන් 38 දෙනෙකු සඳහා ආපදා ණය වශයෙන් රුපියල් එකොළොස් මිලියන නවලක්ෂ අනූදහස් හතළිහක් (රුපියල් 11,990,040.00) ප්‍රදානය කරන ලදී. මීට අමතරව, තුන් මිලියන දෙලක්ෂ පනස් නව දහස් දෙසියයක් (රු. 3,259,200.00) ක් මෝටර් රථ මිලදී ගැනීම සඳහා ණය වශයෙන් ලබා දෙන ලදී. තවද, සමාලෝචිත වර්ෂය තුළ රුපියල් විසිදහසක් (රු. 20,000) ලබා දීමෙන් කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට (1) පාපැදි මිලදී ගැනීමට අධිකාරිය විසින් සහය ලබා දී ඇත.

වර්ෂය තුළ කාර්ය මණ්ඩල සාමාජිකයන් හැත්තෑ අට දෙනෙකු (78) සඳහා රුපියල් එක් මිලියන එක්ලක්ෂ දෙදහසක් (රු. 1,102,000.00) ක අගයක් උත්සව

ආයතනික කළමනාකරණ ශාඛාව

අත්තිකාරම් ලෙස නිකුත් කර ඇත. මීට අමතරව, මාසයක වැටුප් ණය වශයෙන් රුපියල් තුන් මිලියන තිස්පන් ලක්ෂ තුන්සිය තිහක (රු. 335,330.00) ණය මුදලක් නිකුත් කර ඇත.

සුබසාධන පහසුකමක් ලෙස CAASL හි මඩකලපු බංගලාව කාර්ය මණ්ඩලය සඳහා සහනදායී මිලකට යටතේ ලබා දෙන ලදී. රට තුළ වසංගත තත්වය පැවතිය ද කාර්ය මණ්ඩල සාමාජිකයන් හත් දෙනෙකු (7) විසින් මෙම කාලය තුළ මෙම පහසුකම භාවිත කර ඇත. තවද, සුබසාධන පහසුකම් ස්ථාපිත කිරීම වැඩිදියුණු කරමින් අධිකාරිය විසින් සිය කාර්ය මණ්ඩල සාමාජිකයන්ට සුපුරුදු පරිදි දුම්රිය පහසුකම් ලබා දෙන ලදී.

පුහුණු කිරීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු, රැස්වීම්, සමුළු සහ පරීක්ෂණ

CAASL විසින් මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා අඛණ්ඩව ආයෝජනය කළ අතර, සේවකයින් අධිකාරියේ අනාගත සාර්ථකත්වය සඳහා අවශ්‍ය කුසලතාවලින් සහ දැනුමෙන් පෝෂණය වීම සහතික කරලීමට එහි දැක්මට අනුකූලව ඵලදායී ශ්‍රම බලකායක් ක්‍රියාත්මක කරන ලදී. දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් පැවැත්වෙන මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සඳහා රුපියල් හයමිලියන දෙලක්ෂ හැත්තෑ එක් දහස් හයසිය පනස් තුනක් සහ ශත අනූ තුනක් (රු. 6,271,653.93) වැය කර ඇත.

සමාලෝචිත කාල සීමාව තුළ, කොවිඩ්-19 ගෝලීය වසංගත තත්වය දේශීය හා විදේශීය පුහුණුවීම් සඳහා භෞතිකව සහභාගී වීමට විශාල බලපෑමක් ඇති කළේය. කෙසේ වෙතත්, මානව කුසලතා වර්ධනය කිරීම සහ උපයෝගී කර ගැනීමේ අරමුණින් විකල්ප පුහුණු ක්‍රම හරහා ළඟා වීම ඉලක්කය වූ බැවින්, අන්තර්ජාල පහසුකම් හරහා සේවකයන්ට පුළුල් පරාසයක පුහුණුවීම් ලබා දෙන ලදී. එබැවින්, 2021 වසර තුළ කාර්ය මණ්ඩල සාමාජිකයන් එකසිය විසි හතරක් (124) සඳහා රුපියල් එක් මිලියන එක්ලක්ෂ හැට දෙදහස් අටසිය තිස් දෙකයි ශත පනස් නවයක (රු. 1,162,832.59) වැය කරමින් මාර්ගගත පුහුණු සැසි පවත්වා ඇත.

මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සඳහා දරන ලද පිරිවැය - 2021



4 වන රූපය - මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සඳහා දරන ලද පිරිවැය - 2021

ගුවන්සේවා කර්මාන්තයේ පවතින ගතික ස්වභාවය (Dynamic Nature) එහි නියැලී සිටින වෘත්තිකයන්ට වඩාත් යාවත්කාලීන කුසලතා සහ නිපුණතාවලින් පෝෂණය වීමට අභියෝග කරනු ලබයි. එබැවින්, සමාලෝචිත කාල සීමාව තුළ දේශීය හා විදේශීය පුහුණුවීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු, රැස්වීම් සහ පරීක්ෂණ හැට නවයක් (69) පවත්වා ඇත. මේ සම්බන්ධයෙන් වන නවතම ප්‍රවණතා පිළිබඳ අවශ්‍යකරන යාවත්කාලීන දැනුම ලබා ගැනීම සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයන් එකසිය අසූ (187) දෙනෙකු පුහුණු කර ඇත. පෙර වසරට සාපේක්ෂව මුළු පුහුණු ප්‍රමාණයේ 30% ක වර්ධනයක් මෙමඟින් පෙන්නුම් කරනු ලබයි.

මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ගණන - 2021



5 වන රූප සටහන - මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ගණන - 2021

ආයතනික කළමනාකරණ ශාඛාව

කාර්ය මණ්ඩලයේ පොදු පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඇති අතර, “Train the Trainer” නමින් කළමනාකරුවන්ගෙන් යුතු කාර්ය මණ්ඩල සඳහා රුපියල් දෙමිලියන නවදහසක් (රු. 209,000.00) ක පිරිවැයක් දරමින් විශේෂ පුහුණුවක් ලබා දී ඇත. “Traffic Rules and Ethics” නමින් ප්‍රාථමික මට්ටමේ පුහුණු (රියදුරු කාණ්ඩයේ) කාර්ය මණ්ඩලය සඳහා රුපියල් විසි අටදහසක් (රු. 28,000) වැය කොට වැඩසටහනක් පවත්වා ඇත.

දේපළ කළමනාකරණ ක්‍රියාකාරකම්

HRPM අංශයේ ආයතනික කටයුතු සහ දේපළ කළමනාකරණය, පහසුකම් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම තුළින් අධිකාරියේ ප්‍රධාන අරමුණට අබණ්ඩව දායක වේ. පහසුකම් සැපයීම හරහා අබණ්ඩ ක්‍රියාවලියක් පවත්වා ගැනීම සඳහා මෙම අංශය අනෙකුත් අංශ වෙත විවිධාංගීකරණය වූ සේවා පැතිකඩ තවදුරටත් සපයයි.

සමාලෝචිත වර්ෂය තුළ, ශ්‍රී ලංකා රජය විසින් පනවා ඇති සංචාරක සීමා කිරීම් සහ ඇඳිරි නීතිය හේතුවෙන් අධිකාරියේ සාමාන්‍ය ක්‍රියාකාරිත්වයට බලපෑම් එල්ල වී ඇත. කාර්ය මණ්ඩලයට භෞතිකව රාජකාරියට සහභාගී වීමට නොහැකි වුවද, බොහෝ කාර්ය මණ්ඩල සාමාජිකයන් ආරක්ෂිතව නිවසේ රැඳී සිටිමින් තම රාජකාරී කටයුතු පවත්වා ගෙන යන ලදී. කාර්යාල පරිශ්‍රය කොවිඩ්-19 වෛරසයේ බලපෑමෙන් තොරව පවත්වා ගැනීමට මානව සම්පත් සහ දේපළ කළමනාකරණ අංශය සිය දායකත්වය පුළුල් කළේය. සමස්ත පරිශ්‍රයම විෂබීජහරණය කිරීම, අත් සේදීමේ ස්ථාන පිහිටුවීම, ප්‍රමාණවත් සනීපාරක්ෂක අත් සේදුම් දියර සැපයීම සහ ඒවා සෑම මහලකටම ලබා දීම, මුහුණු ආවරණ බෙදාහැරීම යනාදිය ඇතුළුව ක්‍රියාමාර්ග කිහිපයක් මේ සම්බන්ධයෙන් ගෙන ඇත.

2016/07/01 දිනැති අංක 1973/78 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධානවලට අනුව, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, ඒ ආශ්‍රිත දේපළ, මඩකලපුව ගුවන්තොටුපළ සහ රත්මලාන ගුවන්තොටුපළ ඇතුළුව CAASL වෙත පවරා ඇති හඳුනාගත් දේපළ පිළිබඳ පරිපාලන ලේඛන කටයුතු CAASL විසින් ආරම්භ කර ඇත. ඒ අනුව, පහත සඳහන් ගගන නාවික පහසුකම් පැවරීම සහ ඊට අදාළ ඉඩම් දේපළ (2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ තුන්වන උපලේඛනයේ දක්වා ඇති) පැවරීමේ ක්‍රියාවලිය සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කර ඇත.

- රත්මලාන කඳවල පාරෙහි පිහිටි සිවිල් ගුවන්සේවා පුහුණු මධ්‍යස්ථානය, ගොඩනැගිලි සහ එහි ව්‍යුහයන් සහ ඊට අදාළ භූමිය
- රත්මලාන අත්තිඩියේ පිහිටි ගගන සන්නිවේදන සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය, එහි ඇති ගොඩනැගිලි සහ ව්‍යුහයන් සහ ඊට අදාළ ඉඩම.
- ගම්පහ, මඩම්පැල්ලෙහි පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සඳහා වන රේඩියෝ සන්තරණ ආධාරකය, ගොඩනැගිලි සහ එහි ව්‍යුහයන් සහ ඊට අදාළ ඉඩම.
- ගම්පහ පමුණුගම, කපුගොඩ පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ධාවන පථය සඳහා රේඩියෝ සන්තරණ ආධාරකය, ගොඩනැගිලි සහ එහි ව්‍යුහයන් සහ ඊට අදාළ ඉඩම.
- පිදුරුතලාගල කන්දේ පිහිටි රේඩාර් මධ්‍යස්ථානය, එහි ඇති ගොඩනැගිලි සහ ව්‍යුහයන් සහ ඊට අදාළ ඉඩම.
- නුවරඑළිය දිස්ත්‍රික්කයේ, පිදුරුතලාගල පිහිටි භූමියේ එහි කිසියම් ව්‍යුහයක් හෝ ඊට අදාළ දෑ ඇතුළුව, ගුවන්සේවා කාර්ය මණ්ඩලය සඳහා නිවාඩු බංගලා ඉදිකර ඇත.

මූල්‍ය සහ ආදායම් කළමනාකරණ අංශය

වැඩසටහන් අයවැය

වැඩසටහන් අයවැය - 2021 මඟින් ඉදිරි වසරේ වියදම්, ගුවන් අවකාශ හා ගුවන්සේවා සුරක්ෂිතතා නියාමනය, පියාසැරි නිරුපද්‍රවතා නියාමනය සහ සංස්ථාපිත කටයුතු සහ ආර්ථික නියාමනය යන ප්‍රධාන කාර්යයන් හතරක් යටතේ දක්වනු ලබයි. සංශෝධිත ඇස්තමේන්තුගත පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් රු. මිලියන 669 ට සාපේක්ෂව සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම රු. මිලියන 846 ක් ලෙස පෙන්නුම් කරයි.

ආයතනික කළමනාකරණ ශාඛාව

CAASL ආදායම් සහ වියදම්

පෙර වසරට සාපේක්ෂව CAASL ආදායම 14% ක වර්ධනයක් සමඟින්, තථ්‍ය ආදායම රුපියල් මිලියන 986 සිට රුපියල් මිලියන 1,128 දක්වා විය. විතෙර විකුණුම් අධිභාරය සහ අපගමන බද්දේ සේවා ගාස්තුවෙන් ලැබෙන ආදායමේ සුළු වර්ධනයක් දැක ගත හැකිය.

පසුගිය වසරට සාපේක්ෂව තථ්‍ය වියදම්හි 4% ක වර්ධනයක් දැක ගත හැකිය.

කළමනාකරණ තොරතුරු

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

2020 වසරට සාපේක්ෂව 2021 වසර සඳහා වෙනත් ආදායම්



2020 වසරට සාපේක්ෂව 2021 වසරේ මුළු ආදායම



2020 වසරට සාපේක්ෂව 2021 වසරේ OSS ආදායම



2020 වසරට සාපේක්ෂව 2021 වසරේ ප්‍රාග්ධන වියදම්



2020 වසරට සාපේක්ෂව 2021 වසරේ පුනරාවර්තන වියදම්



ඇස්තමේන්තුවෙහි සහ තථ්‍ය ගණනයෙහි වෙනස - 2021



CAASL හි කාර්ය සාධන සාරාංශය - 2021

නියාමන/නිවේදන/නීති සංඛ්‍යාව	2021	2020
ගුවන් යානා මෙහෙයුම්	2	2
ගුවන් යානා ලියාපදිංචිය සහ ගුවන් යෝග්‍යතාව	1	2
ගගන යාත්‍රාංගණ	2	1
ගුවන් සන්තරණ සේවා	5	7
ගුවන් සේවා ආරක්ෂණය	6	4
ගුවන් වෛද්‍ය සේවා	14	3

සංවිධාන/පුද්ගල මූලික සහතිකකරණය	2021	2020
ගුවන් සමාගම් (විදේශ)	9	3
නඩත්තු සංවිධාන	3	11
නියමුවන්	192	106
ගුවන් යානා නඩත්තු බලපත්‍රලාභීන්	32	18
පියාසැරි මෙහෙයුම් නිලධාරීන් (ගුවන් යානා පිටත් කර හැරීම්)	1	-
පියාසැරි උපදේශකවරුන්	-	1
සහකාර පියාසැරි උපදේශකවරුන්	6	3
භූමි උපදේශකවරුන්	15	-
ගුවන් යානා මැදිරි කාර්ය මණ්ඩල සාමාජිකයන්	6	-
පියාසැරි පාසල් බලපත්‍රය	-	2

CAASL හි කාර්ය සාධන සාරාංශය - 2021

සහතික කළ සංවිධාන/පුද්ගල නිරීක්ෂණ	2021	2020
බෑවුම් (Ramp) පරීක්ෂාවන් - ගුවන් යෝග්‍යතාව	-	20
බෑවුම් (Ramp) පරීක්ෂාවන් - මෙහෙයුම්	3	7
ගගන යාත්‍රාංගණ පරීක්ෂාවන්	29	40
ගුවන් ගමන් සේවා පරීක්ෂාවන්	27	32
ගුවන් යානා නඩත්තු සංවිධාන පරීක්ෂාවන්	10	2
අනුමත නඩත්තු පුහුණු සංවිධාන පරීක්ෂාවන්	1	-
අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධාන (CAMO) පරීක්ෂාවන්	8	1
පියාසැරි පුහුණු පාසල් පරීක්ෂාවන්	8	14
ගුවන් සේවා ආරක්ෂණ නිරීක්ෂණ ක්‍රියාකාරකම් (පරීක්ෂාවන්, විගණන, සමීක්ෂණ, පරීක්ෂණ) පැවැත්වීම	52	55
විඩම්බක පරීක්ෂාවන්	3	3
මාර්ගස්ථ පරීක්ෂාවන්	1	2
අන්තරායකර භාණ්ඩ පරීක්ෂාවන්	12	10
ගගන නාවික තොරතුරු සේවා පරීක්ෂාවන්	9	10
ප්‍රධාන කඳවුර පරීක්ෂාවන් / උපදේශක නිරීක්ෂණ	8	8
නම් කළ පිරික්සුම් නියමුවන් (DCP අධීක්ෂණය)	16	26

2021 වර්ෂයේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක

මෙහෙයවීම සහ කළමනාකරණය	2021	2020
අධිකාරි රැස්වීම්	9	8
විගණන කමිටු රැස්වීම්	3	6
කාර්ය මණ්ඩල කමිටු රැස්වීම්	2	3
කර්මාන්ත උපදේශක රැස්වීම්	68	79
බාහිර, සංවිධානය / පෞද්ගලික වෙත පත්කිරීම	137	184
ලද ලිපි ගණන	13,428	6,226
NGAP ශ්‍රී ලංකා කමිටු රැස්වීම්	15	9

නෛතික කටයුතු සහ බලාත්මක කිරීම (LA&E)	2021	2020
නිකුත් කරන ලද/සමාලෝචනය කරන ලද/සංශෝධිත අනුබද්ධ නීති	13	3
ගිවිසුම් / අවබෝධතා ගිවිසුම	26	17
නීතිපති දෙපාර්තමේන්තුවෙහි/නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙහි සහභාගී වූ උපදේශන සංඛ්‍යාව	11	13
නෛතික කරුණු සම්බන්ධයෙන් CAASL/DGCA වෙත නීති උපදෙස් ලබා දීම	103	59
උසාවියේ පෙනී සිටීම්	22	26
සකස් කරන ලද නෛතික ලියකියවිලි	8	4
සමාලෝචනය කරන ලද CAASL ලියකියවිලි ගණන	7	34

ගුවන්සේවා ආරක්ෂණය (AVSEC)	2021	2020
සමාලෝචන/සංශෝධන - NCASP සහ අනුබද්ධ ලේඛන	-	5
ඇගයීම්/සමාලෝචන - දේශීය ගුවන් සමාගම්/ගුවන්තොටුපළ ක්‍රියාකරු ගුවන්සේවා ආරක්ෂණ වැඩසටහන	10	15
ඇගයීම්/සමාලෝචන - විදේශීය ගුවන් සමාගම් ක්‍රියාකරු ගුවන්සේවා ආරක්ෂණ වැඩසටහන	17	27
ඇගයීම්/සමාලෝචන - ගුවන්සේවා ආරක්ෂණ පුහුණු වැඩසටහන/ අධ්‍යයන පරාසය	7	1
ගුවන්සේවා ආරක්ෂක නිරීක්ෂණ ක්‍රියාකාරකම් පැවැත්වීම (පරීක්ෂණ, විගණන, සමීක්ෂණ, පරීක්ෂණ)	52	55
ගුවන්සේවා ආරක්ෂක කළමනාකරුවන් සහතික කිරීම සහ නැවත සහතික කිරීම	20	2
ගුවන්සේවා ආරක්ෂක උපදේශකයන් සහතික කිරීම සහ නැවත සහතික කිරීම	14	13
ගුවන්සේවා ආරක්ෂක පිරික්සුම්කරුවන් සහතික කිරීම සහ නැවත සහතික කිරීම	648	452
ගුවන් යානයක් තුළ/භාණ්ඩ රඳවනයන් මත ආයුධ රැගෙන යාම සඳහා අනුමැතිය	47	62
ගුවන්තොටුපළ ප්‍රවේශ බලපත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශ කිරීම	191	37
ගුවන්සේවා ආරක්ෂක පුහුණුව / දේශන / ඉදිරිපත් කිරීම් පැවැත්වීම	6	1
රාජ්‍ය සහ අනෙකුත් ආයතන සඳහා විශේෂඥ සේවා සැපයීම	-	2

2021 වර්ෂයේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක

පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති (ERP)	2021	2020
ජාත්‍යන්තර ගුවන් සමාගම් සංඛ්‍යාන වාර්තා	317	314
අභ්‍යන්තර ගුවන් සමාගම් සංඛ්‍යාන වාර්තා	48	43
ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංඛ්‍යාන වාර්තා	24	28
අභ්‍යන්තර ගුවන්තොටුපළ සංඛ්‍යාන වාර්තා	17	17
යවන ලද ICAO වාර්තා කිරීමේ පෝරම	51	26
CAASL ක්‍රියාකාරකම්හි කාර්යසාධන සංඛ්‍යාන වාර්තා	214	181
CAASL හි රාජ්‍ය ආයතන/සාමාන්‍ය ප්‍රජාව/අනෙකුත් අංශ සඳහා සංඛ්‍යාලේඛන විධිවිධාන	20	15
නිකුත් කල ලංසු/RFP (යෝජනා සඳහා ඉල්ලීම)	40	28
ප්‍රදානය කරන ලද ගිවිසුම්	53	42
සකස් කරන ලද CAASL මණ්ඩල පත්‍රිකා	2	2
CAASL වැඩමුළු/උත්සව/වැඩසටහන්/විශේෂ දින සඳහා පරිපාලන සහය	3	4
රැස්වීම්/පුහුණුවීම්/සම්මන්ත්‍රණ/වැඩමුළු (ගුවන්සේවා) සංවිධානය කිරීම සඳහා පරිපාලනමය සහය	1	2

ගුවන් සන්තරණ සේවා (ANS)	2021	2020
පවත්වන ලද ATS පරීක්ෂණ	27	32
පවත්වන ලද AIS පරීක්ෂණ	9	10
පවත්වන ලද SAR පරීක්ෂණ	3	4
පවත්වන ලද CNS පරීක්ෂණ	21	30
පවත්වන ලද සිතියම් සහ ප්‍රස්ථාර පරීක්ෂණ	3	3
පවත්වන ලද PANS-OPS පරීක්ෂණ	-	1
NOTAM නිකුතුව සඳහා අනුමැතීන්	579	442
නිකුත් කරන ලද AIP අතිරේකය	3	8
AIP සංශෝධනය	1	-
අනුමත ගුවන් කාර්යයන් ගණන	41	24
නිකුත් කරන ලද AIC ගණන	4	5
නිකුත් කරන ලද ගොඩබෑමේ නිෂ්කාශන	551	451
නිකුත් කරන ලද ගුවන් පියාසැරි නිෂ්කාශන	584	859
කාලසටහන්ගත නොකළ පියාසැරි අනුමත කිරීම් ගණන	1,135	1,317
යවන ලද AFTN	478	600
ලද AFTN	3,850	2,225
ගොඩබෑමේ සහ වාහන නැවැත්වීමේ ගාස්තුවලින් නිදහස් කිරීම් ගණන	12	4
රාජ්‍ය තාන්ත්‍රික පියාසැරිය (ගොඩබෑම) සඳහා විරෝධතා නොමැති සටහන් ගණන	153	68
රාජ්‍ය තාන්ත්‍රික පියාසැරිය (ඉහළින් පියාසර කිරීම) සඳහා විරෝධතා නොමැති සටහන් ගණන	57	53
කොළඹ පියාසර තොරතුරු කලාපයට ඉහළින් පියාසර කරන ගුවන්යානා සංඛ්‍යාව	9,757	16,543

2021 වර්ෂයේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක

ගගන යාත්‍රාංගන සහ පහසුකම් සැලසීම	2021	2020
අනුමත කල කුළුණු ගණන	343	46
උස් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය	172	96
ගොඩබිම් ගුවන්තොටුපළ සහතිකය - අලුත් කිරීම්	1	1
සිදු කරන ලද ගගන යාත්‍රාංගන නිරීක්ෂණ	29	40

ගුවන්සේවා පුහුණුව සහ පුද්ගල බලපත්‍ර	2021	2020
ශිෂ්‍ය නියමු බලපත්‍ර (SPL) (නිකුත් කිරීම + අලුත් කිරීම්)	211	114
පෞද්ගලික නියමු බලපත්‍ර (PPL) (නිකුත් කිරීම+ අලුත් කිරීම්)	173	87
වාණිජ නියමු බලපත්‍ර (CPL) (නිකුත් කිරීම+ අලුත් කිරීම්)	306	176
ගුවන් ප්‍රවාහන නියමු බලපත්‍ර (ATPL) (නිකුත් කිරීම+ අලුත් කිරීම්)	448	295
ගුවන් ගමන් පාලක බලපත්‍ර (ATC) නිකුත් කිරීම + අලුත් කිරීම්)	54	49
ගුවන්යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍ර (නිකුත් කිරීම+ අලුත් කිරීම්)	2	1
ගුවන්යානා නඩත්තු බලපත්‍රය (නිකුත් කිරීම + අලුත් කිරීම්)	81	144
ගුවන්යානා නඩත්තු බලපත්‍ර - ශ්‍රේණිගත කිරීම් වර්ග (නිකුත් කිරීම්)	36	50
ගුවන්යානා නඩත්තු බලපත්‍ර - කාණ්ඩ (නිකුත් කිරීම්)	1	2
ගුවන්යානා මැදිරි කාර්ය මණ්ඩල සහතිකය (නිකුත් කිරීම + අලුත් කිරීම්)	176	96
පියාසර මෙහෙයුම් නිලධාරි බලපත්‍රය (නිකුත් කිරීම +අලුත් කිරීම්)	1	-
PPL, CPL සහ ATPL නිකුත් කිරීම් සඳහා ගුවන්යානා වර්ග ශ්‍රේණිගත කිරීම	67	62
සහකාර පියාසර උපදේශක (AFI) සහ පියාසර උපදේශක (FI) ශ්‍රේණිගත කිරීම - (නිකුත් කිරීම + අලුත් කිරීම්)	9	4
පියාසර පාසල් බලපත්‍ර (නිකුත් කිරීම + අලුත් කිරීම්)	9	8
භූමි උපදේශක බලපත්‍රය (නිකුත් කිරීම +අලුත් කිරීම්)	3	6
භූමි උපදේශක අනුමැතීන් (නිකුත් කිරීම + අලුත් කිරීම්)	19	28
ගුවන් ගමන් පාලක ශ්‍රේණිගත කිරීම (නිකුත් කිරීම්+ අලුත් කිරීම්)	120	140
NIB නිෂ්කාශන නිකුත් කිරීම	114	100
PPL විභාගය (ප්‍රශ්න පත්‍ර ගණන)	463	291
AML විභාගය (පරීක්ෂණ ගණන)	1	1
AML විභාගය (ප්‍රශ්න පත්‍ර ගණන)	1,114	1,105
ATPL (A) විභාග	33	21
ATPL (A) භාර දුන් ප්‍රශ්න පත්‍ර ගණන	737	416
ATPL (H) විභාග	1	1
ATPL (H) විභාගය (ප්‍රශ්න පත්‍ර ගණන)	6	3
ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පරීක්ෂාව (ELPC)	124	85
ගුවන්විදුලි දුරකථන ප්‍රායෝගික පරීක්ෂණය	64	40
සහකාර පියාසර උපදේශක විභාගය (න්‍යායාත්මක සහ වාචික)	16	4

2021 වර්ෂයේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක

ගුවන්යානා මෙහෙයුම්	2021	2020
විශේෂ මෙහෙයුම්	41	52
විදේශ ගුවන් ක්‍රියාකරු සහතිකය - පළමු නිකුත් කිරීම	9	3
විදේශ ගුවන් ක්‍රියාකරු සහතිකය - අලුත් කිරීම	29	30
අන්තරායකර භාණ්ඩ ප්‍රවාහන බලපත්‍ර - පළමු නිකුත් කිරීම	-	3
අන්තරායකර භාණ්ඩ ප්‍රවාහන බලපත්‍ර - අලුත් කිරීම	12	12
DCP - පළමු නිකුත් කිරීම	5	3
DCP අලුත් කිරීම	17	24
ජාත්‍යන්තර ගුවන් ක්‍රියාකරු සහතිකය - අලුත් කිරීම	1	2
සිමියුලේටර් අලුත් කිරීම	3	3
PPC අවසරය	87	81
සිදු කරන ලද නිරීක්ෂණ කටයුතු	31	40

ගුවන්යානා ලියාපදිංචිය සහ ගුවන් යෝග්‍යතාව (AR සහ AW)	2021	2020
සිදු කරන ලද නිරීක්ෂණ කටයුතු (බෑවුම්, විගණනය)	81	68
ගුවන්යානාවන්හි ගුවන් යෝග්‍යතා සහතිකය - පළමු නිකුත් කිරීම	4	1
ගුවන්යානාවන්හි ගුවන් යෝග්‍යතා සහතිකය - අලුත් කිරීම	54	48
ගුවන්යානා ලියාපදිංචි කිරීමේ සහතිකය - පළමු නිකුත් කිරීම	3	2
ගුවන්යානා ලියාපදිංචි කිරීමේ සහතිකය - අලුත් කිරීම	69	68
නඩත්තු සංවිධානය (දේශීය) - පළමු නිකුත් කිරීම	-	2
නඩත්තු සංවිධානය (දේශීය) - අලුත් කිරීම	10	19
නඩත්තු සංවිධානය (විදේශීය) - පළමු නිකුත් කිරීම	3	9
නඩත්තු සංවිධානය (විදේශීය) - අලුත් කිරීම	55	49
නඩත්තු පුහුණු සංවිධානය - අලුත් කිරීම	3	1
අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධානය - පළමු නිකුත් කිරීම	-	1
අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධානය - අලුත් කිරීම	5	6
ගුවන්සේවා සිදුවීම් පිළිබඳ විමර්ශන	164	55

2021 වර්ෂයේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක

ගුවන් ප්‍රවාහනය සහ ආර්ථික නියාමන (ATER)	2021	2020
අභ්‍යන්තර ගුවන් ගමන් කාලසටහන් අනුමත කිරීම්	44	42
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරුවන් සඳහා සිදු කරන ලද ඇගයීම්	29	49
ජාත්‍යන්තර ගුවන් ගමන් කාලසටහන් අනුමත කිරීම්	1,093	833
විදේශ තාක්ෂණික/තාක්ෂණික නොවන විශේෂඥ කාර්ය මණ්ඩලය සඳහා වීසා බලපත්‍ර නිර්දේශ	71	41
ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් සේවය සඳහා වරලත් බලපත්‍රය	7	5
ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් සමාගම සඳහා ගුවන් බලපත්‍රය	5	2
වරලත් බලපත්‍ර - අභ්‍යන්තර නිත්‍ය මෙහෙයුම්	2	-
ගුවන් ප්‍රවාහන සැපයුම්කරුගේ බලපත්‍ර	309	317
වසර අවසානයේ විවෘත ගුවන්සේවා ගිවිසුම්	19	19

මානව සම්පත් සහ දේපළ කළමනාකරණය (HRPM)	2021	2020
කාර්ය මණ්ඩල බඳවා ගැනීම්	8	4
මුළු කාර්ය මණ්ඩලය (ස්ථිර සේවක සංඛ්‍යාව)	176	175
පහසුකම් සලසන ලද විදේශ පුහුණුවීම්/සම්මන්ත්‍රණ/වැඩමුළු	-	2
පහසුකම් සලසන ලද විදේශ රැස්වීම් / සම්මන්ත්‍රණ / සමුළු	2	2
පහසුකම් සලසන ලද විදේශ පරීක්ෂණ	1	2
පහසුකම් සලසන ලද දේශීය පුහුණුවීම්/සම්මන්ත්‍රණ/වැඩමුළු	4	25
පහසුකම් සලසන ලද දේශීය අභ්‍යන්තර පුහුණු වැඩසටහන් (උපදෙස් ඇතුළුව)	8	3
පහසුකම් සලසන ලද මාර්ගගත පුහුණුව/ සම්මන්ත්‍රණ/වැඩමුළු	53	23
පහසුකම් සලසන ලද මාර්ගගත රැස්වීම්/සම්මන්ත්‍රණ	5	-
සකස් කරන ලද කාර්යසාධන ඇගයීම්	141	121
පහසුකම් සලසන ලද කාර්ය මණ්ඩල සඳහා ණය	47	199
ලබා ගත් සහ බෙදා හරින ලද ICAO ලේඛනයන්	720	424

මූල්‍ය සහ ආදායම් කළමනාකරණය (F සහ RM)	2021	2020
එකතු කරන ලද මුළු ආදායම (රු. මිලියන)	1,128	986
දරන ලද මුළු වියදම (රු. මිලියන)	707	679
ගෙවන ලද මුළු කාර්ය මණ්ඩල වියදම් (රු. මිලියන)	356	354

තත්ව සහ අභ්‍යන්තර විගණනය (Q සහ IA)	2021	2020
සිදු කරන ලද විගණන	80	84
ඉදිරිපත් කළ නිගමන	110	87

2021 වර්ෂයේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක

ගුවන්සේවා ආරක්ෂණ අධීක්ෂණය	2021	2020
වාර්තා වූ සිදුවීම් (බරපතළ/සුළු)	12	6
වාර්තා වූ අනතුරු	1	-
වාර්තා වූ සිදුවීම්	226	121
මගීන්ට හෝ ගුවන් කාර්ය මණ්ඩලයට සිදු වූ බරපතළ තුවාල	1	-
මගීන්ට හෝ කාර්ය මණ්ඩලයට ඇති වූ සුළු තුවාල	3	2
සකසන ලද නව රෙගුලාසි	-	3
සකසන ලද නව මාර්ගෝපදේශ	1	5
පවතින මාර්ගෝපදේශ සංශෝධනය කිරීම්	8	5
සකසන ලද නව ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් (IS)	2	1
පවතින ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් (IS) සංශෝධනය කිරීම්	2	6
ඩ්‍රෝන ලියාපදිංචිය - දේශීය හිමිකරුවන්	857	383
ඩ්‍රෝන ලියාපදිංචිය - විදේශීය හිමිකරුවන්	171	2
බලපත්‍රලාභීන් සම්බන්ධයෙන් වන අනතුරු/සිදුවීම් සත්‍යාපනය	39	42

ගුවන් වෛද්‍ය සේවා (AMS)	2021	2020
වෛද්‍ය පරීක්ෂණ	1,353	917

තොරතුරු තාක්ෂණය (IT)	2021	2020
පැමිණිලි සංඛ්‍යාව - "හෙල්ප් ඩෙස්ක්" උපකාරක සහය	4,651	2,656
විසඳන ලද පැමිණිලි සංඛ්‍යාව -"හෙල්ප් ඩෙස්ක්" උපකාරක සහය	4,651	2,584
මිලදී ගත් නව තොරතුරු තාක්ෂණ උපකරණ පිළිබඳ සිදු කරන ලද තක්සේරු කිරීම්	14	8

සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධනය සහ මාධ්‍ය	2021	2020
ගුවන්සර සඟරාව පළ කිරීම	1	1
CADEC වැඩසටහන පැවැත්වීම	-	2
පාසල් සිසුන් සඳහා පවත්වන ලද වැඩමුළු	-	1
විශේෂ ක්‍රියාකාරකම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	9	2
මාධ්‍ය ලිපි	27	47
රූපවාහිනී වැඩසටහන්	38	12

2021 වර්ෂයේ ගුවන් ගමන් පිළිබඳ විස්තර

	2021	2020	වර්ධනය
ජාත්‍යන්තර ගුවන් ගමන්			
මගීන්			
ඇතුළු වූ	**708,076**	1,231,939	-43%
පිට වූ	**792,002**	1,140,989	-31%
මාර්ගස්ථ	**196,553**	275,866	-29%
ගුවන් භාණ්ඩ (මෙට්‍රික් ටොන්)			
දේශීය	**72,676**	49,766	46%
ජාත්‍යන්තර	**111,463**	86,327	29%
ගුවන්යානා සංචලන			
කාලසටහන්ගත ගුවන් ගමන්	**18,738**	19,442	-4%
කුලී ගුවන් ගමන්	**2,269**	1,300	75%
මෙහෙයුම් සිදු කරන ලද ගුවන් සමාගම් සංඛ්‍යාව			
නියමිත සේවා	**32**	36	-11%
කුලී	**37**	39	-5%
සියලු ගුවන් භාණ්ඩ	**4**	4	0%
අභ්‍යන්තර ගුවන් ගමන්			
ප්‍රවාහනය කරන ලද මගීන්	**5,406**	8,960	-40%
ගුවන්යානා සංචලන	**1,093**	2,041	-46%
මෙහෙයුම් සිදු කරන ලද ගුවන් සමාගම් සංඛ්‍යාව	**5**	7	-29%
කාලසටහන්ගත ගුවන් ගමන්	**2**	2	0%
කුලී ගුවන් ගමන්	**3**	5	-40%

2021 වර්ෂයේ ගුවන් ගමන් පිළිබඳ විස්තර

කර්මාන්ත තක්සේරු සටහන්

මගී සංචලන



"2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මගී සංචලන"

ගුවන් භාණ්ඩ සංචලන



"2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගුවන් භාණ්ඩ සංචලන"

ගුවන්යානා සංචලන



"2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගුවන්යානා සංචලන"

මූල්‍ය ප්‍රකාශන - 2021

විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2021 රු.	2020 රු.
ආදායම			
මෙහෙයුම් ආදායම	23	**993,344,282**	803,216,822
මෙහෙයුම් නොවන ආදායම	23	**134,905,424**	182,992,523
		1,128,249,706	986,209,345
වියදම			
කාර්ය මණ්ඩල වියදම්	24	**356,754,794**	354,048,327
රැස්වීම්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු	25	**2,292,036**	1,781,594
පුහුණු කිරීම් සඳහා වියදම්	26	**4,617,621**	5,078,282
පරිපාලන සහ වෙනත් වියදම්	27	**195,510,215**	184,820,164
ක්ෂය වීම්	29	**139,863,363**	133,523,370
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම	30	**8,590,685**	256,265
වත්කම පාවිච්චි කිරීමේ හිමිකම් සඳහා ක්ෂය වියදම්	31	**21,034**	21,034
		707,649,748	679,529,036
බදු පෙර ලාභය		**420,599,958**	306,680,309
ආදායම් බදු වියදම්	28	**90,701,569**	69,528,468
වර්ෂය සඳහා ලාභය		**329,898,389**	237,151,840
වෙනත් විස්තීර්ණ ආදායම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් නැවත මිණුම් කිරීමෙන් ජනිත ලාභය / (අලාභය)		**(12,908,854)**	(20,183,552)
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**316,989,535**	**216,968,288**

පිටු අංක 106 සිට පිටු අංක 135 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්ය අංගයකි.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2021 රු.	2020 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	29	**2,231,885,553**	2,309,530,500
අස්පෘශ්‍ය වත්කම්	30	**27,244,041**	4,081,325
වත්කම පාවිච්චි කිරීමේ හිමිකම	31	**336,539**	357,573
නොනිමි වැඩ - ප්‍රාග්ධනය	32	**469,622,199**	464,794,076
ස්ථාවර තැන්පතු - කාර්ය මණ්ඩල සුභසාධනය සහ සමාජ ආරක්ෂණ අරමුදල		**135,269**	128,487
විලම්භිත බදු - වත්කම්		**15,596,177**	10,377,440
මුළු ජංගම නොවන වත්කම්		**2,744,819,778**	**2,789,269,401**
ජංගම වත්කම්			
තොග		**5,624,206**	6,963,707
වෙළඳ ලැබිය යුතු දෑ	33	**126,228,278**	718,952,055
කාර්ය මණ්ඩල ණය	34	**79,172,733**	90,686,852
මූල්‍ය වත්කම්	35	**1,394,337,537**	1,218,129,968
අත්තිකාරම්, පෙර ගෙවුම්, වෙනත් ලැබිය යුතු දෑ	36	**557,517,472**	513,923,665
මුදල් සහ මුදල් සමාන දෑ	37	**1,748,236,749**	1,658,332,429
මුළු ජංගම වත්කම්		**3,911,116,975**	**4,206,988,675**
මුළු වත්කම්		**6,655,936,753**	**6,996,258,076**
හිමිකම් සහ වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
රජයේ ප්‍රදාන	38	**558,598,755**	562,818,117
රඳවාගත් ඉපැයුම්	39	**4,029,697,346**	3,762,707,811
මුළු ප්‍රාග්ධනය සහ සංචිත		**4,588,296,103**	**4,325,525,928**

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2021 රු.	2020 රු.
වගකීම්			
ජංගම නොවන වගකීම්			
විලම්බිත බදු වගකීම්	40	**37,265,104**	35,260,898
කල්බදු වගකීම	41	**329,501**	353,339
ප්‍රතිපාදන සහ වෙනත් වගකීම්	42	**61,267,822**	94,073,855
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	43	**66,185,597**	50,084,994
මුළු ජංගම නොවන වගකීම්		**165,048,024**	**179,773,086**
ජංගම වගකීම්			
වෙළඳ ගෙවිය යුතු දෑ	44	**1,654,555,238**	2,309,954,594
වෙනත් ගෙවිය යුතු දෑ	45	**74,744,483**	61,855,239
ආදායම් බදු වගකීම්	46	**173,292,905**	119,149,229
මුළු ජංගම වගකීම්		**1,902,592,626**	**2,490,959,062**
මුළු හිමිකම් සහ වගකීම්		**6,655,936,753**	**6,996,258,076**

පිටු අංක 106 සිට පිටු අංක 135 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්ය අංගයකි. 2021.12.31 දිනට අධිකාරියේ කටයුතු පිළිබඳ සත්‍යවූත් සාධාරණවූත් දසුනක් මෙම මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳෙන අතර එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සිදු කොට ඇත. මෙම මූල්‍ය ප්‍රකාශ 2022 පෙබරවාරි 25 වන දින පැවති 178 වන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරී මණ්ඩල රැස්වීමේදී අනුමත කොට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබන ලදී.

කපිතාන් තේමිය අබේවික්‍රම
සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්
සහ ප්‍රධාන විධායක නිලධාරී

උපුල් ධර්මදාස
සභාපති

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
2022 පෙබරවාරි 28

ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

	රජයේ ප්‍රදාන රු.	රඳවාගත් ඉපැයුම් රු.	මුළු එකතුව රු.
2020 ජනවාරි 1 වන දිනට ශේෂය	567,094,016	3,545,739,523	4,112,833,539
කාල පරිච්ඡේදය සඳහා ලාභය	-	237,151,840	237,151,840
වර්ෂය සඳහා ක්‍රමක්ෂය කිරීම	(4,275,899)	-	(4,275,899)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් නැවත මිණුම් කිරීම	-	(20,183,552)	(20,183,552)
2020 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	562,818,117	3,762,707,811	4,325,525,928
කාලපරිච්ඡේදය සඳහා ලාභය	-	329,898,389	329,898,389
ඒකාබද්ධ අරමුදල වෙත පැවරුම්	-	(50,000,000)	(50,000,000)
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් නැවත මිණුම් කිරීම	-	(12,908,854)	(12,908,854)
වර්ෂය සඳහා ක්‍රමක්ෂය කිරීම	(4,219,362)	-	(4,219,362)
2021 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	558,598,755	4,029,697,346	4,588,296,103

පිටු අංක 106 සිට පිටු අංක 135 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්ය අංගයකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය	සටහන	2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහය			
බදු අය කිරීමට පෙර සාමාන්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද ලාභය/(අලාභය)		**420,599,959**	306,680,309
ගැලපුම්			
ක්ෂය වීම්	29	**139,863,363**	133,523,370
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම	30	**8,590,685**	256,265
වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම් සඳහා ක්ෂය වියදම්	31	**21,034**	21,034
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	38	**(4,219,362)**	(4,275,899)
ආයෝජන වෙතින් ලද පොලී ආදායම	23	**(120,997,733)**	(167,903,923)
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද (ලාභය) / අලාභය		**243,984**	125,663
කල්බදු වගකීම්හි මූල්‍ය පිරිවැය	41	**2,946**	1,516
නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන	43	**8,350,858**	6,890,186
කාරක ප්‍රාග්ධනයෙහි වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)		**452,455,734**	**275,318,521**
තොගයෙහි වැඩිවීම		**1,339,500**	(760,483)
වෙළඳ ලැබිය යුතු දෑහි (වැඩිවීම) / අඩුවීම	33	**592,723,776**	(594,434,118)
කාර්ය මණ්ඩල ණයවල (වැඩිවීම) / අඩුවීම	34	**15,403,383**	(39,535,096)
අත්තිකාරම්/පෙරගෙවීම්/වෙනත් ලැබිය යුතු දෑ හි (වැඩිවීම)/අඩුවීම	36	**(17,447,387)**	12,402,778
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ හි වැඩිවීම	44/45	**(642,510,113)**	313,891,308
මෙහෙයුම්වලින් ජනිත මුදල්		**401,964,894**	**(33,117,090)**
අනුමත නොකළ වීකතු කළ අගය මත බදු		**-**	-
ගෙවන ලද නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය (පාරිතෝෂිකය)	43	**(5,159,109)**	(17,449,856)
ගෙවන ලද ආදායම් බදු	46	**(39,772,423)**	(164,706,977)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ලද ශුද්ධ මුදල්		**357,033,363**	**(215,273,922)**
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් වූ මුදල් ප්‍රවාහ			
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	29	**(62,565,451)**	(10,668,748)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම	30	**(31,753,401)**	(2,497,500)
නොනිමි ප්‍රාග්ධනයෙහි වැඩිවීම	32	**(4,828,122)**	(38,734,826)
වෙනත් ආයෝජන ඉවත් කර ගැනීම/අත්පත් කර ගැනීම	35	**(171,880,262)**	(356,434,700)
ලද පොලිය		**86,634,742**	132,987,202
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල්		**103,051**	72,525
බැංකු සහතිකයේ අඩුවීම		**(32,812,815)**	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යොදවන ලද ශුද්ධ මුදල		**(217,102,258)**	**(275,276,045)**
මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් වූ මුදල් ප්‍රවාහ			
ඒකාබද්ධ අරමුදල වෙත දායකත්වය		**(50,000,000)**	-
කල්බදු පදනමින් ගත් වීරවිල ඉඩම සඳහා ගෙවීම	41	**(26,784)**	(26,784)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදවන ලද ශුද්ධ මුදල		**(50,026,784)**	**(26,784)**
මුදල් සහ මුදල් සමාන දෑහි ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		**89,904,320**	**(490,576,752)**
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ	37	**1,658,332,429**	**2,148,909,180**
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	37	**1,748,236,749**	**1,658,332,429**

පිටු අංක 106 සිට පිටු අංක 135 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්ය අංගයකි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.1 පොදු තොරතුරු

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ලියාපදිංචි කාර්යාලය නො.152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක හි පිහිටා ඇත.

1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වාභාවය

2020 දෙසැම්බර් 27 දිනැති 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත යටතේ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පිහිටුවන ලදී. එහි ක්‍රියාවලිය ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ සිවිල් ගුවන් සේවයේ විධිමත්භාවය මෙන්ම ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ 2002 අංක 34 දරන පනත සහ 2010 අංක 14 දරන පනතෙහි ව්‍යවස්ථාදායක නියෝග යටතේ, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් අනුගමනය කරන ලද අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පිළිවෙත්වලට අනුකූලව පරිසරය වෙත එහි බලපෑම පාලනය කරමින් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට අනුව කටයුතු කරනු ලබයි.

1.3 නිකුත් කිරීම සඳහා අවසර ලබා දුන් දිනය

2022 ජුනි 10 වනිදා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට අවසර ලබා දී ඇත.

සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වසරට අධිකාරියේ මූල්‍ය තත්ව ප්‍රකාශය, ලාභ හෝ අලාභ ප්‍රකාශය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම, හිමිකම් වෙනස් වීම, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ සටහන් ඇතුළත් සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති ("මූල්‍ය ප්‍රකාශ"), සංසන්දනාත්මක තොරතුරු සමඟින්, ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලයෙන් නිකුත් කර ඇති පරිදි, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති දක්වනු ලබන ("IFRS") ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRs) (LKAS) අනුව සකස් කර ඇත. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ කළමනාකරණය මූල්‍ය ප්‍රකාශ සැකසීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම දරනු ලබයි.

2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත සකස් කර ඇති අතර, මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමින් මනිනු ලැබේ.

2.3 ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල්

අධිකාරියේ ක්‍රියාකාරී මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල් ලෙස හඳුනා ගැනෙන අතර, මූල්‍ය ප්‍රකාශ ද ශ්‍රී ලංකා රුපියල් මඟින් නිරූපණය කරනු ලබයි.

2.4 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට ඇති හැකියාව කළමනාකරණය විසින් තක්සේරු කරනු ලබයි. අධිකාරියට එහි නීත්‍යනුකූල කටයුතු ඉටු කිරීමට සහ ඉදිරි අනාගතයේ දී මෙහෙයුම් හි පැවැත්ම පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට කළමනාකරණය සතුව සාධාරණ බලාපොරොත්තුවක් පවතී. අනාගතය පිළිබඳ පවතින තොරතුරු සලකා බලන කල්හි ඈවර කිරීමකට හෝ මෙහෙයුම් නැවැත්වීමට අවශ්‍ය යැයි අධිකාරිය විසින් අපේක්ෂා කරනු නොලබයි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අධිකාරිය විසින් අඛණ්ඩ පැවැත්මේ පදනම යොදා ගනු ලබයි.

2.5 සැලකිය යුතු ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා කළමනාකරණය විසින් ආදායම්, වියදම්, වත්කම්, සහ වගකීම්වල ප්‍රමාණයට බලපාන තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම සහ වාර්තා කරනු ලබන දිනයට අවිනිශ්චිත වගකීම් අනාවරණය කළ යුතුය. කෙසේ වෙතත් මෙම උපකල්පන සහ ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාව ප්‍රතිඵලයන් සඳහා බලපානු ඇත. ඉදිරියේ දී බලපෑ හැකි වත්කම් හෝ වගකීම්වල ධාරණ අගයේ ද්‍රව්‍යාත්මක වෙනස්කම් සිදු කිරීමට වය බලපානු ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

තීන්දු

ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම සඳහා සම්බන්ධ වීම හැරුණු කොට, අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ ක්‍රියාවලියේ දී කළමනාකරණය විසින් මූල්‍ය ප්‍රකාශවල හඳුනාගනු ලබන අගය සඳහා කැපී පෙනෙන බලපෑමක් ඇති පහත තීන්දු ගෙන ඇත.

ඇස්තමේන්තු සහ උපකල්පන

ඉදිරි මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ වගකීම් හි ධාරණ අගයේ ද්‍රව්‍යමය ගැලපීමක් ඇති කිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති, අනාගතය පිළිබඳ ප්‍රධාන උපකල්පන සහ වාර්තා කරන දිනයේ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයේ අනෙකුත් ප්‍රධාන මූලාශ්‍ර පහතින් සාකච්ඡා කෙරේ.

(අ) මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම්

මූල්‍ය තත්ව ප්‍රකාශයේ දක්වා ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකම සහ වාර්තාගත මූල්‍ය වගකීම්, ක්‍රියාකාරී වෙළඳපොළෙන් ඇති විය නොහැකි විට, වට්ටම් කළ මුදල් ප්‍රවාහ ආකෘතිය සහ/හෝ ගණිතමය ආකෘති භාවිතය ඇතුළත් විවිධ තක්සේරු ක්‍රම භාවිත කර ඒවා තීරණය කරනු ලැබේ. මෙම ආකෘතීන් සඳහා යෙදවුම් හැකි අවස්ථාවල දී නිරීක්ෂණය කළ හැකි වෙළඳපළ දත්තවලින් ඇති වන අතර, නිරීක්ෂණය කළ හැකි වෙළඳපළ දත්ත නොමැති විට, සාධාරණ වටිනාකම් ස්ථාපිත කිරීම සඳහා විනිශ්චයක් අවශ්‍ය වේ.

මෙම සාධකවල උපකල්පන වෙනස්කම්, වාර්තා කළ මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකම සඳහා බලපෑ හැකිය. භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන සඳහන් අගයේ දක්වා ඇති අතර පෙර වසරේ දී ඒවායේ වියදම මත දක්වා ඇත.

ශේෂ පත්‍රයේ දිනට මූල්‍ය වත්කම්වල වටිනාකම (Carrying Value) (භාණ්ඩාගාර බිල්පත්) රු. 1,404,628,796/- (2020 රු. 1,232,748,534/-) කි.

(ආ) නිර්වචිත ප්‍රතිලාභ බැඳියාවන් පිළිබඳ තක්සේරුව

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) හි මිනුම් රීතියකට අනුව නිර්වචිත ප්‍රතිලාභ බැඳියාවන් පිළිබඳ තක්සේරුවේ පිරිවැය ගණනය කරනු ලබයි.

ශේෂ පත්‍රයේ දිනට නිර්වචිත ප්‍රතිලාභ බැඳියාවන්හි වටිනාකම රු. 66,185,597/- (2020: රු. 50,084,994/-) කි.

(ඇ) සාධාරණ වටිනාකම

සාධාරණ වටිනාකම යනු, දැනුවත් පිරිස සහ කිසිදු බලකිරීමක් නොමැතිව කැමැත්තෙන් සිටින පාර්ශ්වයන් අතර දුරස්ථභාවයකින් ගනුදෙනු කිරීම මඟින් විකඟවන, සැලකිලිමත් වනු ලබන අගයයි. මූල්‍ය උපකරණයක් මුලින් හඳුනා ගත් විට, එහි සාධාරණ වටිනාකම සාමාන්‍යයෙන් ගෙවූ හෝ ලැබුණු සලකා බැලීමේ වටිනාකම වේ. මූලික හඳුනාගැනීමෙන් පසුව, සක්‍රීය වෙළඳපොළක ගෙන හැර දක්වන මූල්‍ය වත්කමක සාධාරණ වටිනාකම සාමාන්‍යයෙන් ලංසු මිල වන අතර, සක්‍රීය වෙළඳපොළක ගෙන හැර දක්වන මූල්‍ය වගකීමක් සඳහා සාධාරණ වටිනාකම සාමාන්‍යයෙන් විකුණුම් සඳහා ඉදිරිපත් කරන මිල නම් වේ. මුදල් සමාන දෑ වැනි මූල්‍ය උපකරණ, සහ කෙටි කාලයක් පවතින කෙටි කාලීන ආයෝජන සඳහා, මෙම උපකරණවල ධාරණ අගය (Carrying Value) සාධාරණ වටිනාකමට ආසන්න වේ.

(ඈ) ආදායම් බද්ද

අධිකාරිය ආදායම් බදු සඳහා යටත් වන අතර, ආදායම් බදු සඳහා සමස්ත විධිවිධාන නිශ්චය කිරීම සඳහා සැලකිය යුතු තීන්දු අවශ්‍ය වේ.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

3. මූල්‍ය වත්කම්

අධිකාරිය විසි මූල්‍ය වත්කම් පහත කොටස් දෙකට වර්ග කොට දක්වයි: ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරෙන තෙක් තබා ඇති සහ විකුණුම් සඳහා යොදා ගත හැකි. මූලික හඳුනාගැනීමේ දී කළමනාකරණය විසින් වර්ගීකරණය තීරණය කරනු ලබන අතර ආයෝජන ලබා ගන්නා ලද අරමුණ මත රඳා පවතී.

3.1 වර්ගීකරණය

(අ) ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු, සක්‍රීය වෙළඳපොළක සඳහන් කර නොමැති, ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ඇති විය නොහැකි මූල්‍ය වත්කමකි. සාමාන්‍ය ගනුදෙනුවලින් ඇති වන ලැබිය යුතු මුදල් ද මෙම කාණ්ඩයේ වර්ගීකරණය කර ඇති අතර හානිකරණ සඳහා සමාලෝචනය කෙරේ.

(ආ) කල් පිරෙන තෙක් තබා ඇති මූල්‍ය වත්කම්

කල් පිරෙන තෙක් තබා ඇති ආයෝජන යනු, ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ඇති විය නොහැකි මූල්‍ය වත්කම් වන අතර, අධිකාරියේ කළමනාකාරීත්වයට ධනාත්මක චේතනාවක් ඇති ස්ථාවර කල්පිරීම් සහ පහත දෑ හැර කල්පිරීම පවතින දෑ වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

- මූලික හඳුනා ගැනීම් මත අධිකාරිය ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකම ලෙස නම් කරයි; හෝ
- විකුණුම් සඳහා යොදා ගත හැකි යනුවෙන් අධිකාරිය නම් කරයි; සහ
- ණය සහ ලැබිය යුතු දෑ යන්නෙහි අර්ථය සපුරාලන

කල් පිරෙන තෙක් තබා ඇති ආයෝජනවල පොලී, ආදායම් ප්‍රකාශයෙහි දක්වා ඇති අතර, 'ආයෝජන ආදායම්' ලෙස වාර්තා කොට ඇත.

(ඇ) විකුණුම් සඳහා යොදා ගත හැකි මූල්‍ය වත්කම්

විකුණුම් සඳහා යොදා ගත හැකි ආයෝජන යනු අනිශ්චිත කාල සීමාවකට තබා ගැනීමට අදහස් කරනු ලබන මූල්‍ය වත්කම් වේ. ද්‍රවශීලිතාවයේ අවශ්‍යතාව මත විකිණීම හෝ පොලි අනුපාත, හුවමාරු අනුපාත මත වෙනස් කරනු ලබන හෝ ද්‍රවශීලිතාවයේ මිල හෝ ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර නොමැති, කල් පිරෙන තෙක් තබා ඇති ආයෝජන හෝ ලාභ හෝ අලාභ තුළින් සාධරණ වටිනාකම මත මූල්‍ය වත්කම් වේ.

3.2 හඳුනා ගැනීම සහ මිනුම් කිරීම

මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ වටිනාකමකින් හඳුනාගෙන ඇති අතර, සියලුම මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් රැගෙන නොයන අවස්ථාවක, ඒවා අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය වේ. ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකමකින් ගෙන යන මූල්‍ය වත්කම්, මූලිකව සාධාරණ වටිනාකමින් හඳුනාගෙන ඇති අතර, ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශයේ වියදම් කෙරේ. මූල්‍ය වත්කම් ඔවුන්ගෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය කල් ඉකුත් වූ විට හෝ ඒවා මාරු කර ඇති විට ඒවා හඳුනා ගැනීමෙන් බැහැර කරනු ලබන අතර, අධිකාරිය විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ වාසි සැලකිය යුතු ලෙස පවරා ඇත. විකුණුම් සඳහා යොදා ගත හැකි මූල්‍ය වත්කම් පසුව සාධාරණ වටිනාකමින් ගෙන යනු ලැබේ. ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ණය සහ ලැබිය යුතු මුදල් සහ කල්පිරීමට නියමිත මූල්‍ය වත්කම් ක්‍රමක්ෂයගත පිරිවැයක් යටතේ ගෙන යනු ලැබේ.

කල්පිරීමට නියමිත ලෙස වර්ගීකරණය කරනු ලබන මූල්‍ය සහ මූල්‍ය නොවන සුරැකුම්හි සාධරණ වටිනාකමෙහි වෙනස්කම්, වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනා ගැනේ.

විකුණුම් සඳහා යොදා ගත හැකි හෝ හානිකරණ ලෙස සුරැකුම් වර්ගීකරණය කරන විට, වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනා ගනු ලබන සමුච්චිත සාධාරණ අගයේ වෙනස්කම්, මූල්‍ය වත්කම්හි ආදායම් ප්‍රකාශයේ හඳුනා ගත් ශුද්ධ ලාභ/අලාභ ලෙස ඇතුළත් කොට ඇත.

විකුණුම් සඳහා යොදා ගත හැකි සුරැකුම්හි පොලිය ඵලදායී පොලී ක්‍රමය භාවිත කොට ගණනය කර ඇති අතර, ආදායම් ප්‍රකාශයේ දී හඳුනා ගැනේ.

3.3 සාධාරණ වටිනාකම හඳුනාගැනීම

ණය සහ අත්තිකාරම්හි සාධාරණ වටිනාකම මෙන්ම බැංකු වෙත වගකීම් සහ ගනුදෙනුකරුවන්, ගිවිස ගෙන එකඟ වූ මූල්‍ය ප්‍රවාහ, බැර තත්වය, ද්‍රවශීලිතාව සහ වියදම වර්තමාන අගය ආකෘතිය යොදා ගෙන හඳුනා ගනු ලබයි.

ධාරණ අගයෙන් (Carrying Value), වෙළඳ ලැබිය යුතු දෑ සහ ගෙවිය යුතු දෑ සඳහා හානිකරණ ප්‍රතිපාදන අඩු කළ පසු ඒවායේ සාධාරණ අගයට ආසන්න අගයක් ලැබෙන බව උපකල්පනය කෙරේ.

3.4 හඳුනා ගැනීමෙන් බැහැර කිරීම

මූල්‍ය වත්කමක් (හෝ මූල්‍ය වත්කමක කොටසක් හෝ සමූහයෙන් කොටසක සමාන මූල්‍ය වත්කමක් යොදා ගත හැකි විටක) හඳුනා ගැනීමෙන් බැහැර කරනු ලබන්නේ,

- කල් ඉකුත් වූ වත්කම්වලින් මූල්‍ය ප්‍රවාහ යොදා ගැනීමේ අයිතිය
- වත්කම්වලින් මූල්‍ය ප්‍රවාහ යොදා ගැනීමේ අයිතිය අධිකාරිය විසින් පවරා ඇත හෝ 'ගනුදෙනු' සැලැස්මක් සඳහා එකඟවීම යටතේ තෙවන පාර්ශ්වයක් වෙත ද්‍රව්‍යාත්මක ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන් ලැබිය යුතු මූල්‍ය ප්‍රවාහ ගෙවීමේ වගකීම උපකල්පනය කරනු ලැබේ.

(අ) අධිකාරිය වත්කමේ අවදානම් සහ වාසි සියල්ල සෑහෙන පරිදි පවරා ඇත. හෝ

(ආ) අධිකාරිය වත්කමේ අවදානම් සහ වාසි සියල්ල සෑහෙන ලෙස පවරා හෝ රඳවා ගෙන නොමැති නමුත් වත්කම් පාලනය පවරා ඇත.

අධිකාරිය එහි වත්කමකින් මූල්‍ය ප්‍රවාහ ලැබීමේ අයිතිය පවරා ඇති විටක හෝ 'ගනුදෙනු' සැලැස්මක් සඳහා එකඟවීමකට යොමු වූ විටක සහ වත්කමේ අවදානම් සහ වාසි සියල්ල සෑහෙන ලෙස පවරා හෝ රඳවා ගෙන නොමැති හෝ එහි පාලනය පවරා නැති විටක, අධිකාරියේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට වත්කම්

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

හඳුනාගෙන ඇත. මෙහිදී, අධිකාරිය හවුල් වගකීමක් ලෙස ද හඳුනා ගැනේ. පවරන ලද වත්කම සහ හවුල් වගකීම අධිකාරිය රඳවා ගත් අයිතීන් සහ වගකීම් පෙන්නුම් කිරීම මත ගණනය කරනු ලබයි. පැවරූ වත්කම පිළිබඳ ඇපකරයක ස්වරූපය ගන්නා අබණ්ඩ මැදිහත්වීම වත්කම්වල මුල් රැගෙන යන මුදලට වඩා අඩුවෙන් මනිනු ලබන අතර අධිකාරියට ආපසු ගෙවීමට අවශ්‍ය විය හැකි උපරිම සලකා බැලීමේ ප්‍රමාණය මනිනු ලැබේ.

4. දේපළ, පිරියත සහ උපකරණ

4.1 පිරිවැය/ප්‍රත්‍යාගණනය

විදිනෙදා සේවා වියදම්වලින් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩු කළ පසු හිමිකරු සතු දේපළ ඇතුළුව දේපළ සහ උපකරණ, වියදම්හි සටහන් කරනු ලැබේ. උපයන විට ආදේශනය හෝ ප්‍රධාන පිරික්සුම් වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර, භාණ්ඩය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට සම්භාවිතාවක් තිබේ නම් සහ භාණ්ඩයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

දේපළ සහ උපකරණවල වියදම් යනු අත්කර ගැනීමේ හෝ ගොඩනැංවීමේ වියදම සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා වත්කම් එහි පවතින තත්වයට ගෙන ඒමට දරන ලද ඕනෑම වියදමක්ය. දේපළ සහ උපකරණ ආයිතමයක් පසුව ප්‍රත්‍යාගණනය කළහොත් එවැනි වත්කම් සියල්ලම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. 2014 වසර සිට බලාත්මක වන පරිදි සෑම අවුරුදු 3-5 කට වරක්ම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිපත්ති අධිකාරිය විසින් වෙනස් කරනු ලබයි. කෙසේ වෙතත් වත්කම්හි සාධාරණ අගය ප්‍රත්‍යාගණනයට යටත් වන විට ධාරණ අගයෙන් (Carrying Value) ද්‍රව්‍යාත්මකව වෙනස් වන විට වැඩිදුර ප්‍රත්‍යාගණනය කරනු ලබයි.

විය ආදායම් ප්‍රකාශයේ පෙර හඳුනාගෙන ඇති එම වත්කමේ ප්‍රත්‍යාගණනය කිරීමේ අඩුවීමක් ප්‍රතිවර්තනය කරන ප්‍රමාණයට හැර, වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට ධාරණ අගයේ ඕනෑම වැඩි වීමක් ප්‍රත්‍යාගණන සංචිතය වෙත සෘජුවම බැර කරනු ලැබේ. එවැනි අවස්ථාවක වැඩි කිරීම ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. ප්‍රත්‍යාගණන සංචිතයක අතිරික්තයකට එරෙහිව, එම වත්කමේ පෙර අතිරික්තයක් හිලව් කරන ඕනෑම ප්‍රත්‍යාගණනය කිරීමේ හිඟයක් සෘජුවම හිලව් කරනු ලබයි. අතිරික්තය වියදමක් ලෙස පිළිගනී. බැහැර කිරීම මත විකුණන ලද වත්කම්වලට අදාළ ඕනෑම ප්‍රත්‍යාගණනය සංචිතයක් රඳවා ගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ.

4.2 ක්ෂය වීම

ක්ෂයවීම් සඳහා වන ප්‍රතිපාදන දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය/ තක්සේරුව (වත්කම්වල පිරිවැය/ඇගයීමේ අවශේෂ වටිනාකමෙන් 10% ට අඩු) සරල මාර්ග ක්‍රමය මත ගණනය කෙරේ. ඉඩම් හැර අනෙකුත් සියලුම දේපළ, පිරියත සහ උපකරණ ප්‍රයෝජනවත් ආයු කාලය තුළ එවැනි මුදල් කපා හැරීම සඳහා පහත සඳහන් ප්‍රතිශත මත වාර්ෂිකව ක්ෂය කර ඇත.

ගොඩනැගිලි	6 2/3%
බහාලුම් ව්‍යුහයන්	10%
මෝටර් රථ	12.5 %
දේපළ, පිරියත සහ උපකරණ	25 %
ලී භාණ්ඩ සහ සවිකිරීම්	25 %
වෙනත් ස්ථිර වත්කම්	25%

භාවිත කිරීමට ඇති වත්කම් දින සිට සමානුපාතික පදනම මත ලාභ සහ අලාභ ගිණුමට ක්ෂයවීම් අය කර ඇති අතර තනි වත්කම්වල ක්ෂය විය හැකි ප්‍රමාණය තීරණය කිරීමේ දී පිරිවැය/ප්‍රත්‍යාගණන අගයෙන් 10%ක් ඉතිරි අගය ලෙස රඳවාගෙන ඇත.

ක්ෂයවීම් ක්‍රමය, ප්‍රයෝජනවත් ආයු කාලය සහ අවශේෂ අගයන් කළමනාකරණය විසින් එක් එක් වාර්තාකරණ දිනක දී සමාලෝචනය කරනු ලබන අතර, පවතින හොඳම තොරතුරු සහ වත්කම්වල අපේක්ෂිත ආර්ථික කාර්යක්ෂමතාව මත පදනම්ව LKAS 16 විසින් අවශ්‍ය පරිදි අදාළ නම් වෙනස් කරනු ලැබේ. මෙම ඇස්තමේන්තුවල අවිනිශ්චිතා, තාක්ෂණික යල්පැනීම් සඳහා අදාළ වන අතර විය ඇතැම් මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණ උපකරණවල උපයෝගීතාව වෙනස් කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

වත්කම් වෙත තක්සේරු කරන ලද ප්‍රයෝජනවත් ආයුකාල පහත පරිදි වේ.

ගොඩනැගිලි	අවුරුදු 15-40
බහාලුම් ව්‍යුහයන්	අවුරුදු 5-10
මෝටර් රථ	අවුරුදු 8-15
දේපළ, පිරියත සහ උපකරණ	අවුරුදු 4-10
ලී භාණ්ඩ සහ සවිකිරීම්	අවුරුදු 4-10
වෙනත් ස්ථිර වත්කම්	අවුරුදු 4-10

4.3 හඳුනා ගැනීමෙන් බැහැර කිරීම

බැහැර කිරීමේ දී හෝ එය භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට දේපළ සහ උපකරණවල අයිතම හඳුනා ගැනීමෙන් බැහැර කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණවල අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය තීරණය වන්නේ, විකුණුම් ක්‍රියාවලිය සහ වත්කම් ධාරණ අගය (Carrying Value) අතර වෙනස මඟින් වන අතර එය ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගනු ලැබේ.

4.4 ස්පෘශ්‍ය වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේ දී, අධිකාරිය විසින් එහි ස්පෘශ්‍ය වත්කම්වල ධාරණ වටිනාකම සමාලෝචනය කරනුයේ එම වත්කම්වල අලාභ හානි සිදුවී ඇති බවට යම් ඇඟවීමක් තිබේද යන්න තීරණය කිරීමටය. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම්, හානිකරණ අලාභයේ ප්‍රමාණය (ඇත්නම්) තීරණය කිරීමට වත්කම්වල අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. තනි වත්කමක අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කිරීමට නොහැකි වූ විට, එම වත්කම අයත් වන මුදල් උත්පාදන ඒකකය සඳහා අයකර ගත හැකි අගය තීරණය කරනු ලැබේ. වෙන් කිරීමේ සාධාරණ සහ ස්ථාවර පදනමක් හඳුනාගත හැකි විට, වත්කම් තනි මුදල් උත්පාදන ඒකක සඳහා ද වෙන් කරනු ලැබේ හෝ එසේ නොමැති නම් සාධාරණ සහ ස්ථාවර වෙන් කිරීමේ පදනමක් හඳුනාගත හැකි කුඩාම මුදල් උත්පාදන ඒකක සමූහයට ඒවා වෙන් කරනු ලැබේ.

වත්කමේ අය කර ගත හැකි අගය යනු වත්කමේ සාධාරණ අගයෙන් වත්කම විකිණීමට දරන පිරිවැය අඩු කළ පසු අගය හා වත්කම දැනට භාවිතා කරන අයුරෙන් ඉපයිය හැකි ආදායම යන දෙකෙන් වැඩි අගය වේ. භාවිතයේ ඇති වටිනාකම තක්සේරු කිරීමේ දී, ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබන්නේ බදු වලට පෙර වට්ටම් අනුපාතයක් භාවිත කරමිනි. එය මුදල්වල කාල වටිනාකමෙහි වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම් පිළිබිඹු කරන අතර අනාගත මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කරන වත්කමට විශේෂිත වූ අවදානම් ගලපා නැත.

වත්කමක (හෝ මුදල් උත්පාදන ඒකකයේ) අයකරගත හැකි මුදල, එහි ධාරණ වටිනාකමට (Carrying Value) වඩා අඩු යැයි ඇස්තමේන්තු කර ඇත්නම්, වත්කමේ (මුදල් උත්පාදන ඒකකය) ධාරණ වටිනාකම එහි ආපසු ලබාගත හැකි වටිනාකමෙන් අඩු කරනු ලැබේ. අදාළ වත්කම නැවත අගය කිරීමේ වටිනාකම් ගෙන යන්නේ නම් හැර, හානිකරණ අලාභයක් ආදායම් ප්‍රකාශයේ අනතුරුව හඳුනා ගැනේ. එවැනි අවස්ථාවක ප්‍රත්‍යාගණනය පාඩුවක් ලෙස හානිකරණ අලාභ හඳුනා ගැනේ.

4.5 නොනිමි ප්‍රාග්ධන ක්‍රියාකාරකම්

නොනිමි ප්‍රාග්ධන ක්‍රියාකාරකම් පිරිවැයෙහි දක්වනු ලබයි. මේවා ප්‍රාග්ධනීකරණය අපේක්ෂිත ගොඩනැගිලි සහ පද්ධති සංවර්ධනයන් ඉදිකිරීමේ දී සෘජුවම දරන ලද ප්‍රාග්ධන ආකාරයේ වියදම් වේ.

සම්පූර්ණ කිරීමේ සහතිකය ලද පසු හෝ වත්කම භාවිත කිරීමට හැකි විට මෙම වියදම් CAASL වත්කම් ලේඛනයට යොදා ගනු ලැබේ.

4.6 අස්පෘශ්‍ය වත්කම්

පිරිවැය ආකෘතිය අස්පෘශ්‍ය වත්කම් මැනීමේදී යොදා ගනු ලැබේ.

තොරතුරු තාක්ෂණ මෘදුකාංග සහ මෙහෙයුම් පද්ධතිවල පිරිවැය (වත්කම්වල පිරිවැයේ අවශේෂ වටිනාකම 10% ට අඩු) මත සෘජු රේඛා පදනම මත ක්‍රමක්ෂය සඳහා ප්‍රතිපාදන ගණනය කෙරේ. ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට එවැනි මුදල් කපා හැරීම සඳහා සියලුම තොරතුරු තාක්ෂණ මෘදුකාංග 50% ක අනුපාතයකින් වාර්ෂිකව ක්‍රමක්ෂ කර ඇත.

අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කිරීමේ අවශ්‍යතාවය සමඟ වරින් වර සමාලෝචනය කෙරේ. තොරතුරු තාක්ෂණ මෘදුකාංගයේ ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ:

තොරතුරු තාක්ෂණ මෘදුකාංග	අවුරුදු 2- 4

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

4.7 කල්බදු ගිවිසුම්

4.7.1 වත්කම පාවිච්චි කිරීමේ හිමිකම

අධිකාරිය බදු දීමේ ආරම්භක දිනයේ දී වත්කම පාවිච්චි කිරීමේ හිමිකම හඳුනා ගනී (එනම්, පදනම් වූ වත්කමේ භාවිත කළ හැකි දිනය). වත්කම පාවිච්චි කිරීමේ හිමිකම පිරිවැයෙන් ගණනය කරනු ලැබේ. වත්කම පාවිච්චි කිරීමේ හිමිකම පහත සඳහන් පරිදි කල්බදු කාල සීමාව සහ ඇස්තමේන්තුගත වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය තුළ සරල මාර්ග ක්‍රමය මත ක්ෂය වේ.

වත්කම	ඇස්තමේන්තුගත ආයු කාලය
ඉඩම	අවුරුදු 30 ට වැඩි

4.7.2 කල්බදු වගකීම්

අධිකාරිය විසින් කල්බදු ආරම්භක දිනයේ දී, කල්බදු කාල සීමාව තුළ සිදු කළ යුතු බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව මනිනු ලබන කල්බදු වගකීම් හඳුනා ගනේ. කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී, අධිකාරිය විසින් බදු දීම ආරම්භ කරන දිනයේ දී භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතය භාවිත කරනු ලබයි.

5. තොග

සියලුම තොග, පිරිවැය අනුව තක්සේරු කර ඇත. ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කළ ක්‍රමය මත පදනම්ව පිරිවැය තීරණය වේ (FIFO). තොග ස්ථාවර හා පරිභෝජ්‍ය වලින් සමන්විත වේ.

6. අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම් සඳහා වෙනත් ණය ගැතියන් සහ ලැබිය යුතු, අත්තිකාරම්, තැන්පතු, පෙරගෙවුම්, ලැබිය යුතු බදු ඇතුළත් වේ.

(අ) අත්තිකාරම්, තැන්පතු, පෙරගෙවුම් වියදම්

එක් මූල්‍ය වර්ෂයකට වඩා ප්‍රතිලාභයක් හෝ සම්බන්ධතාවයක් ඇතැයි සැලකෙන වියදම් අත්තිකාරම්, තැන්පතු සහ පෙරගෙවුම් වියදම් ලෙස වර්ග කෙරේ. එවැනි වියදම්, එය අදාළ වන කාල සීමාව තුළ, කාල සීමා පදනම මත කපා හරිනු ලැබේ.

(ආ) වෙනත් ණය ගැතියන්

වෙනත් ණය ගැතියන් අඩු හානිකරණ අලාභය සහිතව හඳුනා ගනේ.

(ඇ) ලැබිය යුතු බදු

ලැබිය යුතු බදු, පිරිවැයෙන් හඳුනා ගනේ.

(ඈ) කාර්ය මණ්ඩල පෙරගෙවුම් පිරිවැය

අධිකාරියේ සේවකයින්ට සහනශීලී පොලියට ලබා දී ඇති කාර්ය මණ්ඩල ණය වලින් ඇති වන ශේෂය මෙමඟින් නියෝජනය කරනු ලබයි.

(ඉ) ලැබිය යුතු වෙකතු කළ අගය මත බද්ද

මෙය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු වෙකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් නියෝජනය කරයි.

7. මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමානකම් යනු අතේ ඇති මුදල් සහ කෙටි කාලීන බොහෝ ද්‍රවශීල ආයෝජන වලින් සමන්විත වන අතර, ඒවා මුදල්වල ප්‍රකාශ වටිනාකමට පහසුවෙන් පරිවර්තනය කළ හැකි අතර, වටිනාකමේ වෙනස්වීම්වල සුළු අවදානමකට යටත් වේ. කෙටි කාලීන මුදල් බැඳීම් සපුරාලීමේ අරමුණින් මේවා පවත්වනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා, මුදල් සහ මුදල් සමාන දේ, අතැති මුදල් සහ බැංකුවල තැන්පතුවලින් සමන්විත වේ. කෙටි කල්පිරීමක් සහිත ආයෝජන ද මුදල් සමාන ලෙස සලකනු ලැබේ. ඒකාබද්ධ ශේෂ පත්‍රයේ, බැංකු අයිරා වත්මන් වගකීම්වල ණය ගැනීම් තුළ දක්වා ඇත.

8. ප්‍රතිපාදන

පෙර සිදුවීමක් හේතුවෙන් වර්තමානයේ අධිකාරිය සතුව වගකීමක් පවතින්නේ නම් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. එය වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇති සම්පත් වල අලාභයක් අවශ්‍ය වේ යැයි පෙන්නුම් කරන අතර වගකීම් ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් සිදු කළ හැකිය. මුදල්වල කාල අගයේ බලපෑම ද්‍රව්‍යාත්මක නම්, පූර්ව බදු අනුපාතයකින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් ප්‍රතිපාදන තීරණය කරනු ලබයි. එය මුදල්වල කාල වටිනාකමෙහි වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම් සහ සුදුසු අවස්ථාවලදී වගකීම්වලට විශේෂිත වූ අවදානම් පිළිබිඹු කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 7 (ඌ) වගන්තියට අනුව, ගුවන්යානා අනතුරු සහ සිද්ධීන් පිළිබඳ විමර්ශන ආරම්භ කිරීම සහ සෙවීමට සහ මුදාගැනීමේ කටයුතු සම්පාදනය කිරීමට කටයුතු කිරීමේ බලය, ක්‍රියාකාරිත්වය සහ වගකීම අධිකාරිය වෙත පවරා ඇත. 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ VI පරිච්ඡේදයේ, 53, 54 සහ 55 වගන්තිවල විධිවිධාන මගින් මෙය තවදුරටත් විස්තර කොට ඇත.

ශ්‍රී ලංකාව විශාල සාගර ගුවන් අවකාශයක් ඇති දිවයිනක් ලෙස සහ භූමිය සහ සාගර ගුවන් සීමාව හරහා පියාසර කරනු ලබන වර්ධනය වන ගුවන් පියාසැරි සංචලන සංඛ්‍යාව මෙන්ම, රට තුළට සහ ඉන් පිටත ක්‍රියාත්මක වන බැවින්, ගුවන්යානා අනතුරු විමර්ශන සහ සෙවීමට සහ ගලවා ගැනීමේ මෙහෙයුම්හි කාර්යයන් සපුරාලීම සඳහා ප්‍රමාණවත් සංචිත අරමුදලක් පවත්වා ගැනීමට, CAASL වෙත ඉතා වැදගත් වගකීමක් ඇත.

ගුවන්යානා අනතුරු විමර්ශන සහ සෙවීමට සහ ගලවා ගැනීමේ මෙහෙයුම් සඳහා රුපියල් මිලියන 50 ක මුදලක් සංචිත අරමුදලක් ලෙස වෙන් කිරීම සඳහා එවැනි සාකච්ඡා ලියකියවිලි (DP/May/2018/03 (w)) 2018 මැයි 30 වෙනි දින පවත්වනු ලබන 145 වෙනි CAASL මණ්ඩල රැස්වීමේදී ඉදිරිපත් කරන ලදී.

9. සේවක ප්‍රතිලාභ

9.1 නිර්වචිත දායකත්ව සැලසුම්

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව, සේවක අර්ථසාධක අරමුදල (EPF) දායක මුදල් සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා සේවකයින් සුදුසුකම් ලබයි. අධිකාරිය විසින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදල, සේවකයින්ගේ දළ වැටුප්වල ස්ථාවර දායක මුදලට ගෙවන අතර, තවදුරටත් මුදල් ගෙවීමට නීතිමය හෝ සාධනීය බැඳීමක් නොමැත.

9.2 නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් යනු නිර්වචිත දායකත්ව සැලසුම හැරුණු කොට පවතින පශ්චාත් සේවා නියුක්ති සැලැසුම් ය. 1983 අංක 12 දරන පාරිතෝෂක ගෙවීම් පනතට ප්‍රකාරව අධිකාරිය පාරිතෝෂක ගෙවීමට වගකීමෙන් බැඳේ. සේවයේ යෙදී සිටින වසර ගණනින් ගුණ කළ සම්පූර්ණ මාසික වැටුප මත, පනත යටතේ බැඳීම් සඳහා විධිවිධාන තීරණය කරනු ලබන අතර ගණනය කිරීම් LKAS 19 සූත්‍රය මත පදනම් වේ. සෑම වසරකම අවසානයේ පාරිතෝෂික ප්‍රතිපාදනවල වටිනාකම සඳහා වෙනම ආයෝජනයක් පවත්වාගෙන යනු ලැබේ.

9.3 කාර්ය මණ්ඩල සුභසාධන සහ සමාජ සුරැකුම් අරමුදල

රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගෙන සිවිල් ගුවන්සේවා අධිකාරිය සමඟ සම්බන්ධ වූ රාජ්‍ය සේවකයින්ට අදාළව 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 20 (5) වෙනි වගන්තිය යටතේ කාර්ය මණ්ඩල සුභසාධන සහ සමාජ සුරැකුම් අරමුදල සකස් කර ඇත. උපචිත පොලිය සමඟ විශ්‍රාම ලත් සෑම සේවකයෙකුගේම නමට පවතින වටිනාකම ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙන් විශ්‍රාම ගනු ලබන අවස්ථාවේදී ලබා දෙනු ලැබේ.

10. මූල්‍ය වගකීම්

10.1 මූලික හඳුනා ගැනීම සහ මිනුම්කරණය

LKAS 39 විෂය පථය තුළ මූල්‍ය වගකීම් සුදුසු පරිදි ලාභ හෝ අලාභ සහ ණය සහ ණය ගැනීම් හරහා සාධාරණ වටිනාකම මත මූල්‍ය වගකීමක් ලෙස වර්ගීකරණය කොට දක්වයි. අධිකාරිය විසින් මූලික හඳුනාගැනීම මත මූල්‍ය වගකීම් වර්ගීකරණය නිශ්චය කරනු ලැබේ.

මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ වටිනාකම මත හඳුනා ගනු ලබන අතර, ණය සහ ණය ගැනීම්වල දී ක්‍රමක්ෂය පිරිවැය යටතේ දක්වනු ලැබේ.

11. වෙනත් වගකීම්

වෙනත් වගකීම් සඳහා උපචිත වියදම් ඇතුළුව වෙනත් ණය හිමියන් ඇතුළත් වේ. එහි සාධාරණ වටිනාකම ලෙස සලකනු ලබන මේවා ඒවායේ ඓතිහාසික අගය මත සඳහන් කරනු ලැබේ.

12. ආදායම් හඳුනාගැනීම

12.1 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 12 වෙනි පරිච්ඡේදය ප්‍රකාරව, අධිකාරිය සතුව එයට අයත් අරමුදල් සහ 12(2) වෙනි පරිච්ඡේදය යටතේ අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් පැවතිය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

හැකිය. 12 (2) වෙනි පරිච්ඡේදය යටතේ ලැබෙන මුදල් SLFRS 15 සමඟ ඉදිරිපත් කරනු ලබන කාරණා අනුකූල වීමට මූල්‍ය ප්‍රකාශයේ ආදායම් යටතේ වර්ගීකරණය කොට ඇත.

12.2 ආදායම් මාර්ග

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පහත මූලාශ්‍ර මඟින් ආදායම උපයනු ලැබේ.

- මෙහෙයුම් ආදායම
  - » චෙතෙර විකුණුම් අධිභාරය
  - » අපගමන බදු වෙතින් සේවා ගාස්තු
  - » නියාමන සේවා (රක්ෂණ/බලපත්‍ර අලුත් කිරීම/සහතික පත්/ විභාග අනුමැතිය සහ පැවැත්වීම)
- මෙහෙයුම් නොවන ආදායම
  - » වෙනත් ආදායම්
  - » පොලී ආදායම් (කාර්ය මණ්ඩල ණය සහ මූල්‍ය උපකරණ)

චෙතෙර විකුණුම් අධිභාරය/ අපගමන බදු වෙතින් සේවා ගාස්තු/ නියාමන සේවා අදාළ සේවා ලබා දුන් කාල සීමාවල සාධාරණ වටිනාකමින් හඳුනා ගනු ලැබේ. උපචිත පදනමක් මත මෙම සියලුම ආදායම් හඳුනා ගැනේ.

12.3 පොලී ආදායම

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකමින් මනිනු ලබන මූල්‍ය උපකරණ ඇතුළු පොලී දරන මූල්‍ය උපකරණ සියල්ල සඳහා පොලී ආදායම, ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිත කරමින් ආදායම් ප්‍රකාශයේ 'ආයෝජන ආදායම' තුළ හඳුනා ගැනේ. ලැබිය යුතු දෑ හානිකරණ වන විට අධිකාරිය විසින් උපකරණවල මුල් ඵලදායී පොලී අනුපාතයට අපේක්ෂිත ඉදිරි මූල්‍ය ප්‍රවාහ වට්ටම් කිරීම හේතුවෙන් එහි ආපසු ලබා ගත හැකි වටිනාකමට ධාරණ වටිනාකම අඩු කරනු ලබන අතර එම වට්ටම් පොලී ආදායමක් ලෙස දිගටම පවත්වා ගෙන යනු ලබයි.

12.4 වෙනත් ආදායම්

වෙනත් අදායම් උපචිත පදනමින් හඳුනා ගැනේ.

13. වියදම් හඳුනා ගැනීම

සියලු වියදම්, විමර්ශනයේ සාධාරණ වටිනාකම මත ගණනය කරනු ලබන අතර, එම වියදම්වලට සම්බන්ධ කාල සීමාව තුළ හඳුනා ගැනේ.

වත්කම්වල දක්වා ඇති ඉදිරි ආර්ථික ප්‍රතිලාභවල ප්‍රයෝජනවත් ආයු කාලය හෝ පරිභෝජන රටාවේ අපේක්ෂිතයන්හි වෙනස්කම් ක්ෂයවීමේ කාල සීමාව වෙනස් කිරීම මඟින් ගණනය කරනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස සලකනු ලැබේ.

14. ණය ගැනීමේ පිරිවැය

අරමුදල් ගැනීමට සම්බන්ධව අධිකාරිය විසින් දරන ලද පොලී සහ වෙනත් පිරිවැය, ණය ගැනීමේ පිරිවැය වේ. ණය ගැනීමේ පිරිවැය එය දරන ලද කාලය සීමාවේ දී වියදම්වල හඳුනා ගැනේ.

15. ප්‍රවර්තන සහ විලම්බිත ආදායම් බදු

15.1 කාලපරිච්ඡේදයකට බදු වියදම්, ප්‍රවර්තන සහ විලම්බිත බදු වලින් සැකසී ඇත. වෙනත් විස්තීර්ණ ආදායම් හෝ සෘජුවම හිමිකම්වල හඳුනා ගැනෙන අයිතමයන්ට අදාළ වන ප්‍රමාණයක් හැරුණු කොට බදු ආදායම් ප්‍රකාශයේ දී හඳුනා ගැනේ. මෙම අවස්ථාවේ දී බදු ද පිළිවෙළින් වෙනත් විස්තීර්ණ ආදායම් හෝ සෘජුවම හිමිකම්වල හඳුනා ගැනේ.

විලම්බිත ආදායම් බදු වගකීම් ක්‍රමය යොදා ගනිමින් මූල්‍ය ප්‍රකාශවල වත්කම් සහ වගකීම් මත බදු සහ එහි ධාරණ වටිනාකම (Carrying Value) අතර ඇතිවන තාවකාලික වෙනස්කම් මත හඳුනා ගැනේ. කෙසේ වෙතත් ගනුදෙනුව සිදු වන අවස්ථාවේ ගිණුම් හෝ බදු අය කළ හැකි ලාභයට බලපාන ව්‍යාපාර සමායෝජන හැර විලම්බිත ආදායම් බදු ගනුදෙනුවක වත්කම් සහ වගකීම් හඳුනාගන්නා මුල් අවස්ථාවේ ඇති වන්නේ නම් එය අගය කරනු නොලැබේ. වාර්තා කරන දිනයේ අවසානයට නිරූපණය කරන ලද හෝ ප්‍රායෝගිකව නිරූපණය කරන ලද බදු පොලී (සහ නීති) භාවිත කිරීම පාලනය කරනු ලබන අතර, අදාළ විලම්බිත ආදායම් බදු වත්කම් හඳුනා ගන්නා ලද හොත් හෝ විලම්බිත ආදායම් බදු වගකීම් පියවනු ලැබුවහොත් විලම්බිත ආදායම් බදු යොදා ගනු ලැබේ.

තාවකාලික වෙනස්කම් භාවිත කළ හැකි දෑට එදිරිව ඉදිරි බදු අය කළ හැකි ලාභවල පවතින ප්‍රමාණයට විලම්බිත ආදායම් බදු හඳුනා ගැනේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

අධිකාරිය විසින් තාවකාලික වෙනස්කම්හි ප්‍රත්‍යාවර්තනවල කාල නිශ්චය පාලනය කරන විට අවස්ථාවන් හැර අනුබද්ධිත සහ සම්බන්ධිතයන්හි ආයෝජනවල හටගන්නා තාවකාලික වෙනස්කම් මත විලම්බිත ආදායම් බදු සපයනු ලබන අතර ඉදිරි පුරෝකථනවල තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය නොකරන බව පැහැදිලිය.

ප්‍රවර්තන බදු වත්කම්වලට එදිරිව ප්‍රවර්තන බදු වගකීම් හිලව් කිරීම බලාත්මක කිරීමට නීත්‍යානුකූල අයිතියක් ඇතිවිට සහ ශුද්ධ පදනම මත පියවීමට අදහසක් ඇති විට, බදු අය කළ හැකි ආයතනය හෝ විවිධ බදු අය කළ හැකි ආයතන මත එම බදු අය කළ හැකි අධිකාරිය මඟින් අයකරන ආදායම් බදුවලට විලම්බිත ආදායම් බදු වත්කම් සහ වගකීම් අදාළ වන විට විලම්බිත ආදායම් බදු වත්කම් සහ වගකීම් හිලව් කරනු ලැබේ.

ඉදිරියට ගෙන යන භාවිත නොකළ අලාභ හෝ භාවිත නොකළ බදු වැයෙහි බදු බලපෑම, මෙම අලාභයන් භාවිත කළ හැකි දේට එදිරිව ඉදිරි බදු අය කළ හැකි ලාභයන් පවතින්නේ නම් වත්කමක් ලෙස හඳුනා ගැනේ.

15.2 විලම්බිත බදු වත්කම් සහ වගකීම් වෙත විශ්ලේෂණය

	2021 රු.	2020 රු.
ආරම්භක ශේෂය	**50,084,994**	28,389,010
පරිතෝෂ සඳහා ප්‍රතිපාදන වෙතින්	**2,004,206**	1,653,645
වැඩි වූ බදු ක්ෂය වීම වෙතින්	**(5,218,737)**	(5,159,197)
ශුද්ධ විලම්බිත බදු වගකීම්	**46,870,462**	**24,883,458**

2018 වසරට පෙර ගිණුම් සඳහා පරිතෝෂ ප්‍රතිපාදන සඳහා විලම්බිත ආදායම් බදු වගකීම් හඳුනා ගනු නොලැබේ.

15.3 බදු වියදම් සහ ව්‍යවස්ථාපිත බදු අනුපාතයෙන් ගුණ කරන ලද ගිණුම්කරණවල ලාභය අතර සන් සන්දනය පහත පරිදි වේ

	2021 රු.	2020 රු.
ආදායම් බදු වියදම්වලට පෙර ලාභය ගිණුම් තැබීම	**420,599,959**	306,680,309
අඩු: වෙනත් සම්පත් වෙතින් ආදායම සහ විවර්ජන ආදායම	**257,499,747**	311,173,020
	163,100,213	(4,492,711)
අඩු කළ නොහැකි වියදම්	**157,048,889**	140,795,485
ව්‍යාපාර වෙතින් ව්‍යවස්ථාපිත ආදායම	**320,149,102**	**136,302,774**
අඩු: බදු විවර්ජන ලාභය	-	-
බදු ගෙවිය යුතු ආදායම- ව්‍යාපාරික ආදායම	**320,149,102**	136,302,774
බදු ගෙවිය යුතු ආදායම- ව්‍යාපාරික නොවන ආදායම	**121,167,983**	168,005,644
සීමිත ගෙවීම්	**(50,000,000)**	
මුළු බදු ගෙවිය යුතු ආදායම	**391,317,084**	304,308,418
ආදායම් බදු වියදම්	-	-
බදු ගෙවිය යුතු ආදායම - ව්‍යාපාරික සහ ව්‍යාපාරික නොවන ආදායම 24%	**93,916,100**	73,034,020
ආදායම් බදු වියදම්	**93,916,100**	**73,034,020**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

16. විදේශීය මුදල් පරිවර්තනය/ගනුදෙනු

ක්‍රියාකාරී මුදල් හැරුණු කොට ව්‍යවහාර මුදල්වල සියලු ගනුදෙනු, ගනුදෙනු කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාතිකය යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත. සෑම මූල්‍ය තත්ව ප්‍රකාශයකම දිනයට, විදේශීය මුදලකින් දක්වා ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරන ලද දිනයට පවතින විනිමය අනුපාතිකයට සමාන ශ්‍රී ලංකා රුපියල් වෙත පරිවර්තනය කරනු ලැබේ. විදේශීය මුදලකින් දක්වා ඇති මූල්‍ය නොවන වත්කම් වාර්තා කරන ලද දිනයට පවතින විනිමය අනුපාතිකයට සමාන ශ්‍රී ලංකා රුපියල් වෙත පරිවර්තනය කරනු ලැබේ. මූල්‍ය අයිතම පියවීමේ දී ඇති වන විනිමය වෙනස්කම් සහ මූල්‍ය අයිතම නැවත පරිවර්තනය එය ඇති වූ වර්ෂයේ දී ආදයම් ප්‍රකාශයෙන් හඳුනා ගැනේ.

17. අයවැය ලේඛනයට පසු සිදුවීම්

අධ්‍යක්ෂ මණ්ඩලය සිදුවීම් ඉතා හොඳින් නිරීක්ෂණය කරනු ලබන අතර අදාළ පරිදි ද්‍රව්‍යාත්මක පශ්චාත් අයවැය ලේඛනය සම්බන්ධයෙන් වත්මන් මූල්‍ය ප්‍රකාශයේ අවශ්‍ය පරිදි වෙනස්කම් හෝ අනාවරණය කිරීම් සිදු කරනු ලබයි.

18. අවිනිශ්චිත වගකීම්

පෙර සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අනාගතයේ වගකීමක් පවතී නම් හෝ පෙර සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ වගකීමක් පවතී නම් හෝ නමුදු සසම්භාවී නොවන හෝ ප්‍රමාණයක් නොදක්වන ගාස්තුව සාධාරණ ලෙස තක්සේරු කිරීමට නොහැකි නම් අවිනිශ්චිත වගකීම් අනාවරණය කරනු ලැබේ.

19. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ මත LKAS 7 වෙත අනුකූලව වක්‍ර ක්‍රමයක් භාවිත කොට මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලැබේ.

මූල්‍ය නොවන ස්වාභාවය, ඕනෑම විලම්බිතයක් හෝ පෙර හෝ ඉදිරි මූල්‍ය ආදායමක් ක්‍රියාත්මක කිරීමේ උපචිත හෝ ආයෝජන හෝ මූල්‍ය ගලන මුදල් යෙදවීම සමඟ ආදාළ ආදයම් හෝ වියදම් අයිතමයක ගනුදෙනු බලාත්මකව ලාභ හෝ අලාභ වෙනස් කර ඇති බව වක්‍ර ක්‍රමය අනාවරණය කරනු ලබයි.

20. රජයේ ප්‍රදාන

ලැබීමක් පවතින බවට හෝ අධිකාරිය වෙත පවරා ඇති බවට සාධාරණ සහතිකයක් ඇති විට සාධරණ වටිනාකම ඔස්සේ රජයේ ප්‍රදාන හඳුනා ගැනේ.

රජයේ ප්‍රදානයන්හි වටිනාකම අධිකාරිය නිර්මාණය කරන අවස්ථාවේ සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව වෙත පවරන ලද වත්කම් සහ වත්කම් සමුච්චිත ක්‍රමක්ෂයෙන් අඩු කිරීමෙන් පෙන්නුම් කරනු ලබයි.

රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය

ක්‍රමක්ෂය සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ දේපළ, පිරියත සහ උපකරණ හි පිරිවැය/අගය තක්සේරු කිරීම මත (ශේෂ වටිනාකමේ පිරිවැය/වත්කමේ අගය තක්සේරු කිරීම 10%ට අඩු) සරල රේඛීය පදනමක් මතය. රජයේ ප්‍රදානවලට එදිරිව, අනුරූප ගිණුමක් ලෙස ගිණුම් කරන ලද භූමිය හැරුණු කොට සියලු දේපළ, පිරියත සහ උපකරණ ප්‍රයෝජනවත් ආයු කාලය මත පහත ප්‍රතිශතයන්ට වාර්ෂිකව ක්‍රමක්ෂය වී ඇත.

ගොඩනැගිලි	6 2/3 %
රථ වාහන	12.5 %
දේපළ, පිරියත සහ උපකරණ	25 %
ලී භාණ්ඩ සහ සවිකිරීම්	25 %
අනෙකුත් ස්ථිර වත්කම්	25 %

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

21. ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සහ සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනු

21.1 ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS24) අනුව ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල සම්බන්ධිත පාර්ශ්ව අනාවරණය කිරීම යනු, අධිකාරියේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මඟ පෙන්වීම, පාලනය සඳහා බලය සහ වගකීම ඇති පිරිස වේ. ඒ අනුව අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය, අධිකාරියේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය ලෙස වර්ගීකරණය කොට ඇත.

ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වෙත සිදු කරන ලද හානිපූරණ පහත පරිදි වේ.

	2021 රු.	2020 රු.
කෙටි කාලීන සේවක ප්‍රතිලාභ	**3,729,000**	3,809,915

21.2 සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනු

සිවිල් ගුවන්සේවා අධිකාරිය ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමඟ පහත සඳහන් පරිදි සැලකිය යුතු මට්ටමින් ගනුදෙනු සිදු කර ඇත.

ආයතනයේ නම	සම්බන්ධතාවය	ගනුදෙනුවේ ස්වභාවය	2021 රු.	2020 රු.
සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්	රජය සතු	එතෙර විකුණුම් අධිභාරය	**298,751,714**	223,595,211
ලංකා විදුලිබල මණ්ඩලය	රජය සතු	විදුලි ගාස්තු	**15,042,565**	13,096,725
සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (පෞද්ගලික) සමාගම	රජය සතු	විදුලි ගාස්තු	**1,469,058**	861,011
ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය	රජය සතු	ජල ගාස්තු	**214,573**	219,747
සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (පෞද්ගලික) සමාගම	රජය සතු	ජල ගාස්තු	**555,555**	475,998
මහා භාණ්ඩාගාරය	රජය සතු	අපගමන බදු ගෙවීම්	**3,350,052,053**	7,548,000,772
සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (පෞද්ගලික) සමාගම	රජය සතු	අපගමන බදු ගෙවීම්	**725,849,651**	2,111,645,812
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	රජය සතු	අපගමන බදු ගෙවීම්	**362,924,826**	429,225,521
සේවක නියුක්ති භාරකාර අරමුදල් මණ්ඩලය	රජය සතු	සේවක නියුක්ති භාරකාර අරමුදල	**7,272,812**	7,379,359
සේවක අර්ථසාධක අරමුදල	රජය සතු	සේවක අර්ථසාධක අරමුදල	**36,364,062**	36,896,796
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	රජය සතු	ආදායම් බදු	**39,772,423**	164,706,977

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ආයතනයේ නම	සම්බන්ධතාවය	ගනුදෙනුවේ ස්වභාවය	2021 රු.	2020 රු.
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	රජය සතු	මුද්දර බදු	**1,139,309**	1,284,493
ශ්‍රී ලංකා ටෙලිකොම්	රජය සතු	විදුලි සන්දේශ ගාස්තු	**5,207,707**	4,504,637
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	රජය සතු	ඉන්ධන ගාස්තු	**576,532**	347,744
සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (පෞද්ගලික) සමාගම	රජය සතු	ඉන්ධන ගාස්තු	**3,963,813**	3,902,142
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	රජය සතු	රක්ෂණ ගාස්තු	**1,189,717**	17,842,298
ලංකා බැංකුව	රජය සතු	ආයෝජන	**1,734,764,065**	1,621,865,492
මහජන බැංකුව	රජය සතු	ආයෝජන	**932,700,000**	857,950,000
සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් (පෞද්ගලික) සමාගම	රජය සතු	රැස්වීම් සහ පුහුණු කිරීම් සඳහා ආහාර සැපයුම් සේවා	**28,066**	685,929
